

# කුදුසික

# KUDUSIKA

BY

The Ven: DHARMASIRI (MAHA STHAWIRA.)

WITH PARAPHRASE

BY

The Ven: Dimbulâgala Medhankara

REVISED

BY

*The Rev: B. SUMEDHANKARA.*

පූජ්‍යාචාර්‍ය්‍ය ධර්‍මශ්‍රී මහාස්ථවිරප්‍රණීත

# කු දු සි කා.

පූජ්‍යපාද දිඹුලාගල වනවාසී මේධඞ්කර මහාස්ථවිරප්‍රණීත

## ස න් න ස හි ත යි.

කලුතර අශෝකාරාමාධිවාසී
ආචාර්‍ය්‍යසුභූතිනායක ස්ථවිරපාදයන්වහන්සේගේ ශිෂ්‍යවූ
**බේරුවල සුමේධඞ්කර සාමීන් විසින්**
ලිපිදෝෂාපහරණයෙන් ශුද්ධකරණලදී.
ශ්‍රී බුද්ධවර්ෂ 2438.

Printed and Published
BY
S. ENDORIS de SILVA & HENRY S. WIJESOORIYA
at the
*Granthaprakasa Press Colombo.*

**1894.**

# KUDUSIKA

BY

The Ven: DHARMASIRI (MAHA STHAWIRA.)

WITH PARAPHRASE

BY

The Ven: Dimbulâgala Medhankara

REVISED

BY

*The Rev: B. SUMEDHANKARA.*

පූජ්‍යාචාර්‍ය ධර්‍මශ්‍රී මහාස්ථවිරප්‍රණීත

# කුදුසික.

පූජ්‍යපාද දිඹුලාගල වනවාසි මෙධඞ්කර මහාස්ථවිරප්‍රණීත

## සන්න සහිතයි.

කළුතර අශෝකාරාමාධිවාසී
ආචාර්‍ය සුමනතිස්ස ස්ථවිරපාදයන්වහන්සේගේ ශිෂ්‍යවූ
**බේරුවල සුමෙධඞ්කර සාමීන් විසින්**
ලිපිදොෂාපහරණයෙන් ශුද්ධකරණලදී.
ශ්‍රී බුද්ධවර්‍ෂ 2438.

Printed and Published
BY
S. ENDORIS de SILVA & HENRY S. WIJESOORIYA
at the
*Granthaprakasa Press Colombo.*

**1894.**

## නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

---

1 සමුජ්ඣිතාසෙසකිලෙසකූටං
විසාරදං ඛීණභවාභිනන්දිං,
විතිණ්ණසංකාපථෙඤෙය්‍යසිනුං
විසුද්ධබුද්ධං පනමාමි නිච්චං.

2 දිවාධිභූලොකපභූහි සෙවිතං
සමුබ්භවං චක්ඛුමතෙහිපස්සිතං,
භවම්බුධිසංතරණෙ තරිං සමං
විසිට්ඨධම්මං පනමාමි සන්තතං.

3 ගුණොඝපුණ්ණං මුනිසූනුතං ගතං
විභාවයන්තා'රියසච්චභද්දකං;
සුපාගුණෙය්‍යං විගතාසවං වරං
පණීතසඞ්ඝං පනමාමි'නාරතං

4 පණීතො තන්තිභාසාය බුද්ධසික්ඛසමුච්චයො,
යො ධම්මසිරිනාමෙන ථෙරෙන පරිබුද්ධිනා.

5 යා කතා දීපභාසාය සම්මා තස්ස'ත්ථවණ්ණනා,
මෙධඞ්කරෙන ථෙරෙන පොරාණෙන සුධීමතා.

6 තත්ථායාතං නිරාකත්වා ඛලිතං ලිපිකාරතො,
පමොදන්තු කතුස්සාහෙ කොසල්ලෙයෙධ විජානතං.

7 පසෙසරං ඛලිතං කිඤ්චි විඤ්ඤූනො යං පමාදජං,
දයාය සුවිසොධෙන්තු හිතමෙව ගවෙසිනො.

# සංඥාපනය.

## ඛුද්දසික සහගණ්ඨය.

මාගධීභාෂාමයවූ මේ "**බුද්දසික්ඛා**" නම් මාහැඟි උතුම් විනයග්‍රන්ථය සෞගතසාසනශ්‍රීභාරධාරීවූ ශබ්දශාස්ත්‍රාදියෙහිහා ධර්මවිනයෙහිද ප්‍රවීණතර අතිශයබුද්ධිමත් "**ධම්මශ්‍රී**" නම් මහාස්ථවිරතුමන් විසින් රචනාකරණලදි-මේ ආචාර්‍ය්‍යොත්තමයාගේ කාලය නිශ්චයකොට නොකිය හැකිවූත් දෙවරක්ෂිතාභිධාන ජයබාධම්මකිත්ති මහාස්ථවිරපාදයන් වහන්සේ විසින් විරචිතවූ "නිකායසංග්‍රහයෙහි" "බුද්ධඝෝෂනම් අටුවාචාරී මහාස්ථවිර පාදයන් පටන් මේ අතුරෙහි බුද්ධදින්නය. ධම්මපාලය. ජෝතිපාලය. ඛේමය. ධම්මශ්‍රීය. නාගය. ආනන්දය. අනුරුද්ධය—පෙ—යනාදි මහාස්ථවිරවරයෝ නොයෙක් ටීකාටීකාර්ථහා තන්ත්‍රවෙශෝපායවූ අනේකප්‍රකාරධර්මප්‍රබන්ධහා සන්න ගැටපද පිටපත් ආදිය උපදවාබුදුන්ගේ පර්‍ය්‍යාප්ති ධර්මය බැබලවූහ" යන මෙහි "ධම්මශ්‍රී" යයි දක්වා තිබෙන්නේ මේ (ඛුද්දසික කර්තෘවූ) ආචාර්‍ය්‍යවරයාගේ නාමයයි කිවමනා බැවින් මුන්වහන්සේගේ කාලය මහානාම රජුදවස ලක්දිවට පැමිණි අටුවාචාර්‍ය්‍ය බුද්ධඝෝෂ මහාස්ථවිරපාදයන් වහන්සේගේ කාලයට සම්පවූ මීට අවුරුදු 1000 (දහසකට) ප්‍රමාණ පූර්වයෙහිවූ කාලයයි අනුමාන කළහැකිය.

මේ ග්‍රන්ථරචනාවගේ මාහැඟි බැවින්ම මේ ආචාර්‍ය්‍යවරයා පූජ්‍යපාද අලාමක උතුම් පණ්ඩිත රත්නයක්ම බව නිසැකවම සැලකිය යුතුයි—මෙය අධිශීල. අධිචිත්ත. අධිප්‍රඥ. යන ශික්ෂාත්‍රය සම්බන්ධවූ මනොහර බහුවිධ ශික්ෂාවන් සංක්ෂෙපනයින් ස්වල්පකොට ප්‍රකාශකරණ හෙයින් "ඛුද්දසික" නම්වේ.

සාමාන්‍යයෙන් විනයනය විජානනාභිලාෂී සියල්ලටද විශෙෂයෙන් ශ්‍රද්ධාප්‍රව්‍රජිත කුලපුත්‍රයන්ටද හිතවූ මේ ක්‍ෂුද්‍රශික්ෂායෙහි පළමුවෙන් රත්නත්‍රය ප්‍රණාමය කොට ඊට අනතුරුව ගාථාව ලිම්ම පස් වර දසයක් මාතෘකා පද පිහිටුවා ඒ මාතෘකා පටිපාටියෙන් සතරපාරාජිකාය. නවගරුකාපත්තිය. කැපාකප සිව්රු. රජත්. පා. තලුතැටිය. ප්‍රතික්ෂෙපපවාරණය. සතරකාලිකය. පිළිගැණුම්ය. අකැපමාංසය. නිස්ගිපවිතිය. ශුද්ධපවිතිය. ශ්‍රමණව්‍යවහාරය. කැපකිලිනුය. උපාධ්‍යාචාර්‍ය්‍යවත්හා. වච්චකුටි පස්සාවකුටිවත්ය. මහලුසඟුන් පිළිවිස කිරිම්ය. නහනවත්හා නහනවිධිය. නොවැළිය යුත්තන්ය. කැපාකප සම්ගා. වහන්ය. නොබැලියයුතුදෑ. අඳුන්ය. අකැපසයනාසනයන්ය. එකස්නෙහි හින්දයුත්තන්ය. එක නම්භාදිසංවාසයට නොනිස්සන්ය. චතුර්විධකර්මය. මිථ්‍යාජිව

දුරුකිරීමය. අගනතුකාඳිවත්ය. ඊකපුත්ය. නිසගැණුම්ය. කැපාකප පටි. පොළෝ. පිරකරය. බෙහෙත් කිරීම් කරවීම්ය. කැපාකප වත් පිළිගැණුම්ය. කුලදූෂනය. වසෙළඹීම්ය. ගරුබඩුය. ප්‍රකීණ්ණකය. ආපත්තිදෙසනාය. සැදපිරිසුදු පවුරුණුදිම්ය. උපොසථය. පවුරුණුය. ඉන්‍ද්‍රියසංවරය. ශුඬිය. ප්‍රත්‍යයසන්නොෂය. සිව්අරඝුන්ය. විදශිනාය. යන මේ විනය පෙළ අටුවාහි ප්‍රකාශිතනානාවිධ ශිඎාවන් විස්තරකරමින් ග්‍රහණධාරණයට ඉතාපහසුප රිද්දෙන් (500) පන්සියයක් පමණ ගාථායෙන් රචනාකරතිබේ— මීට පුරාණ අභිනව ටීකාදෙකක් හා සන්න දෙකක්ද උපදවාලුබැවින්ම පුරාතන අනන්‍යවාශිවරයන්ට පවා අභිමතවූ අතිශයොපකාරවූ ප්‍රකරණයක් බවත් එසේම ඒ කාලයෙහි පටන් මේ දවස දක්වාම විනයනය විජානනයෙහි ආසා ඇති පැවිදි කුලපුත්‍රයන්ගේ හෘදයසාරවස්තුවක්මෙන් පවත්වාගණ එනබවත් පැහැදිලිව පෙණේ—මෙහි මේ සන්නසද විනයනය විජානනයෙහි බැසගත් ඉතා තියුණු බුඬි ඇත්තාවූ සර්‍වශාස්ත්‍රාදශීනඥනාදශී ඇති මීට අවුරුදු (589) පන්සිය අසූනවයකින් පමණ ඉගත විජයබාරජු දවස විසූ දිඹුලාගල වනවාසී "මෙබඞ්කර" මහාස්ථවිරතුමන් විසින් ඒ ඒ තැනට සුදුසුවූ පාළ්‍යපිකථාටීකා ප්‍රකරණදියේ ගාථා පාඨහා විනය සන්න මෙහි පූරාණ සන්නාදියේ පාඨයන්ද නිදශීනය කරමින් මාහැඟි ලෙසකර තිබේ.

අතින් අතට ලියාගැන්මෙන් පරම්පරාගත පොත් පත්වල විද්‍යමාන ව්‍යාකුලත්වය ගැණ අපි වැඩියමක් නොකීවුත් පෞරාණිකපොත් පත් ශුඬකිරිමෙහි නිපුනතායෝම ඊට ශාඎිවත්ගැර පොත් දෙකක් එකතුකර බැලූවිටද සුවසේ වැටහේමය-මේ පොත ශුඬකිරීම පිණිස පලාත් කීපයකින් පොත් කීපයක් සපයාගෙණ එකිනෙකට සමකර බැලීමෙන්ද පෙලේ ඇතම් තැන බුරුමාඎරයෙන් මුද්‍රිත පොතෙත්හා ටීකානුසාරයෙන්ද වැඩිකොටම සමන්තපාසාදිකානම් විනයඅටුවාවට සමකර බැලීමෙන්ද යථාශක්තීන් ශුඬකෙළෙමි.

අප විසින් සංස්කරණය කරණලද මෙහි කාලානුරූප ප්‍රයොජනවත් පරිද්ඡෙදන් පෙළ ඉලක්කම් පිළිවෙළට ඉහළින් යොදනලදි—මෙය අච්චුගස්වන්නන් විසින් පළමුවෙන් අපිරිසුදු අකුරුඇතිකත්තෝරුවක මුලපෝර්ම කීපයක් අච්චුගස්වනලදුව අපගේ චිත්තඛෙදයට කාරණවූ නුමුත් එයද පොතේ ප්‍රයොජනය සලකන්නන්ට බාධානැති එක එසේම සතුටකි—මෙහි අවසානයෙහි යොදනලද ශුඬිපත්‍රයට දුටුවිට හැඟියන දීඝීවියයුතු හ්‍රස්වයන්ද හ්‍රස්වවියයුතුදීඝීයන්ද පෙලේ ශුඬවත් සන්නයේ අශුඬ පදද බොහෝතැන්වල වැරදී තිබෙන මේ ( ) ' ලකුණුද නොනැඟ

බව දතයුතු-මෙය අච්චු ගහණ අතර අපාචාය්‍යී කළුතර අශොකාරාමාධිවාසි **සුමනතිස්ස ස්ථවිරයන්** වහන්සේගෙන්ද යථාවකාශවශයෙන් ආධාරලත්බැවි ගෞරවයෙන් මනස්කාරම්—මෙහි අපගේ ප්‍රමාදභ්‍රමාදීයෙන් ජනිතවූ යම් දොෂයක් ඇතහොත් නුවණැත්තන් විසින් මෙත් සිතින් යථාර්ථාවබොධය කොට පිරිසිදු කරණුලැබෙත්වා.

B. SUMEDHANKARA.

---

# පටුන.


| පිට. | | පිට. | |
|---|---|---|---|
| 2 | මාතිකා | 69 | සම්මානාසනිකො |
| 4 | චත්තාරොපාරාජිකා | 70 | අසංවාසිකො |
| 10 | නවගරුකා | 70 | කම්මං |
| 14 | චීවරං | 73 | මිච්ඡාජීවවිවජ්ජනා |
| 23 | රජනානි | 74 | වත්තං |
| 23 | පත්තා | 76 | විකප්පනා |
| 26 | ථාලකා | 79 | නිස්සයො |
| 27 | පවාරණා | 80 | කායබන්ධනං |
| 31 | කාලිකා | 83 | පථවි |
| 38 | පටිග්ගාහො | 87 | පරික්ඛාරො |
| 40 | මංසෙසු අකප්පියං | 91 | භෙසජ්ජං |
| 41 | නිස්සග්ගියානි | 93 | උග්ගහො |
| 44 | පාචිත්ති | 97 | දූසනං |
| 46 | සමණකප්පා | 102 | වස්සූපනායිකා |
| 50 | භූමියො | 106 | අවෙභඞ්ගියං |
| 53 | උපජ්ඣාචෙරවත්තානි | 110 | පකිණ්ණකං |
| 55 | වච්චපස්සාවට්ඨානියං | 130 | දෙසනා |
| 57 | ආපුච්ඡකරණං | 140 | ඡන්දදානාදි |
| 58 | නග්ගො | 143 | උපොසථො |
| 59 | නහානකප්පො | 153 | පවාරණා |
| 60 | අවන්දියා | 160 | සංවරො |
| 61 | චම්මං | 160 | සුද්ධි |
| 61 | උපාහනා | 161 | සන්තොසො |
| 63 | අනොලොකියං | 162 | චතුරාරක්ඛා |
| 64 | අඤ්ජනි | 164 | විපස්සනා |
| 65 | අකප්පියානිසයනානි | | |


---

# සන්නසගිත කුදුසික.

HENRY S. WIJESOORIYA
DODANGUWA

**නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.**

1 ආදිතො උපසම්පන්නෙනසික්ඛිතබ්බං සමාතිකං,
බුද්ධසික්ඛං පවක්ඛාමි වන්දිත්වා රතනත්තයං.

---

1 රතනත්තයං, (බුද්ධාදි) රත්නත්‍රය; වන්දිත්වා, (කායවාග්මනොමාරයෙන් සකස්කොට) වැඳ; ආදිතො, ආදියෙහි පටන්; උපසම්පන්නෙන, උපසපන්නුන් විසින්; සික්ඛිතබ්බං, (ග්‍රහණ ධාරණ ප්‍රතිපත්ති ආදි වශයෙන්) හික්මිය යුතුවූ; (නිරන්තරයෙන් පරිහරණය කටයුතු වූ) සමාතිකං, මාතෘකාපදසහිතවූ; බුද්ධසික්ඛං, (සංක්‍ෂෙපමධුර බහුවිධශික්‍ෂාවන් ප්‍රකාශකරණ හෙයින්) කුදුසිකනම්වූ ප්‍රකරණයක්; පවක්ඛාමි, ආදරයෙන් කියමි; නොහොත් අනෙකප්‍රකාරයෙන් හදාරමි.

(“පාරාජිකා ච චත්තාරො” යනාදි උදෙස් පදම විස්තරයට ජනිකාවන බැවින් විස්තරය ප්‍රශවකරණ බැවින් මාතිකානම් වේ.

“බුද්ධසික්ඛං” යත්නෙහි සික්ඛානම් ත්‍රිවිධශික්‍ෂාසි. කීසේමැනෙත්

“සික්ඛාති තිස්සො සික්ඛා අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා’ති, තත්‍ථ පඤ්චඞ්ගදසඞ්ගසීලං සීලමෙව, පාතිමොක්ඛසංවරසීලම්පන අධිසීලං, පාතිමොක්ඛසංවරතො’පි ච මග්ගඵලසම්පයුත්තමෙව සීලං අධිසීලං, කාමාවචරානි පන අට්ඨකුසලචිත්තානි ලොකියඅට්ඨසමාපත්තිචිත්තානි ච චිත්තමෙව, විපස්සනාපාදකඅට්ඨසමාපත්තිචිත්තං පන අධිචිත්තං, තතො’පි ච මග්ගඵලචිත්තමෙව අධිචිත්තං, අත්‍ථි දින්නං අත්‍ථි යිට්ඨන්ති ආදිනයප්පවත්තම්පන කම්මස්සකතාඤාණං පඤ්ඤා, තිලක්ඛණාකාරපරිච්ඡෙදකම්පන විපස්සනාඤාණං අධිපඤ්ඤා, තතො’පි ච මග්ගඵලපඤ්ඤා’ව අධිපඤ්ඤා, එතායෙව සික්ඛිතබ්බතො සික්ඛා’ති අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛාති වුච්චන්ති * යි.)

---

* මෙහි අර්ථ—ශික්‍ෂා යනු අධිශීලශික්‍ෂා අධිචිත්තශික්‍ෂා අධි

(තත්‍රායං මාතිකා)

2 පාරාජිකා ච චත්තාරො ගරුකා නව චීවරං,
රජනානි ච පත්තො ච ථාලකා ච පවාරණා.

3 කාලිකා ච පටිග්ගාහො මංසෙසු ච අකප්පියං,
නිස්සග්ගියානි පාචිත්ති සමණකප්පා ච *භූමියො.

4 උපජ්ඣාචෙරවත්තානි වච්චපස්සාවඨානියං,
ආපුච්ඡකරණං නග්ගො නහානකප්පො අවන්දියා.

---

2 පාරාජිකා ච චත්තාරො, සතරපාරාජිකාවෝද; (මෙහි අනුක්ත සමුච්චයාර්ථ "ච" ශබ්දයෙන් වක්ෂ්‍යමාන උබ්භජානුමණ්ඩලිකාදිප රජි සමුච්චිතයයි ගතයුතු) ගරුකානව, (විකුම්කෙණෙහි ඇවැද්ද යුතු) නවවැදෑරුම් සඟවෙසෙස්හුද; චීවරං, (කැපඅකැප) සිවුරුද; රජනානි ච, (කැප අකැප) රජන්ද; පත්තො ච, (කැප අකැප) පාත්‍රද; ථාලකා ච, (කැපඅකැප) තලුද; පවාරණා, (පිළිකෙව්) පවුරුණුද.

3 කාලිකාච, (සිව්†) කැල්ලෝද; පටිග්ගාහො, පිළිගැණුම්ද; මංසෙසු ච අකප්පියං, මාංසයෙහි අකැප මස්ද; නිස්සග්ගියානි, නිසගි (පචිති)ද; පාචිත්ති, (සුඛ) පචිතිද; සමණකප්පා ච, ශ්‍රමණ ව්‍යවහාරයෝද; භූමියො, (කැප) කිළිනුද.

4 උපජ්ඣාචෙරවත්තානි, උපාධ්‍යායවත් ආචාර්‍ය්‍යවත්ද; වච්චපස්සාවඨානියං, වච්චකුටි පස්සාවකුටියෙහි වත්ද; ආපුච්ඡකරණං, (මහලු

---

ප්‍රඥශික්ෂා යන ත්‍රිශික්ෂාවෝයි, ඔවුන් අතුරෙන් පඤ්චාඞ්ගශීල දශාඞ්ගශීල යනමොහු ශීලයමවෙයි; ප්‍රාතිමොක්ෂසංවරශීලය වූකලී අධිශීලය නම්වෙයි, ප්‍රාතිමොක්ෂසංවරශීලයෙහුදු, මාර්ගඵලසම්ප්‍රයුක්ත ශීලයම අධිශීලය නම්වෙයි; කාමාවචර අෂ්ට කුශලචිත්තයෝද, ලෞකික අෂ්ටසමාපත්තිචිත්තයෝද චිත්තයම වෙයි; විදර්ශනාපාදක අෂ්ටසමාපත්තිචිත්තය වනාහි අධිචිත්තය නම්වෙයි, ඉතුදු මාර්ගඵලචිත්තයම අධිචිත්තය නම්වෙයි, දුන්දෙය ඇත මහායාගය ඇත යන මේආදී ක්‍රමයෙන් පවත්නාවූ කර්මස්වකීයතාඥනය වනාහි ප්‍රඥනම්වෙයි, ත්‍රිලක්ෂණාකාරයෙන් පිරිසිඳුම කරණ විදර්ශනාඥනය වනාහි අධිප්‍රඥ නම්වෙයි ඉතුදු මාර්ගඵලප්‍රඥවම අධිප්‍රඥ නම්වෙයි, මොතොමෝම හික්මියයුතු හෙයින්, ශික්ෂාතුයි අධිශීලශික්ෂා, අධිචිත්තශික්ෂා, අධිප්‍රඥශික්ෂා, ය යි කියනුලැබෙත්.

* සමණකප්පභූමියො—බුරුමපොත්.

† සතර—ඇතම්.

5 චම්මං උපාහනා චෙව අනොලොකියමඤ්ජනී,
අකප්පියානි සයනානි* සමානාසනිකොපි ච.

6 අසංවාසිකො ච කම්මං මිච්ඡාජීවවිවජ්ජනා,
වත්තං විකප්පනා චෙව නිස්සයො කායබන්ධනං.

7 පඨවී ච පරික්ඛාරො භෙසජ්ජුග්ගහදූසනං,
වස්සූපනායිකා චෙවා'වෙභඞ්ගියපකිණ්ණකා.

8 දෙසනා ඡන්දදානාදි උපොසථපවාරණා,
සංවරො සුද්ධි සන්තොසො චතුරාරක්ඛා විපස්සනා'ති.

---

සඟුන්) පිළිවිස කිරීම්ද; නග්ගො, නග්නවද්ද; නහානකප්පො නහනවිදිද; අවන්දියා, (පකතත්තයා විසින්) නොවැන්ද යුත්තෝද.

5 චම්මං, (කැප අකැප) සම්ද; උපාහනාචෙව, (කැප අකැප) වහන්ද; අනොලොකියං, (මහණුන් විසින්) නොබැලියයුතුදෑද; අඤ්ජනී, (කැප අකැප) අඳුන් (නල)ද; අකප්පියානි සයනානි, (උපසපුන් මහණුන් විසින්) අකැප හොනා හිඳිනා දෑද; සමානාසනිකොපි ච, එකඅස්නෙහි හින්ද යුත්තෝද.

6 අසංවාසිකො ච, (එකකම්මාදි) සංවාසයට නොනිස්සෝද; කම්මං, (චතුර්විධ) කර්මද; මිච්ඡාජීවවිවජ්ජනා, ලාමකජීවිකාවගේ දුරුකිරීමද; වත්තං, (ආගන්තුකවත්තාදි) වත්ද; විකප්පනාචෙව, විකපුන්ද; නිස්සයො, නිස (ගැණුම) ද; කායබන්ධනං, (කැප අකැප පටිද.

7 පඨවීච, (කැප අකැප) පොළොව්ද; පරික්ඛාරො, (කැප අකැප) පිරිකරද; භෙසජ්ජ, බෙහෙත් (කිරීම් කරවීම් ආදිය)ද; උග්ගහ, අකැප වත් පිළිගැණුම්ද; දූසනං, (කුල) දූෂනද; වස්සූපනායිකාචෙව, වසේළඹීම්ද; අවෙභඞ්ගියා, (අවෙභඞ්ගි යයි කියනලද) ගරුභාණ්ඩද, පකිණ්ණකං (නොයෙක් පරිද්දෙන්) සාකීර්ණයද.

8 දෙසනා, ඇවැත් දෙසීමද; ඡන්දදානාදි, සැදපිරිසිදුපවුරුණු දීම්ද; උපොසථ, පොහෝද; පවාරණා, පවුරුණුද; සංවරො(ඉන්ද්‍රිය) සංවරද; සුද්ධි, දෙශනා ශුද්ධි අශුද්ධිද; සන්තොසො, ප්‍රත්‍යය සන්තොසද; චතුරාරක්ඛා, සිව්අරක්ද; විපස්සනාති, විදර්ශනාද (යනමෙනෙක්දෙන යථාක්‍රමයෙන් මෙහි කියනු ලැබෙත්.)

---

* අකප්පියසයනානි—බුරුමපොත්.

---

"පාරාජිකා ච චත්තාරො"ති.

9 මග්ගත්තයෙ අනික්ඛිත්තසික්ඛො සන්ථතා'සන්ථතෙ,
අලෙලොකාසෙ තිමිත්තං සං තිලමත්තම්පි සන්ථතං.

10 අසන්ථතමුපාදින්නං පවෙසෙන්තො චුතො'ථවා,
පවෙසනට්ඨිතුද්ධාරපවිට්ඨක්ඛණසාදකො.

---

මේ සත්ගයින් කී පණස්පදයෙහි ආදිය පටන් 'පවාරණ', යනු දක්වා පන්සාළිස් පදයකින් අධිශීලශික්ෂාව කීහ, 'සංවරො, යන්නෙහි පටන් 'චතුරාරක්ඛා' යනු දක්වා සතරපදයකින් අධිචිත්ත ශික්ෂාව කීහ, 'විපස්සනා, යන එක පදයෙන් අධිප්‍රඥාශික්ෂාව කීහයි දතයුතු.

---

"පාරාජිකා ච චත්තාරො"ති, පාරාජිකා ච චත්තාරො යන්නෙහි (සතර පාරාජිකාවෝ නම්.)

9. 10 අනික්ඛිත්තසික්ඛො, නොපස්විකණලද සික ඇති මහණ; සන්ථතාසන්ථතෙ, (චම්මිචොලතිපුපට්ටාදින්) වසනලද හෝ නොවසනලද හෝ; මග්ගත්තයෙ, (වච්චමග්ගාදි) තුන් මඟින් යම්කිසි මඟෙක්හි; අලෙලොකාසෙ,(එහිඳු පියවි සුලඟ නොපහර ණ) තෙත් පියෙස්හි; සන්ථතං, වසනලදහෝ; අසන්ථතං, නො වසනලදහෝ, උපාදින්නං, අනෂ්ටකායප්‍රසාද ඇති; සං (තිමිත්තං,) ස්වාඞ්ගජාතය (තමා නිමිත්;) තිලමත්තම්පි, තලඇටක් පමණකුදු; පවෙසෙන්තො, ප්‍රවේශකරන්නේ (සෙවුනාසිතින් මෙගෙයන්නේ;) චුතො,(ශාසනයෙන්)චුතවේ; අථවා, නොහොත්, (තමා නිමිත්හි මෙරමාගේ උපක්‍රමයක් ඇතිකල්හි) පවෙසන, ප්‍රවේශක්ෂණය, ඨිති, ස්ථිතික්ෂණය; උද්ධාර, උද්ධාරක්ෂණය; පවිට්ඨක්ඛණ, ප්‍රවිෂ්ටක්ෂණය; (යන මොවුන් අතුරෙන් යම්කිසි ක්ෂණයෙක්හි;) සාදකො, ඉවසන්නේද, හෙවත් සෙවුනා සිත් එලවන්නේද; (චුතො, එකෙනෙහිම ශාසනයෙන්) චුතවේ.

("මග්ගො'ති වච්චපස්සාවමුඛලාදීනං නික්ඛමණපථො" * "අගපටන් මුලදක්වා මෙහෙයීම ප්‍රවේශ නම්, සියලු මෙහෙයූසඳ පවිට්ඨ නම්, මෙහෙසූවා අදනාසඳ අතුරෙහි සිටිනාසඳද සුකුරු විසව සමයෙහි මාගමබත්‍යාමයෙන් බැරම සිටිනා සඳ ද ඨිති නම්, අගදක්වා අදිනාසඳ උද්ධරණ නම්" යනු විනය සන්නයි).

---

* මාගී යනු මල මූත්‍ර කෙල ආදින් නික්මෙන මාර්ගයයි

11 ආදියෙය්‍ය හරෙය්‍යා'වහරෙය්‍ය ඉරියාපථං,
කොපෙය්‍ය ඨානා චාවෙය්‍ය සංකෙතං වීතිනාමයෙ.

12 අදින්නං ථෙය්‍යචිත්තෙන භවෙ පාරාජිකො'ථවා,
ථෙය්‍යබලකුසච්ඡන්නපරිකප්පාවහාරකො,
භණ්ඩකාලග්ඝදෙසෙහි පරිභොගෙනෙත්ථ නිච්ඡයො.

13 මනුස්සවිග්ගහං ඡින්ද ජීවිතා වා වියොජයෙ,
සත්ථං වා අස්ස මරණචෙතනො උපනික්ඛිපෙ.

14 ගාහෙය්‍ය මරණූපායං වදෙය්‍ය මරණෙ ගුණං,
චුතො පයොගා සාහත්ථිනිස්සග්ගාණත්තිථාවරා.

15 ඉද්ධිවිජ්ජාමයා කාලවත්ථාවුධිරියාපථා,
ක්‍රියාවිසෙසො ඔකාසො ඡ ආණත්තිනියාමකා.

---

11. 12 අදින්නං, (ස්වාමීනු විසින් කයින් හෝ වචසින් හෝ) නුදුන් ආරාමාදි වස්තුව; ථෙය්‍යචිත්තෙන, සොරසිතින්; ආදියෙය්‍ය, (සවන් බැණ) ගණී නම්, හරෙය්‍ය, (ගෙණයම්නිසිට) ගණී නම්; අවහරෙය්‍ය, (තමා කෙරෙහි භාගා තුබූවා මම් නොගත්මි යනාදින් බොරුකියා) ගණීනම්; ඉරියාපථං කොපෙය්‍ය, (බඩුගෙණ යන්නාහුගේ පියවි) ඉරියව් කොවා (ගණී) නම්; ඨානා චාවෙය්‍ය; තුබූතැනින් පහකොට ගණී නම්; සංකෙතං වීතිනාමයෙ, ස්ථාන් වත් ගන්නා තැනහෝ තමාවිසින් පිරිකැප්ප තැන හෝ ඉක්මවා (ගණී) නම්; පාරාජිකො භවෙ, (කෙලෙස් සතුරන් විසින්) පරදවන ලද වන්නේසි; අථවා, නොහොත්; ථෙය්‍ය, (සන්ධිච්ඡෙදාදි විසින්) නොදක්නාසේ; බල, බලාත්කාරයෙන්; කුස, කුසපත් පෙරලීමෙන්; ඡන්න, (තෘණපර්ණාදින්) මුවහකිරීමෙන්, පරිකප්පා, (භාණ්ඩාවකාශ) පරිකල්පනාවෙන්, අවහාරකො, ගත්තේද; පාරාජිකොභවෙ, (කෙලෙස්සතුරන් විසින්) පරදවනලද වන්නේසි; භණ්ඩ, (සොරාගත්) වස්තුවය; කාල, (අවහාර) කාලය; අග්ඝ, (භාණ්ඩයෙහි) අගය; දෙසෙහි, (අවහාර) දෙශය යනමොවුන් විසින්ද; පරිභොගෙණ, (භාණ්ඩයෙහි ස්වාමි) පරිභොග විසින්ද; එත්ථ, මේ අදත්තාදානයෙහි; නිච්ඡයො, විනිශ්චය (කටයුතු.)

13. 14. 15 මරණචෙතනො, වධකචෙතනා ඇති මහණ; ඡින්ද, මොහු මරම් ප්‍රයොගකොට; මනුස්සවිග්ගහං, මිනිස්සතකු; ජීවි

16 ඣානාදිභෙදමසන්ත මනත්තූපණායිකං,
කත්වා කොට්ඨාසමෙකෙකං පච්චුප්පන්නාභවස්සිතං.

17 අඤ්ඤාපදෙසරහිතං දීපෙන්තො'නධිමානිකො,
කායෙන වාචා විඤ්ඤත්තිපථෙ ඤාතෙ චුතො භවෙ.

---

ත්වා වියොජයෙ, රූපාරූපජීවිතයෙන් වෙන්කෙරේනම්; සත්ථං වා,*(දිවිගෙණයන අසි ආදි) ශස්ත්‍රයක්හෝ; අස්ස උපනික්ඛිපෙ මියනුකැමැත්තහු සමීපයෙහි ගතහැකිසේ එලවාතබානම්; මරණූපායං, ("සත්ථං වා ආහර විසං වා ඛාද"†)යනාදීන් මරණට උපායහෝ; නාමහෙය්‍ය, උගන්වානම්; මරණෙ ගුණං, මරණෙහි අනුසස්හෝ; වදෙය්‍ය, ("ත්වං ඛොසි උපාසක කත කල්‍යාණො අකතපාපො මතං තෙ ජීවිතා සෙය්‍යො"‡යනාදීන්)කියානම්, චුතො, (ශාසනයෙන්) චුතවේ, සාහත්ථී, සවහස්ථ (යෙන් පැහැරීම)ය; නිස්සග්ගි, (ඉසු ආදීන්ගේ) නිස්සජනය; ආණත්ති, අණවීමය; ථාවරා, (ඔපාතඛණනාදිවූ) ථාවරය (යන මොහුද;) ඉද්ධිවිජ්ජාමයා, (කර්මවිපාකජවූ) ඍද්ධියගේ යෙදීමහා (මරණ මන්ත්‍රාදිය) විද්‍යාවගේ පරිජපනයද (යන මොහු සදෙන;) පයොගා, (වධ) ප්‍රයෝගයොයි; කාල, (පූර්වාණ්හාදි වශයෙන් යුක්ත) කාලය; වත්ථු,(මැරියයුතු) සත්වය, ආවුධ,(මරණ) ආයුධය; ඉරියාපථා, (මැරියයුත්තහුගේ ස්ථාන නිෂද්‍යාදි) ඉර්‍ය්‍යාපථය (යන මොහුද;) ක්‍රියා විසෙසො, (ඡෙදනභෙදනාදි) ක්‍රියාවිශෙෂයද; ඔකාසො, (ග්‍රාමවනාදි) අවකාශයද(යන;) ඡ, සදෙන; ආණත්ති නියාමකා, ආණාපණය නියම කරන්නාහුයි.

16· 17 අනධිමානිකො, (අදිට්ඨෙ දිට්ඨසඤ්ඤිතාදි විසින් අධිගත ධර්ම ඇත්තෙමි යන)අදිමන් නැති මහණ; අත්තනි, තමාසන්තෙහි; නොසන්තං, (මේ ඇත්බව නොඉපදවූ බැවින්) නැත්තාවූ; ඣානාදිභෙදං, ධ්‍යානාදි ධර්මවිශෙෂ ඇති උත්තරි මනුෂ්‍යධර්මය, කොට්ඨාසං, (ධ්‍යානවිමොක්ෂාදි) කොටසක් හෝ; එකෙකං, (ප්‍රථමධ්‍යානාදි) එකක් එකක්හෝ; අනත්තූපණායිකං කත්වා; තමාකෙරෙහි ඇතිවක්කොට; (තමාකරා එලවා) පච්චුප්පන්නාභවස්සිතං, වර්තමානාභවය ඇසුරුකොට, අඤ්ඤාපදෙසරහිතං, (යම් මහණෙක් තොපගේ වෙහෙර වෙසේද ඒ මහණ ප්‍රථමධ්‍යානාදි

---

* සත්ථහාරකංවා—පොත්.

† ආයුධයක් හෝ ගණුව විෂයක් හෝ අනුභව කරව.

‡ උපාසකය තොපි කළ කුසල් ඇත්තෙහිය නොකළ පව් ඇත්තෙනීය තොපගේ ජීවත්වීමටවඩා මරණය උතුම,

18 පාරාජිකෙ'තෙ චත්තාරො අසංවාසා යථා පුරෙ,
අභබ්බා භික්ඛුභාවාය සීසච්ඡින්නො'ව ජීවිතුං.

19 පරියායො ච ආණත්ති තතියෙ දුතියෙ පන,
ආණත්තියෙව සෙසෙසු ද්වයමෙතං නලබ්භති.

20 සෙවෙතුකාමතාචිත්තං මග්ගෙ මග්ගප්පවෙසනං,
ඉදමෙථුනධම්මස්ස ආහු අඞ්ගද්වයං බුධා.

---

ලද යනාදි) විතජකථාමිස; විකුණුනිපයෙ, ශ්‍රවණ්‍යාචාරවූ දෙ, ලොස් රියනින් ඇතුලත්හි (සිරි මිනිස්සතණ්හට;) කායෙන, (ගසනාමුළුදි) කායවිකාරය කින්හෝ; වාචාය, (ඔහු දන්නා යම්කිසි) බසකින්හෝ; දිපෙනෙනා, (ප්‍රථමධ්‍යානයට සමවදිමි යනාදි විසින්)පගශුකරන්නේ; සුදතෙ, (වචන සමනන්තරයෙහි මොහු ධ්‍යානයට සමවදිත්ල යන මෙපමණකුදු ඇසුවනු) දත්කෙණෙහිම, චුතොහවෙ, (ශාසනයෙන්) චුතවන්නේයි.

(අධිමාන නම් සුපරිශුඬ ශීලසම්පන්න පිහිටා සමාධිභාවක රූපාරූප සමාපත්ති පිහිටා පැවතුවහට්හෝ විදර්ශනානි යුක්තව සොපකෙලශොදයක් ව්‍යාසඞ්ගනලදුවහට්හෝ මේ ධර්ම මාවිසින් අධිගත යයි දූඩිව උපදනා මනි.

18 එතෙචත්තාරො පාරාජිකා, පරිවිදු අවත් මේ සතර දුගුලෝ; පුරෙයථා, තමන්ගෘහස්ථාපසම්පන්නකාලයෙහිමෙන්; අසංවාසා, (සිල්වත් භික්ෂූන්හා] එකව කරණ එකකම්මාදි) සංවාසයට නොහිස්සෝය; ජීවිතුං, (එමශරීර බන්ධනයෙන්) ජීවත්වනනාව (අභව්‍යවූ;) සීසච්ඡින්නොව, සිරච්ඡෙදනයට පැමිණි (පුරුෂ)යකුමෙන්; භික්ඛුභාවාය, භික්ඛුභාවය(නැවත උපසම්පන්නවීම)ටද; අභබ්බා, අයොග්‍යයෝයි.

19 පරියායොච, පරියාය(තෙපුල්)ද; ආණත්ති, (පරිජිකරණුවූ) ඇණවීමද; තතියෙ, තුන්වෙනි, මනුෂ්‍යවිග්‍රහපාරාජිකාවෙහි; (ලබ්භන්ති;) ලැබෙයි; දුතියෙපන, දෙවනඅදත්තාදාන පාරාජිකායෙහි වනාහි; ආණත්තියෙව, ආණත්තියම (ලැබෙයි;) සෙසෙසු, සෙසු (පළමුවන සතරවන) පාරාජිකාවන්කෙරෙහි; එතංද්වයං, (පර්‍යායය ආණත්තිය යන) මේදෙක; නලබ්භන්ති, නොලැබේ.

20 සෙවෙතුකාමතාචිත්තං,(මෛථුන්දම්)සෙවියටි සිතය; මග්ගෙ (තුන්මගින් එක්තරා) මගෙහි; මග්ගප්පවෙසනං, (තමා)නිමිත් මෙහෙයීමය යන; ඉමං අඞ්ගද්වයං, මේ දෙඅඟ; මෙථුනධම්මස්ස මෛථුන්දම් පාරාජිකාවට; බුධා, විනයධරයෝ; ආහු, කියත්.

21 මාතුස්සං තථා සඤ්ඤී ථෙය්‍යචිත්තඤ්ච වත්ථුනො,
ගරුතා අවහාරො ච අදින්නාදානහෙතුයො.

22 පාණො මානුසකො පාණසඤ්ඤිතා ඝාතචෙතනා,
පයොගො තෙන මරණං පඤ්චෙතෙ වධහෙතුයො.

23 අසන්තතා අත්තනි පාපමිච්ඡතා
යා'රොචනා තස්ස මනුස්සජාතිතා,
නා'ඤ්ඤපදෙසො ච තදෙව ජානනං
පඤ්චඞ්ග අඞ්ගානී අසන්තදීපනෙ.

24 අසාධාරණා ච චත්තාරො භික්ඛුනීනම්පාරාජිකා,
එකාදස ච විඛ්‍යාතා භික්ඛුනී මුදුපිට්ඨිකො.

("සෙවෙතුකාමතාය මෙථුනසෙවාතණ්හාය සම්පයුත්තචිත්තං සෙවෙතුකාමතාචිත්තං"*)

21 මාතුස්සං, මිනිස්සතන් අයත්බවද; තථාසඤ්ඤී, මිනිස්සතකු අයත් යන සංඥද; ථෙය්‍යචිත්තඤ්ච, සොරසිතද; වත්ථුනො ගරුතා, වස්තුනු පල් පොහොනාබවද; අවහාරොච, ගැම්මද (යන මොහු පස්දෙන;) අදින්නාදානහෙතුයො, අදත්තාදාන පාරාජිකාවට අඞ්ගයෝයි.

22 මානුසකොපාණො, මිනිස්සතක; පාණසඤ්ඤිතා, සතෙක යන් සංඥ ඇතිබවය; ඝාතචෙතනා, වධකචෙතනාය; පයොගො, (සාහත්ථිකාදි සපියොවින් එක්) පියෝවෙක; තෙනමරණං, ඒපියොවින් මරණය යන; එතෙපඤ්ච, මොහු පස්දෙන; වධහෙතුයො, මනුෂ්‍යවිග්‍රහපාරාජිකාවට අඞ්ගයෝයි.

23 අත්තනි, තමා සතන්හි; අසන්තතා, (උතුරුමිනිස්දම්) නැති බවද; පාප මිච්ඡතාය, (අසන්තසම්භාවනාය ප්‍රත්‍යය ප්‍රතිලාභ පැතිමය යන ලාමකවූ ඉච්ඡායෙන්; ආරොචනා, ඇරෙපීමද; තස්ස මනුස්සජාතිතා, (යමක්හට ඇරෙපීද) ඔහු මනුෂ්‍යජාතිබවද; නාඤ්ඤපදෙසො, පයඹාය කථාමුකනබවද; තදෙවජානනං, (සහසා උත්පන්නයෙහි) එසඳුන්මද යන; පඤ්ච, පස්දෙන; එත්අසන්තදීපනෙ, මේ උත්තරිමනුෂ්‍යධර්මාරොචනපාරාජිකායෙහි; අඞ්ගානි, අඞ්ගයෝයි.

24. 25. 26. භික්ඛුනීනං, භික්ෂුනීන්ගේ; අසාධාරණාචචත්තාරො, භික්ෂූන්හා සාධාරණනොවූ උබ්භජානුමණ්ඩලිකාය, වජ්ජපටිච්ඡාදිකාය,

* සෙවනයට කැමතිබැව් සංඛ්‍යාත මෛථුනොපභොගතෘෂ්ණාවෙන් සම්ප්‍රයුක්තසිත සෙවෙතුකාමතාචිත්තය (වෙ)යි.

25 ලම්බීමුඛෙනගණ්හන්තො අඞ්ගජාතංපරස්සච
තත්ථේ'වා'භි නිසීදන්තො චත්තාරෝඅනුලොමිකා
26 මග්ගෙනමග්ගපවෙසනා මෙථුනස්සාධිගතා
චත්තාරෝ'ති චතුබ්බීස සමොධානාපාරාජිකා'ති.

---

උක්ඛිත්තානුවත්තිකාය අටඅටවත්ථුකායයන) සතර පාරාජිකාවෝද, අභබ්බකා (මේජනාවයෙහි මහණවීමට) නොනිසිවූ, එකාදසච, (පණ්ඩකාදී) එකොළොස්දෙනාද; විබ්භන්තා භික්ඛුනි, ගිහිවූමෙහෙණද, මග්ගෙනමග්ගපවෙසනා, (රාගවසයෙන් සදෘශවූදෙදෙනාගේ වයංවයසමාපත්තියක් නැතද) මාර්ගයෙහි මාර්ගප්‍රවේශකිරීමෙන්; මෙථුනස්ස, මෛථුනධර්ම පාරාජිකාවට; අනුලොමිකා, අනුලොමවූ; මුදුපිට්ඨිකො, (හෙඹා) මොලොක්කළ පිටුඇත්තේය; ලම්බී, දික්වූඅඞ්ගජාතඇත්තේය; පරස්සඅඞ්ගජාතං, මෙරමාගේ නිමිත්තය; මුඛෙනගණ්හන්තො, (තමා) මුඛයෙන්ගන්නේය, තත්ථෙව, මෙරමානිමිත්තහිම; අභිනිසීදන්තො, තමාවස්මගින් ප්‍රවේශවනසේ හිඳින්නේය (යන) චත්තාරො, සතරදෙනාද; ඉධාගතා, මෙ (ඛුද්දසික්ඛා යෙ)හි (ස්වරූපයෙන්) ආවාවූ; චත්තාරෝති, සතරදෙනාදැයි; පාරාජිකා, පාරාජිකාවෝ; සමොධානා, රැස්ගෙහීන් හෙවත් එක්කොට ගිණීමෙන්; චතුබ්බීස, සූවිස්සෙකි.

පණ්ඩකො ථෙය්‍යසංවාසකො තිත්ථිය පක්ඛන්තකො තිරච්ඡාන ගතො මාතුඝාතකො පිතුඝාතකො අරහන්තඝාතකො භික්ඛුනි දූසකො සඞ්ඝභෙදකො ලොහිතුප්පාදකො උභතොබ්‍යඤ්ජනකො 'ති ඉමෙඑකාදසඅභබ්බපුග්ගලානාම *

පණ්ඩකොච තිරච්ඡානො උභතොබ්‍යඤ්ජනො 'පිච
තයොවත්ථු'විපන්නාහි අහෙතුපටිසන්ධිකා

භික්ඛුභාවො'ච, සතිඑත්ථා'නිවත්ථු භික්ඛුභාවංගන්තාසාපාන පබ්බජ්ජඛඬකාගත සබ්බදෙසව්රහිතගුණ සම්පත්තිවිපුත්තං විපන්නං
පණ්ඩක භාවංදීයොනෙන සෙසතොභවත්ථුවිපන්නා
පඤ්චානන්තරිකාථෙය්‍ය සංවාසොපිචදූසකො
තිත්ථිය පක්ඛන්තකොචෙ'තික්‍රියා නවිපන්නකෙ

---

* පණ්ඩකය. ථෙය්‍යසංවාසකය. තිර්ථ්‍යපක්ෂාන්තකය. තිරශ්චාන ගතය. මාතෘඝාතකය. පිතෘඝාතකය. අර්හත්ඝාතකය. භික්ෂු නිදූෂකය, සඞ්ඝභෙදකය. ලොහිතොත්පාදකය. උභතොබ්‍යඤ්ජනකය. යනමේ එකළොස්දෙන අභව්‍යපුද්ගලයෝනම්(වත්නාහ)

### ගරුකා නවා 'ති.

27 මොචෙතුකාමතා සුක්කස්සූපක්කම්ම විමොචයං.
අඤ්ඤත්‍ර සුපිනන්තෙන සමණො ගරුකම්ඵුසෙ
28 ඉත්ථිසඤ්ඤී මනුස්සිත්ථිං කායසංසග්ගරාගවා
සම්ඵුසන්තො උපක්කම්ම සමණො ගරුකම්ඵුසෙ

---

පක්ඛපණ්ඩක මිකාසිතතා චතුපෝපන පුයකො
නපුංසකෙන උපක්කම'තෙ පණ්ඩකා පරිදීපිතා.
තෙසුආසිතත පුයානං පබ්බජ්ජා න නිවාරිතා
ඉතරෙසන්තු තිණ්ණ'මපි පණ්ඩකානං නිවාරිතා.*

ගරුකානවාති, ගරුකානවයන්නෙනි ගරුකාපත්තිනු නව දෙන නම්:

27 මොචෙතුකාමතාය, ශුක්‍රය මිදියට් බැවින් හෙවත් මොචන ස්වාදයෙන්; උපක්කම්ම,(හස්තාදියම් කිසිවකින් තමානිමිත්ති) උපක්‍රමකොට, සුක්කස්ස, ශුක්‍රය, විමොචයං, මුදන (තුබුසිනතැනින් ගලවන) සමණො, මහණ; අඤ්ඤත්‍රසුපිනන්තෙන, (තපිනිද්‍රාවස්ථා වෙනි වන) ස්වප්නයෙහි ශුක්‍රමොචනය විනා; ගරුකං, සඟවෙශෙස් ; ඵුසෙ, අවදනේයි; මොචෙතු කාමතාය, යි තිබ්බිමනා තන්හි මොචෙතු කාමතා, යි ඡන්දස් පිණිස යකාර ලොපයෙන් ගාථා යෙහි දක්වන ලදි.

28 කායසංසග්ගරාගවා, (හස්තග්‍රහණාදි)කායසංසර්ගයෙහි රාග ඇති; සමණො, මහණ; ඉත්ථිසඤ්ඤී, ස්ත්‍රීස්වාගමක(යන) සංඥ ඇති සාව; උපක්කම්ම, කායින්ප්‍රයෝගකොට; මනුස්සිත්ථිං, (සදනුජාතවූද නොමළ) මිනිස්ස්ත්‍රීයක්, සම්ඵුසන්තො,(සවන් පිරිසෙයින් ලොමයෙහුදු) ස්පර්ශකරන්නේ ; ගරුකම්ඵුසෙ, සඟවෙශෙස් අවදනේයි,
සා සසත රයෙන් මලමානම සි රුරු ප්‍රසතුවනට තුලැයිවේ

---

* පණ්ඩකාය තියතීක්‍ෂානය උභතොබ්‍යඤ්ජනකය යන තුන්දෙ නද විසතුම්පයානායෝදයන මොචිනු අහෙතු ප්‍රතිසන්ධි ඇත්තෝයි ~ මෙයින්ක්‍ෂුභාවය ඇතිකල්හිම විසතුනුයිපණ්ඩකභාවාදියොත යුක්තා වසතුසංවසන භික්‍ෂුභාවානී ප්‍රව්‍රජ්‍යාසකාබකායයපසම්පදෙන චිරජින ඒතුණ සැපතින් පිටුකතය වෙත්වීම යමෙකුට ඇත්නම් ඔ විනු විසතුම්පතනානෝයි ~ පක්‍ෂචානාපාතරීය කලෝද ටෙයසංවා සකයාද තිස්‍රුනිද්‍රතා යාද අවමැනිකොට ඇති නිත්‍ය පක්කපන කයාද යන මොචිනු ක්‍රියානාඞයෝ නම්වෙති ~ පක්‍ෂ ඖපක්‍රමික ආසික්ත යන තුන්දෙනද සතරවැනි උසුයකයාද නපුංසකයාද හා මේ පස්දෙන පණ්ඩකයෝයි දක්වනලද්දුහ ~ ඒපස්දෙන අතුරෙන් ආසික්තොපුංදෙදෙනාගේ ප්‍රව්‍රජ්‍යාව නොවළක්වන ලද්දිය අනික් ත්‍රිවිධපණ්ඩකයන්ගේම ප්‍රව්‍රජ්‍යාතොගෙමෝ වළක්වන ලද්දීය.

29 තථාසුණන්තිංවිඤ්ඤුඤ්ච මග්ගංවා'රබ්භමෙථුනං
දුට්ඨුල්ලවාචාරාගෙන ඔභාසෙන්තොගරුංඵුසෙ
30 වත්වා'ත්තකාමු'පට්ඨාන වණ්ණංමෙථුනරාගිනො
වාචාමෙථුනයුත්තෙන ගරුංමෙථුනයාචනෙ
31 පටිග්ගහෙත්වාසන්දෙසං ඉත්ථියාපුරිසස්සවා
වීමංසිත්වාහරම්පච්ඡා සමණොගරුකංඵුසෙ
32 සඤ්ඤාචිතපරික්ඛාරං කත්වාදෙසිතවත්ථුකං
කුටිංපමාණාතික්කන්තං අසඤ්ඤදෙසංගරුංඵුසෙ

---

29 තථා, එසේම; (මිනිස්මානමක ගන සංඥාඇතිව) සුණන්තිං,(ඒ අදහස්පටහෙනිසිට) අසන්නාවූ; විඤ්ඤුඤ්ච, (හොඳනරක දන්නා) දන්නාවූ; (මිනිස්මාගමකට) මග්ගංවා, වර්ච්චමාර්ගයත් , මෙථුනං, මෙවුන්දම්හෝ;ආරබ්භ,අරබයා; දුට්ඨුල්ලවාචාරාගෙන, දුරුකාම වචනයෙහි ආස්වාදයෙන්; ඔභාසෙන්තො, "තවවච්චමග්ගො.වපස්සාවමග්ගොවසුනොසුසණ්ඨානො"* (යනාදී අනෙකප්‍රකාර අසද්ධර්ම නෙපුල්) බැණ; ගරුංඵුසෙ, සඝාදිසෙස්අවදනේයි.
30 අත්තකාමුපට්ඨාන, තමහටමෙවුන්දම්න් මෙහෙකිරීමෙහි; වණ්ණං, ගුණ;(අනුසස්)වත්වා, ("එතදග්ගංභගිනිපාරිචරියානං යාමාදිසං සීලවන්තං† යනාදීන්") කියා; මෙථුනයුත්තෙනවාචා, ("අරහසි තවංමයහංමෙථුනධම්මදෙහි.(T) යනාදී") මෛථුනධර්ම ප්‍රතිසංයුක්ත වචනයෙන්; මෙථුනයාචනෙ, මෙවුන්දම්අයැදීමෙහි; මෙථුනරාගිනො,මෙවුන්දම්රාගඇතිභික්ෂුහට; ගරුං, (සඝාදි) සඝාදිසෙස්වේ.
31 ඉත්ථියා, ස්ත්‍රියගේහෝ; පුරිසස්සවා, පුරුෂයාගේහෝ; සන්දෙසං (කෙලෙස්පිළිබැඳි)හසුන;පටිග්ගහෙත්වා(කායින්හෝවචසින්හෝ) පිළිගෙණ; වීමංසිත්වා, විමසාහෙවත් හසුන්කියනු ස්ත්‍රීපුරුෂයන්ට ඇරෙජ; පච්ඡාහරං, නැවතගෙණහැර ඇරෙජන්නාවූ ; සමණො, මහණ , ගරුකංඵුසෙ, සඝාදිසෙස්අවදනේයි.
32 සඤ්ඤාචිතපරික්ඛාරං, තමාවිසින් ඉල්වනලද; (වැපොරෝඇ) උපකරණඇති , අදෙසිතවත්ථුකං, නොදෙසනලදකුටිවස්තුඇති,

---

* තිගේ වච්චමග්ගද පස්සාවමග්ගද යහ දෙක යහපත්ය යහපත් සටහන් ඇත්තේය

† නැගනියනි සෙවනය කරන්නියන් අතුරෙන් යම් තැනැත්තියක් මාවැනි සීලවන්තයෙකු සෙවනය කරන්නීනම් ඇගේ ඒ මේ සෙවනය උතුම.

T තීමට මෛථුන ධර්ම දෙනායව සුදුස්සිය

33 මහල්ලකංවිහාරංවා කාරාපෙදෙසිතවත්ථුකං
අත්තනොවසනත්ථාය සමණොගරුකම්මුසෙ
34 අමූලකෙනචොදෙන්තො චොදාපෙන්තොව වත්ථුනා
අනන්තිමෙනවචාවෙතුං සුණමානොගරුකම්මුසෙ
35 අඤ්ඤස්සකිරියංදිස්වා තෙනලෙසෙනචොදයං
වත්ථුනාඅනන්තිමෙනා'ඤ්ඤං චාවෙතුංගරුකම්මුසෙ

---

පමාණාතික්කන්තං, (දිගටපුළුලටවඩුළු) ප්‍රමාණඉක්මූ ගාවූ ; අභාගදෙසං, ආපත්තාදෙශඇති, (තමා වසනු සඳහා) කුටිං, (උල්ලිත්තාවලිත්තාදි) කුටිය, කාරා, කොට ; ගරුම්මුසෙ, සඟාදිසෙස් අවිඳනේයි.

බිම්පටන් බිත්තිසෙවෙනි වනා මැටියෙන්හෝ සුණුයෙන්හෝ ඇඳුරකාවිලු ආලොකාව කාශග්‍ර ඇතුලතින් ලිප්තබැවින් උල්ලිප්තනම් මෙසේම බහිලිප්ත බැවින් අවලිප්තනම් ඇතුළතින් පිටතින් ලිප්තබැවින් උල්ලිප්තාවලිප්තනම්.

33 අදෙසිතවත්ථුකං, නොදෙසනලද විහාරවස්තුඇති ; මහල්ලකං, (කාරවාදෙන සවාමින්ඇති හෙයිනුදුප්‍රමාණාතික්‍රාන්තකොට කටගැකිහුදු) මහත්වූ ; විහාරං, (උල්ලිත්තාවලිත්තාදි) විහාරයද, අත්තනොවසනත්ථාය, තමාවසනු සඳහා ; කාරා, කොට ; සමණො, මහණ, ගරුකම්මුසෙ, සඟාදිසෙස් අවිඳනේයි.

34 අමූලකෙන, (දෘෂ්ටශ්‍රැතපරිශංකාසංඛ්‍යාත) මූල්නැත්තාවූ ; අනන්තිමෙනවත්ථුනා, (භික්ෂුභාවඅනුරූපවූ එකුන්විසි පරිජ අනුරෙන් එක්තරා) පරිජවිතෙකින් ; සුණමානා, (විශුද්ධිපාර්ශයෙහිසිටි) අසන්නාවූ භික්ෂුනු ; චාවෙතුං, (ශාසනයෙන්) චුතකරණ පිණිස ; චොදෙන්තො, "පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි අස්සමණොසි*" යනාදින් චොදනාකරන්නේහෝ ; චොදාපෙන්තොවා, (සවමිෂයෙහිසිට අනිකාකුලවා) වෙ දනාකාරවන්නේහෝ (මහණ) ගරුකම්මුසෙ සඟාදිසෙස් අවිඳනේයි.

"පබ්බජ්ජාය පාතිමොක්ඛසංවරසීලස්ස වා අන්තො විනාසෙ භවං අනන්තිමං පාරාජිකාපත්ති සඞ්ඛාත විනාසකාරණත්ථා වත්ථුං තෙන අනන්තිමෙන වත්ථුනා"†

35 අඤ්ඤස්ස, (ක්ෂත්‍රියාදි) අනිකෙකුගේ ; කිරියං, (මෛථුනසෙවාදි) ක්‍රියාවක් ; දිස්වා, දැක ; තෙනලෙසෙන, ඒ (ජාත්‍යාදි) ලෙසයෙන්,

---

* පැරැදි දහමට පැමිනියෙහි නොමහණෙහි

† ප්‍රව්‍රජ්‍යාවගේ හෝ ප්‍රාතිමොක්ෂ සංවර ශීලයාගේ හෝ අන්තයෙහි විනාශයෙහි වූයේ "අන්තිම" නම්. පැරදි ඇවතයි විනාශ කිරීම් අංග කොට ඇත්තී එයම (වත්ථු) නම්. ඒඅන්තිම වස්තුවෙන්.

36 ඡාදෙති ජානමා'පන්නං පරිවසෙය්‍ය තාවතා
චරෙය්‍ය සඞ්ඝෙ මානත්තං පරිවුත්ථො ඡරත්තියො
චිණ්ණමානත්තම'බ්භෙය්‍ය සඞ්ඝො වීසතිගණො
37 ආපත්තිනුක්ඛිත්තමනන්තරාය
පහුත්තතායො තථාසඤ්ඤිතා ච
ඡාදෙතුකාමො අථ ඡාදනාති
ඡන්නා දසඞ්ගෙහ්‍ය'රුණුග්ගමම්හී'ති

---

විවරණයි.

---

අඤ්ඤං, (ක්ෂත්‍රියාදි) අනික්මහණෙකු; චාවෙතුං, (ශාසනයෙන්) චුතකරණු පිණිස; අනන්තිමෙනවත්ථුනා, පාරාජිකවතෙකින්; චොදෑං, ("ඛත්තියොමයාදිට්ඨො පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි ත්වං ඛත්තියො පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි" යනාදීන්) චොදනාකරණ කරවන) මහණ; ගරුකම්වූසෙ, සඞ්ඝාදිසෙස් අවදනේයි.

36 ආපන්නං, ආපන් සඞ්ඝාදිසෙස්ඇවැත්; ජානං (ඇවැත් ඒ සිත්හෝ වත් වියන්හෝ දැනදැන නොයෙක් ඒ සිත්හෝ) දැන, ය ච, යම්තාක් (දවස්) ඡාදෙති, සඟවාද ; තාවතා, ඒතාක්; (දවස්) පරිවාසො (වසිතබ්බො) පිරිවස් වසිය යුත්තේය, පරිවුත්ථො, පිරිස් වුසූ (මහණ) ඡරත්තියො, සරියක්; සඞ්ඝෙ, සඞ්ඝයා කෙරෙහි; මානත්තං, මානත්; චරෙය්‍ය, පුරන්නේය; චිණ්ණමානත්තං, පුරණමානත් ඇති; තං, ඒ භික්ෂූහු; වීසතිගණො සඞ්ඝො, විංශතිවර්ග සඞ්ඝ තෙමේ; අබ්භෙය්‍ය, අබ්භාන (කම්ම වසයෙන් ඇතුලත්) කරන්නේයි.

37 ආපත්ති, (සඞ්ඝාදිසෙස්) ඇවැත්බවය; අනුක්ඛිත්තං, උක්ඛෙපනී කම් නොලදබවය; අනන්තරාය (ගමනබාධකවූ රාජචොරාදි) අන්තරායක් නැතිබවය, පහුත්තතායො, (සබ්‍රම්සරුන් කරාගන්නට ඇරෙජන්නට) පොහොසත් බවය (යන සතරදෙනද) තථාසඤ්ඤිතා ච (සඞ්ඝාදිසෙසෙක උක්ඛෙපනී කම් නොලදුයෙමි අන්තරාය නැතියෙමි පොහොසත්මි යනාතර) සංඥා ඇතිබවද, ඡාදෙතුකාමො, සඟවනුකැමතිබවද; අථ, නැවත; ඡාදනාති, නොකීමද යන, දසඞ්ගෙහි (මෙ) දසඟින්; අරුණුග්ගමම්හි, අරුණු නැගි සඳ; ඡන්නා (ඇවැත්) සඟවනලදවේ:

---

චීවරභාජී, චීවරං යන්නෙහි කැප අකැප සිවුරු නම්.

38 ඛොම කොසෙය්‍ය කප්පාස සාණභඞ්ගානි කම්බලං.
කප්පියානි ඡ'ළෙතානි සානුලොමානි ජාතිතො.
39 දුකූලඤ්චෙ'ව පත්තුණ්ණ පට්ටං සොමාර චීනජං.
ඉද්ධිජං දෙව දින්නඤ්ච තස්ස තස්සා'නුලොමකං.

---

38 ඛොම. කොමු පිළිය; කොසෙය්‍ය, තිසිරි පිළිය; කප්පාස, කපු පිළිය, සාණ, සණ වැහැරි පිළිය; භඞ්ගානි මුසුපිළිය; කම්බලං, පලස ; (යන) එතානි ඡ, මොහු සදෙන ; සානුලොමානි, අනුලොම් (සිවුරු) සහිතවූවාහු; ජාතිතො, ජාතිභෙදයින්; කප්පියානි, කැපයෝයි:
"ඛොම" යනු ශණකනම් ඒ සෙ වැහැරෙන් වී සිවුරුද කායසියෙ හී කාරණෝපචාරබ්‍යවහාර විසින් 'ඛොම' නම්වෙයි : "කොස" නම් තිසිරි පකා යන කෘමි කොෂය මිහිඟුහින්කල සිවුරු "කොසෙ නිබ්බත්තංකො සෙය්‍යං" යන තද්ධිතබ්‍යවහාර විසින් උක්තයි. කප්පාස. නම් කපුහුයින් වීපිළිය "සාණ,,නම් සණ වැහැරෙන් කල සිවුරුය යන මේදෙක්හි දු ඛොම යෙහි කී නමයි "භඞ්ග' නම් ඛොමාදී පස්මුසුකොට වී සිවුරුය ගේ කරණ ප්‍රකාර විසින් ලද නම් ශංසක නාමයෙන්ම මේ පක්ෂයෙහි ඛොමසේම ගත යුතු "කම්බලං" යනු මිනිස්ලොම් වල්ලොම් විනා සෙසු ලොමින් වියන කල කම්බලනම්.
"භඞ්ගන්නාම පඤ්චහි සුත්තෙහි මිස්සෙත්වා කතං වාකමයමෙ වා'ති,පි වදන්ති" † යනු අටුවායි.
39 දුකූලඤ්චෙව, දුහුල් පිළිද ; පත්තුණ්ණපට්ටං, පත්තුණ්ණ (දෙශයෙහිවූ) පටද, සොමාරචීනජං,සොමාර (දෙශ) චීන (දේශයෙහි උපන්) පටද ; ඉද්ධිජං,(එහිභික්ෂු න්ට)මෙ සෘද්ධිවසයෙන් නිර්මිතසිවුරුද ; දෙවදින්නඤ්ච.(අනුරුත්මහතෙරුන්ට දෙවඟණන්සේ) දෙවියන් දුන්සිවුරුද ; තස්සතස්සානුලොමකං,(ඛොමාදිවූ) ඒ ඒ සිවුරට අනුලොම් සිවුරුයි.
පත්තුණ්ණය. සොමාරය. චීනජය. යනු ඒ ඒ පිළි උපන් දෙශයෙන් ලදනම්.
සාණස්ස දුකූලං හි ඉද්ධිජං දෙවදින්නකං
ඛොමාදීනං සිට්ඨනනු කොසෙය්‍යස්සානුලොමිකං(ෘ)

---

† භඞ්ග නම් පස්හුයින් මිශ්‍රකොට කරණලද්ද හෝ වැහැරි හුවාම කරණලද්ද හෝ කියත්තුයි.
ෘ කොමු පිළි ආදීන්ට දුකුල ඉද්ධිජ දෙවදින්න යන මොහුද සන පිළියට හා තිසිරි පිළියට අවශෙෂයන්ද අනුලොම් කොට ඇත් තේයි.

40 තිචීවරං පරික්ඛාර චොළං වස්සික සාටිකං
අධිට්ඨෙ න විකප්පෙය්‍ය මුඛපුඤ්ඡනිසීදනං.
41 පච්චත්ථරණකං කණ්ඩු පටිච්ඡාදිමෙ'ත්ථ තිචීවරං
න වසෙය්‍ය විනෙ'කාහං චාතුමාසං නිසීදනං.

---

40, 41. තිචීවරං, (සඞ්ඝාටිය උත්තරාසඞ්ගය අන්තරවාසකය යන) තුන්සිවුරැද; පරික්ඛාරචොළං, පිරිකර චොළයද; වස්සිකසාටිකං, වැසිසළුසිවුරද ; මුඛපුඤ්ඡනං , මුවපිස්නා සිවුරද; නිසීදනං, නිසදුන් සිවුරද; පච්චත්ථරණකං, පසතරණ සිවුරද ; කණ්ඩු (පටි) ච්ඡාදිං, කස්පිළියන් සිවුරැද (යන මේනව සිවුරු) අධිට්ඨෙ, (''ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි'' යනාදි වක්ෂ්‍යමාන ක්‍රමයෙන් නම් ගෙණ ඉටත්තේය;) න විකප්පෙය්‍ය, ''ඉමං සඞ්ඝාටිං විකප්පෙමි'' යන දීන් ඒ ඒ සිවුරෙන් නම් ගෙණ) නොවිකපත්තේයි; එත්ථ, මේ නවසිවුරු අතුරෙහි; තිචීවරං විනා (සඞ්ඝාටි ආදි නමින් ඉටූ) තුන්සිවුරෙන් වියෝව; (අත්පසින්දුරුව) එකාහං, එකදවසකුදු; න වසෙය්‍ය, නොවසන්නේය; නිසීදනං විනා, නිසීදන (නාමයෙන් ඉටූ නිසදුන්) සිවුරෙන් වියෝව; චාතුමාසං, සාරමසක් ; (නවසෙය්‍ය) නොවසන්නේයි.

''ඉමං සඞ්ඝාටිං විකප්පෙමි'' යනාදින් ඒ ඒ නම් ගෙණ විකප්පූව හොත් (නොවිකැප්පූවාවේ. අධිෂ්ඨාන සිවුරැ තන්හි සිටියතු විනයසන් නායි— ''තිණ්ණං චීවරානං සමාහාරො තිචීවරං පමාණෙන පන'' සඞ්ඝාටිආදිනමින් ඉටූ තුන්සිවුරටම නම්බැවින් එමකියත් මිස සංඛ්‍යාවසයෙන් යන්නම් තුන්සිවුරක් නොකියයුතු-''පරික්ඛාරචොළං, යනු සඞ්ඝාටිආදි විශිෂ්ටනාමයෙන් නොඉටූ පශ්චිම චීවරාවසාන කළනොකළ යම් සිවුරකට වූ සංඥායි-''වස්සික සාටිකා''යනු වැසි සාරමස හැඳ නහන්නට අනුදත් සිවුරට නාමි— ''මුඛ සන්දමාන ලාලං පුඤ්ඡති එතෙනාති මුඛපුඤ්ඡනං'' යනු කෙළින් සිලියෙන කෙළ ඇත්තවුන් මුව පිස්නා සඳහා අනුඥාත චීවර විශෙෂයකට නාමි— ''නිසීදන්ති එත්ථා ති නිසීදනං'' යනු සඟුන් අතුට හිඳිනට අනුදත් සිවුරකට නාමි— ''පච්චත්ථරණකං'' යනු සඟ සතු හැඳ පුටු වෙහි වෙරපැහැරීමෙන් අවදනා ඇවතින් මුදනු සඳහා අනුඥාත චීවර විශෙෂයකට නාමි— ''කණ්ඩුම්පටිච්ඡාදයති ති කණ්ඩුපටිච්ඡාදි'' යනු කණ්ඩුයාදිරොගඇති සඟුන් සඳහා අනුදත් සිවුරකට නම් යනු වනවිනිස සත්නායි— සමුද්‍ර ඝාෂයෙ එකදෙශයකුදු සමුද්‍රනම් වන්නාසේ ඉටූ තුන් සිවුරෙන් එකකුදු ති චීවර නාමිවේ—

42 ඉමං සඞ්ඝාටිං’ධිට්ඨාමි ‘සඞ්ඝාටිං’මිච්ච’ධිට්ඨයෙ
අහත්ථපාසමෙ’තන්ති සෙසෙසු’පි අයං නයො.
43 අධිට්ඨහනෙන සඞ්ඝාටි පපඟුතිම්පුබ්බ චීවරං
පච්චුද්ධරිත්වා’ධිට්ඨෙය්‍ය පත්තාධිට්ඨහනෙ තථා.
44 එතං ඉමං’ච සඞ්ඝාටිං සංඝෙ පච්චුද්ධරාමි’ති
එවං සබ්බානි නාමෙන වත්වා පච්චු’ද්ධරෙ විදූ.

---

එකාහම්පි විනා භික්ඛු නවසෙය්‍ය තිචීවරං
න වසෙය්‍ය තථාධිට්ඨා චාතුමාසංනිසීදනං †

යන්නු විනවිනිසඩ්ඩ: අධිට්ඨායචලක්ඛීයමානං නිසීදනං තථාවිනා චාතුමාසංනවසෙය්‍ය 6 යි යොදනු.

**42.** සඞ්ඝාටිං, (අත්පස තිබූ රදා කප්බිඳු එබූ) සඟල සිවුර;“ඉමං ඞ්ඝාටිං අධිට්ඨාමි ,ති ‘ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි, යි අධිට්ඨයෙ,ඉටාන්නේ ය; අහත්ථපාසං, (දෙරියන් වියත්) අත්පසින් දුරුවනුබූ සඞ්ඝාටිය; එතන්ති තුබූ තැන් සලකා ; එතං, සඞ්ඝාටිං අධිට්ඨාමි යි ඉටන් නේය සෙසෙසු පි,(උත්තරාසඞ්ග අන්තරවාස කාදි) සෙසු සිවුරෙහි දූ; අයනනයො , මෙමනයයි; “තිචීවරං අධිට්ඨ හතොනාරක්ඛිත්වා කප්පබින්දු දත්වා පමාණයුත්තමෙව අධිට්ඨාතබ්බං,,7(යනු අටුවායි)

**43.** අධිට්ඨහනෙනා, (අයලින් උපන් සිවුරු) ඉටන මහණ; සඞ්ඝාටි පපඟුතිං, සඟල ආදිවූ; පුබ්බචීවරං (ඉටා වැළඳ ගත්) පරණ සිවුරු; පච්චුද්ධරිත්වා, පලමු කොට පසුදුරම,අධිට්ඨෙය්‍ය,පසුව ඉටන්නේයි; පත්තාධිට්ඨහනෙ, පාත්‍ර ඉටී මෙහිදූ; තථා, (දෙපාත්‍ර යක් එකවිට නොවටනා බැවින් අධිට්ඨාන ක්‍රම) එසේමැයි.

තිචීවර වස්සිකසාටිකා, නිසීදන කණ්ඩුපටිච්ඡාදි, යනමේ සහිවුරෙහි එකෙකි සිවුරෙහි එකක් එකක්ම ඉටා වැළඳ ගැණුත් මුත් දෙකක් දෙකක් ඉටා වැලදනැම්ම නොලැබෙන බැවින් එබඳු අනික් අනික් සිවුරක් ඉටනු කැමැත්තාහු විසින් ඉටූපරණ සිවුරු පසුදුරා අයලින්ලද සිවුරු ඉටා වැලඳ ගතයුතුය යන අභිප්‍රායි.

**44.** විදූ, විනය දන්නා මහණ ; එතං සඞ්ඝාටිං පච්චුද්ධරාමි ති,(අත්පසින් දුරුවූව)එතං සඞ්ඝාටිං පච්චුද්ධරාමි යි,හා, නොහොත් අත්

---

† භික්ෂුතෙමේ එකාහවත්කුදු තුන්සිවුරෙන්වෙන්ව නොවසන්නේ ය එසේම අධිට්ඨාන නිසීදනයෙන් වෙන්ව සාරමසක් නොවස න්නේය.

6 අදිටන්කොට වලඳිනු ලබන නිසීදනයෙන් වෙන්ව සාරමසක් නොවසන්නේය.

7 තුන්සිවුර අධිෂ්ඨාණ කරන්නාහු විසින් රජන්කොට කප්බින්දු දී ප්‍රමාන යුක්තවම අධිෂ්ඨාණ කටයුත්තේය,

45 සඞ්ඝාටි පච්ඡිමන්තේන දීඝසො මුට්ඨිපඤ්චකො
උත්තමන්තේන සුගත චීවරූනා'පි වට්ටති
මුට්ඨිත්තිකඤ්ච තිරියං. තථා එකංසිකස්ස'පි.
46 අන්තරවාසකො චා'පි දීඝසො මුට්ඨිපඤ්චකො
අඩ්ඪතෙය්‍යො විහත්ථෝ වා තිරියන්තේන න වට්ටති.

---

පඤ්චව, ඉමංසඞ්ඝාටිම්පච්චුද්ධරාමී ති, ඉමං සඞ්ඝාටිං පච්චුද්ධරාමි සී, සංඝෙ. කියන්නේය; එවං, මෙසේම; සබ්බානි, (උත්තරාසඞ්ගාදී පාත්‍රාවසාන) සියල්ලත්, නාමෙන, (උන්) උන්ගේ නමින්, වත්වා, කීයා, පච්චුද්ධරෙ, පසුදුරන්නේයි.

45. සඞ්ඝාටි, සඞ්ඝාටි තොමෝ; පච්ඡිමන්තේන, යටත් පිරිසෙයින්; දීඝසො, දිගින්; මුට්ඨිපඤ්චකා, මිටි පස්රියන්ඇති; උත්තමන්තේන, උතුම් පිරිසෙයින්; සුගත චීවරූනාපි, සුගතචීවරයට උනුවීද; වට්ටති, වටී; තිරියං, සරස හෙවත් පුළුලෙහි; මුට්ඨිත්තිකඤ්ච, මිටි තුන්රියනක් පමණද සුගත චීවරයට උනුපමණද; (වට්ටති) වටී; එකංසි කස්සපි, උත්තරාසඞ්ගචීවරයාගේද; තථා, (දිගපුළුල පමණ) එසේ මැයි. "එකංසම්ංඅංසෙනිය්‍යුත්තංඑකංසිකං" සුගතචීවරූනාපි යන්නෙහි අපිශබ්දය සම්භාවනායෙහි වැටේ උත්කෘෂ්ඨභාවයෙන් ඒසුගතචීවරය පමණකුදු වටී ඉන් උනුව වත්තව්‍ය නැති යන අර්ථයි අන්තවය සඞ්ග්‍රහයෙන් උභය මධ්‍යයෙහි පොහොනා රිසිසෙනපමණක් ගතයුතු යනු දක්වූයේ වෙත්.

46. අන්තරවාසකොචාපි, අන්තරවාසයද; දීඝසො, දිගින්; මුට්ඨිපඤ්චකො, මිටිපස්රියන් ඇත්තේ; තිරියන්තේන, සරසින්; අඩ්ඪතෙය්‍යො, දෙරියන් විතක් ඇත්තේ හෝ; විහත්ථොවා, දෙරියනක් ඇත්තේහෝ; වට්ටති, (යටත් පිරිසෙයින්) වටී.

* "තිචීවරං අධිට්ඨහන්තේන රජිත්වා කප්පබින්දුං දත්වා පමාණයුත්තමෙව අධිට්ඨාතබ්බං තස්සපමාණං උක්කට්ඨපරිච්ඡෙදෙන සුගත චීවරතො ඌනකං වට්ටති ලාමක පරිච්ඡෙදෙන සඞ්ඝාටියා උත්තරාසඞ්ගස්ස දීඝසො මුට්ඨිපඤ්චකා තිරියං මුට්ඨිත්තිකම්පමාණං

---

* තිසිවුර අදිටන් කරන්නාහු විසින් රදා කප්බිඳු ඔබා පමණයුතු කොටම අදිටන්කටයුතු උඩත් පිරිසෙයින් සුගත් සිවුරෙන් අඩුවද වටී යටත් පිරිසෙයින් සඟළහා උතුරුසළුව දිගම්ටිපහක්හා සරස මිටිතුනක් පමණවටී අතරවැසිල්ල දිග මිටිපහක්ද සරස දෙරියන කුදුවටී පාරුපනයෙනුදු වනාගිතැබ පිළිසඳනට හැක්කේනුයිච්චු පමණින් වනාශී වැඩිවූද අඩුවූද පිරිකර චොළැයිඅදිටත් කටයුතු

47 නිසීදනස්ස දීඝෙන විදත්ථි ද්වෙ විසාලතො
දියඩ්ඪං දසාවිදත්ථී සුගතස්ස විදත්ථියා.
48 කණ්ඩුපටිච්ඡාදිකාය තිරියං ද්වෙ විදත්ථියො
දීඝන්තතො ච තස්සා'ව සුගතස්ස විදත්ථියා.
49 වස්සිකසාටිකාය'පි දීඝසො ඡ විදත්ථියො
තිරියං අඩ්ඪතෙය්යාව සුගතස්ස විදත්ථියා.
50 එත්ථ ඡෙදනපාචිත්ති කාරෙන්තස්ස තදුත්තරිං
පච්චත්ථරණ මුඛචොළා අකම්බිතපමාණිකා.
51 පරික්ඛාරචොළෙ ගණනා පමාණං වා න දීපිතං
තථා වත්වා අධිට්ඨෙය්ය ථවිකාදිං විකප්පියං.

---

එවටති අන්තරවාසකො. දීඝසො මුට්ඨි පඤ්චකො තිරියං විහත්ථො ප චා'ති පාරුපනෙනාපි ගිහිසක්කා නාභිං පටිච්ඡාදෙතු'න්ති වුත්තප්පමාණතො පනඅතිරෙකඤ්ච ඌනකඤ්ච පරික්ඛාරචොළ නාම අධිට්ඨාතබ්බා යනු අටුවායි.

47 සුගතස්ස විදත්ථියා, සුගත්වියතින් ; නිසීදනස්ස, නිසීදන(විවර ය.ගේ ;) දීඝෙන, දිගින් ; ද්වෙවිදත්ථී, දෙවියතෙක ; විසාලතො, පුළුලින් ; දියඩ්ඪං, යෙලවියතෙක ; දසා, දශය ; විදත්ථියො, වියතෙකි.
48 සුගතස්සවිදත්ථියා එව, සුගත් වියතින්ම ; කණ්ඩු පටිච්ඡාදිකාය, කණ්ඩු පටිච්ඡාදි විවරයාගේ ; තිරියං, සරස, ද්වෙවිදත්ථියො, දෙවිය තෙක ; දීඝන්තතො, දිගින් ; චතස්සො, සතරවියතෙකි
49 සුගතස්සවිදත්ථියා' එව, සුගත් වියතින්ම ; වස්සික සාටිකායාපි, වස්සික සාටික විවරයාගේද ; දීඝසො, දිගින් ; ඡ විදත්ථියො, සවියතෙක ; තිරියං, සරස ; අඩ්ඪතෙය්යා, අඩුතුන් වියතෙකි. අඩ්ඪතෙය්යං තතියං යස්ස සා අඩ්ඪතෙය්යා, අඩ්ඪ තතියා යු තැනි මෙනි සුගත් වියත වඩුවි ඃතිත් ඇත් වියතෙකි.
50 එත්ථ, මේ සඞ්ඝාටි ආදිය සිව්රෙහි ; තදුත්තරිං, එ ඒ සිවුරට කී පමණින්වඩා : කාරෙන්තස්ස, කරන්නා හට ; ඡෙදන පාචිත්ති, (අධික තැන්) කපා දෙසිය යුතු පචිති වේ ; පච්චත්ථරණ මුඛචොළා', පච්චත්ථරණය මුඛ පුඤ්ඡන චොළය යන මේහු ; අකම්බිතපමාණිකා, කැමතිවන ලද පමනඇත්තාහුයි.
51 පරික්ඛාර චොළෙ, පිරිකර චොළය සිව්රෙහි ; ගණනං, එකෙක දෙකෙක යන ගණනෙක්හෝ ; පමාණං වා, (දිග පුළුල) පමණෙක් හෝ ; නදීපිතං, (පෙළ අටුවා ගෙහි) නොදක් වනලද ථවිකාදිං, පාත්‍රාපසි පොත්පසි ආදිවූ ; විකප්පියං, විකප්පුත් පොංහො

52 අහතාහතකප්පානං සඞ්ඝාටි දිගුණා සියා
එකච්චි යුත්තරාසඞ්ගො තථා අන්තරවාසකො.
53 උතුද්ධටානං දුස්සානං සඞ්ඝාටි ච චතුග්ගුණා
භවෙය්‍යුං දිගුණා සෙසා පංසුකූලෙ යථාරුචි.
54 තිස්සු චෙවාපි එකං වා ඡින්දිතබ්බං පහොති යං
සබ්බස්ස අප්පහොන්තස්ස අනුවාතාදියෙය්‍ය වා
අච්ඡින්නකඤ්ච අනාදින්නං නධාරෙය්‍ය තිචීවරං.
55 ගාමෙ නිවෙසනෙ උද්දොසිත පාසාදහම්මියෙ
නාවට්ට මාල ආරාමෙ සත්ථඛෙත්තඛලෙ දුමෙ.

---

ණ, (සිවුරු) තථා වත්වා, ("ඉමං චීවරං පරික්ඛාරචොළං අධිට්ඨාමි" යනාදි ප්‍රකාරයෙන් කියා අධිට්ඨෙය්‍ය, ඉටත්තේයි.

52 අහතා හතකප්පානං, අලුත් අලුත් වන් වස්ත්‍රයන් සම්බන්ධ වූ; සඞ්ඝාටි, සඞ්ඝාටිතොමෝ; දිගුණා සියා, දෙපට වන්නීය; උත්තරාසඞ්ගො, උත්තරාසඞ්ගය; එකච්චි, එකපට වන්නේය; අන්තරවාසකො, අන්තරවාසකයද; තථා, එසේම; එකපට වන්නේයි. අහතසදිසං කිඤ්චිඌනානි අහතකප්පානි ලෙසං

53 උතුද්ධටානං, බොහෝකල් හැඳගරණලද; දුස්සානං, වස්ත්‍රයන් සම්බන්ධි වූ; සඞ්ඝාටි, සඞ්ඝාටිතොමෝ; චතුග්ගුණා, (සියා) සතරපටවන්නීය; සෙසා, උත්තරාසඞ්ගඅන්තරවාසකයෝ; දිගුණාභවෙය්‍යුං, දෙපටවන්නාහ; පංසුකූලෙ, සුසානාදියෙහි පතිත පිලොතික චීවරයෙහි; යථාරුචි, කැමති පමණකි.

54 තිස්සු; තුන්සිවුරෙහි; චෙවාපි; දෙසිවුරෙක්හෝ; (කපාකටු යුත්තේය;) එකංවා; එක්සිවුරෙක්හෝ (කපාකටු යුත්තේයි) යං, (පස් අතු සත් අතු ආදි වශයෙන් කපාකරණලද) යම් සිවුරෙක්; පහොති, (පශ්චිම ප්‍රමාණයට) සෑහේද; (තං) ඡින්දිතබ්බං, ඒ කපාකටුයුත්තේය; සබ්බස්ස, තුන් සිවුරම; අප්පහොන්තස්ස, (කපාකරන්නට) නොසෑහෙන කල්හි; අනුවාතාදිංවා, අනුවා පතුරුවී ආම්; ආදියෙය්‍ය, ඇල වන්නේය; (අනුවාතනම් උවන් බහගත් සිවුරෙහි අගමැද දික් ලුහුඬු කොට අස ඇලවන ආගන්තුක පති) අච්ඡින්නකඤ්ච, (උක්ත ක්‍රමයෙන්) නොකැපුද; අනාදින්නං, අනුවාපත් නොඇල්වූද; තිචීවරං, තුන් සිවුර; නධාරෙය්‍ය, වැළඳ නොගන්නේයි. (සඞ්ඝාටිආදි නමින් ඉටා වැළඳගන්නාහට දුකුළාවෙයි යුතැනි)

55-56 ගාමෙ, ඇතුළු ගමහෝ; නිවෙසනෙ, වට්රැස් ඇතෙහි හෝ; උද්දොසිත, බඩු තලහෝ; පාසාද, දික්පහයෙහි හෝ

56 අජ්ඣොකාසෙ විහාරෙ වා නික්ඛිපිත්වා තිචීවරං
භික්ඛුසම්මුතියා'ඤ්ඤත්‍ර විප්පවත්ථුං නලබ්භති.
57 රොග වස්ස පරියන්තා කණ්ඩුච්ඡාදික සාටිකා
තතො පරං විකප්පෙය්‍ය සෙසා අපරියන්තිකා
58 පච්චත්ථර පරික්ඛාර මුඛපුඤ්ඡන * චොළකං
සදසම්පි රතන නාදිනා කප්පං ලබ්භං නිසීදනං

---

ගම්මියෙ, අඳුරු මඩුල්ලයෙහි හෝ ; නාවා, නැවෙහි හෝ ; අට්ට, දොර වූ ගල හෝ ; මාල, කැණිමඩුලු එකක් ඇති සිවුරැස්සලුල වා යෙහි හෝ ; ආරාමෙ, පුෂ්පාරාම ඵලාරාම යෙහි හෝ ; සත්‍ථ, ජඞ්ඝ සත්‍ථ සකට සත්‍ථ යන දෙවැදෑරුම් සත්‍ථාමුලයෙහි හෝ ; ඛෙත්ත, කුඹුරෙහි හෝ ; ඛලෙ, කමත්වලෙහි හෝ ; දුමෙ, රුක්මුලෙහි හෝ ; අජ්ඣොකාසෙ (සෙනසුනහාතරය සට)අභ්‍යවකාශයෙහි හෝ ; විහාරෙ වා, වෙහෙර හෝ ; තිචීවරං, තුන්සිවුර ; නික්ඛිපිත්වා, තබා ; භික්ඛුසම්මුතියඤ්ඤත්‍ර, භික්ෂූන් විසින් දෙන (අවිප්පවාස) සම්මුතිය විනා ; විප්පවත්ථුං (එක රැයකුදු) වියෝව විසීම ; නලබ්භති, නොවටි

ගමිච්ය මනුයෙහි අභාහි අගුණු කොට කළ කාරඩුමඩුගේ යනු විනය සන්නහි—මෙහි එකසෙනස්නෙකුදු විහාරනම්. නියිම්හි ඇතියිහෝතු ප්‍රව්යොවිය †නම්වෙයියනු මෙහි සන්න බැවින් බද්ධසීමාදීනත්සිම තුන්සිවුර අත්පස්හි වූවද නිසහිමවේ.

57 කණ්ඩුච්ඡාදිකසාටිකා, කණ්ඩුච්ඡාදි උදක සාටිකා දෙදෙන රෝගවස්සපරියන්තා, රෝගනාවසාන කාලය කෙළවර කොට ඇත්තාහ ; තතොපරං, ඒ රෝගාවසාන කාලයෙන් මත්තෙහි ; විකප්පෙය්‍ය, විකප්පන් කෙරේය ; සෙසා, සෙසු සිවුරයෝ ; අපරියන්තිකා වැලඳිඟැම්මෙහි කාලපරියන්තයක් නැත්තාහුයි.

58 පච්චත්ථර, පසතුරණද ; පරික්ඛාර, පිරිකර සොළස ද ; මුඛපුඤ්ඡන චොළකං, මුවපිස්නා සිවුරද ; නිසීදනං, නිසදුන් සිවුරද ; සදසම්පි, දස ඇත්තේද නැත්තේද ; අරතනම්පි, නොරැඳුයේද රැඳුයේද ; අනාදිනනකප්පම්පි, කප්බිඳුඑබූයේද නොඑබූයේද ; ලබ්භං, වටී-පච්චත්ථරණ පරික්ඛාර මුඛපුඤ්ඡන චොළක ඔපනා නීලකම්පි පීතකම්පි ලොහිතකම්පි වට්ටති එවරූපං එවරූපං නිෂ්ඨාපෙතුං පාරුපිතුං වා න වට්ටති යනු මෙහි පිකාසී.

---

පොත් * පුඤ්ඡන.

† මෙය සලකාත්වා.

59 අදසං රජිතං යෙව සෙස චීවර පඤ්චකං
කප්පතා'දින්න කප්පං'ච සදසං'ච නිසීදනං.

60 අනධිට්ඨිතං නිස්සට්ඨං කප්පෙත්වා පරි භුඤ්ජයෙ
හත්ථ දීඝං තතො පඩ්ඪ විත්ථාර ඤ්ච විකප්පියං.

61 තිචීවරස්ස භික්ඛුස්ස සබ්බ මෙතං පකාසිතං
පරික්ඛාර චොළියො සබ්බං තථා වත්වා අධිට්ඨති.

62 අච්ඡෙද විස්සජ්ජන ගාහ විබ්භමං
පච්චුද්ධාරෝ මරණං ලිංග සික්ඛා
සබ්බෙව අධිට්ඨාන වියොග කාරණා†
තිවිධ ඡිද්දඤ්ච තිචීවරස්ස.

---

59 සෙසචීවරපඤ්චකං, අනික් සිවුරුපස ; අදසං (සෙව), දහ නැත්තේම ; රජිතංයෙව, රැඳුයේම ; ආදින්න කප්පංච, කප් බිඳුළුවූයේම ; කප්පති, වටී ; නිසීදනං, නිසඳුත් සිවුරද ; සදසං ච, දසසහිත වූයේම (වටී) නිසඳුන් සිවුර දහනැත නොවටනා බැවින් සදසංච, යි අවධාරණ කළෝය.

60 අනධිට්ඨිතං (තිචීවරාදි වශයෙන්) නො ඉටන ලද ; අනිස්සට්ඨං අන්නාට නො දෙනලද ; සිවුර (ඒ) කප්පෙත්වා, විකාප ; පරිභුඤ්ජයෙ, වැළඳ ගන්නේය ; හත්ථදීඝං, (වඩු) රියනින් දිගඇති ; තතො. ඒ රියනින් ; උපඩ්ඪ විත්ථාරඤ්ච, භාගයක් පළල ඇති ; (පශ්චිම චිවරය ; විකප්පියං, විකප්පිය යුත්තේයි.

61 එතංසබ්බං,(අධිෂ්ඨාන ප්‍රමාණය පරිහරණය යන) ඒ හැම විධානය ; තිචීවරස්ස භික්ඛුස්ස,විනය තෙචීවරිකවූ භික්ෂුහට ; පකාසිතං (පරිභෝග වශයෙන්)කියනලද ; පරික්ඛාර චොළියො, පිරිකර සොළස ඇති (මහණ) සබ්බං,(තිචීවරාදි) සියලු සිවුරු ; තථා වත්වා, (ඉමං පරික්ඛාර චොළං අධිට්ඨාමි) යන ක්‍රමයෙන් කියා ; අධිට්ඨාති, ඉටාය ; "පරික්ඛාර චොළ මස්සඅත්ථි නත්ථි වා නිච්ඡතොතාහි පරික්ඛාර චොළියො ,, මෙහි තෙචීවරික නම විනයෙහි වශීත තුන් සිවුරු එකක්කොට තුන් සිවුරුනත්තෝ විනය තෙචීවරික නම් බුතාඞ්ග තෙචීවරිකය හටද තුන්සිවුරු විනි මෙතෙක්ම බැවින් වෙසින් ගැණේ.

62 අච්ඡෙද, පැහැරගැනීමය ; විස්සජ්ජන, අනිකෙකුහට දීමය ; ගාහ, විශ්වාස ගාහය ; විබ්භමා, ශික්ෂාවිමය (යන සාමාන්‍යාද) පච්චුද්ධාරෙ, පසුදීමය ; මරණං, කාලක්‍රියාය ; ලිඟ, ලිඞ්ග (පරිවර්තන

---

පොත් † කාරකා

63 කුස වාක ඵල චීරානි † කම්බලං කෙස වාලජං
ථුල්ලච්චයං ධාරයන්තො ලූක පක්ඛා ජිනක්ඛිපෙ
කදලෙරකක්ක දුස්සෙ පොත්ථකෙ වා පි දුක්කටං.

64 සබ්බ නීලක මඤ්ජෙට්ඨපීත ලොහිත කණ්හකෙ
මහා රඞ්ග මහානාම රඞ්ග රත්තෙ තිරීටකෙ.

65 අච්ඡින්න දීඝ දසකෙ ඵල * පුප්ඵ දසෙ තථා
කඤ්චුකෙ වෙඨනෙ සබ්බං ලභතිච්ඡින්න චීවරෙ 'ති.

---

නා)ය ; සික්ඛා, සිකපස් විනිමය (අන මොහුද) සංඛ්‍යා, සියලු සි චරෙහි ; අධිට්ඨාන වියොග කාරණා, ඉ ්න් වියොග කරන්නාහු (චී) නිච්ඡප්පදසූව, විනිවිදි සිවුරු වනාහි ; තිචීවරස්ස, තිචීවරය ගේ ; (අධිට්ඨාන වියොග කාරණා) ඉමත් වියෝග කරත්තේයි. භිනායචත්තාගෙතන, සිකපස්නොවිකාම ගිහිවත්තුයෙන් එහි උසා ගෙළුන බැව්හෙණ කිනුවෙත් යනු විනය සත්නයි. දිගපුළුල එක හුය කුඩුනැති සුලැඟිලි නියපිටු සාස්දුරු "චීනිච්ඡඡද" නම්.

63 කුස, හීතණ (නොතාකළ) වාක, වැහිරි (නොතාකළ) ඵල පුවරු (නොතාකළ) චීරානි, සිවුරු ද ; කෙසවාලජං මිනිස් කෙහෙයෙන් හෝ අස්වලිගින් සෙමරවලින් හෝ වූ ; කම්බලං, පලස් ද ; උලූකපක්ඛ මහමුහුණුපියා (නොතාකළ සිවුරු හා) අජිනක්ඛිපෙ, අඳුන්දිව්සම් ද ; ධාරයතො, හඳනාපොරෝණාහට ; ථුල්ලච්චයං, තුලැසි (ඇවැත්) වේ; කදලි, කෙසෙල් වැහැරින්කළ ; එරක, එරැහුයෙන්කළ ; අක්ක, වරාහුයෙන්කළ ; දුස්ස, පිළියෙනි ; පොත්ථකෙවාපි කැත්රිකාඩයයි කියනලද නියදවල්ලෙහි ද ; දුක්කටං, දුකුලාවේ. මෙ තිචීරශබ්දය චීවරපරියායයි මේකුසාදි නොතාකළ සිවුරුමවුවේ — චීවරක්ඛන්ධකයෙහි කුසචීවර වාකචීවර ඵලකචීවර කෙසකම්බල වාළකම්බල උලූකපක්ඛ අජිනක්ඛිප අක්කනාලය යන අටවසතුයෙහි මතුලැසිපැණවූ බැවින් මෙහි නොකී වැහිරිආදීන් වරාදඬු ගොනාකළ අක්කනාළයෙහි දු තුලැසි වෙයිද දතයුතු.

64-65 සබ්බනීලක, හැමනිල්වූ ; මඤ්ජෙට්ඨ, (හැම) මදටවන් වූ ; පීත, (හැම) රන්වන්වූ ; ලොහිත, (හැම) ලේවන්වූ ; කණ්හකෙ, (හැම) කළුවූ (පිළියෙහි) ද ; මහාරඞ්ග, රත්වායන්පිටපැහැ

---

පොත් † ඵන-පත

පොත් * ඵලකානි-ඵලකචීවරානි

රජනානිචා'ති.

66 මූලක්ඛන්ධතචපත්තඵලපුප්ඵප්පභේදතො
රජනානි ඡබ්බිධානි † අනුඤ්ඤාතානි සත්ථුනා.

67 මූලෙ හලිද්දිං ඛන්ධෙ ච මඤ්ජෙට්ඨං § තුඞ්ගහාරකෙ
අල්ලිං නීලිඤ්ච පත්තෙසු තචෙලොද්දඤ්ච කණ්ඩුලං
කුසුම්භං කිංසුකං පුප්ඵෙ සබ්බං ලබ්භං විවජ්ජියා 'ති.

---

පත්තා චා'ති.

68 අයො පත්තො මත්තිපත්තො * ජාතියා කප්පියා දුවෙ
උක්කට්ඨො මජ්ඣිමො චෙව ඔමකො චපමාණතො.

---

යේ; මහානාම, තුනුපිඩුම්පෙති පැහැයේ; රඞ්ග, රංජිතවූ, රෑ
තෙන (චාපි) රත්වූ පිළියෙහිද; තිරීටකෙ, රිටිසුඹුලෙහි; අච්
ඡන, නොසුන්දහඇති; දීඝදසකෙ (මැදිත්කැපූ) දික්දහ ඇති
(පිලියෙහිද; ඵල, ඵල(සේගෙතුදහ)ඇති; පුප්ඵදසෙ (කැත්කැත්
කොටබැන්දසිත්දකළ) මල්දහ ඇති (පිළියෙහිද) කඤ්චුකෙ, අ
(හියෙහිද, වෙඨනෙ, හිස්) වෙළයෙහිද; තථා. එසේම (දුකූ ඤා
චෙ) අචජිනානිඃරෙ (නගණකොට සොරුන් විසින්) පැහැරගත්
සිවුරු ඇතිමහණ; සබ්බං (කුසචීවරාදි) සියලු (අකප) සිවුරු; ල
භති (හදනට පොරෝණට) ලැබේ. එබැවින් ලිඟිනියහු විසින් මී
ගියමක්ලද එයින් හිරිඹතප්රැක පැසුලුකැප සිවුරුලද කා ඒ ඉව
සා මේ අකැප සිවුරුහැරියයුතු; පොත්කොත්, වාකමයවණ්ං, ය
නු අඞගුත්තර අටුවාංසි. සීසවෙඨනනම් හිසසිසාලපටයි.
රජනානිචාති,රජනානිචාක්නෙහි කැපඅකැප රජත් නම්.

66 මූල, මුල්ය; ඛන්ධ, කඳය; තච, සුඹුලුය; පත්ත, පතුය; ඵල,
ඵලය; පුප්ඵ, මල්ය (යනමොවුන්ගේ) පභෙදතො, ප්‍රභෙදවිසින්
ඡබ්බිධානි, සවැදෑරුම්වූ; රජනානි, රජත්හු; සත්ථුනා, සර්ඥය
න් විසින්; අනුඤ්ඤාතානි,අනුදත්නාලදහු, රඤ්ජනෙනානිරජ
නං, සීමූලාදිද්‍රව්‍යයම කියතු.

67. 68 මූලෙ, මුල් (රජත්) හි; හලිද්දිං, කහද; ඛන්ධෙ, කඳ
(රජත්) හි; මඤ්ජිට්ඨඤ්ච, මදටද; හෙවත් පතංගිද; තුඞ්ගහාර
කෙ, පිහොල්හරද; පත්තෙසු, පත් (රජත්) හී; අල්ලිං, සිඟිත්

---

පොත් † ඡප්පකාරානි පොත් § මඤ්ජෙට්ඨං
බුරුම * භූමිපත්තො

69 උක්කට්ඨො මාගධ නාළි චය තණ්ඩුල සාධිතං. †
ගණ්හාති ඔදනං සූපං බ්‍යඤ්ජනඤ්ච තදූපියං.

70 මජ්ඣිමො තස්සූපඩ්ඪො ච තතො පඩ්ඪො ච ඔමකො
උක්කට්ඨතො ච උක්කට්ඨො අපත්තො ඔමකොමකො.

---

කසාකොළද ; නීලලිංකූව, බේරුකොළද ; තචෙ, සුඹුලු (රජත්) හී ; ලොද්දක්ඛූව, ලොත්සුඹුලද ; කණ්ඩුලං, කබොල් සුඹුලද ; පුප්ඵෙ, මල් (රජත්) හී ; කුසුම්භං, වණුක්මල්ද ; කිංසුකං, කැහැලමල්ද ; විවජ්ජිය, හැර ; සබ්බං (යථාක්‍රමයෙන් සෙසුමුල් රජත් කඳ රජත් ආදිවූ) සියලු රජත් ; ලබ්භං, වටී ; එලරජත්හී අකැප දෙයෙක්නැති ... පත්තොචා'ති, පාත්තාච, යන්නෙහි කැප අකැප පාත්‍ර නම්.

අයොපත්තො, යපාත්‍රය ; මත්තිපත්තො මැටි පාත්‍රය ; යන ; දුවෙ, දෙපාත්‍රයෝ ; ජාතියා, ජාතිහෙයින්, කප්පියා, කැපයෝයි ; උක්කට්ඨො, උත්කෘෂ්ට (පාත්‍ර) යද ; මජ්ඣිමොචෙව, මධ්‍යම (පාත්‍ර) යද ; ඔමකොච, ලාමක (පාත්‍ර) යද ; පමාණතො, ප්‍රමාණහෙයින් ; තුන්පාත්‍රකෙණෙකි.

69 උක්කට්ඨො (එනී) උත්කෘෂ්ටපාත්‍රය ; මාගධනාළි (අටපත ගන්නා) මගධනැළියෙන් ; චය තණ්ඩුල, දෙනැළියක් සාලින් ; සාධිතං, පිසනලද ; ඔදනං, බතද ; සූපං (ඒබත්හතරවනකොටස පමණවූ අතින්ගෙණයාහැකි) මුද්ගසූපයද ; තදූපියං (පඤ්චමාලොපයදක්වා හැමආලෝපයට) අනුරූපවූ ; බ්‍යඤ්ජනඤ්ච, මත්ස්‍යමාංසාදී අවුලුද ; ගණ්හාති, ගණී.

70 මජ්ඣිමො, මධ්‍යම(පාත්‍ර) ය ; තස්ස, ඒ (උත්කෘෂ්ටපාත්‍රයා) ගේ ; උපඩ්ඪොච, භාගයෙක්ම (ගන්නේ) ය ; ඔමකො, ඔමක (පාත්‍ර) ය ; තතො, ඒ (මධ්‍යමපාත්‍ර) යෙන් ; උපඩ්ඪොච ; භාගයෙක්ම(ගන්නේ) ය ; උක්කට්ඨතොච උක්කට්ඨො, උත්කෘෂ්ට (පාත්‍ර) යටවඩා උත්කෘෂ්ට (පාත්‍ර) යද ; ඔමකොමකො, ලාමක (පාත්‍ර) යටවඩා ලාමක (පාත්‍ර) යද ; අපත්තො, පාත්‍රනම්නොවේ. පාත්‍රලක්ෂණ නම් යථොක්ත ප්‍රමාණය එබැවින් මොහු නොසිටා භාජන පරිභොගයෙන් අනුභව කටයුත්තාහුයි. මෙහි උත්කෘෂ්ට පාත්‍රයෙහි ද්‍රව්‍යයෙන් භාගයක් ගන්නාම මධ්‍යම පාත්‍රය තත්සාහච සංඛ්‍යායෙන් උපඩ්ඪයයි කියනලදී තතොපඩ්ඪොච යන්නෙහිදු මෙසේයින්මැයි.

---

පොත් † සාධියං, සාධිකං

71 අතිරේක පත්තං ධාරෙය්‍ය* දසාහ පරමං සකො
කප්පො නිස්සග්ගියො හොති තස්මිං කාලෙ තිනාමිතෙ.
72 අච්ඡෙද දින ගාහෙහි විබ්භමා මරණෙ'ධිට්ඨා
ලිංගසික්ඛාහි ඡිද්දෙන පත්තො'ධිට්ඨාන මුජ්ඣති.
73 පත්තං න පටිසාමෙය්‍ය සොදකං තව මාතපෙ
උණ්හෙ න නිදහෙ භූම්‍යා න ඨපෙ නොව ලග්ගයෙ.
74 මිඩ්ඪන්තෙ පරිභණ්ඩන්තෙ අඞ්කෙ වා ආතපත්තකෙ
පාදෙසු මඤ්චපීඨෙ වා ඨපෙතුං න ච කප්පති.

---

71 සකො, (කාකණිකා මාත්‍රයකුදු පයවිළ නොහැබ දුන්නොත්) සව (සන්තක) කවූ; කප්පො, පාත්‍ර විධානයෙන් කලුකළ බවින් ඉටත්නට) කැපවූ; අතිරේකපත්තං, නොඉටු නොවිකප්ප පාත්‍රය; දසාහපරමං, දශ දවසක් පරමකොට ඇති කාලයක්; ධාරෙය්‍ය, දැරිය යුත්තේය; තස්මිංකාලෙ, ඒ (දසාහ පරම) කාලය; අතිනාමිතෙ, ඉක්මවූ කල්හි; නිස්සග්ගියොහොති, නිසජීය යුතු වේ.

72 අච්ඡෙද, පැහැර ගැම්මෙන්ද; දින, අන්නට දීමෙන්ද; ගාහෙහි, විශ්වාසින් ගැම්මෙන්ද; විබ්භමා, ගිහිවීමෙන්ද; මරණ, කාලක්‍රියා යෙන්ද; උද්ධටා, පසුදිරිමෙන්ද; ලිංගසික්ඛාහි, ලිඟු පෙරළිමෙන් හා සික පස් කිරීමෙන්ද; ඡිද්දෙන (මුංවිටින් යව දෙඅඟුලක් ඉක්මනණු [illegible] පමණවූ) සිදුරෙන්ද; පත්තො, පාත්‍රය; අධිට්ඨානං, ඉටන්; උජ්ඣති, හරී.

73 සොදකංපත්තං, දියනොසුත් පාත්‍රය; නපටිසාමෙය්‍ය, නොසඟවත්නේය; තවමාතපෙ, අව්වෙහි ගිනියෙහි නොද [illegible] යුත්තේය; උණ්හෙ, එමනුණ; නනිදහෙ, දිය සිඳද නොදැ [illegible] යුත්තේය; භූම්‍යා, අකුරුපස් ඇඇතිබිම; නඨපෙ, නොතබ [illegible] ය: නොලග්ගයෙව, නාග දන්තාදියෙහි (නොදළුවම්හන්දෙසි ඇල්ලගරණ පමණක් වනාහි එට යනු; නනිධධහෙසී ආදිකා [illegible] සෙඛයෙන් උක්තවේ. දඹු කෙළනා දැති මුදුනෙහි පාත්‍රව [illegible] මිද ලගනනම්.

74 මිඩ්ඪන්තෙ, පිලකෙළවරහෝ; පරිභණ්ඩන්තෙ, නි[illegible]තු කෙළවරහෝ; අඞ්කෙවා, ඇකයෙහි හෝ; ආතපත්තකෙ, ස[illegible] මත්තෙහි හෝ; පාදෙසු, පතුල්පිට හෝ; මඤ්චපීඨෙවා, ගැද පුටු මත්තෙහි හෝ; ඨපෙතුං, තබන්නට; නචකප්පති, නොම වටී.

---

* ධාරෙය්‍ය ඇතම් පොත්

75 න නීහරෙය්‍ය උච්ඡිට්ඨො'දකඤ්ච චලකට්ඨිකං
පත්තෙන න පත්තහත්ථො වා කවාටං නාපණාමයෙ.
76 භූමි ආධාරකෙ දාරු දණ්ඩාධාරෙසු සජ්ජිතෙ
ද්වෙ පත්තෙ ඨපෙය්‍යෙ'කං නික්කුජ්ජිත්වාන භූමියං.
77 දාරු රූපිය සොවණ්ණ මණි වෙළුරියා මයා
කංස කාච තිපු සීස ඵලිකා තම්බ ලොහජා.
78 ඡව සීස මයො වා පි ඝටි තුම්බකටාහජා
පත්තා අකප්පියා සබ්බෙ වුත්තා දුක්කට වත්ථුකා'ති.

---

ථාලකාදීනි.

79 කප්පියා ථාලකා තයො තම්බලොහමත්තිකාමයා
දාරු සොවණ්ණ රජත මණි වෙළුරියාමයා.

---

75 උච්ඡිට්ඨොදකඤ්ච, ඉඳුල් දියද; චලකං, එල්සප් ඇසප්ද; අට්ඨිකං, මස්ඇටද දඹඇට ඈ ඇටද; පත්තෙන, පාත්‍රයෙන්; න නීහරෙය්‍ය, (පිටත පියන්නට) නොගෙන යන්නේය; පත්තහත්ථො වා, පාත්‍රගත් අත් ඇත්තේද; කවාටං, (දොර පොහොරු) කවුලු (පොහොරු) නාපණාමයෙ, නොහරණේය; නොඇරියන්නේයි.

76 සජ්ජිතෙ, මනාකොට සැදූ; හෙවත් තරකොට ඉදිකළ; භූමිආධාරකෙ, (දණ්ඩවෙතුලනාදීමයවූ) බිම්වලල්ලෙහිද; දාරු, එක්වැනිකොටකළ දැව්තැන්හෙහිද; දණ්ඩාධාරෙ (බොහෝ දණ්ඩෙන් කළ) අඩුවලල්ලෙහිද; ද්වෙපත්තෙඨපෙය්‍ය (පාත්‍රවත්හෙහි අනික්පයක් තබන විසින්) දෙපාත්‍රයක්තබන්නේය; භූමියං, (කල්‍රාල් අතුළ) භූමියෙහි; නික්කුජ්ජිත්වා, කිබිසිනිකොට හෝ උඩුකුරුකොටහෝ; එකං, (ඨපෙය්‍ය) එක්පයක්තබන්නෙයි.

77 දාරු, දඬුමුවා; රූපිය. රිදීමුවා; සොවණ්ණ, රන්මුවා; මණි (ඉඳුනිල්ඈ) මිණිමුවා; වෙළුරියාමයා, වෛරෝඩි මිණිමුවා (පාත්‍රයෝ) ද; කංස, කස්ලෝවට ලෝහයෙය; කාච, කාඩය; තිපු, හෙළතුඹය; සීස, කළුතුඹය; ඵලිකා, පිළිවහණය; තම්බ, ලොහොය; ලොහජා, තඹලෝහනොය (යනමෙස්ගාවූපාත්‍රයෝද.

78 ඡවසීසමයොවාපි, මිනිස්කබල්මුවා (පාත්‍රය) ද; ඝටිතුම්බකටාහජා, කළකබලින් ලබුකබලින්වූ (පාත්‍රයෝ) ද (යන) සබ්බෙ පත්තා, සියලුපාත්‍රයෝ; අකප්පියා, අකැපයහ; දුක්කට වත්ථුකා, දුකුළුවට ගහයි; වුත්තාති, කියනලදහුයි.

---

ථාලකාදීනි, ථාලකාදියගෙනෙයි කැප අකැප බවන්නම්.

79-80 කප්පියා (ජාති ...) කැපවූ; තම්බලොහ, තඹ ලොහොයෝවූවාය: මත්තිකාමයා, මැටිමුවාය; ථාලකා, ථාලකයෝ: තයො, තුන්

80 අකප්පා ඵලිකා කාච කංසජා ගිහිසන්තකා
සඞ්ඛිකා කප්පියා තුම්බ ඝටිජා තාව කාලිකා.

---

## පවාරණනි

81 යෙනිරියාපථෙනායං භුඤ්ජමානො පවාරිතො
තතො අඤ්ඤෙන භුඤ්ජෙය්‍ය පාචිත්ති නතිරිත්තකං.
82 අසනං භොජනඤ්චෙව අභිහාරො සමීපතා
කාය වාචා පටික්ඛෙපො පඤ්ච අඞ්ගා පවාරණා.
83 ඔදනො සත්තු කුම්මාසො මච්ඡො මංසඤ්චභොජනං.
සාලි වීහි යවො කඞ්ගු කුද්‍රූස වර ගොධුමො

---

දෙනෙක ; දැරූ, දඬුමුවා ; සොවණ්ණ, රන්මුවා ; රජත, රිදීමුවා, මණි, (ඉඳුනිල්ඈ) මිණිමුවා; වෙළුරියාමයා, වෙරළු මිණිමුවා (පාලකාගෝ) අකප්පා, අකැපයෝයි. ඵලිකා, පළිඟුමිණින්ද; කාච, කාචයෙන්ද ; කංසජා, කස්ලොහොවට ලොහොයෙන්දවූ (පාලකයෝවනානි) ගිහිසන්තකා, ගිහි (මිනිසුන්) සතුවාහුද ; සඞ්ඛිකා, සඞ්ඝයාතුවාහුද ; කප්පියා, කැපයෝය ; තුම්බඝටිජා, ලබුයෙන් කලයෙන්වූ (තළකබල්ලු) තාවකාලිකා, තාවකාලිකවූවාහු (කැපයෝයි) එම්නසවලඳ හරණට කැපයයිසේයි.

---

පවාරණනි, පවාරණයන්හෙති පිළිකෙව් පවිරුණුනම්,

81 අයං, මෙමහණ ; යෙනඉරියපථෙන, යම්ඉරියව්වකින් ; භුඤ්ජමානො, වළඳන්නේ ; පවාරිතො, වැළකීද ; තතො, ඒ (ඉරියව්ව) මිස ; අඤ්ඤෙන, අනික් ඉරියව්වකින් , අනතිරිත්තකං (වළඳනාකැමින්හෝ ගිලනක්හුව්සින්හෝ අතිරිත්නොකළ) යාවකාලිකභෝජනයක් ; භුඤ්ජෙය්‍ය, වළඳනම් ; පාචිත්ති, පචිති (ඇවැත්) වේ. එහෙසිම්ම "යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං ආහාරත්ථාය පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති දුක්කටස්ස" යනු පෙළයි යම් කැල්ලෙන් ලිවන්කැල්ලෙහිදුකුළා කියනලදී.

82 පවාරණා, පවාරණතොමෝ ; අසනං, වැළඳීමද (හෙවත්) අඩාලකළ බොජුන් ඇතිබවද ; භොජනඤ්චෙව (පැවරීජනක) භොජනයක්බවද ; අභිහාරො (කයින්) එළවීමද ; සමීපතා (දෙරියන්වියත්) අත්පසබවද ; කායවාචාපටික්ඛෙපො, කයින්හෝ වචනයෙන්හෝ වැලක්මය (යන) පඤ්චඅඞ්ගා (මේ) පස්අඟින් යුක්තයි

83. 84 ඔදනො, බත්ද ; සත්තු, හත්ද ; කුම්මාසො, කොමුද ; මච්ඡො, (දියෙනි) මස්ද ; මංසඤ්ච, ගොඩමස්ද (යන මේ පස)

84 සත්තන්නං මෙසං ධඤ්ඤානං ඕදනො භොජ්ජ යාගු ච
සාමාකාදි තිණං කුද්‍රූසකො වරක චොරකො
වරකො සාලිය ඤෙව ච නීවාරො සංගහිතො.
85 හාඩි ධඤ්ඤ මයො සත්තු කුම්මාසො යව සම්භවො
මංසො ච කප්පියො වුත්තො මච්ඡො උදක සම්භවො
86 භුඤ්ජනො භොජනං කප්ප මකප්පං වා නිසෙධයං
වාරෙය්‍ය භිනට්ටං කප්පං තත්තාමෙත්ථ ඉමන්තිච.

---

භොජනං, භොජන (නම්) වෙයි; සාලි. හැල්ය; වීහි, සෙසුවීය; ය [illegible], [illegible]වය; කඞගු. තණය; කුද්‍රූස, හමුය; වර, ගෙලවිරය; [illegible]ධූමො, ගොධුමය; එසංසත්තන්නං ධඤ්ඤානං, මේසප්තවිධ ධා න්‍යයන් සම්බන්ධිවූ; ඔදනො. බත්ද; භොජ්ජයාගුච, බොල්හවූ [illegible] බදනාතමි. සාමාකාදි [illegible]ණං, ගොඩහමු ආදිවූ තෘණධාන්‍යය; [illegible]ගෙන, හමුයෙහි එත්විමවගියේ; [illegible] කචොරකො, වරගොර [illegible] ගෙලවරයෙහි එක්විමවගියේ; නී [illegible]; සාලිතඤ්ඤූච, ගැල්හිම; සංගහිතො, එ [illegible] සාමාකාදිතිණං මහරතුඇති තෘණයනු මෙසත් [illegible]

[illegible] හාඩිධඤ්ඤමයො, සාරකොචබැදි සප්තවිධධාන්‍යයන්ගේ [illegible] කා [illegible]ල්දේ; සත්තු, හත්තම; යවසම්භවො, ය [illegible] ය්; කුම්මාසො, කොමුනව; මංසොච, මස්වනාහි; කප්පියො වුත්තො, කැපමස්කියනලද; උදකසම්භවො, දියෙහි උ පදනා මච්ඡෝ මස්නාම්.

"[illegible]පාකෙන, හාඩිනං වීහීනං කුණ්ඩ කම්පි ච;
සත්තූනං මොදකොචාපිසජනෙති පවාරණං,"*,

කහුර් ඉඳුබ් ආදීහුදියෙහි උපදනා [illegible]වින්; මච්ඡෝ, යන්නෙහි [illegible] නොවනාමස් ඇති [illegible]; මංසොච කප්පි යො වුත්තො. සිහ [illegible]ආදියෙහි මස නොවන මස් නැති [illegible] මිනමොයි නොපෙනෙනා කියතලදී.

[illegible] [illegible] කැපනෝ; අකප්පංච, අකැපනෝ; භොජනං.(පැ [illegible] භුඤ්ජනො, [illegible]; තත්තා මෙත්ථ, [illegible] නම්න්නෝ; ඉමන්තිච, මේ (ගත්ව)යි (සාමාකාකො [illegible] නෝ (වචන්න්කියා) අභිනට්ටං (කායි [illegible])එලවනල

---

*[illegible] .. බදිනලද වීහුඩද බැදිධාන්‍යසුණු වචකඳ පවා රණය උපදවයි

87 ලාජ තසසතතු * භත්තානි ගොරසො සුද්ධ ඛජ්ජකො
තණ්ඩුලා භට්ඨපිට්ඨඤ්ච පුථුකා වෙළු ආදිනං.
88 භත්තං වුත්තාවසෙසානං රස යාගු රසො පිච
සුද්ධ යාගු ඵලාදීනි නාජනෙන්ති පවාරණං.

---

ද ; කප්පං, කැප (භොජන) යක්ම ; නිසෙධයං (කයින්හෝ වචසින්හෝ) වළකන්නේ ; (ප) වාරෙය්‍ය, පැවරිඅවදන්නේයි.

“කප්පිය මංසං ඛාදන්තො අකප්පිය මංසං පටික්ඛිපති නපවාරෙති කස්මා අවත්ථුතාය අකප්පිය මංසං ඛාදන්තො කප්පිය මංසං පටික්ඛිපති පවාරෙති කස්මා වත්ථුතාය යං හි තෙන පටික්ඛිත්තං තං පවාරණාය වත්ථු යම්පන ඛාදති නං කිඤ්චාපි පටික්ඛිපිතබ්බට්ඨානෙ ඨිතං ඛාදියමානං පන මංසභාවං නාජහාතිතස්මා පවාරෙති,, යත්‍ර අවුචායි

එකො අභිහටෙ සන්නෙ පවාරණභයා පන
ආකිරකිර කොට්ටෙත්වා කොට්ටෙත්වා පූරයාති ච
යචෙ වදන්ති තස්සා පි නපනත්ථි පවාරණා
ඔදනෙනෙව පුච්ඡන්තං මුඤ්ජන්තං ආගමෙහිති
ගණ්හතස්සං ඨපෙන්තස්ස නෙව තස්ස පවාරණා. †

87. 88 ලාජා, විළඳද; තසසතතු භත්තානි, ඒවිළඳයෙන්කළ හත් හාබත්ද ; ගොරසො (කිරි දි මොහොරු ගිතෙල් වෙඬරු යන) පස්ගොරසද ; සුද්ධඛජ්ජකො,(භොජනයක්හා) තුවුඳුවූකණ්ඩද ; තණ්ඩුලා, බැදී නොබැදිසාල්ද ; භට්ඨපිට්ඨඤ්ච, බැදිපිටිද ; පුථුකා, පූළුද ; (එයින්කරණලද හත්හාබත්ද ; වුත්තාවසෙසානං, සටකී සප්තවිධ ධාන්‍යයන් කෙරෙන්) අවශෙෂවූ ; වෙළු ආදිනං, හුණගස් තල්ගස් ආදින්ගේ ; භත්තං (තණ්ඩුලසඳදී යෙන්

---

පොත් - * තංඝතතු

† කැපමස්කන්නහුස් අකැපමස් පිළිකෙව් කෙරේනම් නොම පවාරණය වේයි කවරහෙයින්ද අවස්තුක බැවිනි අකැපමස්කන්නුයේ හැපමස් පිළිකෙව් කෙරේනම් පවාරණවෙයි. කවරහෙයින්ද වස්තුක බැවිනි. ඔහු විසින් යමක් වනාහි පිළිකෙව් කරණලද නම් එය පවාරණයට වස්තුවෙයි. යමක්වනාහි කානම් එය කිසි සේත් පිළිකෙව් කටයුතුතන්හි සිටියේයි. කනු ලබන්න වනාහි මංශභාවය නොහරි එහෙයින් පවාරණය වේයි.

යම් ඇතම්භික්ෂුවක් බත්අබිහැරිකල්හි පවුරුණු බියෙන් වනාහිදමව දමවයිද කොටා කොටාපුරවයිද ඉඳින්ඔහුයා නම් ඔහුටද පවාරණයක් නැත්තේයි. බතින් විචාරන්නාහු මොහොතක් නවතුවයි ගණුපිණිස නවත්වන්නාහටද පවුරුණු නොවන්නේමය.

89 පවාරිතෙන වුට්ඨාය අභුත්තෙන ච භොජනං
අතිරිත්තං න කාතබ්බං යෙන යං වා පුරෙ කතං.
90 කප්පියං ගහිතඤ්චෙව උච්චාරිතං හත්ථ පාසගං
අතිරිත්තං කරොන්තො වං අල මෙතන්ති*භාසතු.

කළ) බත්ද ; රසරසාතු (මස්නැති) රසයෙන් (පිසූ) හබුද ; රසො පිච, (මස්නැති) හුදුරසද ; සුද්ධයාගු (මංසාදිහා) නොමුසුවූයාගුද ; ඵලාදීනි, ඵලපත්තාදිහුද ; පවාරණං පැවරි ; නජනෙනති, නොඋපදවත්.

පුථුකා වා තානි කතසත්තු භත්තාදීනි වා නපවාරෙන්ති — එපෙත්වාවුත්තධඤ්ඤානං තණ්ඩුලෙ අඤ්ඤෙහි වෙළුතණ්ඩුලාදීහිවා කන්දමූල ඵලෙහි වා යෙහි කෙහිචි කතභත්තම්පි පවාරණං ජනෙති,† යනු අටුවායි.

89 පවාරිතෙන, පැවරිඅවන්නාහු විසින් ; වුට්ඨාය (අස්නෙන්) නැගීද ; භොජනං (පැවරිජනක) භොජනයක් ; අභුත්තෙන(මදකුදු) නොවැලඳුව විසින්ද ; යෙනයං පුරෙකතං, යමකු විසින් යම් භොජනයෙක් පළමු කැපකරණ ලදද ; තෙනනංවා, ඔහු විසින් ඒ භොජනයද ; අතිරිත්තංනකාතබ්බං, කැපනොකාට යුත්තේයි.

සචෙ පන එවං කප්පියං කාරාපෙත්වා භුඤ්ජන්තස්ස පුනකිඤ්චිබ්‍යඤ්ජනංවා ඛාදනීයංවා, පතෙන්ති ආකිරන්ති තෙනපඨමං කප්පියංකතං නොකාතුංනලබ්භති,, ‡ යනු අටුවායි.

90 කප්පියඤ්චෙව, කැපමවූ ; ගහිතඤ්චෙව, පිළිගත්නාලදමවූ ; උච්චාරිතඤ්චෙව, මදකුදුඔසවා හෝ බනානෝ පාතාලදමවූ ; හත්ථපාසගඤ්චෙව (දෙරියනක්වියත්) අත්පසට එලවනලදමවූ(යාවකාලිකය) අතිරිත්තං කරොන්තො, කැපකරණ මහණ ; අලමෙතං (සබ්බ) යනි අලමෙතං සබ්බංසී ; එවං මෙසේ ; භාසතු, වාක්

* අලමෙතං සබ්බන්ති

†(ඒහැල් ධාන්‍යයෙන් නිපදි) සහල්පෙති හෝ ඒසහල්පෙතියෙන් කාරණලද හත්සුනු බත් ආදිය හෝ පවාරණයනොවෙති කියනලද ධාන්‍යයන්ගේ සාල්හැර අනික්හුණ සාල්ආදිය හෝ කාදමුල් පලවලින් හෝ යම් කිසිකින් කරණලද බතද පවුරුනු උපදයි.

‡ඉදිත් වනාහි මෙසේ කැපකරවා අනුභව කරන්නාහුගේ පාත්‍රයෙහි නැවත කිසිව්‍යඤ්ජනයක් හෝ ඛාද්‍යයක් හෝ දමත්නම් යමෙක් විසින් පළමු කැපකරණ ලද්දේ නම් ඒතෙමේ (නැවත) කිරීමට නොවටී.

91 නකාරෙ*නුපසම්පන්න භණ්ඩං පෙසයිත්වාපි
කාරෙතුං ලබ්භතෙ සබ්බා භුඤ්ජිතුං සාමකාරකො

---

කාලිකාවාණි.

92 පටිග්ගහිතා චත්තාරො කාලිකා යාවකාලිකං
යාමකාලික සත්තාහ කාලිකං යාවජීවිකං.

93 පිට්ඨං මූලං ඵලං ඛජ්ජං ගොරසො ධඤ්ඤ භොජනං
යාගු සූපප්පභූතයො හොන්ති තෙ යාවකාලිකා.

94 මධු මුද්දික සාළුක චොච මොචම්බ ජම්බුජං
ඵාරුසං නාගහි සත්තන්නං පානකං යාමකාලිකං.

---

හෙදකොට කිශා වා. ගිතුරු ලුහු ඇඹු ඇඳකැපකළ බැව්තුදු අයපමස් නැතිබැව්තුදු කුලදූෂනාදින් නො උපන් බැව්තුදු කප්පියනම් වේ. අලමෙතං සබ්බන්ති එත්තිකාරං අවත්වාව අලමෙතං සබ්බං එත්තකං වත්තුං වට්ටති නතු අවුත්වාසි. අලමෙතං සබ්බාසීශ යුත්තා තිසිට්ටුවසි අලමෙතං සබ්බන්ති යුහොතිප්නොකළාවෙයි යනු විනයසඞ්නාසී.

91 අනුපසම්පන්න භණ්ඩං, අනුපසම්පන්නයාගේ අතහිබුවා ; නකාරෙ කැප නොකාරන්නේශපෙසයිත්වාපි, අන්කන්ගු අනයවාද ; කාරෙතුං, කැපකරවන්නට ; ලබ්භතෙ, වටි ; තං ඒ (කැපකළ හොජන) ය ; අකාරකො, කැපනොකළ ; සබ්බා (පැවරිඅවුත් නොඅවුත්) සියලු මහසඟහු ; භුඤ්ජිතුං වලදන්නට ; [ලබ්භතෙ] ලැබේ.

---

කාලිකාවාති, කාලිකාවයත්තෙහි ; කාලිකයොනම් :-

92 පටිග්ගහිතා, පිළිගන්නාලද ; කාලිකා, කාලිකයෝ ; යාවකාලිකං, යාවකාලිකය ; යාමකාලිකං, යාමකාලිකය ; සත්තාහකාලිකං, සත්තාහකාලිකය ; යාවජීවිකං, යාවජීවිකයයි ; චත්තාරො, සතර දෙනෙකි.

93 පිට්ඨං මූලං ඵලං ඛජ්ජං, පිටියෙන්කළ මුලින්කළ පකින්කළ කාන දැද ; ගොරසො, (කිරිදි මොහොරු. යන ත්‍රිවිධ) ගොරසද ; ධඤ්ඤභොජනං, සප්තවිධ ධාන්‍ය හා පඤ්චවිධ භොජනයද ; යාගු හඹුද ; සූප පහුතයො, සූපාදිහුද (යන) එතෙ (ඒ ඒ දේශයෙහි පියම්න් අහරකිස සපයන) මොහු ; යාවකාලිකා හොන්ති, යාවකාලිකනම් වෙති.

94 මධු, මිදෙහිසම්රසය ; මුද්දික, ඇල්පැනමැඩිම්ද ය ; සාළුක, හෝඑය ; චොච, ඇටකෙහෙල ; මොච, සෙසුකෙහෙල ;

---

* නකාරෙයය, පොත්

95 සානුලොමානි ධඤ්ඤානි ඨපෙත්වා ඵලජො රසො
මධුකපුප්ඵං අඤ්ඤත්‍ර සබ්බො පුප්ඵරසො පිච.
96 සබ්බපත්තරසො චෙව ඨපෙත්වා පක්කඩාකජං
සීතොදමද්දිතොදිච්ච පාකො වා යාමකාලිකො.
97 සප්පි නොනීත තෙලානි මධු ඵාණිත මෙවච
සත්තාහකාලිකා සප්පි යෙසං මංසඤ්ච වාරිතං.

---

අම්බ, අඹය; ජම්බුජං, දඹ (ස යනමෙ) සීත් වූද චාරුසං, බොරළු දමන (යෙන්වූ) ද ; පානකං, (අෂ්ටවිධ) පානය ; නාගගිහතා තතං, ගින්නෙන් හුණුනොකරණ ලද්දේ ; යාමකාලිකං, යාම කාලිකයි. මධුජ, නම් මීදසීයදැ ඉස හෙතෙම යව්කැලිය ඇල් පැන් වත්කොට පහරණ ලද්දේ යම්කැලි වේ. මීද ඇල්පැන මැඩපෙ රහාගත් පැන මුද්දිකපාන නම් හෝ එ කෙහෙල් ආදිවූ සෙස්සද ඇල් පැන මැඩහෝ සියදූඉස ඇල්පැන වත්කොට හෝ පහරණ ලද්දේ යම් කැලිවේ. චාරුසතති, අරිය දෙසෙ එකො රුකෙබා යනුව්තය සත්නායි.

95-96. සානුලොමානි (තව මහාඵල හා අපරණ්ණයයන) අනු ලොම්සහිතවූ ; ධඤ්ඤානි (සප්තවිධ) ධාන්‍යයන් ; ඨපෙත්වා, තබා ; ඵල ජෝරසො (සෙසුයාවකාලික) ඵලයෙන්වූ රසද ; මධුකපුප්ඵං අඤ්ඤත්‍ර, මීපුප්විය ; සබ්බොපුප්ඵ රසොපිච සියළු (යාවකාලික) මල් රසද ; පක්කඩාකජං ඨපෙත්වා. ගිවූ (යාවකාලික) පත්‍රයෙන්වූ ර සතබා, සබ්බ පත්තර සො චෙව, සියළු ; (යාවකාලික) පත්‍රයන් ගේ රසද ; සීතොද මද්දිතො, සිහිල්දියෙහි මඩනා ලද්දේ ; ආදිච පාකොවා, අව්වෙහි තබාහුණු කරණ ලද්දේහෝ නොකරණ ලද්දේ හෝ යාමකාලිකො, යාමකාලිකයි.

තාලඤ්ච නාලිකෙරඤ්ච පනසං ලබුජම්පි ච
තිපුසා ලාබු කුම්භණ්ඩී තථා පුස්සඵලම්පි ච
එව මෙලාලුකඤ්චාතිනවෙතානි ඵලානි හි
අපරණ්ණඤ්ච සබ්බම්පි සත්ත ධඤ්ඤානු ලොමිකං
යාවකාලික සත්තාන මපි සීතුදකෙ කතො
මද්දිත්වා දිච්චපාකොපි විකාලෙ පනවට්ටති *

97 සප්පි ගිතෙල ; නොනීත. වෙඬරුය ; තෙලානි තෙල්

---

* තල්ද පොල්ද පනාද දෙල්ද තියඹරාද කොමඩුද එසේම පුසුල් ඵලද මෙසේ කැකිරිද. යන මේනව (මහ) ඵලයෝද. සියලු අපරණ්ණයද. සප්තවිධ ධාන්‍යානුලොම්කොට ඇත්තේයි:

යව්කැලි පත්‍ර (යන්ගේ) සිහිල්දියෙහි මැඩකරණලද රසයද අව් වෙහිකකාලරසයද විකාල යෙහි වනාහිවට්ටි,

98 තෙලං තිලවසෙරණ්ඩ මධුසාසපසම්භවං
ඛුද්දභමරමධුකාරී මක්ඛිකාහි කතම්මධු
99 රසාදිඋච්ඡුවිකති පක්කාපක්කාව ඵාණිතං
සවත්ථුපක්කා සාමං වා වසා කාලෙ අමානුසා
අඤ්ඤඤ්ඤං නපචෙ වත්ථුං, යාවකාලිකවත්ථුනං.

---

යනමොහුද ; මධු, මීද ; ඵාණිතමෙවච, සකුරුද යනමොහුපස්දෙන ; සත්තාහකාලිකා, සප්තාහකාලිකයෝයි ; සප්පි (එහි) ගිතෙල්නම් ; යෙසං(ගොමහිසාදි) යම්සත්ව කෙනෙකුන්ගේ ; මංසං, මාංසය ; අවාරිතං, නොවලකනලදද හෙවත් කැපද ; (තෙසංසපි) ඔවුන්ගේ ගිතෙල් වෙඩරුදු එසේමැයි.

98 තිල, තලයෙන්ද ; වසා, වසායෙන්ද ; එරණ්ඩ, එරඬුඇටින්ද ; මධු, මීබියලින්ද ; සාසප, අබයෙන්ද ; සම්භවං සම්භවූයේ ; තෙලං, තෙල්නම් ; ඛුද්ද, කනවෙමැස්සහ ; භමර, බඹරමැස්සහ ; මධුකාරීමක්ඛිකාහි, දඬුවැල්බැමැස්සහ, නොහොත් මහම්මැස්සහ යනමොවුන් විසින් ; කතං, කරණලද්දේ ; මධු, මීනම්.

99 පක්කා, කකාරනලදහෝ ; අපක්කාවා, නොකකාරන ලදහෝ ; රසාදි, උක්පැත් ආදිවූ ; උච්ඡුවිකති, ඉක්ෂුවිකෘතිනොමෝ උගිත්වූයේ ; ඵාණිතං, සකුරුනම්වේ ; අමානුසා, මනුෂ්‍යවසායෙන් අන්‍යවූ ; වසා(ගොමහිසාදීන්ගේ) වසාතොමෝ ; කාලෙ පෙරවරු ; සාමං, තමාවිසින් ; සවත්ථු පක්කාවා, වස්තුව හා එක්කොට පිසහරණලද්දේ (කප්පති) සත්දවසකට වටී. යාවකාලිකවත්ථුනං, යාවකාලිකවස්තු කොටඇති ; අඤ්ඤඤ්ඤං (වසාතෛලයෙන්) අන්‍යවූ (ගිතෙල් ආදීන්)ගේ ; වත්ථුං, ක්ෂීරාදිවස්තුව, නපචෙ, නොපිසන්නේයි. මෙහි කාරණෝපචාර විසින්වසා තෛලය වසායයි කියනලදී.

අනුජානාමි භික්ඛවෙ වසානි භෙසජ්ජානි අච්ඡවසං මච්ඡවසං-පෙ-කාලෙ පටිග්ගහීතං කාලෙනිප්පක්කං කාලෙ සංසට්ඨං තෙලපරිභොගෙන පරිභුඤ්ජිතුං. * යනුමෙහි පෙළයි.
සංසට්ඨන්ති පරිස්සාවිතං.

---

* මහණෙනි කාලයෙහි පිළිගත්නාලද කාලයෙහි කකාරන ලද කාලයෙහි පෙරනලද මිනිතෙල්හැර සියලු අකැපමාංසයන්ගේ තෙල සියලුකැප මාංසයන්ගේ තෙල කිඹුල් තෙල් ඌරුතෙල කොටලුතෙල යන වසාසංඛ්‍යාත බෙහෙත්හු තෛල පරිභෝගයෙන් පරිභෝගකරන්ට අනුදනිමි.

100 හලිද්දිං සිඞ්ගිවෙරඤ්ච වචත්ථං ලසුනං වචා
උසීරං භද්දමුත්තඤ්ච තිවිසා කටුකරොහිණී
පඤ්චමූලාදිකඤ්චා'පි මූලනාමං යාවජීවිකං.
101 බිලඞ්ගං මරිචං ගොට්ඨ ඵලං පිප්ඵලි රාජිකා
තිඵලෙරණ්ඩකාදීනං ඵලනාමං යාවජීවිකං.
102 කප්පාසනිම්බකුටජ පටොලසුලසාදීනං
සූපෙය්‍යපණ්ණං වජ්ජෙත්වා පණ්ණනාමං යාවජීවිකං
103 ඨපෙත්වා උච්ඡුනිය්‍යාසං සරසං උච්ඡුජං තචං
නිය්‍යාසො ච තචො සබ්බො ලොණං ලොහං සිලා තථා.

---

100. හලිද්දිං, කහද ; සිඞ්ගිවෙරඤ්ච, ඉඟුරුද ; වචත්ථං, වජපිජබුලුද ; ලසුනං, හෙලලූනුද ; වචා, වදද ; උසීරං, සුවඳහොටද නොහොත් ලමඟද ; භද්දමුත්තඤ්ච, කම්මුතුද ; අතිවිසා, ඉවු දද ; කටුකරොහිණී, කුඹුරුනද ; පඤ්චමූලාදිකඤ්චාපි, සුලුපසමහපස මුල් ආදිදයන ; නාමමූලං, ඒ සියලුමුල් ; යාවජීවිකං, යාවජීවිකයි. වචත්ථංවජපිජබුලුහෙලි වෛජෙයෙහි, විනයසන්නයි. වචත්ථන්ති සෙතවචං, යනුසංවණ්ණිකායි.

101 බිලඞ්ගං, වලඟසාල්ද ; මරිචං ; මිරිස්ද ; ගොට්ඨඵලං, කුකුළුපත්ද ; පිප්ඵලි, වගපුල්ද; රාජිකා, අබද, නොහොත් හබද ; තිඵලං, අරළු බුළු ඇඹුලුද ; එරණ්ඩකාදිනංඵලං, එරඬු ආදීන්ගේ ඵලද යන; තං, ඒ සියල්ල ; යාවජීවිකං, යාවජීවිකයි.

102 සූපෙය්‍යපණ්ණංවජ්ජෙත්වා, සූපය ව නිඹුවූ මුඹුපලාඅෑපලාහැර; කප්පාස, කපුය; නිම්බ, කොසඹය ; කුටජ, කෙළින්දය ; පටොල, දුම්මැලය ; සුලසාදිනං, තලාය යනාදීන්ගේ ; පණ්ණං, ඒසියලුකොළ ; යාවජීවිකං, යාවජීවිකයි.

103 උච්ඡුනිය්‍යාසං, උක්ලහාටුද ; සරසං, රසසහිතවූ; උච්ඡුජං තචං, උක්පොතුද ; ඨපෙත්වා, තබා; සබ්බො, සියලු; නිය්‍යාසොච ලහටුද ; තචො, සුඹුලුද ; ලොණං, ලුණුද ; ලොහං, ලොහොද; සිලා, ගල්ද ; තථා, එසේම යාවජීවිකයි.

104 සුඛසිඞ්ඝඤ්ච, මිනැතිඕිරිද ; සෙවාලො, සෙවෙල්ද ; සුඛුම්පිතං, වනාකොවදවාදඹු කරණිලද ; යංකිඤ්චි, මහාසිංහාඅංගිසම්කිසිවෙක්ද ; ඒකවාදිපභෙදඤ්ච, මහාවිකවාදිභෙදද; යාවජීවිකං, යාවජීවිකයයි ; ඤාතබ්බං, දතයුතුයි. මලමූත්‍රාහාළ මැටි ම හාජීකාටනම්.

104 දුබ්බිනත්ථඤ්ච සෙවාලො යඤ්චඤ්ඤං සුඛාපිතං
ඒකවාදිපපභෙදඤ්ච ඤාතබ්බං යාවජීවිකං.

105 මූලං සාරං තචො ඵෙග්ගු පණ්ණං පුප්ඵං ඵලං ලතා
ආහාරට්ඨම'සාදෙන්තා තංසබ්බං යාවජීවිකං,

106 සබ්බකාලිකසම්භොගො කාලෙසබ්බස්ස කප්පති
සතිපච්චයෙ විකාලෙපි කප්පතෙ කාලිකාත්තයං,

---

ඛාමක මහාභූතෙ ඉදානාම් නාමඩණිහි නංපි දූපක්ඛාවිත මපන නාඞ්ඛතිනි, සුපක්ඛාම්තමනුභාවශිමිගි ඩුණ්ණං කාඛා ලොභෙ උපනෙතුං වට්ටතිහි * යන්නුඅට්ඨාවයි.

105 ආහාරට්ඨං, අහරත්වන ප්‍රයෝජනයෙහි අහරණිස ; අසාදෙන්තං, නොසපයන්නාවූ ; මූලං, මූලය ; සාරං, හරය ; තචො, සුඹුලය ; ඵෙග්ගු, කොවුල ; පණ්ණං, පත ; පුප්ඵං, මල ; ඵලං, ඵලය ; ලතා, වැලය යන ; තංසබ්බං, ඒ සියල්ල ; යාවජීවිකං, යාවජීවිකයි.

106 සබ්බකාලික, එදවස් පිළිගත් සියලු කාලිකයන්ගේ ; සම්භොගො, වැළඳීම ; කාලෙ, එදවස් පෙරවරු ; සබ්බස්ස, (ගිලන් නො ගිලන්) සියල්ල හට ; කප්පති, වටී (ආපත්තිජනක නොවේ,) කාලිකත්තයං, යාමකාලිකාදී තුන්කාලිකය ; පච්චයෙ සති (ඒ ඒව නිසි පිපාසාදි) කාරණයක් ඇති ; විකාලෙපි, පෙරවරු මිස අන් කල්හිදු ; කප්පතෙ, වටී (පෙරවරු හැමකල්හිම අහර පිණිස වලදත් එදවස් පිළිගත් බැවින් නොපස්චිකා වැලඳුවද ඇවැත් නොවෙයි, පූර්ව අරුණෙහිම අතිතපසච්ඡකමෙත් පස්ඡකුව ඉණි පරිභොගද නොමවේය තම්කැලි හා යවජීව්කැලි පුනාදවස් පෙරවරු රෙණ පිණිස වලදත් නොපස්චිකූවිහොත් ඇවැත්වේ. යනුමෙයි සත්නායි.

---

* දූටු මහාභූතයෙහි මෙනම්දය නොවිදෙන්යේ කියනුතුදෙ යෙක්නැත හොඳින් නොදන්නලද්ද නොවිටිනුයි ශොදවදවන ලද ම්නී ඇට පුණුකොට ලොහයෙන්බඟන්ටිටි.

107 කාලයාම මතික්කන්තා පාචිත්තිං ජනයන්ත්‍යුභො
ජනයන්ති උභොපෙතෙ අනෙනා වුත්ථඤ්ච සන්නිධිං.
108 සත්තාහකාලිකෙ සත්තඅහානි අතිනාමිතෙ
පාචිත්ති පාළිනාරූළ්හෙ සප්පි ආදිම්හි දුක්කටං.
109 නිස්සට්ඨලද්ධං මක්ඛෙය්‍ය නඞ්ගං නජ්ඣොහරෙය්‍ය ච
විකප්පෙන්තස්ස සත්තාහෙ සාමණෙරස්ස ඩිටඨිතො
මක්ඛනාදීස්ව නාපත්ති අඤ්ඤස්ස දදතොපිච.

---

107 උභො, යාවකාලික යාමකාලික දෙදෙනා; කාල, පෙරවරුව ; යාමං, ප ශ්ච ම; අතික්කන්තා, යථාක්‍රමයෙන් ඉක්මූනාහු හෙවත් ඉක්මවා වළඳනලද්දාහු ; පාචිත්තිං ජනයන්ති, පචිති ඇවැත් උපදවත් ; එතෙඋභොපි, මොහු දෙදෙනම ; අනෙනාවුත්ථඤ්ච, අසපනිළ්ළයෙනි විසීමෙන් දුකුළාද ; සන්නිධිං, දෙවන දවස් වැළඳීමෙන් සන්නිධිපචිතිද ; ජනයන්ති ; උපදවත්.

සන්නිධිකතං යංකිඤ්චි යාවකාලිකංවා යාමකාලිකංවා අජ්ඣොහරිතුකාමතාය ගණ්හන්තස්ස පටිග්ගහණෙ තාවආපත්තිදුක්කටස්ස අජ්ඣොහරතො පන එකමෙකස්මිං අජ්ඣොහාරෙ පාචිත්තියං * යනු අටුවායි.

108 සත්තාහකාලිකෙ, සප්තාහකාලිකය ; සත්තඅහානි; සත් දවස්; අතිනාමිතෙ, ඉක්මවනලද කල්හි ; පාචිත්ති. නිසගි පචිතිවෙයි ; පාළිනාරූළ්හෙ, පාළියෙහි ආරූඪනොවූ පෙළනො ආවාවූ; සප්පිආදිම්හි, මනුෂ්‍ය සප්පිආදියෙහි; දුක්කටං, සතිය ඉකුත් කල්හිදුකුලාවේ

සබ්බාකප්පියමංසානං වජ්ජෙත්වා මනුස්සමෙව ච
ඛීරං දධිඤ්ච සප්පිඤ්ච නවනීතඤ්ච වට්ටති. †

109 නිස්සට්ඨලද්ධං, නිස්සැලද ගිතෙල්ආ: අඞ්ගං සරීරයෙහි; නමක්ඛෙය්‍ය නොගාගන්නේය ; නවඅජ්ඣොහරෙය්‍ය නොවළඳන්නේයි; සත්තාහෙ, සත්දවස ඇතුලත්හී; සාමණෙරස්ස, සාමණේර

---

* පිළිගැණ එක්රැයක් ඉක්මවනලද යම් කිසි යාවකාලිකයක් හෝ යාමකාලිකයක්හෝ අනුභවකරණු කැමැත්තෙන් ගන්නාහුට පිළිගැම්මෙහි පළමුකොට දුකුළා ඇවති අනුභව කරන්නාට වනාහි එක එක ආලොපයක්පාසා පචිතියි.

† සියලු අකප මාංසයන්ගේ මස් හැරකිරිද දීද ගිතෙල්ද වෙඬරුද යහමොවිනුවටී.

110 යාවකාලිකආදීනි සංසට්ඨානි සහත්තනා
ගාහාපයන්ති සභාවං තස්මා එවමුදීරිතං.

111 පුරෙපටිග්ගහීතඤ්ච සත්තාහං යාවජීවිකං
සෙසකාලිකසම්මිස්සං පාචිත්තිපරිභුඤ්ජතො.

112 යාවකාලිකසම්මිස්ස මිතරං කාලිකත්තයං
පටිග්ගහීතං තදහු තදහෙව පරිභුඤ්ජයෙ.

113 යාමකාලිකසම්මිස්සං සෙසමෙවං විජානියං
සත්තාහකාලිකම්මිස්සඤ්ච සත්තාහං කප්පති' තර ,නති.

---

යෙක්හට ; විකප්පෙන්තස්ස ( ඉදං සප්පිං තුය්හං විකප්පෙමි, යනාදීන්) විකප්පත්නාහට්ද; මක්ඛනාදිං, අබ්භඤ්ජනාදිකොට; අධිට්ඨහතො ච, සිහිත් සලකාණුවහට්ද; අඤ්ඤස්ස, අනික් උපසම්පනක්හට; දද තොපිච ( නිරාල යව ) දෙන්නාහට්ද; අනාපත්ති, ආපත්තිනැති.

110 යාවකාලික ආදීනී, යවකැලි ආදීහු ; අත්තනාසහ, තමත්හා සමග ; සංසට්ඨානි, රසවිසින් එක්වූවවුන්; සභාවං, තම තමන්ගේ (යාවකාලිකාදි) භාවය; ගාහාපයන්ති, ගන්වත්; තස්මා, එහෙයින් ; එවමුදීරිතං, පෙළඅටුවායෙහි මෙසේයින් කියනලදී,

111 පුරෙපටිග්ගහීතං, පෙරවරු පිළිගත්නාලද ; සත්තාහඤ්ච සත්තාහකාලිකයද; යාවජීවිකං, යාවජීවිකයද; සෙසකාලික සම්මිස්සං, (එදවස් පිළිගත්) සෙසුයවකැලි යම්කැලිහා මුසුකොට ; පරිභුඤ්ජතො, වළඳත්නාහට; පාචිත්ති, සන්නිධිපාචිත්තිවේ,

112 යාවකාලිකසම්මිස්සං, යාවකාලිකය හා මුසුවූ; ඉතරං කාලිකත්තයං, අනික්තුන් කැල්ල ; තදහු පටිග්ගහීතං, එදවස් පෙරවරු පිළිගත්නාලදද ; තදහෙව, එදවස් පෙරවරුම ; පරිභුඤ්ජයෙ වළඳත්තේයි.

113 යාමකාලික සම්මිස්සං, යාමකාලිකය හාමුසුවූ ; සෙසං, අනික් සත්තාහ කාලිකය යාවජීවිකය ; එවං, මෙසේම ( යවකැලි කොට වැළඳියයුතුයයි ) විජානියං, දතයුත්තේයි ; සත්තාහකාලිකම්මිස්සං, සත්තාහ කාලිකයහා මුසුවූ ; ඉතරඤ්ච, යාවජීවිකය වනාහි ; සත්තාහං, සත්දවසකට; කප්පති, වටී.

පටිග්ගාහොහොති,

114 දාතුකාමාභිහාරො ච හත්ථපාසෙරණක්ඛමං.
තිධාදෙනෙන ද්විධාගාහො පඤ්චවඞ්ගෙනවං පටිග්ගහො.
115 අසංහාරෙ තත්ථ ජාතෙ සුඛුමෙ චිඤ්චආදිනං
පණ්ණෙණ්ණවා සය්හභාරෙ ච පටිග්ගාහො නරූහති.

---

යාවකාලිකමාහාරෙ පානකං යාමකාලිකං
සත්තාහකාලිකන්නාම සප්පිආදිමධු පඤ්චකං
ලොණම්පන හලිද්දාදිභෙසජ්ජං යාවජීවිකං
චතුධා කාලිකා වුත්තා උදකං හොති කාලිකං *

---

පටිග්ගාහොහොති, පටිග්ගාහොයන්නෙහි පිළිගැණුම්නම්.

114 දාතුකාම, දෙනුකැමත්තහුගේ; අභිහාරොච, නයීත් එළවීමද; හත්ථපාසො, දෙරියන්වියත් අත්පසබවද; එරනක්ඛමං, බලවැදුම් පුරුෂයෙකු නැගියහැකි බවද; තිධාදෙනෙන (කායය කායපටිබද්ධය නිස්සග්ගියය යන) තුන් පරිද්දෙන් දෙනකල්හී, ද්විධා (කායය කායපටිබද්ධය යන) දෙපරිද්දෙන්; ගාහො, ගැන්ම දයනා; එවං, මෙසේ; පටිග්ගාහො, පිළිගැන්ම; පඤ්චවඞ්ගො, පචඞ්ගයක් ඇත්තේයි.

115 අසංහාරෙ, තුබූතැනින් පහනොකාටහැකි එලකපාසානාදියෙහිද; තත්ථජාතෙ, රැක්ගිම හටගණ තුබූනොවූම්පත් කැහැලපත් ආදිවූපත්හිද; චිඤ්චආදිනං, සිනිබලා ආදීත්ගේ; සුඛුමෙ පණ්ණෙවා සිඳුම්පත්හිද; අසය්හභාරෙච, බලමැදුම් පුරුෂයෙකු නොනැගියහැකි භාරයෙහිද; පටිග්ගාහො, පිළිගැන්ම; නරූහති, නොනැගේයි.

---

* අහරයාවකාලිකනම් වෙයි පැන්යාමකාලිකනම්වෙයි ගිතෙල්ආදී පඤ්චක සත්තාහකාලිකනම්වෙයි ලොණකාසංදිබෙහෙත්වනානී යාවජීවිකනම්වෙයි කියා කාලිකයෝ සතර පරිද්දෙකින් කියනලද්දාහුය ජලය අකාලිකවෙයි.

116 සික්ඛාමරණලිඞ්ගෙහි අනපෙක්ඛවිසජ්ජනතො
අවෙජ්ඣ, නුපසම්පන්නදානා ගාහො පසම්මති.

117 අප්පටිග්ගහිතං සබ්බං පාචිත්තිපරිභුඤ්ජතො
ධූමඤ්ච නාතිබහලං කප්පතෙ උදකං තථා.

118 අඞ්ගලග්ගමවිච්ඡින්නං දන්තක්ඛිකණ්ණගූථකං
ලොණස්සුඛෙලසිඞ්ඝාණි සෙම්හමුත්තකරීසකං

119 ගූථමත්තිකමුත්තානි ඡාරිකඤ්ච තථාවිධෙ
සාමං ගහෙත්වා සෙවෙය්‍ය අසන්තෙ කප්පකාරකෙ.

---

භූමියං අත්ථතෙසු සුඛුමෙසු තින්තිණිකාදිපණ්ණෙසුපි පතිග්ගහණං නරුහති නහි තානි සන්ධාරෙතුං සමත්ථානි * යනු අටුවායි. සිනිඛලං පත්හිනොවටිනා සිටුවා සිනිඛලා ආදි කොළ තුරුගෙහි වටි යනු අටුවාසන්නයි.

116 සික්ඛාමරණලිඞ්ගෙහි. සික්පස්වීමෙන් කාලක්‍රියාවෙන් ලිඟුපෙරළීමෙන්ද ; අනපෙක්ඛවිසජ්ජනතො, නිරාලයව හැරපීමෙන්ද ; අවෙජ්ඣ ; පැහැර ගැනීමෙන්ද ; අනුපසම්පන්නදානා, අනුපසම්පන්නක්හට දීමෙන්ද ; ගාහො, පිළිගැනීම ; උපසම්මති, සිඳේ.

117-118. අප්පටිග්ගහිතං, නොපිළිගන්නාලද ; සබ්බං, සියලුකැලි ; පරිභුඤ්ජතො, වළඳන්නාහට ; පාචිත්ති, පචිතිවේ ; ධූමං, රජස් රෙණුනැති ; නාතිබහලං ඉතාබොල්නොවූ ; උදකඤ්ච, හිමොදකසමුද්‍රොදකාදිවනායි ; කප්පතෙ, වටී.
අඞ්ගලග්ගං, ශරීරයෙහිඇලුනාවූ ; අවිච්ඡින්නං, සියතැනින්පහනොවූ ; දන්තක්ඛිකණ්ණගූථකං, දන්තමල අක්ඛිමල කණ්ණමලද ; ලොණ,(සිරැරෙහි) නැගි එනුද ; අස්සු කඳුලුද ; ඛෙල, කෙලද ; සිඞ්ඝාණි, මුකුණුද ; සෙම්හ, සෙම්ද ; මුත්ත, මූත්‍රද ; කරීසකං අහර මලද ; තථා, එසේම ( කැප ) යි.

119 ගූථ, අහරමලද ; මත්තික, මැටිද ; මුත්තානි, මූත්‍රද ; ඡාරිකඤ්ච, හළුද ; තථාවිධෙ, එබඳුකල්හි ; මෙවන් සර්පදෂ්ටකාලයෙහි ; කප්පකාරකෙ ; පිළිගන්වනකැපකරුවන් ; අසන්තෙ, නැතිකල්හි ; සාමංගහෙත්වා, තමාමගෙණ ; සෙවෙය්‍ය, වළඳන්නේයි.

---

* බිම අතුලසිටුම් සියඹලාදි පත්‍රයන්හිද පිළිගැනීම නොනැගෙයි ඔව්හු සන්ධාරණයට අසමර්ථයෝයි.

120 දුරූපචිණ්ණෙ රජොකිණ්ණෙ අථුග්ගහපටිග්ගහෙ
අන්තොවුත්ථෙ සයංපක්කෙ අන්තොපක්කෙ ච දුක්කටං'ති,

---

## මංසෙසුච අකප්පියකථා.

121 මනුස්සහත්ථිඅස්සානං මංසං සුනඛදීපිනං
සීහව්‍යග්ඝතරච්ඡානං අච්ඡස්ස උරගස්සච.

---

චතුමහාවිකටානි අසති කප්පියකාරකෙ සාමම්පි ගහෙත්වා පරිභුඤ්ජිතුං වට්ටති එත්ථ දුබ්බලො පි අසමත්ථොපි කප්පියකාරකො අසන්තපක්ඛෙයෙව තිට්ඨති * යනුඅටුවායි.

120 දුරූපචිණ්ණෙ, නොපිළිගත් ආමිසහරිතභාජනාදි කෙළිවිසිත්අතින්පිරිමැදීමෙහිද, රජොකිණ්ණෙ, රජස්වගුලපාත්‍රානො පිළිගත්වාම අනාරගැම් මෙහිද, අථ, නැවත; උග්ගහපටිග්ගහෙ, නොපිළිගත්බව දැනදැන ගත්නාලදද නැවත පිළිගැනීමෙහිද, අන්තොවුත්ථෙ, අයපකිළිය තබා අරුණු ඉක්මවූයෙහිද; සාමංපක්කෙ, තමාපිසූයෙහිද; අන්තොපක්කෙ, අයපකිළිය ඇතුළෙහි පිසූයෙහිද, දුක්කටං, දුකුළාවේ.

---

මංසෙසුච අකප්පියනති, මංසෙසුච අකප්පියංයත් නෙහි අකප්පියමාංසනම්.

121 මනුස්සහත්ථි අස්සානං, මිනිසුන් හා ඇතුන් හා අසුන්ගේද; සුනඛදීපිනං, බල්ලන් හා දිවියන්ගේද; සීහව්‍යග්ඝතරච්ඡානං, සිංහයන් ව්‍යාඝ්‍රයන් තරසුන්ගේද; අච්ඡස්ස, වලසුන්ගේද; උරගස්සච, අපාදක දීඝජාතින්ගේද; මංසං, මාංස, නකප්පති, නොවටී.

අපාදකස්ස දීඝජාතිකස්සාති, අහිජාති, යෙව පටික්ඛිත්තා මලංකාදිමච්ඡා අපාදකාපි වට්ටන්තෙව † මලඩක ආදි යනුවිනයසන්නයි.

---

* සතරමහාවිකටයෝ කැපකරුවෙකුනැතිකල්හි තමාමගෙණ අනුභවකරන්ට වටී මෙහි-දුර්වලවූයේත් අසමර්ථ කප්පිය කාරකතෙමේත් අසන්ත පක්ෂයෙහිම සිටී.

† අපාදකස්සාදීඝජාතිකස්ස යනුයෙන් සර්පජාතීනුම ප්‍රතික්ෂෙප කරණලද්දැහ මලඩකාදිමත්ස්‍යයෝ පා නැත්තාහුද වටිත්මය.

122 උද්දිස්සකටමංසඤ්ච යඤ්ච අප්පටිවෙක්ඛිතං
ථුල්ලච්චයං මනුස්සානං මංසෙ සෙසෙසු දුක්කටං.

123 අට්ඨී'පි ලොහිතං චම්මං ලොමමෙපසං න කප්පති.
සච්චිත්තකං'ව උද්දිස්සකටං සෙසා අචිත්තකා.

"නිස්සග්ගියානී"ති.

124 අරූපියං රූපියෙන රූපියං ඉතරෙන ච
රූපියං පරිවත්තෙය්‍ය නිස්සග්ගි ඉධ රූපියං.

---

122 උද්දිස්සකටමංසඤ්ච, (පස්සභද්‍රයන් කෙරෙහි යම්කිසි වෙකු)උදෙසා මැරූ(ගොඩමස් දියෙහි)මස්ද; යං, යම් මාංසයක්; අප්පච්චෙක්ඛිතං,(කවරමස්දැයි) නොවිචාරණලද්ද (තඤ්ච, හොද;)නකප්පති, නොවටී; මනුස්සානං මංසෙ, මනුෂ්‍ය මාංසයෙහි; ථුල්ලච්චයං,ථුලැසි(වෙ)යි; සෙසෙසු,සෙසු(අවශෙෂ)මාංසයෙහි; දුක්කටං, දුකුළාවේ.

("අලං දෙවදත්ත මයා තිකොටිපරිසුද්ධං මච්ඡමංසං අනුඤ්ඤාතං අදිට්ඨං අසුතං අපරිසඞ්කිතං"* යන පාඨයෙන් උදෙසා මැරූ මත්ස්‍යයනුදු නොවටනාබව වදාළබැවින් "උද්දිස්සකටමංසඤ්ච" යන්නෙහි "ච"ශබ්දයෙන් දියෙහි මස්ද ගතයුතු,"සචෙ පන අඤ්ඤකමංසානි ජානාති පටිපුච්ඡිතබ්බං නො'ති අජානන්තෙන පන පුච්ඡිත්වා'ව ඛාදිතබ්බං"† යනු අටුවායි. දියෙහි මස් නොවටනා නැතිබැවින් පිළිවිසුම් නැති.)

123 එසං, මේ දසදෙනාගේ; අට්ඨීපි, ඇටද; ලොහිතං, ලෙහෙද; චම්මං, සම්ද; ලොමම්පි, ලොම්ද; නකප්පති, නොවටී; උද්දිස්සකටං එව; උදෙසාකළ මත්ස්‍යමාංසම; සච්චිත්තකං,සචිත්තකය; සෙසා, අවශෙෂ(මාංස)යෝ; අචිත්තකා, අචිත්තකයෝයි. (මෙහි සචිත්තකනම් ආපත්තිය මෙතැන ඇවනට හෙතුවූ මස් එලොපචාර පිසින් සචිත්තක නම්වී-මෙහි සිතනම් නාමයෝ සහ දූෂියත්හෝ උදෙසා කළබව දන්නාසිනී.)

---

"නිස්සග්ගියානී"ති, නිස්සග්ගියානි යන්නෙහි(නිසගිපචිත්තිනම්.)

125, 125 රූපියෙන, නිසගිවත්තිත්; අරූපියං, කැපවත්හා දූකුළාවත්ද; රූපියං, අකැපවත්ද නිසගිවත්ද; ඉතරෙන, අරූපිය

---

* දෙවදත්තය මවිසින් අනුදත්නාලද අදිට්ඨ අශ්‍රුත අපරිසංකිත යන ත්‍රිකොටි පරිශුද්ධ මත්ස්‍යමාංසය පමණී.

† ඉදින් වනාහි අසවල් මාංසයයි දනීනම් විචාරීම කටයුතුනැත නොදන්නහු විසින් වනාහි විචාරම අනුභවකළයුතු.

425 කහාපණෙ සජ්ඣුසිඞ්ගී වොහාරූපගමාසකං
වත්ථුමුත්තාදි ඉතරං කප්පං දුක්කටවත්ථු ච.

126 ඉමං ගහෙත්වා භුත්වා’ව ඉමං දෙහි කරා’නය
දෙමිවා’ති සමාපනෙන නිස්සග්ගි කයවික්කයෙ.

---

යෙන්; රුපියඤ්ච, නිසගිවත්ද; පරිවත්තෙනස්ස, පෙරළිහොරේ නම්; නිස්සග්ගි, නිසගි (පචිති)වේ, ඉධ, මෙහි; කහාපණෙ,(ස්වර්ණාදියෙන්කළ) කහවුණුද; සජ්ඣු, රිදීද; සිඞ්ගී, රත්රන්ද; වොහාරූපගමාසකං, (ඒ ඒ දෙශයෙහි) ව්‍යවහාරයට යන්නාවූ (ලොහාදියෙන් කළ) මාසකයද; රුපියං, රුපියනම්; වත්ථුමුත්තාදි, පිළිමුතු ආදිවූ; කප්පං දුක්කටවත්ථුච, කැපවත් දුකුළාවත්ද; ඉතරං, අරුපියනම්.

126 ඉමංගහෙත්වා, මේ(තණ්ඩුලාදිය)ගෙණ; ඉමංභුත්වා,මේ(ඔදනාදිය)කා; ඉමං දෙහිවා,මේ(වස්ත්‍රාදිය)දෙසිහෝ; ඉමංකර වා මේ(රජතපචනාදිය)කරසිහෝ; ඉමං ආනයවා, මේ(රජත්කාපසාදිය) ගෙණෙසිහෝ; දෙමිවා, (මේනට) දෙමි (තෝවනාහි මේ දේ මේ කර මේ ගෙණෙ)සිහෝ; ඉති, මෙසේ; කයවික්කයෙ සමාපනෙන, ගණු දෙනු කෘ කල්හි; නිස්සග්ගි, නිසගිපචිතිවේ.

(“අයංහි කයවික්කයො ඨපෙත්වා පඤ්ච සහධම්මිකෙ අවසෙසෙහි ගිහිපබ්බජිතෙහි අන්තමසො මාතාපිතූහි’පි සද්ධිං නවට්ටති, මාතරම්පන පිතරංවා ඉමංදෙහී’ති වදතො විඤ්ඤත්ති නහොති, ඉමං ගණ්හාහී’ති දදතො සද්ධාදෙය්‍යවිනිපාතනං න හොති, අඤ්ඤාතකං ඉමං දෙහී’ති වදතො විඤ්ඤත්ති, ඉමං ගණ්හාහී’ති දදතො සද්ධාදෙය්‍යවිනිපාතනං, ඉමිනා ඉමං දෙහී’ති කයවික්කයං ආපජ්ජතො නිස්සග්ගියං, තස්මා කප්පියභණ්ඩං පරිවත්තෙන්තෙන මාතා පිතූහි’පි සද්ධිං කයවික්කයං අඤ්ඤාතකෙහි සද්ධිං තිස්සොආපත්තියො මොචෙන්තෙන පරිවත්තෙතබ්බං,තත්‍රා’යං පරිවත්තනාවිධි—භික්ඛුස්ස පාථෙය්‍යතණ්ඩුලා හොන්ති සො අන්තරාමග්ගෙ භත්තගෙහං පුරිසං දිස්වා අම්හාකං තණ්ඩුලාඅත්ථි නච නො ඉමෙහි අත්ථො භත්තෙන පන අත්ථො’ති වදති පුරිසො තණ්ඩුලෙ ගහෙත්වා භත්තංදෙති වට්ටති තිස්සො’පි ආපත්තියො න හොන්ති අන්තමසො නිමිත්තකම්මමත්තම්පි න හොති, කස්මා, මූලස්ස අත්ථිතාය. අයං තාව පනෙතා කිං අග්ඝතී’ති පුච්ඡති ඉමං නාමා’ති වුත්තෙ පන සචෙ තස්ස කප්පියභණ්ඩං මහග්ඝං හොති එවඤ්ච නාම පරිවදති උපාසක මම ඉදං වත්ථුං මහග්ඝං තවපත්තං අඤ්ඤස්ස දෙහී’ති තාදිස්වා ඉතරො අඤ්ඤං ඵාලකම්පි දස්සාමී’ති වදති ගණ්හිතුං වට්ටති ඉදං අම්හාකං අත්ථී’ති උත්තාලක්ඛණෙ පතති. සචෙසො පනෙතා මහග්ඝො භික්ඛුනො වත්ථුං

127 අත්තනො අඤ්ඤතො ලාභං සඞ්ඝස්සඤ්ඤස්ස වා නතං
පරිනාමෙය්‍ය නිස්සග්ගි පාචිත්ති සියා'පි දුක්කටං.

---

අප්පග්ඝං පත්තසාමිකො ච'ස්ස අප්පග්ඝභාවං ජානාති පත්තො නාගගෙහෙතබ්බො මම චතුත්ථං අප්පග්ඝං නත්ථි ආවිකාතබ්බං මහග්ඝභාවං ඤත්වා චෙක්ඛුවත්වා ගණ්හන්තාති භණ්ඩං අග්ඝාපෙත්වා කාරෙතබ්බතං ආපජ්ජති සචෙ පත්තසාමිකො හොතු භන්තෙ සෙසං මම පුඤ්ඤං භවිස්සතී'ති දෙති වට්ටති'' * යනු අටුවායි.

''සකත්ථං පරභණ්ඩස්මිං පරභාත්ථඤ්ච අත්තනො,
භණ්ඩකෙපන සම්පත්තෙන නිස්සග්ගියමුදීරිතං†'')

127 සඞ්ඝස්ස, සඞ්ඝයාටහෝ; අඤ්ඤස්සවා, අනිකෙකෙකුටහෝ;

---

* මේ ගණුදෙනුව වනාහි පස්සගදැමියන්හැර සෙසු ගෘහස්ථ ප්‍රව්‍රජිතයන්හාද යටත්පිරිසෙයින් මව්පියන්හාද නොවටී, මවුටහෝ පියාටහෝ මෙය දෙවයි කියන්නාට විඤ්ඤත්තිනො වෙයි, මෙය ගණුවයි දෙන්නහුට සඞ්ඝාදෙය්‍යවිනිපාතනය නො වෙයි, නොනෑයෙකුට මෙය දෙවයි කියන්නාට විඤ්ඤත්තියි, මෙය ගණුවයි දෙන්නාහුට සඞ්ඝාදෙය්‍යවිනිපාතනය වෙයි, මෙසින් මෙය දෙවයි ගණුදෙනුවට පැමිණෙන්නාට නිසගියි, එහෙයින් කැපභාණ්ඩය පෙරලන්නාහුවිසින් මව්පියන්හා කප්පියකාරයද නොනෑයන්හා තුන් ඇවැත්ද මුදමින් පරිවර්තනයකටයුතු. එහි මේ පරිවර්තනය කරණ ආකාරයි, භික්ෂුවට මාගෝපකරණ සාල්වෙති හෙතෙම අතරමගදී බත්අතැති පුරුෂයෙක් දැක අපට සාල්ඇත මින් අපට ප්‍රයොජන නැත බතින් ප්‍රයොජනැයි කියති පුරුෂතෙමේ සාල්ගෙණ බත් දේනම් වටී, තුන්ඇවැත්ම නොවෙති, යටත් පිරිසෙයින් නිමිත්තකම්මමාත්‍රයද නොවෙයි. කුමක්හෙයින්ද, මිලදී ඇතිබැවිනි. මේ නෝ පද කොතෙක් අගීදැයි විචාරයි මේ පමණනමැයි කීකැණි වනාහි ඉදින් ඔහුගේ කැප භාණ්ඩය මහගුවේනම් උපාසකය මාගේ මේ වස්තුව මහගතා පය අනකොකුට දෙවයි ඔහු මෙසේද ප්‍රත්‍යවචනදෙයි එයසා අනිස්තෙමේ අත්තලියකුදු දෙම්යිකියයිනම් ගන්ට වටී, මෙය අපට ඇතකියනලද ලක්ෂණය පැමිණෙයි.

ඉදින් ඒපය මහග (නම්) භික්ෂුවගේ වස්තුව සුලුවග (නම්) පාසැමිතෙමේද එයගේ සුලුවග බව නොදනී (නම්) පාතොගත පුත්තේය, මා වස්තුව සුලුවගැයි කියපුත්තේයි, මහගුබව දැන වංචාකොට ගන්නේ වනාහි බඩුඅගවා කළයුතු බවට පැමිණෙයි, ඉදින් පාසැමි තෙමේ ස්වාමීනි එසේ වේවා සෙස්ස මට පින් වන්නේයයි දේනම් වටී.

† පරභාණ්ඩයෙහි ස්වකසතයද ස්වභාණ්ඩයෙහි පරකසතයද පැමිණි කල්හි නිසගි දක්වනලදී.

128 අනිස්සජ්ජිත්වා නිස්සග්ගිං පරිභුඤ්ජෙය්‍ය නාදෙය්‍ය වා,
නිස්සට්ඨං සකසඤ්ඤාය දුක්කටං අඤ්ඤථෙ'තරන්ති.

"පාචිත්තී"ති.

129 මුසාවාදෙ'මසාවාදෙ' පෙසුඤ්ඤහරණෙ තථා
පදසො ධම්මසාගාර උජ්ඣාපනකඛීයනෙ.

---

නතංලාභං, (දෙව්කොරෙන්සි වාක්හෙදවිසින්) පිරිනැමූචීවරාදී ප්‍රත්‍යය; අත්තනොවා තමහට හෝ; අඤ්ඤතොවා අනිකෙක්හට හෝ; පරිනාමෙය්‍ය, පිරිනමානම්; නිස්සග්ගී ,නිසගිපචිතිද; පාචිත්තිඤ්චාපි, සුද්ධපාචිත්තිද; දුක්කටං, දුකුලාදවේ.
("සඞ්ඝස්ස නතං ලාභං අත්තනො පරිනාමෙය්‍ය නිස්සග්ගි,අඤ්ඤතො පරිනාමෙය්‍ය පාචිත්ති,අඤ්ඤස්ස නතං ලාභං අත්තනො අඤ්ඤතොවා සඞ්ඝස්සවා පරිනාමෙය්‍ය දුක්කටං"* යි යොදනු.)

128 නිස්සග්ගිං, නිසජීයයුතු (චීවරාදී) වස්තුව; අනිස්සජ්ජිත්වා, නොනිසජා; (විනයකර්ම නොකොට;) පරිභුඤ්ජෙ, වැලඳගන්නී නම්හෝ;නිස්සට්ඨං,(විනයකර්ම පිණිස) නිසජුවා;සකසඤ්ඤාය,තමාගේය යන සිතින්; නාදෙය්‍යවා, නොදේනම්හෝ; දුක්කටං, දුකුලාවෙයි; අඤ්ඤථාවා, ඔහු සතුබව දැන දැන ලෙසයෙන් නොදේනම්; ඉතරං,ඒ භාණ්ඩයෙහි අගයවූ පරිද්දෙන් පාරාජිකාදී ඇවැත්වේ.
("මය්හං දින්නං ඉමිනාති ඉමාය සඤ්ඤාය නාදෙන්තස්ස දුක්කටං තස්ස සන්තකභාවං පන ඤත්වා ලෙසෙන අච්ඡින්දතො භණ්ඩං අග්ඝාපෙත්වා කාරෙතබ්බො,"යනුද. "මාසකෙවා ඌනමාසකෙවා දුක්කටං අතිරෙකමාසකෙවා ඌනපඤ්චමාසකෙවා ථුල්ලච්චයං පඤ්චමාසකෙවා අතිරෙකපඤ්චමාසකෙවා පාරාජිකං" † යනුද අවුළායි )

---

"පාචිත්තී"ති, පාචිත්තියත්නෙහි; (සුද්ධපාචිත්ති නමි.)
129 මුසාවාද, දැනදැන මුසාවාද කීමෙහිද; ඔමසවාදෙ, උපස

---

* සඞ්ඝයාට පිරිනැමු ලාභය තමහට පිරිනමා නම් නිසගිය, අනිකෙකුට පිරිනමානම් පචිතිය. අනිකෙකුට පිරිනැමූලාභය තමන්ටහෝ අනිකෙකුටහෝ සඞ්ඝයාටහෝ පිරිනමානම් දුකුලාය,
† මොහුපිස්න් මටදෙනලදැයි යන මේ සංඥායෙන් නොදෙන්නාහට දුකුලාවේ, ඔහු සන්තක බව වනානි දැන ව්‍යාජයෙන් සිඳින්නෙ භාණ්ඩය අගවා කටයුත්තේය. 'මස්සෙහිහෝ උනමස්සෙහිහෝ දුකුලාය, අතිරෙක මාසකයෙහිහෝ ඌන මාසකයෙහිහෝ තුලැසිය, පමමාසකයෙහිහෝ අතිරෙකපඤ්ච මාසකයෙහිහෝ පාරාජිකාය,

130 තලසත්ත්‍යඅනාදරකුක්කුච්චුප්පාදනෙසු ච
ගාමප්පවෙසනා'පුච්ඡා භොජනෙච පරම්පරා.

131 අනුද්ධරිත්වා ගමනෙ සෙය්‍යං සෙනාසනානිච
ඉත්ථීය'ද්ධාන ගමනෙ එකො'කාය නිසීදනෙ.

132 භිංසාපනාකොටනඅඤ්ඤවාද
විහෙසදුට්ඨුල්ලපකාසනාදෙ
භාසොදකෙ නිච්ඡුභනෙ විහාරා
පාචිත්තිනි වුත්තා 'නුපඛජ්ජ සායෙ.

---

පනක්හට ජාත්‍යාදීන්ගෙටාබිණීමෙහිද; පෙසුඤ්ඤකරණෙ, කෙලාම් කීමෙහිද; තථා, එසේම; පදසොධම්ම, කැටිව කියා(අනුපසපනක්හු)බණ නැදෑරීමෙහිද; සාගාර, (අනුපසපනුන්හා මාගමුන්හා) සමග එක්ගෙයි රෑ ගෙවීමෙහිද; උජ්ඣාපනක,(සම්මුතිලද මහණහු) ලාමකකොට සිතවීමෙහිද; ඛියනෙ, (ඔහුගේ)අගුණ කීමෙහිද.

130 තලසත්ති, (උපසපනක්හට දැහැවිසිතත්) අත්සත් කියවීමෙහිද; අනාදර, (ධම්මයෙහිවත් පුද්ගලයාකෙරෙහිවත්)අනාදර කිරීමෙහිද; කුක්කුච්චුප්පාදනෙසුච, (උපසපනක්හට නිකරුනෙහි) කුකුස් ඉපදවීමෙහිද; අනාපුච්ඡා, (දෙලොස්වියනෙක ඇතිමහණහු "විකාලෙගාමප්පවෙසනං ආපුච්ඡාමි"යි) නොපිළිවිස; ගාමප්පවෙසනෙ, (විකල්) ගම්වැදීමෙහිද; පරම්පරභොජනෙච, (භොජනනාමයෙන් පැවරූ පිළිවෙළම්ස නොවිකපා)උතුපටිපාටියෙන් වැළඳීමෙහිද.

(මෙහි විකපීමනම්"මය්හංභත්තං පච්චාසං තුය්හං විකප්පෙමි" යනාදීත් විකපීමයි.)

131 සෙය්‍යං, (හිසිවිලිම්කාදී දසවැදෑරුම්) සෙය්‍යාදෙ; සෙනාසනානිච, (මඤ්චපීඨාදිචතුර්විධ) සයනාසනද; අනුද්ධරිත්වා, නගානොතිබා; ගමනෙ, (යථාක්‍රමයෙන් උපචාරසීමාහා දෙකැටසනක් ඉක්මබැහැර) යාමෙහිද; ඉත්ථියා, මාගමකහාසමග (බැණගණ) අද්ධානගමනෙ, (ගම්අතුරු අඩයොජනයත) දුරුමගයාමෙහිද; එකො, හුදකලාව; එකාය, හුදකලා මාගමකහා සමග; නිසීදනෙ,(රහස්තැන) හිඳීමෙහිද,

132 භිංසාපන,(උපසපනක්හු)බැවීමෙහිද; ආකොටන,(උපසපනක්හු දැහැවිසිතින්) පැහැරීමෙහිද; අඤ්ඤවාද, (වත් ඇවැත් විසින් සඟමැද විචාලදෙයනොබා) අනිකක්කීමෙහිද; විහෙස,(එසේම විචාළදෙය නොකියා)වෙහෙසීමෙහිද; දුට්ඨුල්ල; (උපසපනක්හු අවත්) සඟවෙසෙස් ඇවැත්; පකාස, (සඞ්ඝසම්මුතිශූන්‍ය

"සමණකප්පා"ති.

133 භූතගාමසමාරම්භෙ පාචිත්ති කතකප්පියා
නඛෙනවා'ග්ගිසත්ථෙහි භාවෙ සමණකප්පියං.

---

තිච අනුපසම්පන්නක්හට) කීමෙහිද; ජාදෙ, (උපසම්පන්නක්හට) සැ ඟවීමෙහිද; හාසොදකෙ, අංගුලිපතොදකයෙන් කෙලිමහා දියෙහි කෙලිමෙහිද, විහාර, සඟරමින්; නිච්ඡුභනෙ,(රුහු ණිව උපසම්පන්නක්හු) නැගීමෙහිද;අනුපඛජ්ජ සයෙ,(උපසම්පන්නක්හු)ආස න්නයට වැද(ගැහැටවනසේ) හෙවී(ම් හිඳී) මෙහිද, පාචිත්ති වූ හතා,පච්ති ඇවැත් කියනලදී.

("භිසි චිලිමිකා භුම්මත්ථරණං උත්තරත්ථරං
තට්ටිකා චම්මඛණ්ඩො ච පච්චත්ථරණ නිසීදනා
සන්ථාරො තිණපණ්ණානං සෙය්‍යා දසවිධා සියා" *
"මඤ්චො පීඨං භිසි කොච්ඡං චතුබ්බිධංසෙනාසනං" †)

"සමණ කප්පා චා"ති, සමණකප්පාච යන්නෙහි (ශ්‍රමණව්‍යව හාරනම්.)

133 භූතගාම,(රුක්ඛලතාදී) භූතගාමයාගේ; සමාරම්භ, ඡෙදන භෙදනාදියෙන්; පාචිත්ති, පචිතිවේ; නඛෙනවා, නියෙන් හෝ; අග්ගිසත්ථෙහි, ගින්නෙන්හෝ ශස්ත්‍රයෙන්හෝ; කතක ප්පියං, කැපකරණලද්දේ; සමණකප්පියං භවෙ, ශ්‍රමණකැපනම් වන්නේයි.

("භවන්ති අහුවන්ති චා'ති, භූතා, ජායන්ති වඩ්ඪන්ති චා 'ජාතා' ව ඩ්ඪිතා චා'ති අත්ථො-ගාමො'ති රාසි. භූතානං ගාමො'ති' භූතගා මො, භූතාඑව්වා ගාමො 'භූතගාමො' පතිට්ඨිත හරිත තිණ රු ක්ඛාදීන මෙතමධිවචනං." ‡)

---

* ඇඳපුටු බිස්සද, පිරියම්කළ බිම අතුලමනා අතුරණද, බුම තුරණද, මතුතුරණද, තට්ටුවද, සම්කඩද, පසුතුරණද, නිසීදන ච්චරයද, තෘණපර්ණාස්ථරණද,යි සෙය්‍යාතොමෝ දශප්‍රකාර වන්නීය — † මඤ්චකය, පීඨකය, භිසිය, භද්‍රපීඨකය,යි සෙනසුන් චතුර්විධ වන්නේය.

‡ වෙත්නුයිහෝ වූවාහුනුයිහෝ 'භූතයෝයි, හටගණිත් වැ ඩෙත් 'ජාතයෝයි, වැඩෙනලද්දෝහුද යන අර්ථයි, ගාමයනු ස මූහයයි, හටගත්තවුන්ගේ හෙවත් වැඩුනවුන්ගේ සමූහය භූත ගාමනම්වෙයි, වැඩුනාහුමහෝ සමූහය භූතගාමනම්වෙයි, පිහි ටි නිල් තෘණවෘක්ෂයන්ට මේ නාමෙකි.

134 සමූලඛන්ධබීජග්ගඵලුබීජප්පභාවිතො
ආරම්භෙ දුක්කටං බීජං භූතගාමවියොජිතං.

135 නිබ්බත්තබීජං නොබීජමකතඤ්ඤා'පි කප්පති
කටාහබද්ධබීජානි බහිද්ධා වා'පි කාරයෙ.

136 එකාබද්ධෙසු බීජෙසු භාජනෙ වා'පි භූමියං
කතෙ ච කප්පියෙ'කස්මිං සබ්බෙසෙව කතං භවෙ.

---

134 සො, ඒ (භූතගාමය) තෙමේ; මූල, මුල් (බිජු) ය; ඛන්ධ, කඳ (බිජු)ය; බීජ, ඇට (බිජු)ය; අග්ග, කොල (බිජු)ය; ඵලුබීජ, පුරුක්බිජුය; (යන පඤ්චවිධ බීජයෙන්) පභාවිතො, වූයේයි; භූතගාමවියොජිතං, භූතගාමයෙන් වෙන්කරණලද; බීජං, බීජගාමය; ආරම්භෙ, ඡෙදනභෙදනාදියෙහි දුක්කටං, දුකුළාවේ.

("පඨමං කප්පියං කාරෙන්තී'ති භූතගාම පරිමොචනං කාරෙත්වා බීජගාමපරිමොචනත්ථං පුනපි කප්පියං කාරෙතබ්බං."*

"මූලබීජං නාම හලිද්දි සිඞ්ගිවෙරාදි–ඛන්ධ බීජං නාම අස්සත්ථනිග්‍රොධ පිලක්ඛාදි–බීජබීජං නාම පුබ්බණ්ණාපරණ්ණාදි–අග්ගබීජං නාම අජ්ජකසිඞ්ගිවෙරාදි—ඵලුබීජං නාම උච්ඡුවෙලුනලාදි" † පිලක්ඛනම්, පුලිලයි, අජ්ජකනම්, අඳුසි.)

135 නිබ්බත්තබීජං, ඇටහැර කෑහැකි චිළිකුත් අඹ කොස් ආදිද; නොබීජං, ලාඅඹපත් ආදිද; අකතකප්පාපි කප්පති, කැපනොකරණලද්දේද වටී; කටාහබද්ධබීජානි, කබල්හා එක්ව මිදුලුඇති (කපිත්ථාදි)බීජයන්; බහිද්ධාවාපි, කබල්පිටද; කාරයෙ, (කැප)කරවන්නේයි.

136 භාජනෙවා, බඳුනෙකහෝ; අපි නැවත; භූමියංවා, බිම්හෝ; එකාබද්ධෙසු, එක්බැඳීවතුබු; බීජෙසු(තිලමාසාදි) බීජයන් අතුරෙහි; එකස්මිං, එක්බීජයෙක්හිදු; කප්පියෙ කතෙ, කැපකරණලද කල්හි; සබ්බෙසෙව, සියල්ලෙහිම; කතංභවෙ, කරණලද වන්නේයි.

---

* පළමුව "කප්පියං කාරෙහි" කියා භූතගාම පරිමොචනයකරවා බීජගාම පරිමොචනය පිණිස නැවතද කැප කටයුත්තේයි.

† මූලබීජනම් කහ ඉඟුරු ආදියයි, ඛන්ධබීජනම් ඇසටු නුගපුලිලඇදියයි, බීජ බීජනම් හැල්වී ආදියහා මුං උඳු ආදියයි, අග්ග බීජයනම් අඳු ගිරිවේරාදියයි, ඵලුබීජයනම්, උක් හුණබට ආදියයි.

137 නික්ඛිත්තෙ කප්පියං කත්වා මූලපණ්ණානි ජායරුං
කප්පියං පුන කාරෙය්‍ය භූතගාමො හි සො තදා.

138 සපණ්ණා වා අපණ්ණා වා සෙවාලො දකසම්භවො
චෙතියාදීසු සෙවාලො නික්ඛන්තද්විත්තිපත්තකො
භූතගාමො'ව බීජම්පි මූලපණ්ණවිනිග්ගතෙ.

139 ඝටාදිපිට්ඨසෙවාලො මකුලං අහිඡත්තකං
දුක්කටස්සෙ'ව වත්ථූනි ඵුල්ලමබ්‍යවහාරිකං,

---

137 කප්පියංකත්වා, කැපකොට; නික්ඛිත්තෙ, තුබූ(බීජගාම)යෙහි; මූලපණ්ණානි, මුල්හා (නීල)පණ්ණයෝ; ජායරුං, උපන්නාහු නම්; පුන, නැවත; කප්පියං කාරෙය්‍ය, කැපකරවත්තේයි; සො, හෙතෙම; තදා, එකල්හි; (මුල්පත්හටගත්කල්හි) භූතගාමොහි භූතගාමමවේ.

("සචෙ පන කප්පියං කාරාපෙත්වා ඨපිතස්ස සිඞ්ගිවෙරාදිනො මූලානි සඤ්ජායන්ති උපරිභාගෙ ඡින්දිතුං වට්ටති සචෙ අංකුරෙ ජායන්ති හෙට්ඨාභාගෙ ඡින්දිතුං වට්ටති මූලෙච නීලඞ්කුරෙච ජාතෙ නවට්ටති"* යනු අටුවායි.

"මූලෙවා පණ්ණෙවා නික්ඛන්තෙ බීජගාමො'ව මූලෙච නික්ඛන්තෙ පණ්ණෙච හරිතෙ ජාතෙ භූතගාමො'ව හොති". †)

138 සපණ්ණාවා, පත් ඇතිහෝ; අපණ්ණාවා, පත් නැතිහෝ; දකසම්භවො, දියෙහි උපන්නාවූ; සෙවාලො, (නීලබීජාදි) සෙවෙල්ද; නික්ඛන්තද්විත්තිපත්තකො, නිකුත්දෙතුන්පතක් ඇති; චෙතියාදීසු සෙවාලො, චෛත්‍යාදියෙහි සෙවෙල්ද; මූලපණ්ණවිනිග්ගතෙ, මුල්හා නිල්පත් නිකුත්කල්හි; බීජම්පි, බීජගාමයද; භූතගාමොව, භූතගාමනම්වේ. (නීලබීජනම්, තලඇට පමණ සිඟින්පත්ඇති සෙවෙලි.)

139 ඝටාදිපිට්ඨසෙවාලො, කලකොතලාදිපිටසෙවෙල්ද; අහිඡත්තකං මකුලං, ඡියසතුකැකුලුද; (යනමොහු) දුක්කටස්සෙව වත්ථූනි, දුකුළාවටම වස්තූහ; ඵුල්ලං, පිපීගිය සතන; අබ්‍යවහාරිකං, අපත්‍යඞ්ග නොවේ.

---

* ඉඳින් වනාහි කැපකරවා සිහිල් ප්‍රදෙශයෙහි තබනලද ඉඟුරුආදීන්ගේ මුල් හටගණිත්නම්, මතුභාගය සිඳින්ට වටී, ඉඳින් කරටිහටගණීනම්, යටභාගය සිඳින්ට වටී, මුල්ද නිල්කරටිද හටගත්කල්හි සිඳින්ට නොවටී.

† මුල්හෝ පතුහෝ හටගත්කල්හි බීජගාමමය මුල්ද නික්මුනුකල්හි නිල් පතුද හටගත්කල්හි භූතගාමයමවේදී.

140 ලාබා නියාසජතූනි අල්ලරුක්ඛෙ විකොපයං
ගණ්හතො තස්ස පාචිත්ති ඡින්දතො වා'පි අක්ඛරං.

141 පිළෙතුං නාළිකෙරාදිං දාරුමක්කටකාදිනා
ඡින්දිතුං ගණ්ඨිකං කාතුං තිණාදිං න ච කප්පති.

142 භූතගාමං ච බීජං වා ඡින්දභින්දො'විණ්ඩි වා
ආලෙඛි විජ්ඣ පචවා නියමෙත්වා න භාසයෙ.

---

("ගෙහපමුඛපාකාරවෙදිකාචෙතියාදීසු නීලවණ්ණො සෙවාලො හොති යාව මෙ තිණ්ණි පත්තානි න සඤ්ජායන්ති තාව අග්ගබීජසංගහං ගච්ඡති පත්තෙසු ජාතෙසු පාචිත්තිවත්ථු පානීය ඝටාදීනං බහි සෙවාලො දුක්කටවත්ථු අනෙනා අබ්බොහාරිකො දන්තකට්ඨපූවාදීසු කණ්ණකම්පි අබ්බොහාරිකමෙව" *යනු අටුවාසි.)

140 අල්ලරුක්ඛෙ, නොමලරුකෙහි; ලාබා, ලාද; නියාස, ලහ වූද; ජතූනි, සතුද; විකොපයං, (රුක්සුඹුලු) කලකිරුවමින් ගණ්හතො, ගන්නාහටද; තස්ස, ඒ (නොමලරුකෙහි) අක්ඛරං ඡින්දතොවාපි, අකුරු ලියන්නාහටද; පාචිත්ති, පචිති වෙයි.

("තචංවිකොපෙත්වා" යූ බැවින් රුකසතුද පපටිකාද මල්ලහටූද රුක නොමලසුඹුලු නොකලකිරුවා මතුයෙන් ගණුත් දොස් නැති යනු අටුවාසන්නයයි.)

141 දාරුමක්කටකාදිනා, දාරුමක්කටකාදියෙන්; නාළිකෙරාදිං, පොල්ගස් ආදී; පිළෙතුං, පෙළන්නාටද; තිණාදිං, තෘණලතාදීන්; ඡින්දිතුං, සිඳිනාපිණිස හෙවත් සිඳිනසේ; ගණ්ඨිකංකාතුං, ගැට ලන්නටද; නචකප්පති, නොමවටී. (තිසුඹුකොට ඇණකවා අතුරෙනි කාටුඛච්චිත්ල ගේ දාරුමක්කට නම් යනු මෙහි සන්නයි.)

142 භූතගාමංවා, භූතගාමයහෝ; බීජංවා (භූතගාමයෙන් තොරවූ) බීජගාමයහෝ; ඡින්ද, සිඳයිහෝ; භින්ද, බිඳයිහෝ; ඔවිනාහිවා, පසිඳපියයිහෝ; ආලෙඛි, පලයිහෝ; විජ්ඣ, විදයිහෝ; පචවා, පිසයිහෝ; නියමෙත්වා, ("ඉමංරුක්ඛං ඡින්ද" යනාදීන්) නියම්කොට, නභාසයෙ, නොකියන්නේයි.

---

* ගෙසිපිල්කඩ ප්‍රාකාරවෙදිකා චෛත්‍යාදියෙහි නිල්වන්සෙවෙල්වේද යම්තාක්කල් දෙතුන්පත්‍රයන් නොහටගණීද්ද ඒ තාක් අග්‍රබීජසංග්‍රහයට යෙයි. පත්හටගත්කල්හි පචිති වස්තුව යි. පැන්කල ආදින්ගේ පිට සෙවෙල දුක්කටවස්තුයි. ඇතුලත (සෙවෙල්) ව්‍යවහාරව නැත්තේයි. දැහැටි කැවුම් ආදින්හි පුස්ද ව්‍යවහාරකොට නැත්තේය.

143 ඉමං කරොහි කප්පියං ඉමං ගණ්හ'ද මාහර
ඉමං දෙහි ඉමං සොධෙහෙ'වං වට්ටති භාසිතුන්ති.

"භූමියො"ති.

144 සම්මුති'ස්සාවනන්තා ච ගොනිසාදි ගහපති
කප්පියා භූමියො යාසු වුත්ථං පක්කඤ්ච කප්පති.

145 වාසත්ථාය කතෙ ගෙහෙ සංඝිකෙ වෙ'කසන්තකෙ
කප්පියාකුටි ලද්ධබ්බා සහසෙය්‍යප්පහොනකෙ.

146 ගෙහෙ සඞ්ඝස්ස වෙ'කස්ස කරමානෙ'ව මීරයං
පඨමිට්ඨකථම්භාදිං ඨපෙය්‍යු'ස්සාවනන්තිකා.
කප්පියකුටිං කරොම කප්පියකුටිං කරොමා'ති.

---

143 ඉමං කප්පියං කරොහි, මේ කැපකර; ඉමං ගණ්හ, මේගණු; ඉදමාහර, මේ ගෙණෙ; ඉමං දෙහි, මේදේ; ඉමං සොධෙහි, මේ සුධකරසිහෝ; එවං, මෙසේ; භාසිතුං, කියන්නට; වට්ටති, වටී.

("රුක්ඛං ඡින්ද ලතං ඡින්ද බනධමූලම්පි උද්ධර
උප්පාටෙහී'ති වත්තුම්පි වට්ටතෙ'වා'නියාමතො.
අම්බ ජම්බුම්පි නිම්බං වා ඡින්ද භින්දු'ද්ධරා'ති වා
ගණ්හෙ'ව්‍යා පන නාමම්පි වට්ටතෙ'වා'නියාමතො" *)

''භූමියොති'' භූමියො යන්නෙහි (කැපකිළිඹු නම්.)

144 යාසු, යම්කුටියෙක්හි; වුත්ථං, විසූයේද; පක්කඤ්ච, පිසූයේද; කප්පති, කැපද; (තා) කප්පියා භූමියො, (ඒ) කැපකිළිඹු; සම්මුති, සම්මුතිකුටිය; උස්සාවනන්තා ච, උස්සාවනන්තිකාකුටිය ගොනිසාදි, ගොනිසාදිකුටිය; ගහපති, ගහපතිකුටිය; යන මොහුයි.

145 වාසත්ථාය කතෙ, වසනු සඳහා කරණලද; සඞ්ඝිකෙ වා, සඟසතුහෝ; එකසන්තකෙ වා, එක් උපසපනක්හු සතුහෝ; සහසෙය්‍යප්පහොනකෙ, සහසෙය්‍යාපොහොනාවූ; ගෙහෙ, ගෙහි; කප්පියාකුටි, කැපකිළිතොමෝ; ලද්ධබ්බා ලැබියයුතුයි.

146 සඞ්ඝස්ස වා, සඟහටහෝ; එකස්ස වා, එක්උපසපනක්හට හෝ; ගෙහෙ, ගෙයක්; කරමානෙ, කරණලබනකල්හි; පඨමි

---

* රුකසිඳු වැලසිඳු අලඋදුර මූල් උත්පාටනය කරසිද අනියමින් කියත්වද වටනේමය, අඹසිඳුව දඹබිඳුව කොසඹ උදුරයි හෝ නමදගෙණ වනාහි අනියමින් (කියත්ව) වටනේමය.

147 යෙභුය්‍යෙනා'පරික්ඛිත්තො ආරාමො සකලො'පි වා
වුච්චතෙ ගොනිසාදී'ති සම්මුති සඞ්ඝසම්මතා.

148 භික්ඛුං ඨපෙත්වා අඤ්ඤෙහි දින්නො තෙසං ච සන්තකො
අත්ථාය කප්පකුටියා ගෙහො ගහපති මතො.

---

ටඨකථම්භාදිං, පළමු (කොටපිහිටුවන) උළුවැම්ආදිය "කප්පියකුටිං කරොම කප්පියකුටිං කරොමා"ති, "කප්පියකුටිං කරොම කප්පියකුටිං කරොම"යි; එවං, මෙසේ; ඊරයං, කියමින්; ඨපෙය්‍ය, පිහිටුවන්නේයි; උස්සාවනන්තිකා, (මෝතොමෝ) උස්සාවනන්තිකා (කුටි) නමු.

147 යෙභුය්‍යෙන, බොහෝසෙයින්හෝ; සකලොපිවා, සියලුහෝ; අපරික්ඛිත්තො, (වැටආදීන්) පරික්ෂෙපනොකරණලද; ආරාමො, විහාරය; ගොනිසාදීති, ගොනිසාදීනම්වැයි; වුච්චති, කියනුලැබෙයි; සඞ්ඝසම්මතා, සඞ්ඝයාවිසින් (ඤත්තිදුතිය කම්මයෙන්)සම්මත්නාලද්දී; සම්මුති, සම්මුතිකුටිනමු.

("ගොනිසාදිකා දුවිධා ආරාමගොනිසාදිකා විහාරගොනිසාදිකා'ති' තාසු යත්ථ නෙ'ව ආරාමො නසෙනාසනානි පරික්ඛිත්තානි හොන්ති අයං ආරාමගොනිසාදිකානාම, යත්ථ සෙනාසනානි සබ්බානිවා එකච්චානිවා පරික්ඛිත්තානි ආරාමො අපරික්ඛිත්තො අයං විහාරගොනිසාදිකානාම, ඉති උභයත්‍රා'පි ආරාමස්ස අපරික්ඛිත්තභාවො යෙව පමාණං" * යනු අටුවාහි.)

148 භික්ඛුංඨපෙත්වා, උපසම්පන්නභික්ෂූනබා; අඤ්ඤෙහි (සාමණෙරාදි සෙස්සවුන් විසින්; කප්පකුටියා අත්ථාය, කැපකිළිපිණිස, දින්නො ("කප්පියකුටිං දෙමපරිභුඤ්ජථ"යි කියාද; නොහොත් "කප්පියකුටිං කාතුං දෙම"යි කියාද) දෙනලදහෝ; තෙසං සන්තකොවා, ඔවුන්ම සතුහෝ; ගෙහො, ගෙය; ගහපතිමතො, ගෘහපතිකුටියයි දන්නාලදී.

---

* ආරාම ගොනිසාදිකාය විහාරගොනිසාදිකා යයි ගොනිසාදිකායෝ දෙවැදෑරුම් වන්නාහ ඔවුන් අතුරෙන් යම්තැනක ආරාමය පරික්ෂෙප නොකරණලදද සෙනාසන පරික්ෂෙප කරණලද්දෑහු නොවෙද්ද මෙ ආරාම ගොනිසාදිකානම්,යම්තැනෙක සෙනාසන සියල්ලහෝ සමහරක්හෝ පරික්ෂෙප කරණලද්දෑහුද ආරාමය පරික්ෂෙප නොකරණ ලද්දේද මේ විහාර ගොනිසාදිකානම්,.දෙතන්හිම ආරාමයාගේ පරික්ෂෙපනො කරණබවම ප්‍රමාණයි.

149 අකප්පකුටියා වුත්ථං සප්පිආදිවිමිස්සිතං
වජ්ජෙය්‍ය අන්තොවුත්ථත්තං පුරිමං කාලිකද්වයං.

150 තෙනෙහ'ව භික්ඛුනා පක්කං කප්පතෙ යාවජීවිකං
නිරාමිසං ව සත්තාහං සාමිසෙ සාමපාකතා.

151 උස්සාවනන්තිකා යෙහි ථම්භාදීහි අධිට්ඨිතා
තෙසු යෙවා'පනීතෙසු තදඤ්ඤෙසු'පි තිට්ඨති.

152 සබ්බෙසු අපනීතෙසු භවෙ ජහිතවත්ථුකා
ගොනිසාදිපරික්ඛිත්තා සෙසා ඡදනවිබ්භමා·

---

149 අකප්පකුටියා වුත්ථං, අකැපකිළියෙහි (ඇතුලෙහි) ලැගී; සප්පිආදිවිමිස්සිතං, සප්පිආදි (සත්තාහකාලික යාවජීවිකයන්) හා මුසුවූ; පුරිමං කාලිකද්වයං, පළමු දෙකැල්ල; අන්තොවුත්ථත්තං, (අයපකිළිය) ඇතුලෙහි ලැගිබවට; වජ්ජෙය්‍ය, යන්නේයි.

150 තෙනෙහෙව, ඒ(අයපකිළියෙහිම ලැගී සප්පිආදිසත්තාහ කාලිකයන්) හා එක්කොටම; භික්ඛුනා, භික්ෂුහුවිසින්; පක්කං, පිසනලද; යාවජීවිකං, යාවජීවිකය; නිරාමිසංච, ආමිසරහිතවම; සත්තාහං, සත්දවසකට; කප්පතෙ, කැපය; සාමිසෙ, ආමිසහා මුසුකල්හි; සාමපාකතා, තමාපිසූබවවේ.

151 උස්සාවනන්තිකා, උස්සාවනන්තිකා කුටිතොමෝ; යෙහි ථම්භාදීහි, යම්ටැම් ආදියකින් අධිට්ඨිතා, පිහිටුවනලදද; තෙසු අපනීතෙසු, ඒටැම්ආදින් හළුකල්හි; තදඤ්ඤෙසුපි, එයින් අන්‍යයන් කෙරෙහිදු; තිට්ඨති යෙව, සිටීමැයි.

152 සබ්බෙසු අපනීතෙසු, සියල්ලන් හළකල්හි; ජහිතවත්ථුකා භවෙ, හරණලද කුටිවස්තුඇතිවන්නීය; ගොනිසාදි, ගොනිසාදි කුටිතොමෝ; පරික්ඛිත්තා,(වැටආදින්) පරික්ෂෙපකළ කල්හි (ජහිතවස්තුකවන්නීය) සෙසා (සම්මුතිකුටිගහපති කුටියන) සෙසු දෙකිළිහු; ඡදනවිබ්භමා, සෙවෙනි විදිනීමෙන් (ජහිත වස්තුකවෙත්.)

(“ගොවනැසිමතියෙ එකිපකිච්සා මැඩිලි ඇතිහොති කිකි පරාළි ඇතිහොති පරාළි මතියෙහි එකිදෙහි ඇම්හොති නම්නාම් නොවෙසි” යනුමෙහි සන්නයි)

## “උපජ්ඣාචරියවත්තානි”ති.

153 නිස්සායු ‘පජ්ඣාචරියෙ වසමානො සුපෙසලො
දන්තකට්ඨාසනං තොයං යාගුං කාලෙ දදෙ සදා.

154 පත්තෙ වත්තං චරෙ ගාමප්පවෙසෙ ගමනා ගමෙ
ආසනෙ පාදපීඨෙච කථලොපාහණ චීවරෙ.

155 පරිභොජනපානීයෙ * වච්චපස්සාවඨානිසු
විහාරසොධනෙ වත්තං පුන පඤ්ඤපනෙ තථා.

---

(“ආරාමො පන උපඩ්ඪපරික්ඛිත්තො'පි බහිපරික්ඛිත්තො'පි පරික්ඛිත්තො යෙව නාමා'ති කුරුන්දියම්මහාපච්චරීසු වුත්තං තස්ස කප්පියකුටිං ලද්ධුං වට්ටති” † යනුඅටුවායි.)

---

“උපජ්ඣාචරියවත්තානි”ති උපජ්ඣාචරියවත්තානි යන්නෙහි (උපාධ්‍යායවත් ආචාර්‍ය්‍යවත් නම්.)

153 උපජ්ඣාචරියෙ, උපාධ්‍යායආචාර්‍ය්‍ය දෙදෙනා; නිස්සාය, නිසා; වසමානො, වසන්නාවූ; සුපෙසලො, ශික්ෂාකාමී (භික්ෂු) තෙමේ; කාලෙ, (එයට නිසි) කාලයෙහි; දන්තකට්ඨං, දැහැටි දඬුද; ආසනං, (හිඳිනා) අසුන්ද; තොයං (මුණුදියහැල්) දියද; යාගුං, කැඳද; සදා, හැමකල්හි; දදෙ, දෙන්නේයි.

154 පත්තෙ (හාඹුවැලඳූ) පාත්‍රයෙහිද; ගාමප්පවෙසෙ (ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන්) ගම්වදනාකල්හිද; ගමනෙ (පසුගමනවූ) ගම්වැදීමෙහිද; ආගමෙ, (නැවත) ඊමෙහිද; ආසනෙ (ඔවුන් හුන්) අසුනයෙහිද; පාදපීඨෙච (දෙව්) පාතබනපෝරුවෙහිද; කථලෙ, (නොදෙව් පාතබන) පෝරුවෙහිද; උපාහණවහන්හිද; චීවරෙ, සිවුරෙහිද; වත්තං චරෙ, වත්පුරන්නේයි.

155 පරිභොජනීය (බාහ්‍ය) පරිභොගජලයෙහිද; පානීයෙ, බොනපැනෙහිද, වච්චපස්සාවඨානිසු, මලකිස වටන්කිස සපයන තැන්හිද; විහාරසොධනෙ (ඔවුන් වසන) සෙනසුන්හැමදීමෙහිද; පුනපඤ්ඤපනෙ (හැඳපුටු ඈ) නැවත පැනවීමෙහිද; වත්තං, (කටයුතු)වත්ද; තථා, එසේම (පුරන්නේ)ය.

---

* භොජනීයපානීයෙසු—ඇතැම්.

† ආරාමය වනාහි අඩියක් වැටආදියෙන් අවුරණලදද පිටවැට අවුරණලදද පරික්ෂෙපකරණලදනමැයි කුරුන්දිය මහාපච්චරිය යන අටුවාදෙක්හි කියනලදී එහිදු කැපකිළියක් ලබන්ට වටී.

156 නපප්ඵොඨෙය්‍ය සොධෙන්තො පටිවාතෙච * පඞ්ගණෙ
විහාරං භික්ඛුපානීය සාමිනා සයනාසනං.

157 නහාණෙ ච නහාතස්ස රඞ්ගපාකෙ'ථ ධොවනෙ
සිබ්බනෙ චීවරෙ ථෙවෙ රජන්තො න වජෙ'ට්ඨිතෙ.

158 එකවච්චස්ස අනාපුච්ඡා පත්තංවා චීවරානිවා
නදදෙය්‍ය නගණ්හෙය්‍ය පරික්ඛාරං ච කඤ්චි යං

159 එකවච්චං පච්ඡතො කාතුං ගන්තුං වා තස්ස පච්ඡතො
පිණ්ඩපාතඤ්ච නීහාතුං නීහරාපෙතුමත්තනො.

160 කිච්චයං පරිකම්මං වා කෙසච්ඡෙදඤ්ච අත්තනො
කාරාපෙතුංච කාතුංවා අනාපුච්ඡා නවට්ටති.

---

156 විහාරං (ආචාර්‍ය්‍යඋපාධ්‍යායයන් වසන) සෙනසුන්; සොධෙන්තො භික්ඛු, හමදනාමහණ; පටිවාතෙ, උඩුසුලඟෙහිද; පඞ්ගණෙ, බොහෝදෙනා රැස්වන මිදුලෙහිද; පානීයසාමිනා පැන්සම්පයෙහිද; සයනාසනං (භූමත්ථරණාදි) සෙනසුන්; න පප්ඵොඨෙය්‍ය, නොගසන්නේයි.

157 නහාණෙ, නහණකල්හිද; නහාතස්ස නෑවහුටද; රඞ්ගපාකෙ, පඬුපිසීමෙහිද; අථ, නැවත ධොවනෙ (සිවුරු) සේදීමෙහිද; සිබ්බනෙ, ගෙත්තම් කිරීමෙහිද; (තථා, එසේම එත් පුරන්නේය;) රජන්තො, සිවුරුරදන්නේ; චීවරෙ, සිවුරෙහි; ථෙවෙ, පඬුපෙත්; අට්ඨිතෙ, නොසිටිකල්හි; නවජෙ, නොයන්නේයි.

158 එකවච්චස්ස (ආචාර්‍ය්‍යඋපාධ්‍යායයන්ට විපක්ෂ) පුද්ගලයෙකුට; පත්තංවා, පාත්‍රයක්හෝ; චීවරානිවා, සිවුරුහෝ; කඤ්චි යං පරික්ඛාරංවා, යම්කිසි පිරිකරයක්හෝ; අනාපුච්ඡා (ආචාර්‍ය්‍යඋපාධ්‍යායයන්) නොපිළිවිස; නදදෙය්‍ය (තමාගෙන්) නොදෙන්නේය; නගණ්හෙය්‍ය (ඔවුන්අතින්) නොගන්නේයි.

159 එකවච්චං (ගුරුත්ව) විපක්ෂපුද්ගලයා; පච්ඡතොකාතුං (තමහට) පසු (මහණ)කරන්නටද; තස්සපච්ඡතො, ඔහුටපසු (මහණව;)ගන්තුංවා, (තමා)යන්නටද; පිණ්ඩපාතං, පිඬු; නීහාතුංවා (ඕහට) තමාගෙණයන්නටද; අත්තනො, තමහට; නීහරාපෙතුං, ඔහුලවා ගෙන්වන්ටද.

160 කිච්චයං, (කුඩුමහත්) මෙහෙයක්හෝ; පරිකම්මංවා(හස්ත පරිකම්මාදි) පරිකම්මයක්හෝ; කෙසච්ඡෙදංවා, හිසකේ බෑවී

---

* සඞ්ගණෙ.

161 ගාමං සුසානං නිස්සීමං දිසංවා ගන්තුමිච්ඡතො
අත්තනො කිච්චයං වා'පි අනාපුච්ඡා නවට්ටති.

162 උප්පන්නං අරතිං දිට්ඨිං කුක්කුච්චං වා විනොදයෙ
කරෙය්‍ය වා'පි උස්සුක්කං සඞ්ඝා යත්තෙනස්ස කම්මසු.

163 ගිලානෙච උපට්ඨෙය්‍ය වුට්ඨානං නෙසමාගමෙ
වත්තභෙදෙන සබ්බත්‍ථ අනාදරෙන දුක්කටන්ති.

"වච්චපස්සාවඨානිකානනි."

164 නකරෙය්‍ය යථාවුඩ්ඪං වච්චං යාතානුපුබ්බියා
වච්චපස්සාව කුටියො නහාණ තිත්‍ථකෙච ලබ්භති.

මස් හෝ; අත්තනො, තමහට; කාරුපෙතුංවා (ඔහුලවා) කර වන්වද; කාතුංවා (ඕහටතමා) කරත්වද; අනාපුච්ඡා, නොපිළි විස; නවට්ටති, නොවටී.

161 ගාමං, ගමටහෝ; සුසානං සොහොනටහෝ; නිස්සීමං, සීමින්පිටතටහෝ; දිසංවා, දිසාවකට හෝ; ගන්තුමිච්ඡතො, ය නුකැමැත්තාහටද; අත්තනොකිච්චයංවාපි (ඇතුලුවෙහෙර) ත මාගේ (පාත්‍රපචනාදී) කෘත්‍යයෙක්ද; අනාපුච්ඡා, නොපිළිවිස; නවට්ටති, නොවටී.

162 උප්පන්නං, (අවාසිඋපාධ්‍යායයන්ට) උපන්; අරතිං (ශා සනයෙහි) උකටලිද; දිට්ඨිං, මිත්‍ථ්‍යාදෘෂ්ටිද; කුක්කුච්චංවා, (විනය පිළිබඳ) කුකුසක්ද; විනොදයෙ, දුරුකරන්නේසී; සඞ්ඝායත්තෙ සු, සඟහු අයත්වූ; කම්මසු (පරිවාසතජ්ජනීයාදිවූ) කර්මයෙහි; උස්සුක්කංවාපි, උත්සාහද; කරෙය්‍ය, කරන්නේසී.

163 ගිලානෙච, ගිලන්වූවන්වද; උපට්ඨෙය්‍ය, උපස්ථානක රන්නේය; නෙසං, ඔවුන්ගේ; වුට්ඨානං (රොගයෙන්) නැගීමද ආගමෙ, බලන්නේසී; සබ්බත්‍ථ (මෙකී) සියලුතන්හී; අනාදරෙ න, අනාදරවිසින්; වත්තභෙදෙන, වත් නොකිරීමෙන්; දුක්ක ටං, දුකුලාවෙයි.

"වච්චපස්සාවඨානිකානනි" වච්චපස්සාව ඨානිකං යන්නෙහි(ව ච්චකුටි පස්සාවකුටියෙහි වත්නම්.)

164 වච්චං, මලකිස; යථාවුඩ්ඪං, මහලුපිළිවෙළින්; නකරෙය්‍ය නොකරන්නේසී; වච්චපස්සාවකුටියො, වච්චපස්සාවකුටිහුද; න හාණතිත්‍ථකෙච, නාහණතොටද; යාතානුපුබ්බියා, ගියපිළිවෙළින් ලබ්භති, ලැබේ.

165 පවිසෙය්‍යු'බ්භජිත්වා නො සහසා පවිසෙය්‍ය ච
උක්කාසිත්වා වු'බ්භජෙය්‍ය පාදුකාස්වෙව සණ්ඨිතො.

166 නකරෙය්‍ය නිත්ථුනං වච්චං දන්තකට්ඨං ච ඛාදයං
වච්චපස්සාව දොණීනං නකරෙය්‍යු'භයං බහි.

167 කූපෙ කට්ඨං නපාතෙය්‍ය ඛෙළං පස්සාව දොණියා
නා'ව ලෙඛෙය්‍ය ඵරුසෙ නූහතඤ්චා පි ධොවයෙ.

168 න නික්ඛමෙය්‍ය සහසා උබ්භජිත්වා න නික්ඛමෙ
චපුචපු නාචමෙය්‍ය උකලාපඤ්ච විසොධයෙ'ති.

---

165 උබ්භජිත්වා පිටතදීම හඳනය නගාගෙණද, සහසාව, වෙලෙව්වද; නොපවිසෙය්‍ය (කුටියට) නොවදනේය; උක්කාසිත්වා (බැහැරසිට) උකැසම හෙවත් සෙම්බගාම; පවිසෙය්‍ය, වදනේය; පාදුකාස්වෙව, පාදුකාවෙහිම; සණ්ඨිතො, සිටියේ; උබ්භජෙය්‍ය, හඳනය නගත්තේයි.

166 නිත්ථුනං, තතනමින්හෝ; දන්තකට්ඨංඛාදයංවා, දැහැටි කමින්හෝ; වච්චං, ශරීරවලඤ්ජනය; නකරෙය්‍ය, නොකරන්නේයි; වච්චපස්සාවදොණීනං, වච්චදොණී පස්සාව දොණීන්ගේ බහි, පිටත; උභයං, මලමූත්‍රදෙක; නකරෙය්‍ය, නොකරන්නේයි.

("දන්තකට්ඨං ඛාදන්තෙනා'ති අයං වච්චකුටියා'පි අවච්චකුටියා'පි සබ්බත්ථෙ'ව පටික්ඛෙපො"* යනු අටුවාහි.)

167 කූපෙ, (අසූචි) කූපයෙහි; කට්ඨං (පුසන්) දඬුද; පස්සාව දොණියා, වටත්දෙන; ඛෙළං, කෙළද; නපාතෙය්‍ය, නොලන්නේය; ඵරුසෙන, කොරොස්, (පුසන්) දඬෙන්; නාවලෙඛෙය්‍ය, නොපිස්නේය; ඌහතඤ්චාපි, කෙලෙසුනුතැනුදු; ධොවයෙ, සෝදන්නේයි.

168 සහසා, වෙලෙව්වද; නනික්ඛමෙය්‍ය, නොනික්මෙන්නේය; උබ්භජිත්වා, හඳනයනගාගෙණද; ननනික්ඛමෙ, නොනික්මෙන්නේය; චපුචපුඉති, චපුචපුයනහඬඇතිකොටද; නාචමෙය්‍ය, දියනොගන්නේය; උකලාපඤ්ච, කසළද; විසොධයෙ, හමදන්නේයි.

---

* දන්තකට්ඨං ඛාදන්තෙන යනුයෙන් මේ වැසිකිළියෙහි දු නොවැසිකිළියෙහිදු හැමතැන්හිම ප්‍රතික්ෂෙපය වෙයි.

"අපුච්ඡකරණනි."

169 අනජ්ඣිට්ඨො'ව ථෙරෙන පාතිමොක්ඛං නඋද්දිසෙ
ධම්මං නකථයෙ පඤ්හං නපුච්ඡෙය්‍ය නවිස්සජෙ. *

170 අපුච්ඡිත්වා කථෙන්තස්ස † පුන වුඩ්ඪතරාගමෙ
පුන අපුච්ඡනා නත්ථි භාසනගෙ වා'නු මොදතො.

171 වසන්තොච අනාපුච්ඡා වුඩ්ඪෙනෙ'ක විහාරකෙ.
නසජ්ඣායෙය්‍ය උද්දෙසං පරිපුච්ඡංච නොදදෙ.

172 ධම්මං නභාසයෙ දීපං නකරෙ නච විජ්ඣපෙ
වාතපානං කවාටං වා විවරෙය්‍ය ථකෙය්‍ය ච.

"අපුච්ඡකරණනි" අපුච්ඡකරණං යන්නෙහි (මහලු සඟුන් පිළිවිස කිරීමනම්.)

169 ථෙරෙන; තෙරුන්විසින්; අනජ්ඣිට්ඨො, අණනොලත්තව්; පාතිමොක්ඛං, පාමොක්; නෙවඋද්දිසෙ, නොමඋසුරුවන්නේය; ධම්මං, බණ; නකථයෙ, නොකියන්නේය; පඤ්හං, පැණ; නපුච්ඡෙය්‍ය, නොපුළුවුස්නේය, නවිස්සජෙ (පුලුවුත්පැණ) නොවිසඳන්නේයි.

170 අපුච්ඡිත්වා, (තෙරුන්) පිළිවිස, කථෙන්තස්ස, කියන්නහුට; පුන, නැවත; වුඩ්ඪතරාගමෙ (හැමදෙනාට) වැඩිමහල්ලෙක්ණෙකුන් ඒමෙහි; පුන අපුච්ඡනා නත්ථි, නැවත පිළිවිස්මෙක් නැත; භාසනයෙහි, බනහි; අනුමොදනොව (දනපතීහුගේ අයැදමෙන්) අනුමෙවෙනි බණ කියන්නාහටද (අපුච්ඡනානත්ථි) පිළිවිස්මෙක් නැති.

171 වුඩ්ඪෙන, වැඩිමහල්ලන්හා; එකවිහාරකෙ, එකසෙනස්නෙහි; වසනොව වසන්නේද, අනාපුච්ඡා නොපිළිවිස; නසජ්ඣායෙය්‍ය, නොහදාරන්නේය; (නොපිරිවහන්නේය) උද්දෙසං, පෙළහෝ; පරිපුච්ඡංවා, අටුවාහෝ; නොදදෙ, නොදෙන්නේයි.

172 ධම්මං, බණ; නභාසයෙ, නොකියන්නේයි; දීපං, පහන්; නකරෙ, නොනගන්නේය; නච විජ්ඣපෙ, නොදනිවන්නේය, වාතපානං කවාටංවා, කව්ළු දොරපොහාරුද; (න) විවරෙය්‍ය නොහරණේය; (න)ථකෙය්‍යච, නොදපියන්නේයි.

* නපුච්ඡෙ නච විස්සජෙ. † කථේන්තත—පොත්.

173 එඩකාමෙ එඩකමනෙතා'පි බුද්ධෙන පරිවත්තයෙ
යෙන බුද්ධො ස සඞ්ඝාටිකණ්ණෙනෙ'තා නාඝට්ටයෙ'ති.

---

"නගෙහා"ති.

174 නගෙහා මග්ගං වජෙ භුඤ්ජෙ පිවෙ ඛාදෙ නසායයෙ
නගණ්හෙ නදදෙ නෙ'ව වන්දෙ වන්දාපයෙය්‍යවා.

175 පරිකම්මං නකාරෙය්‍ය නකරෙ පටිච්ඡාදිසු
පරිකම්මෙ දුවෙ වත්ථච්ඡාදි සබ්බත්ථ කප්පියා'ති.

---

("වාරනනාම යස්මා මහාවලඤ්ජං තස්මා තත්ථ ආපුච්ඡන කිච්චං නත්ථි සෙසානි පන උද්දෙසදානාදීනි ආපුච්ඡිත්වා'ව කාතබ්බානි" * යනු අටුවාසි.)

173 බුද්ධෙන, වැඩිමහල්ලන්හා; එඩකමෙ (එක) සන්මතහි; එඩකමනෙතාපි, සන්මත්කරත්තේද; යෙනබුද්ධො, යම් පාශ්වයෙක බුඩ්ද(තෙන) ඒ පාශ්වයෙන්;පරිවත්තයෙ (මහල්ලන්ට අභිමුඛව) නැමෙන්නේය; සො, ඒමහණ; සඞ්ඝාටිකණ්ණෙන, සිවුරුකණින්; එතං, ඒ බුඩ්ඩයා; නඝට්ටයෙ, නොපහරන්නේසි.

---

"නගෙහා"ති,නගෙහා යන්නෙහි (නගන වත්නම්.)

174 නගෙහා, නගනව; මග්ගං, මාර්ගයෙහි (ගමන්) (න) වජෙ, නොයන්නේය (න) භුඤ්ජෙ, නොවලඳන්නේය (න)පිවෙ, නොබොන්නේය (න) ඛාදෙ, නොකන්නේය; නසායයෙ, නොලොව්නේය, නගණ්හෙ, (ආමිස පිළි) නොගන්නේය; නදදෙ, (ආමිස අනුන්ට) නොදෙන්නේය;නෙව වන්දෙ, නොමවඳනේය; (නෙව) වන්දාපයෙය්‍යවා (තමාද)නොමවදවන්නේසි. (අනුන්ව දුන් නොඉවසන්නේය යුතුනි.)

175 පරිකම්මං, පිරියම්; නකාරෙය්‍ය (තමහට) නොකරවන්නේය; නකරෙ (තමාද අන්නට) නොකරන්නේය; පටිච්ඡාදිසු (උදකපටිච්ඡාදි ජනතාඝරපටිච්ඡාදි වත්) පටිච්ඡාදීන් කෙරෙහි; පරිකම්මෙ, පරිකර්මයෙහි; දුවෙ,(උදකපටිච්ඡාදි ජනතාඝර පටිච්ඡාදි, දෙදෙන; කප්පියා, කැපයෝය; වත්ථච්ඡාදි, වත්පට ච්ඡාදතොමෝ; සබ්බත්ථ(මාර්ගගමිනාදි) සියල්ලෙහිම(කප්පියා) කැපසි.

---

* මාරයනම් යම්හෙයකින් මහත් නුවර දෙරවුවෙක එහෙයින් එහිදි විචාරීම කටයුතු නැත. සෙසු උද්දෙසදානාදියෙහි වනාහි විචාරම කටයුත්තාහුය.

"නහාණකප්පො"ති.

176 නවනහායෙය්‍ය ථෙරානං පුරතො'පරිවා තථා
දදෙය්‍ය ඔතරන්තානං මග්ගමුත්තරමානකො.

177 කුඩ්ඩත්ථම්භතරුට්ටානෙ නහායමානො නඝංසයෙ
කායං ගන්ධබ්බහත්ථෙන කුරුවින්දකසුත්තියා.

---

"නහාණකප්පො"ති, නහාණකප්පො යත්නෙහි (නහණ විධි නම්.)

176 ථෙරානං, මහල්ලන්ට; පුරතො, පෙරට; නවනහායෙය්‍ය, නොම නහන්නේය; උපරිවා, උඩුහොයෙද; තථා, එසේම,(නොනහන්නේය) උත්තරමානකො (නහා දියෙන්) නැගෙන්නේ; ඔතරන්තානං (නහන්ට) බස්නාමහල්ලන්ට; මග්ගං, මග; දදෙය්‍ය දෙත්තේසි.

177. නහායමානො, නාහන්නේ; කුඩ්ඩ (උළුමුවා ගල්මුවා දැවමු වා) පව්රෙහිද; ථම්භ (නහණතොටහිඳුවූ) ටැඹද; තරු, රුක්හිද; අට්ටානෙ,අට්ටානඵලකයෙහිද; කායං, ශරීරය; නඝංසයෙ, නොගහන්නේය; ගන්ධබ්බහත්ථෙන(වඳුරත්අත්වැනි) දඬුඅතින්හෝ; කුරුවින්දකසුත්තියා, * කුරුඳුවැලයෙන්හෝ;

178. 179. මල්ලකෙන † (මොහොරුදැති සිද පිඹුම් කෙමියක් සෙසින් කළ) මල්ලකයෙන්හෝ; අඤ්ඤමඤ්ඤං සරීරෙනවා, ඔවු නොවුන් සිරුරෙන්හෝ; නඝංසයෙ (සිරුරු) නොගහන්නේය; කපාලිට්ඨක ඛණ්ඩානි, කබල්කඩහා පතුලුකඩද;වසුවට්ටිච(ඇඹ රු)පිළිවැටියද; පුථුපාණිච, හසතපරිකම්මද (අනිත් ඔවුනොවුන් පිට ඉලීමද) සබ්බෙසං, ගිලන් නොගිලන් සියල්ලන්ටම; වට්ටති, වටී;ගිලානුස්ස, ගිලන්හට;අකතමල්ලකං,දැති නොසුත් මල්ලක ය(වටී)පාසාණ, පහණය; ඵෙණ(මුදු)පෙණය;කථලා,කැබලිතිය (යනමොහු) පාදඝංසනෙ, පාගැහීමෙහි; කප්පියා, කැපයෝයි.

("අට්ඨානඵලක"නම්. පොහොරුවක්මෙන් දැවයක් සැසසුණු දුරා එහි පිට ගහා නාන්නු සදහා දැපොරු ආකාරයෙන් හිරි සිද

---

(අටුවායෙහි)*"කුරුවින්දකසුත්තියා"ති කුරුවින්දකපාසාණචුණ්ණ නිලාබාය බන්ධිත්වා කත"ගුලිකකලාපකො"වුච්චති-"කුරුවින්දක සුත්තියා"යනු කුරුවින්දකනම් පහන් සුණුලාකඩහා බැඳ කරණ ලද"ගුලිකකලාපය"යි කියනුලැබේ.

† "මල්ලකනාම" මකරදන්තකෙ ඡින්දිත්වා මල්ලකමූලසණ්ඨා නෙනකතං"මල්ලකො"වුච්චති-"මල්ලක"නම මූවරදත් සිඳ කෙ ලමල්ලාමූලසටහණින්(වටව)කළ"මල්ලකය"යි කියනුලැබේ-

178 මල්ලකෙන ‘ඛුද්දමක්ඛෙදං වා සරීරෙන නඝංසෙය
කපාලිට්ඨකඛණ්ඩානි එළුවට්ටිච වට්ටති.

179 සබ්බෙසං දුප්ඵ පාණීච ගිලානස්ස ‘කතමල්ලකං
පාසාණඵෙණකථලා කප්පියා පාදඝංසනෙ’ති.

"අවන්දියා"ති.

180 උක්ඛිත්තා’නුපසම්පන්නා නානාසංවාසකුත්ථීයො*
නාවොච ගරුකට්ඨොච පණ්ඩකොච අවන්දියා’ති.

---

නහණතොටට ගිඳුවන පොහොරුවයි." ගන්ධබ්බහත්ථ,,නම්.නාහණතොට තබන දඬුමුවා අතයි.එයින් හුණුගෙණ සිරුරුගහා නාහත්ලු. කුරුඳලාහා මුසුකොට ලකවැලිසෙයින් වටා කඳුරුමල් පෙළ සෙයින් අවුනා පිටගහා නහනී මෙ"කුරුඳුවැල"නම්.)

---

"අවන්දියා"ති, අවන්දියායත්තෙනි (පුවතත්හුවිසින් නොවැන්ද යුත්තෝනම්.)

180 උක්ඛිත්තා, උකෙව්ණි කම් ලදුයේද; අනුපසම්පන්නා, අනුපසම්පන්නද; නානාසංවාසකුත්ථියො(ලද්ධි)නානාසංවාසකය මාගමය (යනමොහු) ද; නවොච (නමහට) සගමහණද; ගරුකට්ඨොච, ගරුකසඨද; පණ්ඩකොච, පණ්ඩකද (යනමොහු) අවන්දියා, නොවැඳියයුත්තෝයි.

(පරිවාසපූරණාදිවිසින් සඟවෙසෙසට පිළියම් කෙරෙමින් සිටියේ,, ගරුකට්ඨ,, නම්. නික්ඛිත්තවත්තයාද පරිවාසාදී සමාදන් නොවූයේද මෙහි"ගරුකට්ඨ"නම්.නොවේ.

† "ආපත්තියා අදස්සනෙ තථා අප්පටිකම්මකෙ,
උක්ඛිත්තකො අනිස්සග්ගෙනා පාපිකායච දිට්ඨියා.
අබ්භානාමානත්තාරහා මූලාය පටිකස්සකො
පාරිවාසිකමානත්තා ච'පි'මෙ ගරුකට්ඨකා"

---

* උක්ඛිත්තානුපසම්පන්නනානාසංවාසකුත්ථියො-

† ඇවත නොදැක්ම නිමිත්තකොටගෙණද. එසේම (ඇවතට) පිළියම් නොකිරීම නිමිත්තකොටගෙණ උක්ඛෙපණීයකම්මයකරණලද්දේද, ලාමකවූදෘෂ්ටියනොහරණේද,අබ්භානයටහා මානත්ව සුදුස්සෝ(දෙදෙන)ද.මූලායපටිකස්සන කම්මය කරණලද භික්ෂුවද, පිරිවෙස්මානත් පුරන්නාහු (දෙදෙන)ද,යන මොහුතුම් ගරුඇවැත් වත් අටදෙනා වෙති.

“චම්මන්ති.”

181 මිගාජෙළකචම්මානි කප්පන්ති පරිභුඤ්ජිතුං
රොහිතෙණිපසද, ච කුරුඞ්ගා මිගජාතිකා.

182 අනුඤ්ඤාතත්තයා අඤ්ඤං චම්මං දුක්කටවත්ථුකං
ථවිකොපාහනෙ, චම්මා සබ්බං කප්පති මානුසන්ති.

“උපාහනාචෙවා”ති.

183 මජ්ඣදෙසෙ නකප්පන්ති ගණඞ්ගණූපාහනා නවා
සබ්බස්ස කප්පන්තා'රාමෙ සබ්බත්ථා'කල්ලකස්ස ච.

184 සබ්බනීලකඔදාතපීතලොහිතකණ්හකා
මහාරඞ්ගමහානාමරඞ්ගරත්තාචු'පාහනා.

---

“චම්මන්ති, චම්මං යන්නෙහි (කැපඅකැප සම්නම්)

181 මිග, මුවන්ගේද; අජ, එළුවන්ගේද; එළක, තිරළුවන්ගේද; චම්මානි, චර්මයෝ; පරිභුඤ්ජිතුං (මඤ්චපීඨාදියෙහි) අතුට ගිඳිනට; කප්පන්ති, වටිත්; රොහිතෙණිපසද,ච, රොහිතය එණිය පසදය (යනමොහුද) කුරුඞ්ගා, කුරඟයෝද; මිගජාතිකා, මෘගජාතිහූයි (පසදයෝ නම් තිත්මුවෝයි.)

182 අනුඤ්ඤාතත්තයා, අනුදන්නාලද තුන්සම්පිස; අඤ්ඤං චම්මං, සෙසුසම්; දුක්කටවත්ථුකං, දුකුළාවන; ථවික (ශකාසිපසිඈ) පසියෙහිද; උපාහනෙ, වහන්හිද; අමානුසං, මිනිස්සම්හැර; සබ්බං චම්මං, සියළුසම්; කප්පති, වටී.

“උපාහනාචෙවා”ති, උපාහනාචෙවයන්නෙහි(කැපඅකැප වහන්නම්.)

183 නවා, අලුත්වූ(එකවරෙකද පය නොලූ)ගණඞ්ගණූපාහනා, සතරපට ඈ බොහෝ පට ඇති වහන්හූ, මජ්ඣදෙසෙ, මැදුම්පියස්හි; නකප්පන්ති, නොවටිත්; සබ්බස්ස (මධ්‍යදෙශයෙහිදු ප්‍රත්‍යන්තදෙශයෙහිදු ගිලන්නොගිලන්) සියල්ලන්හට; ආරාමෙ, අඩ්‍යාරාමයෙහි; කප්පන්ති, වටිති; අකල්ලකස්සච, ගිලන්හටවනාහි; සබ්බත්ථ(ග්‍රාමය විහාරය යන)හැමතැන්හිම (වටිත්.)

(මෙයින් එකවරෙකද පය ලා අනුභව කළ පරණ වහන් මධ්‍යදෙශයෙහි කැපසේද අලුත් වහණුදු පරණ වහණුදු ප්‍රත්‍යන්තදෙශයෙහි කැපසේද කියූද වෙත්.)

184 සබ්බනීලක, හැම නිල්වූ; ඔදාත(හැම) සුදුවූ; පීත (හැම) රන්වන්වූ; ලොහිත,(හැම)රත්වූ; කණ්හකා,(හැම)කලුවූ;(වහන්දෑ)මහාරඞ්ග, රත්වායන් පිටපැහැසේ; මහානාමරඞ්ග, තුනුපිඩුම්පෙති පැහැසේ රත්තා, රත්වූ; උපාහනාච, වහන්ද.

185 සබ්බමඤ්ජිට්ඨිකා චිත්‍රා නීලපීතාදිවට්ටිකා
තිත්තිරපත්තිකා මෙණ්ඩඅජවිසාණවට්ටිකා.

186 බලලබද්ධා පූටබද්ධා තූලපුණ්ණාචු'පාහණා
පාළිගුණ්ඨිමකා මොරපිඤ්ඡපරිසිබ්බිතා.

187 විච්ඡිකාළිකතා සීහව්‍යග්ඝුද්දාජිනදීපිනා
මජ්ජාරකාලකොලූකචම්මෙහිච පරික්ඛටා,
පාදුකාසංකමනීයා කොච්ඡි ධාරෙය්‍ය දුක්කටං.

188 නීලාදිවණ්ණං සකලං පුඤ්ඡිත්වාවෙ'කදෙසකං,
උපාහණා වලඤ්ජෙය්‍ය හාරෙත්වා බලලකාදිකානි.

---

185 සබ්බමඤ්ජිට්ඨිකා,සියලු මදටවන් වහන්ද;චිත්‍රා(මාලාකම්ම ලතාකම්මයෙන්) විසිතුරුවහන්ද, නීලපීතාදිවට්ටිකා, නිල්වන් රන්වන් ඈ වැටි(වර)ඇතිවහන්ද; තිත්තිරපත්තිකා, තිතුරුපත පිටපැහැ බඳු වර ඇති වහන්ද;මෙණ්ඩඅජවිසාණවට්ටිකා,මැඩෙලුවන් තිරලුවන් අංවැනි වැටි(වර)ඇතිවහන්ද.

186 බලලබද්ධා, විලුඹ වසා සිටිනා වහන්ද;පූටබද්ධා, කකුලෙහි පටන් සියලු පග වසා සිටිනා තැලිවහන්ද;තූලපුණ්ණා,උපාහණාව, පුළුන්, පිරූ වහන්ද; පාලිගුණ්ඨිමකා, පිටිපතුල් වසා සිටිනා වහන්ද; මොරපිඤ්ඡන පරිසිබ්බිතා, මොණර පිල් ඈ පිළිවියින් වටා ගිවනලද වහන්ද.

("බලලබද්ධා"ති පණ්හි පිධානත්ථං තලෙ බලලං බන්ධිත්වා කතා. "පූටබද්ධා"ති යොනකඋපාහණා වුච්චති. යාව ජඞ්ඝතො සබ්බපාදං පටිච්ඡාදෙති. "පාළිගුණ්ඨිමා"ති පලිගුණ්ඨිත්වා කතා. උපරිපාදමත්තමෙව පටිච්ඡාදෙති, "මොරපිඤ්ඡන පරිසිබ්බිතා"ති තලෙසුවා වද්ධෙසුවා මොරපිඤ්ඡෙහි සුත්තකසදිසෙහි පරිසිබ්බිතා" * යනුඅටුවායි )

187 විච්ඡිකාලිකතා,නෝහුස්සත් නඟුටුවැනි වර ඇති වහන්ද; සීහ, සිංහය; ව්‍යග්ඝ, ව්‍යාඝ්‍රයහ; උද්ද, සවායහ; අජිනදීපිනං, අඳුන්දිවියහ යනමොවුගේ(චම්මයෙන්ද)මජ්ජාර, බලල්හු; කාලක, ලේනහු; උලූක, පියාබලල්හු යනමොවුන්ගේ; චම්මෙහිච, චම්මයෙන්ද;පරික්ඛටා, සිසාරා ගිවනලද වහන්ද;සංකමනීයා(පය ලා)සක්මන්කටහැකිවූ;පාදුකා, වහන්ද;කොච්(ශිලත් නොශිලත් යම්)කිසි මහණෙක්;ධාරෙය්‍ය,පය්ලා වැලඳගණීනම්; දුක්කටං, දුකුලාවේ.

188 නීලාදිවණ්ණං, නිලාදිවණීණය; සකලංවා, සියල්ලහෝ;

---

* මෙහි අරුත් පහත පේණ පෙලපාඨයන්හයෙන් ප්‍රකාශයි.

"අනොලොකියන්ති."

189 සාරෙත්තා ඉත්ථියා යොනිං මුඛංවා භික්ඛුදසියා,
පරස්ස පත්තං උජ්ඣානසඤ්ඤීවා අත්තනො මුඛං.
ආදාසෙ උදපත්තෙවා ඔලොකෙය්‍ය'ස්ස * දුක්කටන්ති.

එකදෙසකංවා, එකදෙශයක්හෝ; පුඤ්ජිත්වා, පිසද; බල්ලකාදිකං, විලුම්වසාසිටිනබල්ලකාදීං; හාරෙත්වා,(සියල්ල) හැර; උපාහණං-වහන්; වලඤ්ජෙය්‍ය, වැලඳගන්නේයි ("බල්ලකාදිකං"යන් නෙහි "ආදි" ශබ්දයෙන් තිත්තිරපත්තික මෙණ්ඩක අජ විසාණ වට්ටික උපාහණද ගතයුතු.)

("න භික්ඛවෙ බල්ලබද්ධා උපාහණා ධාරෙතබ්බා—න පුටබද්ධා—න පාළිගුණ්ඨිමා—න තූලපුණ්ණිකා—න තිත්තිරපත්තිකා—න මෙණ්ඩවිසාණවට්ටිකා—න අජවිසාණවට්ටිකා—න විච්ඡිකාළිකා—න මොරපිඤ්ඡපරිසිබ්බිතා—න චිත්‍රා උපාහණා ධාරෙතබ්බා යොධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස" † යනුපෙළයි.)

"අනොලොකියන්ති" අනොලොකියං යන්නෙහි (මහණුන් විසින් නොබැලිය යුත්තදෙයනම්.)

189 සාරෙත්තා, සාරත්තව(රාගීන් ඇතිව); ඉත්ථියා,(තදහුජතද වූ)මාගමගේ; යොනිං, දියවුනුමගහෝ; භික්ඛුදසියා, බික්දෙත්නියගේ; මුඛංවා, මුහුණහෝ; උජ්ඣානසඤ්ඤී, කිපිසිත්ඇතිව; පරස්සපත්තංවා, මෙරමා(වලඳන)පාත්‍රයහෝ; ආදාසෙ, ආදශීතලයෙහිද; උදපත්තෙ, උදපාත්‍රයෙහිද; අත්තනොමුඛං, තමාමුහුණහෝ; ඔලොකෙය්‍ය (යම්මහණෙක්) බලානම්; අස්ස, ඔහට; දුක්කටං, දුකුළාවේ.

("සචෙ'පි පටසතං නිවත්ථා හොති පුරතො පච්ඡතොවා ඨත්වා ඉමස්මිං නාමො'කාසෙ නිමිත්තන්ති උපනිජ්ඣායන්තස්ස දුක්ක

* ඔලොකෙන්තස්ස.

† මහණෙනි (විලුඔවැහෙන්නු පිණිස තෙලෙහි) කුලබැඳ කරණලද වහන්ද, (ජංඝාවපටන් සියලු පාදය වැසෙනසේ කරණලද)යොන් වහන්ද,(මතුපාදමාත්‍රයම වැහෙන ජංඝාව නොවැහෙනසේ) හාත්පස වසාකලවහන්ද, පුලුන්පිරූවහන්ද, තිතුරු පත්පිට පැහැබඳු වරඇති වහන්ද, මැඩෙලුවන් අං වැනි වැටි ඇති වහන්ද, තිරෙලුවන් අං වැනි වැටි ඇති වහන්ද, ගෝනුස්සන් නගුටු වැනි වරඇති වහන්ද,(තෙලෙහිහෝ වැප්යෙහිහෝ හූල්වැනි)මොණරපිළින් මහණලද වහන්ද, (මාලා කම්මලතා කම්මයෙන්) විසිතුරු වහන්ද, නොදැරියයුත්තේය. යමෙක් දරනම් කුඩුලාවක්හුගේ(නොහොත්)දුකුළාවක්සම්බන්ධවූ ඇවැති.

“අඤ්ජනී”ති.

190 වට්ටාට්ඨසොළසංසා වා මට්ඨා වට්ටති අඤ්ජනී,
තිස්සො'පි මූලෙ ගීවායං ලෙඛා එකා'ව බන්ධිතුං.

191 යංකිඤ්චි රූපං මාලාදිකම්මං මකරදන්තකං,
ගොමුත්තකාඩ්ඪචන්දාදිවිකාරං නෙ'ත්ථ වට්ටති.

192 ලබ්භ'කවණ්ණසුත්තෙන සිබ්බිතුං ථවිකා තථා.
සිපාටිකුඤ්චිකා කොසා සලාකා'පි අවිත්තිකා.

---

ටමෙව. අනිච්ඡන්ගාමදාරිකං නිම්මිතං උපනිජ්ඣායන්තස්ස පන කිමෙව වත්තබ්බං. තිරච්ඡානගතානම්පි නිමිත්තෙ එසෙව නයො. ඉත්ථිවා හොතු පුරිසොවා භික්ඛාදානසමයෙ මුඛං නඋල්ලොකෙතබ්බං”* යනුඅටුවායි.)

(“එයිබටදියටිව දෙව්යටිව බලනුසුහට තිරචනී එකතියෙහි ගරහන වෙළෙඳුන් විසිනි බොජුම්නි භුනු පුපපු බැලියනොලැබෙයි” යනු මෙහි සන්නයි—මුහුණපෑනෙන ලොහභාජනාදී “ආදාස” යන්නෙහිම ගැණෙයි. හඹුහුණුකෑද ඇ “උදපතෙන” යන්නෙහිම ගැණේ.)

“අඤ්ජනී”ති,අඤ්ජනී යන්නෙහි (අඳුන්නලනම්.)

190 වට්ට, වටහෝ; අට්ඨසොළසංසාවා, අටැස්හෝ සොළොසැස්හෝ; මට්ඨා, මාලාකම්මාදි විකාරරහිතවූ; අඤ්ජනී, අඳුන්නල; වට්ටති, වටී; මූලෙ, පත්ලෙහි; තීසොපි ලෙඛා, තුන්රේඛාකෙණෙක්ද; (වට්ටන්ති, වටිත්)බන්ධිතුං, පියනබඳිනාපිණිස; ගීවාය, කර; එකාවලෙඛා, එකම්රේඛාවක් (වට්ටති, වටී.)

(“උජුකමෙව පන චතුරස්සා වා අට්ඨංසා වා සොළසංසා වා අඤ්ජනී වට්ටති” †යනුඅටුවා බැවින් “වා” ශබ්දයෙන් සිව්රැස් අඤ්ජනියද ගතයුතු.)

191 යංකිඤ්චිරූපං, (පක්ෂිරූපාදි) යම්කිසිරූපයක්ද; මාලාදික්ම්මං, මාලාදිකම්ද; මකරදන්තකං, මෝරදතිද; ගොමුත්තක, ගොමුනුවංකය; අඩ්ඪචන්දාදි, අඩසඳය යනාදිවූ; විකාරං, (නොයෙක්)විකාරද; එත්ථ, මේඅඤ්ජනියෙහි; නවට්ටති, නොවටී.

192 ථවිකා, අඳුන්පසිය; එකවණ්ණසුත්තෙන, එක්පැහැඇති

---

* ඉඳින් පිළිසියයක් ගැඬි ස්ත්‍රියක් විද ඉදිරියෙන්හෝ පසුවෙන්හෝ සිට ස්ත්‍රීඅඞ්ගය මෙනම් අවකාශයෙහියයි සලකන්නහුට දුකුලාමයි. නොහැඳ ගම්දැරියකගේ අඞ්ගය සලකන්නහුට වනාහි කිය යුතුකිම. තිරශ්චීනගතයන්ගේ නිමිත්තෙහිදු මෙවනයයි. ස්ත්‍රියක්හෝ පුරුෂයෙක්හෝ වේවා භික්ෂාදානකාලයෙහි මූව නොබැලියයුතුයි.

† සෘජුව වනාහි සතරැස්වූහෝ අටැස්වූහෝ සොළොසැස්වූහෝ අඳුන්නල වටී.

193 සංඛනාභිවිසාණට්ඨිනළදන්තමයා තථා,
ඵලකට්ඨමයා වෙළුලාබු ලොහමයා'පිච.

194 අඤ්ජනියො සලාකායො ධූමනෙත්තාච ලබ්භරෙ,
තථා ජත්තකදණ්ඩානි * නත්‍ථුදානාච තම්මයා'නි.

---

"අකප්පියානි සයනානි"ති.

195 ආසන්දි තූලි පල්ලඞ්කො පටිකං ගොනචිත්තකං,
පටලි විකති උද්දලොමි එකන්තලොමිකා.

196 කුත්තං කොසෙය්‍යකට්ටිස්සං හත්‍ථිඅස්සරථත්ථරා,
අජිනප්පවෙණි † කදලිමිගප්පවරඅත්‍ථතං.‡

---

හුයිත්; සිබ්බිතුං, මිදිනට; ලබ්භා, වටි; සිපාටිකුඤ්චිකා කොසා, කරබියලි කෙසිපයි (දෙකද;) තථා, එසේමැයි; සලාකාපි, අඳුන් ලහද; අචිත්තකා, විසිතුරුනොවී(ලබ්භං)වටි.

193 සංඛනාභි, සක්නැබමුවාවූ; විසාණ, අංමුවාවූ; අට්ඨි, ඇට මුවාවූ; නල, රණහුනමුවාවූ; දන්තමයා, දළමුවාවූද; තථා, එ සේම; ඵලකට්ඨමයා, ඵලකමුවාවූ දඬුමුවාවූද; වෙළු, හුණමුවාවූ; ලාබු, ලාමුවාවූ; ලොහමයාපිච, ලොහොමුවාවූද.

194 අඤ්ජනියො, අඳුන්නළද; සලාකායො, අඳුන්ලහද; ධූම නෙත්තාච, දුම්නැලිද යන මොහු; ලබ්භරෙ, වටිත්; ජත්තක දණ්ඩානි, සැත්මිටිද; නත්‍ථුදානාච, නැහොරුද; තම්මයා, ඒ (සං ඛනාභිවිසාණාදි) මයවූවාහු; තථා, එසේම වටිත්. ("නනි වත් ලා වටූ සැත්දඬු දුඩබඳු අඳුන් නැලිජු නොම වටියෙත්" යනු විනය සන්නයි.)

---

"අකප්පියානි සයනානි"ති, අකප්පියානි සයනානි යත්නෙහි (උසසුන් මහඅසුන් විසින් අකැප හෝනා හිඳිනා දැනම්.)

165 ආසන්දි, පමණ ඉකුත් දික් හගලා දුටුද; තූලි, තිලීද; ප ල්ලඞ්කො, (ඇරුහිඳුවූ ව්‍යාළරූපඇති) පලඟද; පටිකං, ලොම් මුවානෙළ ඇතිරිද; ගොන, සතරඟුලෙන් දික්ලොම්ඇති ඇති රිද; චිත්තකං, චීමෙත් විසිතුරු ඇතිරිද; පටලී, ඝණපුප් ඇතිරි ද; විකති, සිංහාදිරූපයෙන් විසිතුරු ඇතිරිද; උද්දලොම්, එකපි පිටෙක ලොම්ඇති ඇතිරිද; එකන්තලොමිකා, දෙපිටලොම්ඇ ති ඇතිරිද.

196 කුත්තං, මාගමුන් සොළොස්දෙනෙකු සිට නැටියහැකි

---

* සත්‍ථක දණ්ඩානි. † ජිනප්පවෙණි-පොත්.
‡ මිගපවරපච්චත්‍ථරණතං-මිගප්පවරඅත්‍ථරා-පොත්

197 සලොහිතවිතානකඤ්ච'භතො රත්තූපධානකං,
අකප්පියානි එතානි දත්වා'පි පරිභුඤ්ජතො.

198 අසනාදීනතයා සෙසෙ ලබ්භතෙ ගිහිසන්තකෙ,
ධම්මාසනෙච භත්තගෙහ ඝරෙචා'පි නිසීදිතුං,
භූම්මත්ථරණසංඛෙපෙ සයිතුඤ්චා'පි කප්පති.

199 චතුරංසපීඨා සත්තඞ්ගා පඤ්චඞ්ගා උච්චපාදකා,
තූලොනද්ධා ඝරෙයෙව මඤ්චපීඨා නිසීදිතුං.

---

අවත් මහ ඇතිරිද; කොසෙය්‍ය, රත්කසුකම් කළ හිඟිරිපසතර ණද; කටිස්සං,රත්කසුකම් කොට කැටිහිඟිරිගුසීත් කළ පසතර ණද; හත්ථිඅස්සරථත්ථර, ඇතුත්පිට අසුත්පිට රථයෙහි අතුරණ ඇතිරිද; අජිනප්පවෙණි, (හැදපම්ණකොට ගිවනලද) අඳුන් දි වි සමින්; කදලිමිගපවර, උතුම් කෙහෙල් මුව සම් පසතරණින් අත්ථතං, අතුරණලද්දේද.

197 සලොහිතවිතානඤ්ච, රත්වියන් ඇත්තේද; උභතො, දෙපාශ්වයෙහි,හෙවත් හිස්පෑරපාමුල; රත්තූපධානකං,රත්කත් වයින් ඇත්තේදයන; එතානි, මේ සයනාසනයෝ;අකප්පියානි,අ කපයහ;පරිභුඤ්ජතො,අනුභවකරන්නාහට;දුක්කටං, දුකුළාවේ.

198 අසනාදීනතයා සෙසෙ, ආසඤ්ඡාදිතුනීන් අන්‍යවූ; ගිහිස න්තකෙ, ගිහිසන්තක (වූ සයනාසන) යෙහිද; ධම්මාසනෙච, ධ ර්මාසනයෙහිද; භත්තගෙහ, බතැගෙහිද; ඝරෙවාපි, ගිහිගෙයිද (පනවනලදකල්හි;) නිසීදිතුං, හිඳිනට; ලබ්භතෙ, වටී; භූම්මත් ථරණසංඛෙපෙ, බූමිතුරුණුකොට පනවනලද කල්හි; සයිතුඤ්චා පි (තමාගේ කැප ඇතිරියක් ඒ මත්තෙහි ලා) හෝනටද; කප්ප ති, කැපයි.

("භත්තගෙහෙච, බත් ඇගෙහිජු වෙහෙරෙහි දිවයි පිරිවෙසන තැන්හි එවි බොජුනු හැළුිහි එව්" යනු මෙහි සන්නයි.
"අනුජානාමි භික්ඛවෙ පච්චත්ථරිත්වා නිපජ්ජිතුනානි වුත්ත තතා පරිභණ්ඩකතං භූමිංවා භූම්මත්ථරණසෙනාසනංවා සඞ්ඝි කං මඤ්චපීඨංවා අත්තනො සන්තකෙන පච්චත්ථරණෙන පච්ච ත්ථරිත්වා'ච නිපජ්ජිතබ්බං" * යනු අටුවායි.)

199 උච්චපාදකා, වඩුරියන් උස්පාඇති; චතුරංසපීඨා, චතුරං

---

* මහණෙනි පසතුරුණු ලා වැදහෝනට අනුදනිමි යි වදාළ බැව්න් පිරිබඩුකළ බිමහෝ බූමතුරුණුවත් සෙනසුනහෝ සඟ සතු ඇඳපුටුවහෝ තමාසතු පසතරණින් පසුතුරම වැදහොව් යයුත්තේය.

200 චොළවාකුණ්ණපණ්ණානං තිණානඤ්චෙ'ව පූරිතා,
චිවරවජ්ජියො පඤ්ච භිසී සබ්බත්‍ථ කප්පියා.

201 තූලත්තයං භිසිගබ්භා ලොමානි මිගපක්ඛිනං,
බිබ්බොහනෙ අනුඤ්ඤාතං තූලවජ්ජං මසූරකෙ.

---

සපීඨයෝ; සත්තඞ්ගා, (තුන්පසවැනතුවෙහෙළි හා සතරපා විසින්)සත්අඟක් ඇත්තාහුද; පඤ්චඞ්ගා(පිටිපසවැනතුවෙහෙල්ලහා සතරපා විසින්) පස්අඟක් ඇත්තාහුද; කප්පන්ති, වටිත්; තූලොනද්ධා, පුලුන්එවැවලදනාලද; මඤ්චපීඨා, වචපීඨයෝ; ඝරෙයෙව, ගිහිගෙයිම; නිසීදිතුං, හිඳිනට(වටිත්).

("සත්තාඞ්ගො, නාම තිසු දිසාසු අපස්සයං කත්වා කතමඤ්චො. අයම්පි පමාණාතික්කන්තො වට්ටති" * යුබැවින් සත්තාඞ්ග පඤ්චාඞ්ග මඤ්චද වඩුරියනිත් උස් පා ඇත්තේ වටී.

"අනුජානාමි භික්ඛවෙ ඔනද්ධං මඤ්චං ඔනද්ධං පීඨන්ති වචනතො පන චම්මාදීහි ඔනද්ධං මඤ්චපීඨං වට්ටති" †)

200 චොළ, කඩින්ද; වාක, වැහැරෙන්ද; උණ්ණ, ලොම්න්ද; පණ්ණානං, පතින්ද; තිණානඤ්චෙව, තණයෙන්ද; පූරිතා, පුරණලද; චිවරවජ්ජියො, සිව්රුකඩම ජව්කොටඇති; පඤ්චභිසී, පස්විධ භිසිහු; සබ්බත්‍ථ(මඤ්චපීඨභත්තාදී) හැමතැන්හිම; කප්පියා, කැපයෝයි.

201 තූලත්තයං(රුක්ඛතූල ලතාතූල පොටකිතූලයන)තුන්පුලුන්ද; චොළගබ්භා, චොළ(වාකාදි පඤ්චවිධ භිසි)ගර්භද; මිගපක්ඛීනං(සිංහාදි)චතුස්පදයන්හා(හන්ස මයූරාදි)පක්ෂීන්ගේ; ලොමානි, ලොමයෝද, (යන මේ සියල්ල;)බිම්බොහනෙ, කන්වගිනෙහි; අනුඤ්ඤාතා, අනුදන්නාලද; මසූරකෙ, සමින් කළ භිසිආදියෙහි; තූලවජ්ජං, තූලයහැර(සෙස්සඅනුදන්නාලදී.)

‡("රුක්ඛතූලන්ති" සිඹලිරුක්ඛාදීනං යෙසං කෙසඤ්චි රුක්ඛා

---

* සත්තාඞ්ගනම් තුන් දිශාවන්හි අපසයකොට කළ ඇඳයි. මේද ප්‍රමාණාතික්‍රාන්තවූයේ වටී.

† මහණෙනි අවනද්ධ මැසිත් අවනද්ධ පුටුත් අනුදනිමි යන වචනින් වනාහි චර්මාදියෙන් අවනද්ධවූ මඤ්චපීඨ වටී.

‡ "රුක්ඛතූලං" යනු ඉඹුල්රුක් ඈ යම්කිසි වෘක්ෂයන්ගේ පුලුන, "ලතාතූලං" යනු කිරිවැල් ආදී යම් කිසි වැල්ජාතින්ගේ පුලුන, "පොටකීතූලං" යනු පොටකී තෘණආදිවූ යම්කිසි තෘණජාතීන්ගේ යටත් පිරිසෙයින් උක්නල ආදීන්ගේද පුලුන, නොගිලනාට ශීර්ෂූපධානයත් පාදූපධානයත් යන දෙකම වටී. ගිලනාට බිම්බොහණයත් අතුරා මතු පසතුරුණු ලා වැදහෝනාට වටී.

**202** මනුස්සලොමමුණ්ණායං පණ්ණෙ පුප්ඵං තමාලකං,
සුද්ධං න ආසනඤ්චෙව ලබ්භමප්පච්චවෙක්ඛිතං.

---

නං තූලං, "ලතාතූලන්ති" ඛීරවල්ලිආදීනං යාසං කාසඤ්චි වල්ලීනං තූලං, "පොටකීතූලන්ති" පොටකීතිණාදීනං යෙසං කෙසඤ්චි තිණජාතිකානං අන්තමසො උච්ඡුනළාදීනම්පි තූලං"යනු දු. "අගිලානස්ස සීසූපධානඤ්ච පාදූපධානඤ්චා'ති වසමෙව වට්ටති. ගිලානස්ස බිම්බොහනානි සන්ථරිත්වා උපරි පච්චත්ථරණං දත්වා නිපජ්ජිතුම්පි වට්ටත්" යනු අටුවායි.

"බිසිබිබ්බොහනට අනුජනී පර්වණ කී එව පමණ ඉකිතහොති කොට්ටකන්වයි නිකට නොලැබෙයි යම් කවර් එව පමණ්යිම කරණී"යනු මෙහිසන්නයි.

"තිරියං මුට්ඨිරතනං හොති බිම්බොහනම්මිතං,
දීඝතොහි දියඩ්ඪං වා විහත්ථිනාති කුරුන්දියං." *)

**202** උණ්ණායං, ලොම්බිස්සෙහි; මනුස්සලොමං, මිනිස්ලොම්ද; පණ්ණෙ, කොලබිස්සෙහි; පුප්ඵං (පුවගුමල් මුහුණමල් ආදිවූ) මල්ද; සුද්ධං, අම්ශුවූ; තමාලකං, තමලුපත්ද; අප්පච්චවෙක්ඛිතං, අපරීක්ෂිතවූ (අත්ගගා විමසනු නොලද); ආසනංචෙව (පිඩාම් ඈ අතුරණලද)ආසනයද; නලබ්භං නොවටී.

("අප්පච්චවෙක්ඛිතන්ති" එත්ථ කීදිසං ආසනං පච්චවෙක්ඛිතබ්බං කීදිසං නපච්චවෙක්ඛිතබ්බං, යං සුද්ධං ආසනමෙව හොති අපච්චත්ථරණකං යඤ්ච අගන්ත්වා සීතානං පස්සතං යෙව අත්ථරියති තං නපච්චවෙක්ඛිතබ්බං නිසීදිතුං වට්ටති, යම්පි මනුස්සා සයං හත්ථෙන අක්කමිත්වා ඉධ භන්තෙ නිසීදථා'ති දෙන්ති තස්මිම්පි වට්ටති, සචෙ'පි පඨමමෙව අගන්ත්වා පච්ඡා උද්ධංවා අධොවා සංකමන්ති පච්චවෙක්ඛණ කිච්චනත්ථි'යම්පි තනුකෙන වත්ථෙන යථාතලං දිස්සති එවං පටිච්ඡන්නං හොති තස්මිම්පි පච්චවෙක්ඛණකිච්චං නත්ථි'යම්පි පටිගචෙච'ව පාවාර කොජවකාදීහි අත්ථතං හොති තං හත්ථෙන පරාමසිත්වා සල්ලක්ඛෙත්වා නිසීදිතබ්බං, මහාපච්චරියම්පන ඝණසාටකෙනා'පි අත්ථතෙ යස්මිං වලිතං පඤ්ඤායති තං නපච්චවෙක්ඛිතබ්බන්ති වුත්තං" † යනුඅටුවායි.)

---

* බිම්බොහණ ප්‍රමාණය සරස මිට්රියනක් වෙයි දිගින්වනාහි එක්වියත්හමාරක් වෙයි කුරුන්දියඅටුවායෙහි දෙවියතාකැයි(කියනා ලදි).

† "අප්පච්චවෙක්ඛිතං" යන මෙහි කෙබඳු ආසනයක් පිළිවිකියයුත්තේද කෙබඳු (ආසනයක්) නොපිළිවිකියයුත්තේද (යත්) යම් සුද්ධවූ ආසනයක් පසතුරුණු රහිතමවේද යම්ආසනයක් අවුත් බලාසිටියදීම අතුරණුලැබේද එය නොපිළිවිකිය යුත්තේය

"සමානාසනිකො'පිවා"ති.

203 තිවස්සන්තර'බ්භුඤ්ඤාතං භික්ඛූනමෙකමාසනං,
සත්තවස්සතිවස්සෙහි පඤ්චවස්සො නිසීදති.

204 ඨපෙත්වා පණ්ඩකං ඉත්ථිං උභතොබ්‍යඤ්ජනං මුනි,
දීඝාසනෙ අනුඤ්ඤාසි සබ්බෙහෙ'ව නිසීදිතුං.

205 අනන්තා දීඝාසනං තිණ්ණං යා පහොති නිසීදිතුං,
මඤ්චකෙවා'පි පීඨෙවා විනානා ලබ්භා නිසීදිතුන්ති.

---

"සමානාසනිකොපිවා"ති, සමානාසනිකොපිව යන්නෙහි (එක අස්නෙහි හිඳුනුත්තෝ නම්)

203 භික්ඛූනං, භික්ෂූන්ට; තිවස්සන්තරා, තුන්වසක් ඇතුලෙහි; එකමාසනං, එකාසනය; අනුඤ්ඤාතං අනුදන්නාලදී (එසේම) පඤ්චවස්සො, පස්වසක්ඇති මහණ; සත්තවස්ස, සත්වසක් ඇත්තවුන්හාද; තිවස්සෙහි, තුන්වසක් ඇතියවුන්හාද, සමඟ; නිසීදති(එකඅස්නෙන්)හිඳී.

204 මුනි, සර්වඥතෙම; පණ්ඩකං, පණ්ඩකයාද; ඉත්ථිං, මාගමද, උභතොබ්‍යඤ්ජනං, උභතොබ්‍යඤ්ජනකයාද; ඨපෙත්වා,තබා; සබ්බෙහෙව(සමානාසනික අසමානාසනික)සියල්ලන්හාම එක්ව; දීඝාසනෙ, දිගඅස්නෙහි; නිසීදිතුං, හිඳිනට; අනුඤ්ඤාසි, අනුදනී.

205 යා, යම්අස්නක්; තිණ්ණං, තුන්දෙනෙකුට; නිසීදිතුං, (පලක් බැද)හිඳිනට;පහොති, සෑහේද,තං, ඒ; අනන්තං දීඝාසනං, පශ්චිම දීඝාසනය නම් වේ; මඤ්චකෙවාපි, හැදහෝ; පීඨෙවා, පුටුවෙහිහෝ; නිසීදිතුං, හිඳිනට; විනානා,(සමානාසනික)දෙන්නෙකුට; ලබ්භං, වටී.

---

"අසංවාසිකොවා"ති, අසංවාසිකොවියන්නෙහි(එක කම්මාදී සංවාසයට නොනිස්සෝ නම්.)

---

හිඳිනට වටී, යම් ආසනයක් මනුෂ්‍යයෝ අනිත්මැඩ පහත්කොට ස්වාමීනි මෙහි වැඩහිඳිව්යයි දෙද්ද එහිදවටි, ඉදිත්පලමුවම අවුත් පසුව උඩහෝ යටහෝ සක්මන් කරද්ද පිළිවිසුත් කටයුත් තක් නැත,යම් ආසනයක් යම්සේ තලය දක්නේද එසේ තුනීව තකින්වසනලද්දේ වේද එහිදූ පිළිවිසුත් කටයුත්තක් නැත, යම් ආසනයක් පලමුකොටම උතුරුසලු කොඳුපලස් ආදියෙන් අතුරණලද වේනම් එය අනින් පරාමශිනය කොට සලකා හිඳියයුතු. මහාපච්චරිය අටුවාවෙහි වනාහි ඝණවස්ත්‍රයකින්නුදු අතුරණලද යම් ආසනයෙක්හි රැලි පෙණෙන්නුලැබේනම් එය නොපිළිවිකිය යුතුයයි කියනලදී.

"අසංවාසිකොමා"ති.

206 උක්ඛිත්තා'නුපසම්පන්නා භික්ඛුනී ජිනාහමූලකො,
නානාසංවාසනිස්සීමට්ඨිතවෙහාසසණ්ඨිතො.
එකාදස අභබ්බාච අසංවාසා'ති දීපිතා ති.

"කම්මනානි"

207 වග්ගෙන අධම්මකම්මං සමග්ගෙන අධම්මිකං,
වග්ගෙන ධම්මකම්මඤ්ච සමග්ගෙන ච ධම්මිකං,
චතුත්ථං යෙව'නුඤ්ඤාතං සෙසකම්මෙසු දුක්කටං.

206 උක්ඛිත්තා, උක්ෂෙප්ත් කම් කරණලද්දෙද; අනුපසම්පන්නා, උපසම්පන්නොනොවූයේද; භික්ඛුනී, මෙහෙනද; ජිනාහමූලකො, පරිජීඅවත්ද; නානාසංවාස,(ලබ්ධි) නානාසංවාසකද; නිස්සීමට්ඨිත, සීමින්බැහැර සිටියේද; වෙහාසසණ්ඨිතො, අකාසයෙහි සිටියේද; එකාදස අභබ්බාච, එකොළොස් අභව්‍ය පුද්ගලයෝද; අසංවාසාති, අසංවාසහයි; දීපිතා, දක්වනලදහු.

("කම්මුනා ලද්ධිසීමාහි නානාසංවාසකා තයො
උක්ඛිත්තො තිවිධො කම්මනානාසංවාසකො මතො.
අධම්මවාදිපක්ඛස්මිං නිසින්නො'ව විචිනායං,
ධම්මවාදිපන්නෙ'තෙ'ති උප්පන්නෙ පන මානසෙ.
නානාසංවාසකො නාම ලද්ධියා යං පකාසිතො,
තත්‍රට්ඨො පන සො ඒනහං කම්මං කොපෙති සඞ්ඝිකං.
බහිසීමගතො සීමා නානාසංවාසකො මතො,
නානාසංවාසකා එවං තයො වුත්තා මහෙසිනා".*)

("ලද්ධිනානාසංවාසක"යන්නෙහි ලබ්ධිනම් ධම්මවාදීහයි ගත් සිත)

"කම්මනානි" කම්මං යන්නෙහි (චතුර්විධ කම්මනම්.)

207 වග්ගෙන, වර්ගසඞ්ඝයා විසින් කරණ; අධම්මකම්මං, අධර්මකර්මයද; සමග්ගෙන, සමගිසඞ්ඝයා විසින් (කරණ)අධර්මී

* කම්මයෙන්ද ලබ්ධිසීමා දෙකින්ද නානාසංවාසකයෝ තුන්දෙනෙක් වෙති. තුන්වැදෑරුම්වූ උක්ෂෙපණීයකර්මය කරණලද්දේ කර්මනානාසංවාසකයයි දන්නාලදී-විචිධසිත් සිතමින් අධර්මවාදීන්ගේ පක්ෂයෙහි හුන්නේම මොව්හුවනාහි ධර්මවාදීහු යයි සිතඋපන් කල්හි වනාහි—මේ තෙම ලබ්ධියෙන් නානා සංවාසකනමැති ප්‍රකාශකරණලදී, හෙතෙම වනාහි ඒ (අධර්මවාදී පක්ෂයෙ)හි සිටියේ දෙපක්ෂයගේ සංඝයා විසින් කටයුතුවූකර්මය කොපකෙරෙයි—සීමාවෙන් පිටසිටියේ සීමානානාසංවාසක යයි දන්නාලදී මෙසේ නානාසංවාසකයෝ තුන්දෙනෙක් මහර්ෂීවූ බුදුන් විසින් වදාරණලදහු.

208 චතුවග්ගා පඤ්චවග්ගා දසවීසතිවග්ගිකො,
අතිරෙකවීසතිවග්ගා පඤ්චසඞ්ඝා විභාවිතා.

209 චතුවග්ගාව අබ්භානූපසම්පදපවාරණං,
පඤ්චවග්ගාව අබ්භානං මජ්ඣදෙසූපසම්පදං.

210 දස වග්ගා'ව අබ්භානං ඨපෙත්වා සබ්බකම්මිකො,
ඉතරො සබ්බකම්මෙසු කම්මප්පත්තා'ති දීපිතො.

211 චතුවග්ගෙන කත්තබ්බෙ චත්තාරො පකතත්තකා,
කම්මප්පත්තා පරෙ ඡන්දාරහා සෙසෙ'ප්‍යයං නයො.

---

කං, අධර්මකර්මයද; වග්ගෙන, වර්ගසඞ්ඝයා විසින්(කරණ)ධම්ම කම්මඤ්ච, ධර්මකර්මයද; සමග්ගෙන, සමග්‍රසඞ්ඝයා විසින්(කර ණ)ධම්මිකඤ්ච, ධර්මකර්මයදැයි(කර්මසතරක්වේ) චතුත්ථංයෙව, සතරවනකර්මයම; අනුඤ්ඤාතං, අනුදන්නාලද; සෙසකම්මෙසු, සෙසු(තුන්)කර්මයෙහි; දුක්කටං, දුකුළාවේ.

208 චතුවග්ගා, චතුර්වර්ගසඞ්ඝයාද; පඤ්චවග්ගා, පඤ්චවර්ග සඞ්ඝයාද; දසවීසතිවග්ගිකො, දශවර්ගසඞ්ඝය විංශතිවර්ගස ඞ්ඝය; අතිරෙකවීසතිවග්ගා, අතිරෙකවිංශතිවර්ගසඞ්ඝය ය න පඤ්චසඞ්ඝා, සඞ්ඝපස්දෙනෙක්; විභාවිතා, විභාගකොට; දක්වනලදහු.

චතුවග්ගා(එනි) චතුර්වර්ගසඞ්ඝතෙමේ; අබ්භානඤ්ච, අබ්භා නකර්මයද; උපසම්පදං, උපසම්පදකර්මයද; පවාරණං, පවාරණු ද; පඤ්චවග්ගා, පඤ්චවර්ගසඞ්ඝතෙමේ; අබ්භානඤ්ච, අබ්භාන කර්මයද; මජ්ඣදෙසූපසම්පදං; මධ්‍යදෙශයෙහි උපසම්පදාද; දසවග්ගා, දශවර්ගසඞ්ඝතෙමේ; අබ්භානංච, අබ්භානකර්මයම; ඨපෙත්වා, තබා; සබ්බකම්මිකො, (සියලුකර්මයෙහි) කර්මප්‍රාප්ත ය; ඉතරො, විංශතිවර්ග අතිරෙක විංශතිවර්ග සඞ්ඝතෙමේ; සබ්බ කම්මෙසු, සියලු (සඞ්ඝ)කර්මයෙහි; කම්මප්පත්තොති, කර්මප්‍රා ප්තයයි(කර්මයට නිසියයි)දීපිතො, දක්වනලදී.

(විසිවනසඟුන් විසින් සියලු සඞ්ඝකර්ම සිද්ධවතුදු අසිරා විසිවග සඟුන් ගැම්ම චතුවග්ගාදි සඟුන් විසින් කටයුතු කර්ම අතිරෙ කයන් විසින් කටගැකිසේ ඌනයන් විසින් නොකොට හැකිසේ දක්වනු පිණිසයයි දතයුතු.)

211 චතුවග්ගෙන, චතුර්වර්ග සඞ්ඝයා විසින්; කත්තබ්බෙ, කට යුතුකර්මයෙහි; පකතත්තකා (පරිජිනොඅවත් උක්ෂෙපිනි කර් නොලද නාත්සංවැසි නොවූ බැවින්) පුවතත්වූ; චත්තාරො, සත ර දෙනෙක්; කම්මප්පත්තා, කර්මයට යොග්‍යහ; අපරෙ (එකසි

212 චතුවග්ගාදිකත්තබ්බං අසංවාසකම්මාරහං,
පරිවාසාදිකම්මඤ්ච ගරුකට්ඨෙස්වඤ්ඤතරං,
කත්වා'ව ගණපූරකං කතං කුප්පඤ්ච දුක්කටං.

213 අධම්මකම්මං වාරෙය්‍ය අනන්තරායෙ දුවෙ තයො,
දිට්ඨාවිකම්මෙකො'ධිට්ඨානං වාරෙන්ත'ව තතො'ධිකා.

214 කම්මාරහඅසංවාසඛිත්තචිත්තදුඛඅද්දිතා,
එතෙසං සඞ්ඝමජ්ඣම්හි පටික්ඛෙපො න රූහති.

215 පකතත්තෙනෙකසීමට්ඨසමසංවාසභික්ඛුනො,
ආරොචෙන්තස්ස'න්තමසො 'නන්තරස්සා'පි රූහති.

---

මායෙහි සිටි)සෙසු පුවතත්හු; ජනාරහා,සදදෙන්නට; නිස්සෝසි; සෙසෙපි, (පඤ්චවර්ගීසඞ්ඝාදීන් විසින් කටයුතු)සෙසුකර්මයෙහිදු; අයන්හයො, මෙමනයයි.

212 චතුවග්ගාදි, චතුර්වර්ගී සඞ්ඝාදීන් විසින්; කත්තබ්බං, කටයුතු සඞ්ඝකර්මය; අසංවාස (ගණපූරකං) අසංවාසකයා ගණපූරක කොටහෝ; කම්මාරහං (ගණපූරකං) කර්මලබන්නට නිස්සඟු ගණපූරක කොටහෝ; පරිවාසාදිකම්මඤ්ච, පිරිවෙස්ආදිවූ කර්මය වනාහි; ගරුකට්ඨෙසු, ගරුකස්ථයන් අතුරෙන්; අඤ්ඤතරං ගණපූරකං කත්වාවා, එක්තරාකෙණෙකු ගණපූරක කොටහෝ; කතං, කරණලද්දේද; කුප්පඤ්ච, කොප්‍යදවේයි; දුක්කටං, (කාරකයන්ට) දුකුළාදවේ.

213 අධම්මකම්මං, අධර්මකර්මය; වාරෙය්‍ය, වලකන්නේය; අනන්තරායෙ,(ජීවිත බ්‍රහ්මචර්යාවට)අනන්තරායක් ඇතිකල්හි; දුවෙ තයො දෙන්න තුන්දෙන; දිට්ඨාවිං, (කරෙය්‍යුං, "අධම්මකම්මං ඉදං න මෙ තං ඛමති"යි ඔවූ නොවූත්ට තමන්ගේ) ලබ්ධිප්‍රකාශ කරන්නාහුය; එකො, හුදකලාමහණ; අධිට්ඨානං, (කරෙය්‍ය "න මෙතං ඛමති"යි සිතින්) ඉවත්නේය; තතො, ඒ තුන්දෙනා කෙරෙන්; අධිකා, බොහෝදෙන; වාරෙනෙනව, වලකත්මැයි.

214 කම්මාරහ, කර්මලබන්නට නිස්සෝය; අසංවාස, සංවාසාභිනොවත්නේය; ඛිත්තචිත්ත, උම්මත්තකයා; දුඛඅද්දිතා, වෙදනාර්ත්‍ය යන; එතෙසං, මොවුන්ගේ; සඞ්ඝමජ්ඣම්හි, සඟ මැද; පටික්ඛෙපො, ප්‍රතික්ෂෙපය; නරූහති, නොනැගේ.

215 අන්තමසො, යටත්පිරිසෙයින්; අනන්තරස්සාපි, ආසන්නයෙහි හුන්නාහටද; ආරොචෙන්තස්ස, කියන්නාවූ; පකතත්තා, පුවතත්වූ; එකසීමට්ඨ, එකසීමාවෙහි සිටි; සමසංවාසභික්ඛුනො, සමානසංවාස ඇති භික්ෂූහුගේ(පටික්ඛෙපො) වැලකීම; රූහති, නැගේ.

216 කොපෙතුං ධම්මිකං කම්මං පටික්කොසෙය්‍ය සම්මුඛා,
තිරොක්ඛා කායසාමග්ගිං ඡන්දං නොදෙය්‍ය දුක්කටන්ති.

---

“මිච්ඡාජීවවිවජ්ජනා”ති.

217 දාරුං වෙළුං ඵලං පුප්ඵං චුණ්ණං නහාණමුඛොදකං,
මත්තිකං දන්තකට්ඨාදිං නදදෙ කුලසංගහා.

218 පාරිභට්ටකතාමුග්ගසූප්‍යතාවත්ථුවිජ්ජයා,
පහෙණ දූතකම්මෙන ජඞ්ඝපෙසනියෙන වා.

219 අනුප්පදානපතිපිණ්ඩවෙජ්ජකම්මෙන වා පුන,
නා'ඤ්ඤෙනවා'පි සම්බුද්ධපතිකුට්ඨෙන ජීවයෙ.

---

216 ධම්මිකං, ධර්මයෙන් යුක්තවූ; කම්මං (අපලොකනාදි චතුර්විධ) සඞ්ඝකර්මය; කොපෙතුං, කොප්‍යකරන්නට; සම්මුඛා, හමුයෙහි; පටික්කොසෙය්‍ය, වලකානම්; තිරොක්ඛා, නොහමුයෙහි; කායසාමග්ගිං, කායසාමග්‍රියහෝ; ඡන්දං, සඳහෝ; නොදෙය්‍ය, නොදේනම්; දුක්කටං, දුකුළාවේ.

---

“මිච්ඡාජීවවිවජ්ජනා”ති, මිච්ඡාජීවවිවජ්ජනා යන්නෙහි(ලාමක ජීවිකාවගේ දුරුකිරීමනම්.)

217 දාරුං, දැවද; වෙළුං, (හිණෙළුයට ඈ) හුණද; ඵලං,(තාලපනසාදි)ඵලද; පුප්ඵං,(පුවඟුමල් ඈ)මල්ද; චුණ්ණං,(මඟරිසුණු ඈ) සුණුද, නහාණමුඛොදකං, නහණදියහා මූවසොදන දියද; මත්තිකං (පියවිමැටි ඈ) මැටිද; දන්තකට්ඨාදිං, දැහැටි දඬු ආදීද; කුලසංගහා, කුලයන් සගැම්ම හෙතුකොට ගෙණ; නදදෙ, නොදෙන්නේයි.

218 පාරිභට්ටකතා (ලාභාසායෙන්) කුලදරුවන් (ඔරලණ ආදී විසින්) වැඩීමෙන්හෝ; මුග්ගසූප්‍යතා, හිවූ මුංසේ අනූන් සගන්නට සැබෑ මදකොට; බොරු බොහෝකොට කීමෙන්හෝ; වත්ථුවිජ්ජයා, (ලිංබිම් ගෙබිම් ඈ පාන) වස්තු විද්‍යාවෙන්හෝ, පහෙණ (කෙත්වත් අරම් ආදියට) මෙහෙවර යනා කමින්හෝ; දූතකම්මෙන(පත්හසුන් පඬුරු ගෙණ යන)දූතකර්මින්හෝ;ජඞ්ඝපෙසනියෙනවා, හසුන් ගෙණ එගෙන් එගෙට යන කුද්‍ර මෙහෙයෙන්හෝ.

219 අනුප්පදාන, (ලාභාසායෙන්) අත්ලස් ඈ දීමෙන්හෝ; පතිපිණ්ඩ, පිළිපිඬු දීමෙන්හෝ; වෙජ්ජකම්මෙනවා, පිළියම් කිරීමෙන්හෝ; පුන, නැවත; සම්බුද්ධපතිකුට්ඨෙන, බුදුන් විසින්

220 විඤ්ඤත්තිනෙසනාභූතුල්ලපනාකුහනාදිහි,
කුලදූසාදිනුප්පන්නපච්චයෙ පරිවජ්ජයෙ'ති.

---

“වත්තන්ති”

221 ආගන්තුකො න ආරාමං පවිසෙ සඋපාහනො,
සඡත්තො'ගුණ්ඨිතො සීසෙ කරිත්වා වා'පි චීවරං.

222 පානීයෙන නධොවෙය්‍ය පාදෙ වුඩ්ඪතරෙ'පි ච,
ආවාසිකෙ'භිවාදෙය්‍ය පුච්ඡෙය්‍ය සයනාසනං.

---

නීනදූකොට හරණලද; අනෙසනවාපි (අඞ්ගවිද්‍යා නක්ෂත්‍රවිද්‍යා ආදි)අනිකෙකින්හෝ; නජීවයෙ, ජීවත් නොවන්නේයි.

තමාලද මනාපසය කුලත්ට දී උන් දෙනුගැන්ම “පතිපිණ්ඩදාන” නම්වේ—“අඞ්ගවිද්‍යා”නම්. අඟපසඟ ලකුණු දත්නා විද්‍යායි. “නක්ෂත්‍රවිද්‍යා” නම්. නකත්දත්නාවිද්‍යායි.

220 විඤ්ඤත්ති (නොනෑ නොපැවරූවන්)ඉල්වීමෙන්ද; අනෙසනා, නුසුදුසු පියොවින් පස සෙවීමෙන්ද; අභූතුල්ලපනං, තමා කෙරෙහි නැති උතුරුමිනිස්දම් කීමෙන්ද; කුහනාදිහි, කුහනලපනාදියෙන්ද; කුලදූසාදිනා, කුලදූසනාදියෙන්ද; උප්පන්න පච්චයෙ, උපන් (සතර) පසය; පරිවජ්ජයෙ, (විෂමිශ්‍රදෙයක් සෙ සිත් දුරින්) දුරුකරන්නේයි.

(“කුලදූසාදි” යන්නෙහි “ආදි” ශබ්දයෙන් රූපියපටිග්ගහණ රූපියසංවොහාර ගතයුතු.)

---

“වත්තන්ති” වත්තං යන්නෙහි (ආගන්තුකවත්තාදි වත්නම්.)

221 ආගන්තුකො, අමුතුමහණ; සඋපාහනො,(පයලු) වහන් ඇතිවහෝ; සඡත්තො, (හිසට කුඩ) සත් ඇතිව හෝ; ඔගුණ්ඨිතො, හිස් වසා පෙරවහෝ; චීවරං, සිවුර; සීසෙ, කරිත්වාවාපි, හිසතබාහෝ; ආරාමං, (ලගනසඳහා වදනා) වෙහෙරට; නපවිසෙ, නොවදනේයි (උවසරසිම සිට මේ හැම හැර වැද්දයුතු.)

222 පානීයෙන, බොනපැනින්; පාදෙ නධොවෙය්‍ය, පා නොසෝදන්නේය; වුඩ්ඪතරෙ, තමහට වැඩිමහලුවූ; ආවාසිකෙපි ච, තන්වැසියනුදු; අභිවාදෙය්‍ය, වඳනේය; සයනාසනං, ලගනා සෙනසුන්ද; පුච්ඡෙය්‍ය (කවර සෙනස්න මට පැමිනේද අජ්ඣාවුත්ථ අනජ්ඣාවුත්ථ දැයි) පුලුවුස්නේයි.

(“සචෙ සඞ්ඝස්ස චෙතියෙසා පොක්ඛරණියො වා උදකසොණ්ඩියොවා හොන්ති කතිකාච කතා එත්ථ නහායිතබ්බං ඉතො පානීයං ගහෙතබ්බං ඉධ සබ්බපරිභොගො කාතබ්බො'ති. කති

223 ගම්කො පටිසාමෙත්වා දාරුමත්තිකභණ්ඩකං,
විහාරඤ්ච ථකෙත්වාන ආපුච්ඡ සයනාසනං.

224 අපුච්ඡිතබ්බෙ අසති සඞ්ගොපෙත්වාන සාධුකං,
පක්කමෙය්‍ය'ඤ්ඤථා තස්ස පක්කන්තුං නව කප්පති.

225 ආවාසිකො පඤ්ඤපෙය්‍ය බුඩ්ඪාගන්තුස්ස ආසනං,
උපනික්ඛිපෙ පාදොදකප්පභුතිං පත්ත චීවරං.

226 පච්චුග්ගන්ත්වාන ගණ්හෙය්‍ය පානීයෙනාච පුච්ඡයෙ,
ආගන්තුමභිවාදෙය්‍ය පඤ්ඤපෙ සයනාසනං.

---

කාවතෙතනෙ'ව සබ්බං කාතබ්බං, යත්ථ කතිකා න'ත්ථි තත්ථ සබ්බපරිභොගො වට්ටති" * යනු අටුවායි.)

223 ගම්කො, බැහැර යන මහණ; දාරුමත්තිකභණ්ඩකං, (මඤ්චපීඨාදි) දාරුභාණ්ඩහා (රජනභාජනාදි) මත්තිකාභාණ්ඩද; පටිසාමෙත්වා, සඟවාතබා; විහාරඤ්ච, සෙනස්නද; ථකෙත්වාන, (පුරුකිකොට දොරකවුලු)පියා; සයනාසනං(මඤ්චපීඨාදි) සයනාසනද; ආපුච්ඡ (ඇවත මේ රක්‍ෂාකරයි ආරාමිකාදින්) පිළිවිස(පක්කමෙය්‍ය, යන්නේයි.)

224 අපුච්ඡිතබ්බෙ අසති, පිළිවිස්නට නිසි ආරාමිකාදි යමක්හු නැතිකල්හි; සාධුකං, මනාකොට; සඞ්ගොපෙත්වාන, සඟවාතබා; පක්කමෙය්‍ය, යන්නේයි; අඤ්ඤථා, එසේනොකොට; පක්කන්තුං, ගමන්යාම්; තස්ස, ඕහට; නවකප්පති, නොමවටී.

225 226 ආවාසිකො, තත්වැසිමහණ; බුඩ්ඪාගන්තුස්ස, වැඩි මහලු ආගන්තුකයහට; ආසනං (හිඳිනා) අසුන්; පඤ්ඤපෙය්‍ය (දුර දක්ම)පණවන්නේය; පාදොදකප්පභුතිං, පාදොදක පාදකඨලිකා දින්; උපනික්ඛිපෙ, එළවා තබන්නේය; පච්චුග්ගන්ත්වාන, පෙර මගට ගොස්; පත්තචීවරං, පාසිවුරු; ගණ්හෙය්‍ය, ගන්නේය; පානීයෙනාච, බොනපැන්හුදු; පුච්ඡයෙ, විචාරන්නේය; ආගන්තුං, ආගන්තුකයා; අභිවාදෙය්‍ය, වඳනේය; සයනාසනං, ලගනාසෙනසුන්; පඤ්ඤපෙ (මේ සෙනස්න නුඹට පැමිණෙයි) පණවන්නේයි.

---

* ඉදින් සඟහට පොකුණු දෙකක් තුනක්හෝ පැන්ඇති ගල් පොකුණු (දෙකක් තුනක්)හෝ වෙත් නම් මෙහි නෑයුතුය මිත් පැන් ගතයුතුය මෙහි සියලු පරිභොග කටයුතුයයි කතිකාත් කරණලදනම් කතිකාවනිත්ම සියල්ල කටයුතුයි, යම්තැනක කතිකා නැත්නම් එහි සියලු පරිභොගය වටී.

227 අජ්ඣාවුත්ථමවුත්ථංවා ගොචරාගොචරං වදෙ,
වච්චපස්සාවට්ඨානානි කතිකං සෙඛසම්මුතිං.

228 පවෙසනිග්ගමෙ කාලං පරිභොජනියපානියං,
නිසින්නො'ව නවකස්ස එතං සබ්බං සමුද්දිසෙ'ති.

---

"විකප්පනාචෙවා"ති.

229 සම්මුඛාපරම්මුඛාභෙදා දුවෙ වුත්තා විකප්පනා,
සම්මුඛාය විකප්පෙන්තො ව්‍යත්තස්සෙ'කස්ස සන්තිකෙ,
"ඉමං චීවරංතුය්හංවිකප්පෙමී"ති භාසයෙ.

230 එත්තාවතා නිධෙතුං ච කප්පති න ච කප්පති,
පරිභොගාදිකං තෙන අපච්චුද්ධටභාවතො.

---

227 228 අජ්ඣාවුත්ථමවුත්ථංවා, වසනලදබවද නොවසනලද බවද; ගොචරාගොචරං, සිඟියයුතු නොසිඟියයුතු ගමද; වච්චපස්සාවට්ඨානානි, මලකිස වටත්කිස සාහන තැන්ද; කතිකං, (ඒ වෙහෙර සඞ්ඝයාගේ) කතිකාවත්ද; සෙඛසම්මුතිං, සෙඛසම්මුති(ලදකුල)ද; පවෙසනිග්ගමෙකාලං (වෙහෙරට) වැදීම් නික්මීමෙහි කල්ද; පරිභොජනීයපානීයං, නහණපැන් බොන පැන්ද; වදෙ, කියන්නේයි; නිසින්නොව, (තන්වැසිමහණ) හුන්නේම; නවකස්ස,(ආගන්තුක) නවකයහට; එතංසබ්බං මේ හැම(වත්) සමුද්දිසෙ, කියන්නේයි. ("නිසින්නොව" යනු අනාපත්ති මාත්‍රයක් දක්වයි. හුන්තැනින් නැඟී මේ හැමවත් කරත් වටිමැයි.)

---

"විකප්පනාචෙවා"ති, විකප්පනාචෙව යන්නෙහි (විකාපුත්නාමි.)

229 සම්මුඛාපරම්මුඛාභෙදා, සම්මුඛපරම්මුඛභෙදවිසින්; විකප්පනා, විකප්පනාවෝ; දුවෙ, දෙදෙනෙක්; වුත්තා, කියනලදහු; සම්මුඛාය, හමුයෙහි සිටියහුට; විකප්පෙන්තො, විකපන්නේ; ව්‍යත්තස්ස (විකපනපසුදුරණසේ දන්නාහෙයින්) ව්‍යත්වූ, එකස්ස සන්තිකෙ, එක්උපසම්පන්නායකුසම්පයෙහි; "ඉමං චීවරං තුය්හං විකප්පෙමී"ති, "ඉමං චීවරං තුය්හං විකප්පෙමි"යි; භාසයෙ, කියන්නේයි. (ඉමංචීවරං, මේ සිවුරු; තුය්හං, තට; විකප්පෙමිනි, විකපමියි, යනු මෙහිඅර්ථයි.)

230 එත්තාවතා, මෙපමණකින්; නිධෙතුංච, තගාතබන්නටම; කප්පති, කැපයි (නිසගිනොවේ) තෙන, ඒ වියත්හු විසින්; අපච්චුද්ධටභාවතො, නොපසුදුළු බැවින්; පරිභොගාදිකං, පරිභොගවිස්සජ්ජනාදිය; නවකප්පති, නොම්වටී. ("ආදි" ශබ්දයෙන් විස්සජ්ජන අධිට්ඨාන ගතයුතු.)

(1)"**මය්හං සන්තකං පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථාපච්චයං වා කරොහී**"ති.

231 තෙන පච්චුද්ධරෙ යෙව පරිභොගාදි කප්පති,
අපරා සම්මුඛා වෙ'කා භික්ඛුස්සෙ'කස්ස සන්තිකෙ,
ගහෙත්වා නාමමෙකස්ස පඤ්චන්නං සහධම්මිනං.

(2) "ඉමං චීවරං තිස්සස්ස භික්ඛුනො, තිස්සාය භික්ඛුනියා, තිස්සස්ස සාමණෙරස්ස, තිස්සාය සාමණෙරියා, තිස්සාය සික්ඛමානාය විකප්පෙමී"ති වත්තබ්බං.

(3) තෙන භික්ඛුනා "තිස්සස්ස භික්ඛුනො, තිස්සාය භික්ඛුනියා, තිස්සස්ස සාමණෙරස්ස, තිස්සාය සාමණෙරියා, තිස්සාය සික්ඛමානාය, සන්තකං පරිභුඤ්ජ වා, විස්සජ්ජෙහි වා, යථාපච්චයං වා කරොහී"ති වත්තබ්බං.

---

(1) "**මය්හං සන්තකං පරිභුඤ්ජ වා—පෙ—කරොහී**"ති "**මය්හං සන්තකං පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථාපච්චයං වා කරොහී**"යි.

**231** තෙන, ඔහු විසින්; පච්චුද්ධරෙයෙව, පසුදුලකල්හිම; පරිභොගාදි, පරිභොගවිස්සජ්ජනාදිය; කප්පති, කැපයි. (මය්හං සන්තකං, මාසතුසිවුර; පරිභුඤ්ජ වා, වැලඳගැණැයිහෝ; විස්සජ්ජෙහි වා, අන්නට දෙයිහෝ; යථාපච්චයං, තාරුස්නක්; කරොහීති වා, කරයිහෝ, යනු මෙහි අර්ථයි.) අපරා, අනික්; එකාසම්මුඛාව, එක්සම්මුඛා (විකප්පනා) වක්ම (කියනුලැබේ) එකස්ස භික්ඛුස්ස සන්තිකෙ, එක් උපසපනක්හු සමීපයෙහි; පඤ්චන්නං සහධම්මිනං, පඤ්චසහධාර්මිකයන් අතුරෙන්; එකස්ස නාමං ගහෙත්වා, (නමාකැමති) එකක්හුගේ නම ගෙණ.

(2) ඉමං චීවරං, මේ සිවුර; තිස්සස්ස භික්ඛුනො (විකප්පෙමීති වා) තිස්සනම් භික්ෂූහට විකපමියිහෝ—පෙ— තිස්සාය සාමණෙරියා * විකප්පෙමීති වා, තිස්සනම් හෙරණියට විකපිමියිහෝ; වත්තබ්බං, කියයුතු.

(3) තෙන භික්ඛුනා, ඒ භික්ෂූහු විසින්; තිස්සස්ස භික්ඛුනො සන්තකං, තිස්සනම් භික්ෂූහු අයත් සිවුර—පෙ—තිස්සාය සාමණෙරියා * සන්තකං, තිස්සනම් හෙරණිය අයත් සිවුර; පරිභුඤ්ජ ව, අනුභවකරයිහෝ; විස්සජ්ජෙහි වා, වසජයිහෝ, යථාපච්චයං කරොහීති වා, තාරුස්නක් කරයිහෝ; වත්තබ්බං, කියයුත්තේයි.

---

* 'තිස්සාය සාමණෙරියා'(යන්නට වඩා) 'තිස්සාය සික්ඛමානාය' යනු ගැලපෙන බැව් හැඟෙන නුමුත් අපදිටු සියලුම පොත්වල එකාකාර බැවින් නොවෙනස්කෙළෙමු.

232 පරම්මුඛාවිකප්පනෙ'කස්ස සන්තිකෙවමීරයෙ,
"ඉමං චීවරං තුය්හං විකප්පනත්ථාය දම්මී"ති.

(4) තෙන වත්තබ්බො. "කො තෙ මිත්තො සන්දිට්ඨො වා"ති. ඉතරෙනචෙ'වං වත්තබ්බං. "තිස්සො භික්ඛූ'ති වා, තිස්සා භික්ඛුනී'ති වා, තිස්සො සාමණෙරො'ති වා, තිස්සා සාමණෙරී'ති වා, තිස්සා සික්ඛමානා'ති වා.

(5) පුන තෙනා"හං තිස්සස්ස වා භික්ඛුනො, තිස්සාය වා භික්ඛුනියා, තිස්සස්ස වා සාමණෙරස්ස, තිස්සාය වා සාමණෙරියා, තිස්සාය වා සික්ඛමානාය දම්මී"ති විකප්පෙත්වා තෙනෙ'ව "තිස්සස්ස භික්ඛුනො, තිස්සාය භික්ඛුනියා, තිස්සස්ස සාමණෙරස්ස, තිස්සාය සාමණෙරියා තිස්සාය සික්ඛමානාය සන්තකං පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථාපච්චයං වා කරොහී"ති පච්චුද්ධරිතබ්බං.

233 දූරසන්තිකත්තෙකත්තං බහුභාවං විජානිය,
එතං ඉමන්ති එතානි ඉමානී'ති'පි යොජයෙ.

---

232 පරම්මුඛාවිකප්පනා, පරම්මුඛවිකප්පනා තොමෝ (කියනු ලැබේ) එකස්සසන්තිකෙ, එක්මහණහු කෙරෙහි; ඉමං චීවරං, මේ සිවුර; විකප්පනත්ථාය, විකප්පනාපිණිස; තුය්හං, තට; දම්මී ති, දෙමියි; එවං, මෙසේ; ඊරයේ, කියන්නේයි.

(4) තෙන, ඔහුවිසින්; තෙ, තාගේ; මිත්තො වා, දැඩිමිතුයෙක් හෝ; සන්දිට්ඨො වා, දුටුමිතුරෙක්හෝ; කො ඉති, කවරෙක් දැයි; වත්තබ්බො, කියයුත්තේයි; ඉතරෙනච, සිවුරගිම් මහණහු විසිනුදු; තිස්සො භික්ඛූති වා, තිස්සනම් මහණයයිහෝ;—පෙ—තිස්සා සාමණෙරීති වා, තිස්සනම් හෙරණියයිහෝ; එවංවත්තබ්බං, මෙසේ කියයුතු.

(5) පුන, ඉක්බිත්තෙන්; තෙන, ඒ (සිවුර විකපන) මහණහුවිසින්; අහං, මම; තිස්සස්ස භික්ඛුනොදම්මීති වා, තිස්සනම් භික්ෂුහට දෙමියිහෝ—පෙ—තිස්සාය සාමණෙරියා දම්මීති වා, තිස්සනම් හෙරණියට දෙමියි හෝ; විකප්පෙත්වා, විකපා; තෙනෙව, ඔහුවිසින්ම; තිස්සස්ස භික්ඛුනො සන්තකං, තිස්සනම් මහණහු සන්තකය—පෙ—තිස්සාය සාමණෙරියා සන්තකං, තිස්සනම් හෙරණිය සන්තකය; පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථාපච්චයං වා කරොහීති, පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථාපච්චයං වා කරොහියි පච්චුද්ධරිතබ්බං, පසුදිරියයුතු.

233 දූරසන්තිකත්තං, දුරබව සමීපබවද; එකත්තං, එකක්බවද; බහුභාවං, බොහෝබවද; විජානිය, දැන; එත්ථ, මේ දූරාදියෙහි; එතං ඉති, එතං (චීවරං) කියාද; ඉමං ඉති, ඉමං (චීවරං) කියාද; එතානීති, එතානි (චීවරානි) කියාද; ඉමානීති, ඉමානි (චීවරානි) කියාද; යොජයෙ, යොදන්නේයි.

234 දසාහං මාසමෙකංවා පඤ්චවා කඨිනත්ථතෙ,
පාරිපූරත්ථමූනස්ස පච්චාසා සති මාසකං,
නූ'ප්පාදයති නිස්සග්ගිං නා'ධිට්ඨිතවිකප්පිතන්ති.

**“නිස්සයො”ති.**

235 ව්‍යත්තස්ස පඤ්චවස්සස්ස නත්ථි නිස්සාය කාරියං,
යාවජීවම්පි අබ්‍යත්තො නිස්සිතොයෙව ජීවති.

236 එකංසං චීවරං කත්වා පග්ගණ්හිත්වාන අඤ්ජලිං,
උක්කුටිකං නිසීදිත්වා වදෙ යාවතතියකං.

**(6)“ආචරියො මෙ භන්තෙ හොහි ආයස්මතො නිස්සාය වච්ඡාමී”ති.**

237 පක්කන්තෙන පක්ඛසඞ්කන්තෙන විබ්භන්තෙන වා'පි නිස්සයො,
මරණාණත්තුපජ්ඣායසමොධානෙහි සම්මති.

---

**234** නාධිට්ඨිතවිකප්පිතං, නොඉටු නොවිකපූ සිවුර; දසාහං, දසදවසක්හෝ; එකං මාසංවා, (කෙළිත්නො අතුලවෙහෙර) එකම චීවරමාසයහෝ; කඨිනත්ථතෙ, කෙළිත් අතුළකල්හි; පඤ්චවා, පස්මසක්හෝ; ඌනස්ස, ඌනචීවරයාගේ; පාරිපූරත්ථං, පරිපූරණයපිණිස; පච්චාසාසති (කඩෙක්ලැබෙයිනා) ප්‍රත්‍යාසාවක් ඇතිකල්හි; මාසකං, (නැවත) මසක්හෝ; නිස්සග්ගිං, නිසගිපචිති; නුප්පාදයති, නුපදවා.

“නිස්සයො”ති, නිස්සයො යත්නෙහි(නිසගැණුම්නම්.)

**235** ව්‍යත්තස්ස (නිසයෙන් මිදෙන්නට සුදුසු බණ අසාදත් බැවින්) වියත්වූ; පඤ්චවස්සස්ස, පස්වසක්ඇති භික්ෂුහට; නිස්සාය, නිසාවිසීමෙන්; කාරියං, කටයුත්තෙක්; නත්ථි, නැත; අව්‍යත්තො, නොවියත් මහණ; යාවජීවම්පි, දිවිහිම්කොටද; නිස්සිතොයෙව, (ආචාර්‍ය්‍යඋපාධ්‍යායයන්) නිසාම; ජීවති, ජීවත්වේ.

**236**-(6) චීවරං, උත්තරාසඞ්ගය; එකංසං කත්වා, එකස් කොට; අඤ්ජලිං පග්ගණ්හිත්වාන, ඇඳිලිබැඳ; උක්කුටිකං නිසීදිත්වා, එලිල්ලෙහිඳ. “ආචරියො—පෙ—වච්ඡාමී”ති. “ආචරියො මෙ භන්තෙ හොහි ආයස්මතො නිස්සාය වච්ඡාමී”යී; යාවතතියකං, තුන් යලක්; වදෙ, කියන්නේයි. (භන්තෙ, ස්වාමීය; මෙ, මට; ආචරියො හොහි, ආචාර්‍ය්‍යවූ; ආයස්මතො, ආයුෂ්මත්හු; නිස්සාය, ආශ්‍රයකොට; වච්ඡාමි, වෙසෙමි; යනු මෙහි අර්ථයි.)

**237** පක්කන්තෙන, බැහැරගියකල්හිද; පක්ඛසඞ්කන්තෙන, තිර්ථකයන්(ගේ ලබ්ධිවෙස රුස්වාගෙණ උන්)කරා වන් කල්හිද; විබ්භන්තෙනචාපි, ගිහිවූකල්හිද; මරණ, කාලක්‍රියායෙන්ද; ආණත්ති, මෙයටනොවැද යනාදී නිශ්‍රයප්‍රණාමයෙන්ද; උපජ්ඣායස

238 නිස්සාය න වසෙ ලජ්ජිං අපුබ්බට්ඨානමාගතො,
ආගමෙ චතුපඤ්චාහං ලද්ධුං භික්ඛුසභාගතං.

239 අද්ධිකස්ස ගිලානස්ස ගිලානුපට්ඨාකස්ස ච,
යාචිතස්ස අරඤ්ඤෙ ච සල්ලක්ඛෙන්තෙන ඵාසුකං,
සභාගෙ දායකෙ සන්තෙ වසිතුං තාව ලබ්භතී'ති.

“කායබන්ධනන්ති.”

240 අකායබන්ධනො ගාමං දුක්කටං පවිසෙය්‍ය චෙ,
බන්ධෙය්‍ය යත්ථ සරති තත්ථෙ'වා'සතියා ගතො.

---

මොධානෙහි, උපාධ්‍යායයන්හා (දර්ශනශබ්දශ්‍රවණවශයෙන්) එක්වීමෙන්ද; යන මේ සපරිද්දෙන්; නිස්සයො (ආචාරීන්කෙරෙන්ගත්) නිසූ, සම්මති, බිඳේ. උපාධ්‍යායයන් කෙරෙන්ගත් නිසවනාහි උපාධ්‍යායසමොධානවිනා අනික්පස්පරිද්දෙන්බිඳේ.

238 අලජ්ජිං, අලජ්ජීහු; නිස්සාය, නිසා, න වසෙ, නොවසන්නේය; අපුබ්බට්ඨානං, පෙර(නිසනොගෙණ) නොවිසූවිරූ තැනකට; ආගතො, එළඹියේ; භික්ඛුසභාගතං, (විනයභාආචාර්‍යයපරම්පරයෙන්) භික්ෂූන්හා එක්වැනිබව (හෙවත්) නිශ්‍රයදායක භික්ෂූහුගේ ලජ්ජීභාවය; ලද්ධුං, දන්නා පිණිස; චතුපඤ්චාහං, සතරපස්දවසක්; ආගමෙ, බලන්නේයි.

239 අද්ධිකස්ස, ගමන් යන්නුවහටද; ගිලානස්ස, ගිලන්හටද; යාචිතස්ස (ගිලන්නු විසින්) ආරාධනා කරණලද්දාවූ; ගිලානුපට්ඨාකස්ස ච, ගිලන්වත්කරණ්නුවහටද; අරඤ්ඤෙ, වල්හි; ඵාසුකං, (සමථවිදර්ශනාවන්ගේ ප්‍රතිලාභයෙන්) සුඛවිහාරය; සල්ලක්ඛෙන්තෙනවා, සලකන්නාහු විසින්ද; සභාගෙ, (විනයභා ඇඳුරෙල් විසින්) එක්කොටසක්වූ; දායකෙ, (නිශ්‍රය) දායකයක්හු; අසන්තෙ, නැතිකල්හි; තාව, (යම්තාක් ඇසලපුණු පෝයද) එතාක් කල්; වසිතුං, (නිසනොගෙණ) වසන්නට; ලබ්භති, වටි.

(“සචෙ යාචාහි මන්ති වුච්චමානො'පි මානෙන නයාචති ගන්තබ්බං” * යන්නු අටුවායි.—“සචෙ ආසාළ්හිමාසෙ නිස්සය දායකං න ලබ්භති යත්ථ අත්ථි තත්ථ ගන්තබ්බං, අන්තොවස්සෙ පන අනිස්සිතෙන වත්ථුං නවට්ටති” ‡ යන්නු මෙහි ටීකායි.)

---

‘කායබන්ධනන්ති’කායබන්ධනායන්නෙහි(කැපඅකැප පටිනම්.)

240 අකායබන්ධනො, කාබාන්නැතිව හෙවත් කාබාන්නො

---

* ඉදින් මා අයදූයි කියනු ලබන්නේද මානයෙන් යාඥනොකෙරේනම්යායුතු—‡ ඉදින් ඇසළමසදී නිසදෙන්නෙකු නොලබාද යම් තැනෙක ඇත්තේද එහි යායුතු, වස් ඇතුලත වනාහි අනිශ්‍රිතව වසන්ට නොවටී.

241 පට්ටිකා සූකරන්තන්ති දුවිධං කායබන්ධනං,
දුස්සපට්ටො ච රජ්ජුච එකා තදනුලොමිකා.

242 මච්ඡකණ්ටකඛජ්ජූරිපත්තා මට්ටා ච පට්ටිකා,
ලබ්භා දසා චතස්සො'පි අන්තෙ විගුණසුත්තකා.

243 මාලාදිං කක්කටච්ඡාදිං දස්සෙත්වා ගුණසුත්තකං,
කොට්ටිතා කුඤ්ජරච්ඡාදිං පට්ටිකා න ච කප්පති.

2!4 ඝටකං මකරමුඛාදිං න කප්පන්ති දසාමුඛෙ,
උභන්තෙ ඝටිකා ලෙඛා පිළකා අක්ඛකුක්ඛිව විතානකං.

---

බැඳ; ගාමං, ගමට; පච්ඡෙය්‍යවෙ, වදනේවි නම්; දූතකාටං, දූතු ශ්‍රාවේ; අසනියා ගතො, සිහිනොකොට ගියේ; යත්, යම්හැ නෙක්ගිලා; සරති, සිහිකෙරේද; තත්‍ථෙව, එතනම(සිට;)බන්ධෙය්‍ය, බඳනේයි.

241 කායබන්ධනං, කාබාණ; පට්ටිකා, හැඳරවාපටිය; සූකරන්තන්ති, (දුනුපසියන් බඳු) හූරුඅතුනුපටියයි; දුවිධං, දෙවැදෑරුම්වේ; දුස්සපට්ටොච, පිළිවැටියද; එකාරජ්ජුච, එක්වැලරැහැණද (යනමොනු;) තදනුලොමිකා (යථාක්‍රමයෙන්) ඒ දෙපටියට අනුලොම් හූයි. ("මැජබිදෙ විළිතුලු කොට බඳුත් නොම වටී. එක් විළිතුල බාණින් මැඟින දුනදුනා සිසාරා බඳුත් වනාගි" වට්සතු විනය සන්නයි.)

("එකරජ්ජුකං පන මුද්දිකාකායබන්ධනඤ්ච සූකරන්තකං අනුලොමෙති" * යනු අට්ඨවායි-"මුද්දිකාකායබන්ධනං නාම චතුරස්සං අකත්වා සජ්ජිතං" † යනු අට්ඨවායි.)

212 මච්ඡකණ්ටක, මස්කටුරටා ඇති; ඛජ්ජූරිපත්තා, ඉඳිපත්රටා ඇති; පට්ටිකා, පටිය; මට්ටාච, මාලාකම්ම ලතාකම්මාදි විකාර නැතිවම; ලබ්භා (තදනු ලොම්ව එහිම ඇතුලත්වන බැවින්)වටී; දසා, (කාබාණෙහි) දහවැල; චතස්සොපි, (උඩහින්) සතරෙකුදු (වටී)අන්තෙ, පටියදෙකෙළවර; විගුණසුත්තකං, (දහකත්කුරුත්ගුලා කත් තරවන පිණිස)දෙතුන් දිවුණු හූයෙක් (වටී)

243 මාලාදිං, මාලාදිකම්මද; කක්කටච්ඡාදිං, කකුළුඇස් ආදිද; ගුණසුත්තකං, (අතරතුරෙහි) දිවුණුහූද; කුඤ්ජරච්ඡාදිං, ඇත් අස් ආදිද; දස්සෙත්වා, දක්වා;කොට්ටිතා, ගසනලද; පට්ටිකා, පටිය; නචකප්පති, නොමවටී.

244 දසාමුඛෙ, දහකෙළවර; ඝටකං, කොතුරුපත්ද; මකරමු

---

* එකරජ්ජුකයද මුද්දිකාකායබන්ධනයද (යනදෙක) සූකරන්තකයට අනුලොම්වෙයි.

† මුද්දිකා කායබන්ධනය නම් හතරැස් නොකොට සෑදනලද්දකි.

245 දද්දුභකඤ්ච මුරජං මද්දවීණං කලාබුකං,
න කප්පන්ති දසාසු ද්වෙ මජ්ඣිමායෙව කප්පරෙ.
246 වෙළුදන්තවිසාණට්ඨිකට්ඨලාඛාඵලාමයා,
සඞ්ඛනාභිමයා සුත්තනළලොහමයා'පි ච,
පීඨා න කප්පන්ති කප්පන්ති ගණ්ඨියො චා'පි තම්මයා'තී-

## පඨමභාණවාරං

---

බාදිං, මකරමුඛදද්දුභකයිසාදි යම් කිසි විකාර රූපයෙක්ද යන මොහු; නකප්පන්ති, නොවටිත්; පීඨෙ, (දහමුල තරබව පිණිස වෙළුදන්තාදියෙන් කළ)පීඨයෙහි; උභතොන, දෙකෙළවර; ඝට කං, කළවටුද; ලෙඛා, පරිච්ඡෙදරේඛාද තබා; අක්ඛකං විතානක ඤ්ච(අටමඟලාදිවූ)අත්විසිතුරුද;(නකප්පති නොවටී.)

245 දද්දුභකඤ්ච,බරණිගිස් වැනි (මල ඇති කාබාණ)ද; මුර ජං, (තන් හුයින් සිසාරු ගත්) දෙණ්ඩමයක් වැනි(කාබාණ)ද; ම ද්දවීනං, පමුවක්සේ (සිව්රැස් කාබාණ)ද; කලාබුකං, බොහෝ රෙජු ඇති (කාබාණ)ද; යන මොහු සතරදෙන; නකප්පන්ති නොවටිත්; දසාසු, දහයෙහි; මජ්ඣිමා, මැදතුරෙහිවූ; ද්වෙයෙව (මුරජමද්දවීණ) දෙදෙනම; කප්පරෙ, වටිත්.

("මුරජන්නාම මුරජවට්ටිසණ්ඨානං වෙඨෙත්වා කතං"යනුඅටුවා යි."මුරජවට්ටිසණ්ඨානංනාම"නත්හුයින් සිසාරුගත් දෙණ්ඩමවැ නිසේයි". යනු විනය සන්නයි. "මද්දවිණනාම පාමඞ්ගසණ්ඨා නං"යනුඅටුවායි. පමුදම්සේ සිව්රැස්සවහන්ඇතියේ යනු නියස ඥෙහයි.

"පාමඞ්ගසණ්ඨානංපන" යනුයෙහි දුවක්මල්රටාවට ගෙතූ සෙයින් වනාහි පමුදමසටහන් නම් නොවෙයි" යනු විනය සන්නයි. "කලාබුකන්නාම බහුරජ්ජුකං"යනු අටුවායි. "බොහෝ රෙජු ඇති" යනු එයට සන්නයි. "බහුරජ්ජුකෙ එකතො කත්වා එකෙන නිරන්තරං වෙඨෙත්වා කතං බහුරජ්ජුකන්ති හවතත ඛිං නවට්ටති." යනු අටුවා, බැවින් බොහෝ රෙජු එක්කොට දෙකෙළවර මතු බඳනාලද්දේ බහුරජ්ජුක නමැයි දතයුතු.)

246 වෙළු, හුණමුවාවූ; දන්ත, දළමුවාවූ; විසාණ, හංමුවාවූ; අට්ඨි, ඇටමුවාවූ; කට්ඨ, දඬු මුවාවූ; ලාඛා, ලාමුවාවූ; ඵලාමයා, ඵල මුවාවූද; සඞ්ඛනාභිමයා, සක්නැබමුවාවූද; සුත්ත, හූමුවාවූද; නළ, රණ්හුනමුවාවූද; ලොහමයාපිච, ලොහෝමුවාවූද; පීඨා, පීඨ යෝ; කප්පන්ති, වටිති; තම්මයා, ඒ (කී) වෙළු ආදිමයවූ; ගණ්ඨි

‘‘ප ඨ වි චා ති’’

247 ජාතාජාතා’ති දුවිධා සුද්ධමත්තිකපංසුකා,
ජාතා අදඩ්ඪා ච පඨවී බහුමත්තිකපංසුකා,
චාතුමාසාධිකොවට්ටපංසුමත්තිකරාසි ච.

248 සුද්ධසක්ඛරපාසාණමරුම්බකඨලවාලුකා,
දඩ්ඪා ච භූමි යෙභුය්‍යසක්ඛරාදිමයීපි ච,
දුතියා වුත්තරාසි’ච චාතුමාසොමවට්ටකො.

---

යොචාපි, (සිව්රෙගි) ගැටවවුවෝද; කප්පානි, වට්ත්. (ඇමලක කල්කාදීන් කළෙළ ‘‘ඵලමුවා’’නමි.)

**පඨමකභාණවාරං, පළමුවෙනි බණවරයි.**

---

‘‘පඨවීචා’’ති, පඨවිච යන්නෙහි (කැප අකැප පොළෝනම්.)

**247** ජාතා, ජාතපඨවිය, අජාතාති, අජාතපඨවියයි; දුවිධා, (පඨවීතොමෝ) දෙවැදෑරුම්වේ; අදඩ්ඪා, (උඩනපාත්‍රපචනාදියෙන්) නොදෑ; සුද්ධමත්තිකපංසුකාච, හුදු මැටි පස්ඇති භූමිද; බහුමත්තිකපංසුකා, බොහෝමැටි බොහෝපස් ඇති භූමිද, චාතුමාසාධිකොවට්ට, වැසිවටසාරමසක් ඉක්මුණු; පංසුමත්තිකරාසිච, පස් රැස් මැටිරැස්ද; ජාතා පඨවී, අයප පොළෝ නමු.
‘‘බහුමත්තිකපංසුකා’’යන්නෙහි ‘‘බහු’’ශබ්දය යෙභුය්‍යපරියායයි ‘‘උදකෙන, යනු ඉදිව ආසින්ම වසිනා දියෙන් අනික් තෙනෙක පැහැර ගී තෙමේඝොතුජ්ජ වට්යෙත්’’ යනු අටුවාසන්නයි.)

**248** සුද්ධසක්ඛර, හුදුසකුරු ඇති; පාසාණ(හුදු)පහණ ඇති; මරුම්බ(හුදු)කළුසකල ඇති; කඨල(හුදු) කැබිලිති ඇති; වාලුකා(හුදු)වැලි ඇති භූමිද; දඩ්ඪාචභූමි,(උඩනපාත්‍රපචනාදීන්)දැගියභූමියද; යෙභුය්‍යසක්ඛරාදිමයීපිච, බොහෝ සකුරුආදිය ඇත්තියයි සලකනලද භූමිද; චාතුමාසොමවට්ටකො, වැසිවට සාරමසක් නොඉකුත්; වුත්තරාසිච, කියන ලද පස්රැස් මැටිරැස්ද; දුතියා, දෙවෙනිවූ කැපපොළෝනමු.

‘‘මුට්ඨිප්පමාණතො උපරි පාසාණා වෙදිතබ්බා මුට්ඨිප්පමාණා සක්ඛරා. කඨලා’ති කපාලඛණ්ඩානි. මරුම්බා’ති කටසක්ඛරවාලිකායෙව’’ * යනු අටුවායි. ‘‘යෙභුය්‍යසක්ඛරාදී’’ යන්නෙහි ‘‘ආදී’’ ශබ්දයෙන් බොහෝ පහණ බොහෝ කළුසකල බොහෝ කැබිලිති බොහෝ වැලි ඇති භූමි ගතයුතු.

---

* මිටපමණින් මතු පහන්හු දතයුත්තාහුය, මිටපමණවූවාහු සකුරුහුය. කඨලා යනු කබල්කැබලිහුය. මරුම්බා යනු කැටසකුරු ඇති වැලිහුමැයි.

249 ද්වෙභාගා තීසු භාගෙසු මත්තිකා යාය භූමියා,
යෙභුය්‍යමත්තිකා එසා සෙසෙසු'පි අයං නයො.

250 පාචිත්ති ඛණනෙ ජාතෙ ජාතසඤ්ඤිස්ස දුක්කටං,
විමතිස්සා'ජාතසඤ්ඤිස්ස නා'පත්ති'ණාපනෙ තථා.

251 පහාරෙ පහාරා'පත්ති ඛණමානස්ස අත්තනා,
එකායා'ණත්තියා එකා නානාණත්තීසු වාචසො.

252 ඉමංඨානමිමං කන්දමිධ වාපිං ඛණෙ'ත්ථ ච,
ජාලෙහ'ග්ගින්ති වා වත්තුං නියමෙත්වා න වට්ටති.

253 ථම්භස්සිමස්සා'වාටං වා මත්තිකං ජානමාහර,
කරොහි කප්පියං චෙති වචනං වට්ටතෙ'දිසං.

254 අසම්බද්ධං පඨවියා සුක්ඛකද්දමආදිකං,
කොපෙතුං තනුකං ලබ්භමුස්සිඤ්චනියකද්දමං.

---

249 යායභූමියා, යම් භූමියකගේ; තිසුභාගෙසු, තුන්කොටස කින්; ද්වෙභාගා, දෙකොටස් කෙනෙක්; මත්තිකා, මැටිද; එසා, මේ [illegible]; යෙභුය්‍යමත්තිකා, බොහෝ මැටි ඇත්තිනමු; සෙසෙසුපි (යෙභුය්‍යපංසු යෙභුය්‍යසක්ඛරාදිවූ) සෙස්සෙහිදු; අයංනයො, මෙමනයයි.

250 ජාතෙ, අකප්පිය පඨවියෙහි; ජාතසඤ්ඤිස්ස, අකැප පොළොවය යන සංඥා ඇත්තාහට; ඛණනෙ (තමාම) කැණීමෙහි; පාචිත්ති,පචිති ඇවැත්වෙයි; විමතිස්ස, විමති ඇත්තාහට; දුක්කටං, දුකුළාවෙයි; අජාතසඤ්ඤිස්ස, කැපය යන සංඥා ඇත්තාහට; අනාපත්ති, ඇවැත්නැති; ආණාපනෙ, ඇනවීමෙහිද; තථා, එසේමැයි.

251 අත්තනා, තමා විසින්; ඛණමානස්ස, කණනාහට; පහාරෙ පහාරෙ, පහර පහර; ආපත්ති,ඇවැත්(වේ;)එකාය ආණත්තියා,එකවරෙක ඇණවීමෙන්; එකා, එකඇවතක් වෙයි; නානාණත්තීසු, නොයෙක්වාර ඇණවීමෙහි;වාචසො,තෙපුල් ගණිනිත්(වේ.)

252 ඉමංඨානං, මෙතැන; ඉමංකන්දං, මේ අලය (ඛණවා) කණසිහෝ; ඉධ, මෙතැන; එත්ථ, එතන; වාපිං ඛණ, වැවක් කණසිහෝ; අග්ගිං ජාලෙහිවා, ගිනි දල්වසිහෝ; ඉති, මෙසේ; නියමෙත්වා, නියම්කොට; වත්තුං, කීම; නවට්ටති, නොවටී.

253 ඉමස්සථම්භස්ස, මේ ටැඹට; ආවාටං, වළක්; ජානවා (වනසේ)දනැසිහෝ; මත්තිකං,මැටි,ජානවා,(වනසේ)දනැසිහෝ; ආහරවා,ගෙණෙසිහෝ; කප්පියං කරොහි වා ඉති, කැපකරසිහෝ; යන එදිසං වචනං, මෙබඳු(කැප)තෙපුල්; වට්ටති (කියත්) වටී.

254 පඨවියා, පොළොවහා; අසම්බද්ධං, එකාබද්ධනොවූ; සුක්ඛ

255 ගණ්ඩුප්පාදං උපචිකාමත්තිකං මූසිකුක්කුරං,
චාතුමාසාධිකොවට්ටං ලෙඩ්ඩාදික්ඛිප න කොපයෙ.

256 පතිතෙ වාපිආදීනං කූලෙ උදකසන්තිකෙ,
පාසාණෙව රජෙ ලග්ගෙ පතිතෙ නවසොණ්ඩියා.

257 වම්මිකෙ මත්තිකාඛණ්ඩෙ අබ්භොකාසුට්ඨිතෙ තථා,
යෙභුය්‍යකඨලට්ඨානෙ තිට්ඨති'ට්ඨකාඛණ්ඩකො.

258 උම්මාදිං ගණ්හිතුං භූමිං සඤ්චාලෙත්වා විකොපයං.
ධාරාය භින්දිතුං භූමිං කාතුං වා විසමං සමං.

259 සම්මුඤ්ජනීහි ඝංසිතුං කණ්ටකාදිප්පවෙසිතුං,
දස්සෙස්සාමී'ති ඡන්දෙනා භූමිං චඞ්කමිතුං පදං.

---

කද්දමආදිකං, වියලිමඩආදිද; තනුකං, නොබොල්වූ; උස්සිඤ්ච නීයකද්දමං, ඉසසහැකි මඩද; කොපෙතුං(කඩනඇවිසිත්) කළුකුරුවන්ට; ලබ්භං, වටී. (මෙහිආදිශබ්දයෙන් "උදකෙන ගතට්ඨානෙ උදකපප්පටකො නාම හොති. වාතප්පහාරෙන චලිතං අපනෙතුං වට්ටති" අටුවායෙහි කියනලද උදකපප්පටගත්තු උදක පප්පටක නම් රොම් මඩ වියලි කබල්ලයි.)

255 චාතුමාසාධිකොවට්ටං, වැසිවට සාරමසක් ඉකුත්; ගණ්ඩුප්පාදං, ගැඬවිලුන්නැගූ මැටිද; උපචිකාමත්තිකං, වේ පස්ද; මූසිකුක්කුරං, මීයන් නැගූපස්ද; ලෙඩ්ඩාදික්ඛිප, සාණනැන නඟුලෙන් කැබී නැගි මැටිකැටිආදිද; නකොපයෙ, නොකළකුරුවන්නේයි.

("මූසිකානං උක්කුරො මූසිකුක්කුරො මූසිකාහි උද්ධටං පංසුං".*)

256 257 උදකසන්තිකෙ, දියසමීපයෙහි; පතිතෙ, හුනූ; වාපිආදීණං, වැව් ආදීන්ගේ; කූලෙ, ඉවුරෙහිද; පාසාණෙ, පහණපිට; ලග්ගෙ, ඇලුනු; රජෙච, රජස්හිද; නවසොණ්ඩියා, අලුත්කලදීයනැතිකෙම; පතිතෙ, වගුලරජස්හිද අබ්භොකාසුට්ඨිතෙ, අබවසනැහි; වම්මිකෙ, තුඹස්හිද; මත්තිකාඛණ්ඩෙ, මැටිපව්රෙහිද; තථා, එසේමැයි; (වැසිවටසාරමසක් ඉකුත්කල්හි නොකළකුරුවන්නේයි;) ඉට්ඨකාඛණ්ඩකො, අබවසනැගූ උළුපව්ර; යෙභුය්‍යකඨලට්ඨානෙ, බොහෝසේ කැබලිනි ඇති පොළෝතන්හි; තිට්ඨති, සිටී.

258 259 භූමිං, අකැපපොළොව; විකොපයං, කලකුරුවමින්; සඤ්චාලෙත්වා (ඔබ්නොබ) සලා; උම්මාදිං(අබවස සිටි) වැම්ආදී; ගණ්හිතුං, ගන්නටද; ධාරාය, ධාරාවේගයෙන්; භූමිං, (අකැප)

---

* මීයන් විසින් නැගූයේ මූසිකුක්කුර (නම්) මීයන් විසින් උඩරණය කරණලද පසයි.

260 ඝංසිතුං අඞ්ගපච්චඞ්ගං කණ්ඩුරොගී තථාදිසු,
හත්ථංවා ධොවිතුං භූමිං ඝංසිතුං නච කප්පති.

261 ඵම්හාදිමුඤ්ජබබ්බජාරො පාසාණාදිපවට්ටනං,
සාඛාද්ධඞ්කබන්ධනං රුක්ඛලතාච්ඡෙදනඵාලනං.

262 සෙකො පස්සාවආදිනං සුඛවිතක්කස්ස වට්ටති,
අල්ල හත්ථං ඨපෙත්වාන රජග්ගාහො ච භූමියා.

263 අග්ගිස්ස අනුපාදානෙ කපාලෙ ඉට්ඨකාය වා,
පාතෙතුං ලබ්භතෙ අග්ගිං භූමියං වා'වසෙ සති'ති.

---

පොළොව; භින්දිතුං, බිඳින්ටද; විසමං, නොසමතැන්; සමංකාතුං, සමකරණු පිණිස; සම්මජ්ජනිං, මුස්නෙන්; ඝංසිතුං, ගහන්නටද; කණ්ටකාදිප්පවෙසිතුං, කටුආදිරුවන්නටද; පදං දස්සෙස්සාමීති, පියවරක් දක්වම්යි; භූමිං, (අයප) බිම; භින්දතො (පත්ලෙත්)බිඳිමින්, චඞ්කමිතුං, සක්මන් කරන්නටද.

260 කණ්ඩුරොගී, කණ්ඩුතිරොග ඇත්තානු; තථාදිසු, ඉවුරුආදියෙහි; අඞ්ගපච්චඞ්ගං, අඟපසඟ; ඝංසිතුංවා, ගහන්නටද; හත්ථං අත; ධොවිතුං, සොධනපිණිස; භූමිං, (අයප) බිම; ඝංසිතුංවා, ගහන්නටද; නචකප්පති, නොමවටී.

261 262 ඵම්හාදිමුඤ්ජබබ්බජාරො, වැම්ආදිඉඳුරුතෑගීමද; පාසාණාදිපවට්ටනං, පහණ ඈ පෙරළපෙරළා ගෙණ යාමද; සාඛාද්ධඞ්කබන්ධනං, අතුආදි බිම ගහා ඇදගෙණ යාමද; රුක්ඛලතාච්ඡෙදනඵාලනං, මල රුක්වැල් (බිමතබා) කැපීම් පැළීම්ද; පස්සාවආදිනං දියවුනු ආදීන්ගේ; සෙකො, සිඤ්චනයද (වැගිරවීමද,) අල්ලහත්ථං, තෙත්අත්ල; භූමියා, භූමියෙහි; ඨපෙත්වාන,(පමණින් මොලොක්කොට) ඔබා; රජග්ගාහොච, රජස්ගැම්මද; සුඛවිතක්කස්ස, පොළොව් බිඳුම් යන සිත් නැත්තාහට; වට්ටති, වටී.

(හස්තෛකදෙශවූ හස්තතලයම මෙහි හස්තනාමි).

263 අග්ගිස්ස, ගින්නට; අනුපාදානෙ, ඉන්ධනනොවූ (හෙවත්) ගිනිගෙණ නොදැවිය හැකිවූ; කපාලෙ, කබලෙකහෝ; ඉට්ඨකායවා, උළුයෙකහෝ; අග්ගිං, ගිණි දැල්වීමද; අවසෙසති, තමාවිසිබවක් නැති කල්හි(හෙවත්)හස්තදාහාදි ආපදයක් ඇතිකල්හි; භූමියංවා,(හිස්)බිමහෝ; පාතෙතුං, හෙළිමද; ලබ්භතෙ, වටී.

("උපාදියතීති උපාදානං ඉන්ධනං න උපාදානං කපාලාදි".)

("තිණුක්කං ගහෙත්වා ගච්ඡන්තො හත්ථෙ ඩය්හමානෙ භූමියං පාතෙති අනාපත්ති. පතිට්ඨානෙයෙව උපාදානං දත්වා අග්ගිං කාතුං වට්ටති". * යනු අටුවායි.)

---

* තණසුලක් ගෙණයත්තෙ අතදතුලබන කල්හි බිම හෙලාද ඇවැත්නැති. වැටුනු තැන්හිම දර දමා ගිනි දල්වන්ට වටී.

"පරික්ඛාරො"ති

264 පඤ්චවණ්ණෙහි සුත්තෙහි අන්තෙ බද්ධිං ච සිබ්බිතුං,
ගිරිකූටඩ්ඪචන්දාදිං ඡත්තපණ්ණෙ ච ඡින්දිතුං.

265 ඝටිකං වාළරූපං වා දණ්ඩෙ ලෙඛා න වට්ටති,
වට්ටනී දණ්ඩබුන්දම්හි අහිච්ඡත්තකසාදිසං.

266 සිබ්බිතුං එකවණ්ණෙන පඤ්ජරං වා විනන්ධිතුං.
ථිරත්ථං වට්ටති ඡත්තෙ දණ්ඩෙ ලෙඛා ච බන්ධිතුං,

---

"පරික්ඛාරො"ති පරික්ඛාරෙ යත්නෙහි(කැපඅකැප පිරිකරනම්.)

264 පඤ්චවණ්ණෙහි සුත්තෙහි, පස්වණක් පැහැ ඇති හුයින්; අන්තෙ, (පත්කුඩය) ඇතුලෙහිදු; බද්ධිච, පිටත්හිදු; සිබ්බිතුං, රූ ඇතිකොට හිවත්නටද; ඡත්තපණ්ණෙ, කුඩයෙහි සෙවූ පත්හි; ගිරිකූටඩ්ඪචන්දාදිං, මෝරදත් අඩසඳඇ; ඡින්දිතුඤ්ච, කපත්නටද; නවට්ටති, නොවටී. (මුවවිටින් නමා ඇතුලූකල පතහෝ මැඩිලි පත අගහෝ ගිරිකූටාදි කෙරෙත්.)

235 දණ්ඩෙ (සැත්) දඬෙහි; ඝටිකං, කොතුරු පත්ද; වාළරූපං වා, චණ්ඩරූපද; ලෙඛා, හිරිද; නවට්ටති, නොවටී; දණ්ඩබුන්දම්හි, සැත්දඬුමුල හෙවත් කුඩපුඩුමුල, අහිච්ඡත්තකසාදිසං, පිපිහිය හිඝසත්තස්බඳු සටහණ, වට්ටති, වටී.

266 ථිරත්ථං, තරවන පිණිස; එකවණ්ණෙන, නිල් ඇ එක් පැහැඇති හුයින්; සිබ්බිතුං,(පත්කුඩය ඇතුලෙහි පිටත) හිවත්නටද; පඤ්ජරං, කුඩනන; විනන්ධිතුංවා, වෙළත්නටද; වට්ටති, වටී; ඡත්තෙ, සැත්මැඩිල්ලෙහි; බන්ධිතුං, (සුලඟින් නොසැලෙන සේ රැහැණගත්වා දණ්ඩෙහි) බඳනා පිණිස; දණ්ඩෙ, සැත්දඬෙහි; ලෙඛාච(ලණු බඳනා තැන වලල්ලක් මෙන් නැගූ)රෙඛා වක්ම වටී.)

("එකවණ්ණෙන පන නීලෙනවා පීතකෙනවා යෙන කෙනචි සුත්තෙන සිබ්බිතුං ඡත්තදණ්ඩගාහකසලාකපඤ්ජරංවා විනන්ධිතුං වට්ටති තඤ්ච ඛො ථිරකරණත්ථං නවණ්ණමට්ටත්ථාය වාතප්පහාරෙනවා අචලනත්ථං ඡත්තමණ්ඩලිකං රජ්ජුකෙහි ගාහෙත්වා දණ්ඩෙ බන්ධන්ති, තස්මිං බන්ධනට්ඨානෙ වලයම්ව උක්කිරිත්වා ලෙඛං ඨපෙන්ති සා වට්ටති" * යනු අටුවායි.

---

* නිල්වූ හෝ පීතවූ හෝ යම් කිසි එකවත් හුයකින් වනාහි හිවත්නටද ඡත්‍රදණ්ඩග්‍රහණය කරණ නනමැදිරියහෝ වෙළත්නටද වටී. හෙද වනාහි පැහැය හා මටවනපිණිස නොවේ, තරකරණු පිණිසය. හුලත් පහරත්හෝ නොසැලෙනු පිණිස සැත්මැඩිල්ල රැහැන්වලින් ගෙණ දඬුයෙහි බඳිති, ඒ බඳනා තැන්හි වලල්ලක්මෙන් උකුරුවා ඉරනසත් එය වටී.

267 අනෙන පත්තමූබෙවා'පි වෙණ්ණී සඞ්බලිකා'පි වා,
සූචිවිකාරමක්ඛං වා චීවරෙ නච කප්පති,
කප්පබින්දුවිකාරම්පි පාළිකණ්ණිකආදිකං.

268 ගණ්ඨිපාසකවට්ටා'පි චතුකොණා'ව අග්ඝිකා,
මුගගරෙ කක්කටච්ඡාදිවිකාරං හෙ'ත්‍ථ වට්ටති.

269 කොණසුත්තා ච පිළකා දුවිඤ්ඤෙය්‍යාව කප්පරෙ,
ගන්‍ධතෙලංච ලාඛං වා රජනෙ නච පක්ඛිපෙ.

270 රත්තං සඞ්ඛමනිනා ඝට්ටෙය්‍ය'ක්ඛුනවා නච,
කංසෙය්‍ය දෙණ්ණියං කත්වා පහාරෙ නච මුට්ඨිනා.

---

"වඩුනි,බඳුත් බඳනට නිසිතැත් බැවීන් ලණු නොබඳුතුඩු වටි ම"යනු විනය සන්නයි).

267 අනෙන, තුවායෙහි හෝ; පත්තමූබෙවාපි,දෙපත් අග ගැල පුතැණහෝ; වෙණ්ණී, (හමුකරල්වැනි) වෙණද; සඞ්බලිකාපිවා (බලල්දම්වැනි)දම්ද, අක්ඛං(මේ කියෙන්)අනෘවූ;සූචිවිකාරංවා (නත්ගුයින් සතපදිආකාරාදීන් කරණ යම්කිසි)සූචිකම්මවිකාරද; පාළිකණ්ණිකආදිකා,වැලරුසේ ඔබන පෙළකප් කන්කප් ආදිවූ; කප්පබින්දුවිකාරම්පි, කප්බිඳුවිකාරද;.චීවරෙ, සිවුරෙහි; නච කප්පති, නොමවටි.

268 ගණ්ඨිපාසකපට්ටාපි, ගැටපත් මලපත්හුද; චතුකොණාව, සිවුරුස්වූවාහුම (වටිනි) අග්ඝිකා, ඇගැසවහන්ද; මුගගරෙ, මුගුරුසවහන්ද; කක්කටච්ඡාදිවිකාරං, කකුළු ඇස් ඈ සූචිවිකාරද; එත්‍ථ, මේ ගැටවටුපත්පටුයෙහි; නවට්ටති, නොවටී.

269 කොණසුත්තාව (පස්වටුයෙහි සතර) කණින් නිකුත්හුද; පිළකාව(එම්හුය නවනා හෙළා නැගු)පසගුකෙළද;යන මොහු; දුවිඤ්ඤෙය්‍යාව (රැඳුකල්හි) නොදනහැක්කාහුම; කප්පරෙ, වපිත්; ගන්ධ (සුවඳ පිණිස) හඳද; තෙලංවා (උජ්වලබව පිණිස) තෙල්ද; ලාඛංවා (පැහැ පිණිස) ලාද; රජනෙ, රජන්පඹුයෙහි; නචපක්ඛිපෙ, නොලත්තේයි.

270 රත්තං, රැඳුසිවුර; සඞ්ඛන,සකින්හෝ;මනිනා, පහණින් හෝ, අක්ඛුනවා (ඔප්නැගෙන මුගුරු ඈ)අන්කිසිවකින්හෝ; නචඝට්ටෙය්‍ය, නොදගටන්නේය; දෙණ්ණියංකත්වා (රදන්) දෙනතබා, නකංසෙය්‍ය (අතින්ගෙණ) නොදගහන්නේය; මුට්ඨිනා, මිටින්; නචපහරෙ, නොදපහරන්නේයි.

රජනදෙණ්ණිපකිරති එවනබතියේයි යනුදූඅස්වඳුකාබාත් ගහ ටත් වනාගි වටි යනුදූ විනය සන්නයි.

271 කණ්ණකොණකසුත්තානි රජනෙ ඡින්දෙය්‍ය චීවරෙ,
ලෙඛා න වට්ටන්ති ධම්මකරකෙ ඡත්තවට්ටියං.

272 ලෙඛං ඨපෙත්වා මණිකා පිළකා කුඤ්චිකායච,
පිප්ඵලෙච පරිච්ඡෙදලෙඛා දණ්ඩම්හි වට්ටති.

273 මාලාද්‍යරණීයං පත්තමණ්ඩලෙ භත්තිකම්මඤ්ච,
හෙට්ඨා ලෙඛා වයං උබ මගිවිජ්ජාතකසාදිසං.

274 ගිත්වා කත්තරයට්ඨිම්හි සූචිසණ්ඩාසකෙපිච,
යංකිඤ්චි ගිරිකූටාදිවණ්ණමට්ඨං න වට්ටති.

---

271 272 කණ්ණ,(සිවුරෙහි)කන්හූ;කොණකසුත්තානි,(පස්වටු යෙනි) කොන්හූද; චීවරෙ රජනෙ, සිවුර රැඳූකල්හි; ඡින්දෙය්‍ය, කපන්නේයි;(මෙහි සිවුරෙහි දිග පළලද තුවායෙන් පිටතට නික්මවූ හූද සිවුර රඳුවියලනකල එල්වන පිණ්ස තුවායෙහි බඳනා හූද කණ්ණසූත්‍ර නම්.

"චීවරස්ස කණ්ණසුත්තකං න වට්ටති, රජිතකාලෙ ඡින්දිතබ්බං. යම්පන'අනුජානාමි භික්ඛවෙ කණ්ණසුත්තකන්ති, එවං අනුඤ්ඤාතං තං අනුවාතෙ පාසකං කත්වා බන්ධිතබ්බං රජනකාලෙ ලග්ගනත්ථාය" * යනු අටුවායි. "කොන්සුත්තකංයි කී පස්වටුයෙහි කණින් නෙලහූ" යනු වනවිනිසසන්නයි.)

ඡත්තවට්ටියං, සැත්මුවවිට; ලෙඛං ඨපෙත්වා, රෙඛාවක් තබා; ධම්මකරකෙ, ධබරායෙහි; ලෙඛා, (අනන) රෙඛාවක්; නවට්ටති, නොවටී; කුඤ්චිකායච, කෙයස්තෙහිද; පිප්ඵලෙච, කඩකතුරෙහිද; මණිකා, මහත් බුබුලද; පිළකා, කුඩාබුබුලද; න වට්ටති, නොවටී; දණ්ඩම්හි, කඩකතුරු දණ්ඩෙහි; පරිච්ඡෙදලෙඛා, පරිච්ඡෙදරෙඛාවක්; වට්ටති, වටී.

("කුඤ්චිකාය වණ්ණමට්ඨකම්මං න වට්ටති, පිප්ඵලකෙපි මණිකං වා පිළකංවා යංකිඤ්චි ඨපෙතුං න වට්ටති, දණ්ඩකෙ පන පරිච්ඡෙද ලෙඛා වට්ටති" † යනු අටුවායි.)

273 274 අරණීයා, අරණීභාණ්ඩයෙනි; මාලාදි, මාලා (කම්මං)

---

* සිවුරට කන්හූ නොවටී (ඒය) රජත්කළ කල සිඳිය යුතු "මහණෙනි කන්හූය අනුදනිමැයි" මෙසේ යමක් වනාහි අනුදන්නාලදද එය රජත්කළ කල ලග්නා පිණ්ස තුවායෙහි පුඩුවක් කොට බැඳිය යුතු.

† කෙස්සෙහි වණ මට (වන) කම් නොවටී. කතුරෙහිදු මහ බුබුලක්හෝ කුඩා බුබුලක්හෝ යම් කිසිවක් තබන්ට නොවටී. දණ්ඩෙහි වනාහි පරිච්ඡෙද රෙඛාවක් වටී.

275 බිම්බොහනෙ භිසිමඤ්චපීඨාදිසයනාසනෙ,
සම්මුඤ්ජනිම්හි සඞ්කාරජඩ්ඩනෙ රඞ්ගභාජනෙ.

276 පානීයභාජනෙ පාදපීඨෙ කඨලිකායච,
පත්තාධාරපිධානෙසු තාලවණ්ටෙච වීජනෙ.
යං කිඤ්චි මාලාකම්මාදිවණ්ණමට්ඨංචවාරිතං.

277 සෙනාසනෙ පන වාරකවාටාදිප්පභෙදනෙ,
සොවණ්ණමපි'නුඤ්ඤාතං වණ්ණමට්ඨම්හි කා කථා.

---

දිද; පත්තමණ්ඩලෙ, (පාතබන තිපුසීසාදිමය) පාම්බුල්ලෙහි; භ
ත්තිකම්මඤ්ච, (මෝරුදැති මිස සෙසු) භිත්තිකම්මද;(නවට්ටති)
නොවටී; කත්තරයට්ඨිම්හි, සැරයටියෙහි; හෙට්ඨා, යට; (පිළිය)
ලෙඛාමත්තං, රෙඛාදෙකක්ද; උද්ධං, මත්තෙහි; අහිච්ඡත්තකසා
දිසං, හිස්සතුකැකුලක් බදු සටහන්ද; හිත්වා, හැර; වණ්ණමට්ඨං,
වණ්ණමට්ඨකම්මෙක්ද; සූචිසණ්ඩාසකෙ, හිඳිකටු ගහණ දඬුහඬුයෙ
හි; ගිරිකූටාදි, මෝරුදැතීආ; යංකිඤ්චිවණ්ණමට්ඨම්පිච, යම්කිසි
රුවැති දෙයක්ද; නවට්ටති, නොවටී. (උත්තරාරණිය අරණිධනු
කය උපරිපෙල්ලන දණ්ඩකය යනමේ අරණීභාණ්ඩනම්. "කතුරු
වට කොළවර හබුකොට කරණ යවලශුදු වටීම" යනු විනය සත්
නයි.)

275 276 බිම්බොහනෙ, කන්වඩිනෙහිද; භිසිමඤ්චපීඨාදිසය
නාසනෙ, බිසිය ගැදපුටුය බුමුතුරුණුය යනාදි හෝනා හිඳිනා
දැයෙහිද; සම්මුඤ්ජනිම්හි, මුස්නෙහිද; සඞ්කාරජඩ්ඩනෙ, කසළ
හඹුයෙහිද; රඞ්ගභාජනෙ,(රදන් දෙන ආ)රජනභාජනයෙහිද;
පානීයභාජනෙ, (කලකොතලා ආ) පැන්බඳුනෙහිද; පාදපීඨෙ,
දෙව් පාතබනා පොහොරුයෙහිද; කඨලිකායච, නොදෙව් පාත
බන පොහොරුයෙහිද; පත්තාධාරපිධානෙසු, පාත්‍රවලලු පාත්‍ර
පතද; තාලවණ්ටෙච, තල්වැටද; වීජනෙ, සිව්රැස් වීජනියෙහි
ද; මාලාකම්මාදි, මාලංකම්මාදිවූ; යංකිඤ්චිවණ්ණමට්ඨං, (මාහම්
රුව්නා) යම් කිසි රුවැතිදෙයක්; අවාරිතං, නොවලක්වනලදී.
("කීවුතායෙහි මහණනට මාහම් රූ මිස සෙසු වණ්ණමට වටි
යෙත්" යනු විනය සන්නයි.)

277 වාරකවාටාදිප්පභෙදනෙ, දොරකවුළු දොරබා ආ ප්‍රභෙදආ
ති; සෙනාසනෙපන, (ප්‍රාසාදාදිවූ) සෙනාසනයෙහි වනාහි; සො
වණ්ණමපි, රන්කමුදු; අනුඤ්ඤාතා, අනුදන්නාලද; වණ්ණම
ට්ඨම්හි, අත්රුවැතියෙහි; කාකථා, කියනුකිම.

278 විසාණනාලාලාබුවාදිප්පභෙදෙ තෙලභාජනෙ,
පුම්ත්‍ථිරූපරගිතං වණ්ණමට්ඨම්වාරිතනති.

---

"භෙ ස ජ්ජ නති."

279 ජනස්ස කාතුං භෙසජ්ජං දාතුං වත්තුං න ලබ්භති,
භික්ඛාචරියවිඤ්ඤත්ති සකෙහි සහධම්මිනං.

280 පිතූනහං තදුපට්ඨාකභික්ඛුනිස්සිතභණ්ඩුනං,
ලබ්භං භෙසජ්ජකරණං වෙය්‍යාවච්චකරස්ස ච.

281 මහාචූළපිතාමාතාභාතාභගිනීආදිනං,
තෙසං සකෙන'ත්තනියෙ දාතබ්බං තාවකාලිකං.

---

279 විසාණනාලාලාබුවාදිප්පභෙදෙ, තෙල්හං තෙල්නල තෙල් ලබු ඈ ප්‍රභෙද ඇති; තෙලභාජනෙ, තෙල්බජනෙහි; පුම්ත්‍ථිරූ පරගිතං, මාගම් පිරිමි රූ නැත්තාවූ; වණ්ණමට්ඨං, වණමට; අ වාරිතං, නොවලකනලදී.

---

"භෙසජ්ජනති" භෙසජ්ජං යත්නෙහි (බෙහෙත්කිරීම් කරවීම් ඈ නම්)

279 280 ජනස්ස, (නොනෑ) ජනයාහට; භෙසජ්ජං, බෙහෙත්; කාතුං, කරන්නටද; දාතුං, දෙන්නටද; වත්තුං, කියන්නටද; නලබ්භති, නොවටී; භික්ඛාචරිය, සිඟාලද (බෙහෙදින්) විඤ්ඤත්ති, විණවාලද (බෙහෙදින්) සකෙහි, තමාඅයත් (බෙහෙදින්;) සහධම්මිනං, පඤ්චසහධම්මිකයන්ටද, පිතූනහං, මව්පියන්ටද; තදුපට්ඨාක, මව්පියන්හට මෙහෙකරන්නේය; භික්ඛුනිස්සිත, භික්ෂූන් නිසා වසන්නේය; භණ්ඩුනං, පඬුපලාසය යන මොවුන් ටද; වෙය්‍යාවච්චකරස්සච, (තමාගේ) මෙහෙකරුවාහටද; භෙසජ්ජකරණං, බෙහෙත් කිරීම; ලබ්භං, වටී.

281 මහාචූළපිතා, මහළුපිය සුලුපියෝය; මාතා, මහළුමව් සුලු මවිය; භාතා, මල්බෑයෝය; භගිනිආදිනං, නගුබුනුන්හුය; ("ආදි" ගහණින් ගත් නෑදමයිලෝය යන;) තෙසං, ඒදසදෙනාහට; සකෙන, උන්සතු බෙහෙදින් (බෙහෙත් කාට්ටුනුය) අත්තනියෙ, (අස ති) උත්සතු බෙහෙත් නැතිකල්හි; තාවකාලිකං, (තාවකාලිකො ට ගන්වයි කියන විසින් හෝ තමන්ට ඇති සදදෙති යන අභො ග විසින් හෝ) තාවකාලිකකොට; දාතබ්බං, (තමාසතු බෙහෙත්) දියයුතු. ("එසේ නොදිනිහොත් යඩාදෙය්‍ය විනිපාතිනම්වෙයි යෙනි" යනු මෙහි සන්නයි. "සචෙ පටිදෙන්ති ගහෙතබ්බං නොචෙ දෙන්ති න චොදෙතබ්බං" * යනු අටුවායි.)

---

* ඉදින් පෙරලා දෙත්නම් ගතයුතු නොම්දෙත්නම් චොද නා නොකොටයුතු.

282 කුලදූසනවිඤ්ඤත්තිභෙසජ්ජකරණාදිහි,
මාතාපිතූහි සම්බන්ධඤාතකෙසු න රූහති.

283 පිණ්ඩපාතො අනාමට්ඨො මාතාදීනමවාරිතො,
ජනානං දාමරිචොරස්ස දාතුමිස්සරියස්ස ච.

284 තෙසං සුත්තොදකෙනෙව පරිත්තං කරෙ නාත්තනො,
භණිතබ්බං භණාපෙන්තෙ පරිත්තං සාසනොගධං.

285 සීලං ධම්මං පරිත්තං වා ආගන්ත්වා දෙතු භාසතු,
දාතුං වත්තුඤ්ච ලභති ගන්ත්වා කෙනචි පෙසිතො'ති.

---

282 කුලදූසන, (පුප්ඵඵලදානාදියෙන්) කුලදූෂණය; විඤ්ඤත්ති, (සතර පසය) විඤ්ඤප්තිය; භෙසජ්ජකරණාදිහි, බෙහෙත් කිරීමය යනාදීන් වනාහි; මාතාපිතූහි, මව් පියන්හා; සම්බන්ධ, සත්වන කුලපරම්පරාව දක්වා එක්බැඳිවූ; ඤාතකෙසු, නෑයන්කෙරෙහි; නරූහති, නොනැගේ; (ආපත්තිජනක නොවේ.)

(මෙහි "ආදි" ග්‍රහණීන් අනාමට්ඨපිණ්ඩපාතදාන පරිත්තොදක පරිත්තසුත්තදාන දූතෙය්‍ය ජඞ්ඝපෙසනික යන මෙතෙක්ද ගත්තාලදී.)

283 අනාමට්ඨො, අග්‍රයින් නොගත්තාලද; පිණ්ඩපාතො, අහර; මාතාදීනං, මව්පියආදීවූ; ජනානං, (යටකී) සඳෙනාහටද; දාමරි චොරස්ස, ගම් චොල්ලොගත්තා ප්‍රසිද්ධ සොරහටද; ඉස්සරියස්සච, ඉසුරුහටද; දාතුං, දෙන්නට; අවාරිතො, නොවලකනලදී.

("එත්ථ පණ්ඩුපලාසස්ස ඨාලකෙ පක්ඛිපිත්වා'පි දාතුං වට්ටති, තං ඨපෙත්වා අඤ්ඤෙසං අගාරිකානං මාතාපිතූනම්පි නවට්ටති. පබ්බජිතපරිභොගොහි අගාරියානං චෙතියට්ඨානසදිසො" * යනු අටුවායි.)

284 තෙසං, ඒ නොනෑ ගිහිමිනිසුන්ගේ; සුත්තොදකෙනෙව, හුයෙන් හා දියෙන්ම; පරිත්තං කරෙ, පිරිත්කරන්නේය; නාත්තනො, තමා අයත් සූත්‍රොදකයෙන් නොකරන්නේයි; භණාපෙන්තෙ, (පිරිත්) බණවන කල්හි; සාසනොගධං, ශාසනපර්‍යාපන්නවූ; පරිත්තං, (රතනපරිත්තාදි) පිරිත්; භණිතබ්බං, බිණියයුතු.
285 ආගන්ත්වා, අවුත්; සීලංදෙතු, සිල්දෙත්වයි හෝ; ධම්මං, බණ (කියත්වයි හෝ); පරිත්තං භාසතුවා, පිරිත් බෙණෙත්වයි හෝ; කෙනචි, (රජ යුවරජ ආදී) කිසිවෙකුහු විසින්; පෙසිතො, (ආරාධනාකො

---

* මෙහි පණ්ඩුපලාසකාහට තල්ලුතැටියෙහි බහා දෙන්වද වටී. ඒ හැර අනික් ගෘහස්ථවූ මව් පියන්ටත් (තල්ලුතැටියෙහි බහා දෙන්ට) නොවටී. ප්‍රව්‍රජිතපරිභොගය වනාහි ගෘහස්ථයන්ට චෛත්‍යස්ථානයක් බඳු (වෙ) යි.

"උග්ගහො"ති.

286 කම්මචෙතියසඞ්ඝඤ්ඤපුග්ගලත්ථං ගණස්ස ච,
දසභෙදම්පි රතනං උග්ගණ්හන්තස්ස දුක්කටං.

287 නිස්සග්ගි තෙසු අත්තත්ථං ද්වීසු සෙසෙසු දුක්කටං,
අනාමසිත්වා වුත්තෙන ච ගණං සඞ්ඝඤ්ච පුග්ගලං.

288 චෙතියස්ස නවකම්මස්ස දම්මී'ති න පටික්ඛිපෙ,
වදෙ කප්පියකාරානං වදන්තෙවමිමෙ ඉති.

---

ට) එවලද්දේ; ගහාඩා, ගොස්; දැතූං, (සිල්) දෙත්වද; එනෑනු ඤ්ව, (බණ) කියත්වද;(පිරත් බණන්නවද;) ලහති, ලැබේ.

---

'උග්ගහො'ති, උග්ගහොයත්නෙති(අකැප වත් පිළිගැණුම්නම්.)

286 කම්ම, නවාම් පිණිසද; චෙතිය, දාගැබ් පිණිසද; සඞ්ඝ, සඞ්ඝයා පිණිසද; අඤ්ඤපුග්ගලත්ථං, අනිස්පුඟුලකු පිණිසද; ගණස්සච, (සූත්‍රාන්තිකාදි) ගණයකටද; දසභෙදම්පිරතනං,(මුතුමැණික් ආ)දසවිධවූ රුවනම; උග්ගණ්හන්තස්ස, ගන්නාහට; දුක්කටං, දුකුළාවේ.

287 288 තෙසු, ඒ දසවිධවූ රත්නයන් අතුරෙහි; අත්තත්ථං, තමා පිණිස;(ගන්නාහට)ද්වීසු,(ජාතරූපරජත)දෙක්හී; නිස්සග්ගි, නිසගිපචිති වෙයි; සෙසෙසු, සෙසු රුවන්හි; දුක්කටං, දුකුළාවේ; ගණං, ගණයක්ද; සඞ්ඝඤ්ච, සංඝයාද; පුග්ගලං, පුද්ගලයෙකුද; අනාමසිත්වා, නොගෙණ; චෙතියස්ස, චෛත්‍යයට (දෙම්) නවකම්මස්ස දම්මීති, නවකර්මයට දෙමියි; වුත්තෙන ච, කීකල්හි වනාහි; න පටික්ඛිපෙ, ප්‍රතික්ෂෙප නොකරන්නේය; ඉමෙ එවං වදන්තීති, මොහු මෙසේ කියතියි; කප්පියකාරානං වදෙ, කැපකරුවන්ට කියන්නේයි.

("සචෙ'පි කොචි ජාතරූපරජතං ආනෙත්වා ඉදං සඞ්ඝස්ස දම්මි ආරාමංවා කරොථ චෙතියංවා භොජනසාලාදීනංවා අඤ්ඤතරන්ති වදති ඉදම්පි සම්පටිච්ඡිතුං න වට්ටති සචෙ පන සඞ්ඝංවා ගණංවා පුග්ගලංවා අනාමසිත්වා ඉදං හිරඤ්ඤසුවණ්ණං චෙතියස්ස දෙම විහාරස්ස දෙම නවකම්මස්ස දෙමා'ති වදන්ති පටික්ඛිපිතුං න වට්ටති. ඉමෙ ඉදං වදන්තී'ති කප්පියකාරකානං ආචික්ඛිතබ්බං." * යනු අටුවායි.)

---

* ඉදිහුදු කිසිවෙක් දෑරු රිදී ගෙණවුත් මෙය සඟුටදෙමි අරමක්හෝ චෛත්‍යයක්හෝ බොජුන්හල්ආදින් අතුරෙන් එක්තරදෙයක්හෝ කරවිති කියානම් මෙත් පිළිගන්ට නොවටී. ඉදින් වනාහි සඟහෝ ගණයාහෝ පුඟුලුහෝ අනමැස මේ හිරන්රුවන් සෑයට දෙමු වෙහෙරට දෙමු නවාම්පිණිස දෙමුයි කියත්නම් පිළිකෙව්නට නොවටී. මොව්හු මෙය කියත්යයි කැපකරුවන්ට කියයුතු.

289 ඛෙත්තං වත්ථුං තළාකං වා දෙන්තෙ දාසපස්වාදිකං,
පටික්ඛිපිත්වා ගණ්හෙය්‍ය කප්පියෙන කමෙන ච,
ඛෙත්තාදීනි විහාරස්ස වුත්තෙ දම්මී'ති වට්ටති.

290 නවමාතිකකෙදාරතළාකකිරියා භවෙ,
මත්තිකුද්ධරණං බන්ධො පිරිකාරෙ ච ආළියා,

---

289 ඛෙත්තං, ක්ෂෙත්‍රයක්හෝ; වත්ථුං, (උඩුවතු තලවතුඈ) වත්තක්හෝ; තළාකංවා, වැවක්හෝ; දාසපස්වාදිකං, දැසිදැස්ගෙරි මීවුන් ඈහෝ; දෙන්තෙ, (සඟහට ගණහට පුද්ගලහට දෙම්යි) දෙනකල්හි; පටික්ඛිත්වා, (නොවටනේයයි) ප්‍රතික්ෂෙපකොට; කප්පියෙන කමෙන, (නැවත) කප්පිය ක්‍රමයෙන්; ගණ්හෙය්‍ය, ගත්තේය; ඛෙත්තාදීනි, ක්ෂෙත්‍රාදීන්; විහාරස්සදම්මී'ති, විහාරයට දෙම්සි; වුත්තෙ, කීකල්හි; වට්ටති, වටී.

(“කප්පියෙන කමෙන ගහණං නාම, ඛෙත්තං දම්මි වත්ථුං දම්මි තළාකං දම්මි දාසං දම්මි ගොමහිසඅජෙළකාදයො දම්මී'ති වුත්තෙ න වට්ටති'ති පටික්ඛිපිත්වා ඉතො චත්තාරෙ පච්චයෙ පරිභුඤ්ජථා'ති වා චතුපච්චයපරිභොගත්ථාය දම්මී'ති වා සඞ්ඝො උදකං පරිභුඤ්ජිස්සතු භණ්ඩකං ධොවිස්සතු'ති වා ආරාමිකං වෙය්‍යාවච්චකරං කප්පියකාරකං දම්මී'ති වා පඤ්චගොරසපරිභොගත්ථාය දම්මී'ති වුත්තෙ වා අථා'පි මම තළාකං වා පොක්ඛරණිං වා සඞ්ඝස්ස දම්මී'ති වුත්තෙ සාධු උපාසක සඞ්ඝො පානීයං පිවිස්සති භණ්ඩකං ධොවිස්සති මිගපක්ඛිනො පිවිස්සන්ති'ති වත්වා වා සම්පටිච්ඡනං.” *)

290 නවමාතිකකෙදාරතළාකකිරියා, අලුත ඇලබිඳීම් කුඹුරු තැනීම් වැව් බැඳීම්ද; අනවෙ, (කැප විසින් පිළිනත්) පරණවැව්හි; මත්තිකුද්ධරණං, (ඇතුලු වැවින්) පස් කපා නැගීමද; බන්ධො (සුත් වෑකඩ) බැඳීම්ද; ආළියා, වැම්යර; පිරිකාරෙච, (පිඩිගසා දුව්ලතැන්) තරකිරීම්ද.

---

* කෙතක් දෙම් වත්තක් දෙම් වැවක් දෙම් දාසයකු දෙම් ගවමිව් තිරලු එලු ආදීන් දෙම්යි කීකල්හි නොවටනේයයි පිළිකෙව්කොට මෙයින් සිව්පස පරිභොග කරව්යිහෝ සිව්පසපරිභොග පිණිස දෙම්යිහෝ සඞ්ඝතෙමේ ජලපරිභොගකරාවායිහෝ බඩු සොදාවායිහෝ ආරාමිකයෙකු වත්පිළිවෙත් කරන්නෙකු කැපකරුවෙකුදෙම්යිහෝ පස්ගොරස පරිභොග පිණිසදෙම්යි කී කල්හිහෝ (පිළිගැම්ම) කැපක්‍රමයෙන් ගැණීමනම් (වෙයි) නොහොත් මාගේ තටාකයගෝ පුෂ්කරණීයගෝ සංඝයාට දෙම්යි කීකල්හි උපාසකය යහපත සංඝතෙමේ පැන්පානය කරන්නේය බඩු සෝදන්නේය මුවපක්ෂීහු බොතියි කීයාගෝ පිළිගැණීම (කැපක්‍රමයෙන් පිළිගැම්ම නම්වෙයි.)

291 අතිරෙකභාගදානං * කෙදාරෙ අනවෙ නවෙ,
අපරිච්ඡින්නභාගෙ ච සස්සෙ දෙථෙත්තකෙ ඉති.
කහාපණුට්ඨාපනං ච සබ්බසම්පි අකප්පියං.

292 අවත්වා කස වපි'ච්චාදිමෙත්තිකාය ච භූමියා,
පතිට්ඨාපෙති භූමිං වා භාගො දෙය්‍යො'ති එත්තකො.

293 භූමිභාගෙ කතං සස්සමෙත්තකෙ ගණ්හ'ෙත්තකං,
ගණ්හනත්ථං වදන්තෙවං පමාණං දණ්ඩරජ්ජුභි.

294 මිණනෙ රක්ඛණෙ ඨත්වා ඛලෙ තං නීහරාපනෙ,
කොට්ඨාදිපටිසාමනෙ තස්සෙවෙතමකප්පියං.

295 පටිසාමෙය්‍ය පාචිත්ති යංකිඤ්චි ගිහිසන්තකං,
භණ්ඩාගාරිකසීසෙන සබ්බෙ'පි පිතුසන්තකං.

---

291 අනවෙ කෙදාරෙ, පරණ කුඹුරෙහි; අතිරෙකභාගදානං, (පෙරසිරිත්සේ නොගෙණ) වඩා භාග ගැම්මද; අපරිච්ඡින්නභාගෙ,(මේ බිම සා වවුවත් මෙතෙක් දියයුතුයයි)නොපිරිසිඳුන්භාගඇති; නවෙච, අලුත් කුඹුරෙහිද; සස්සෙ, (කලාවූ මෙතෙක්) ගොයම්හි; එත්තකෙ දෙථ ඉති, මෙතෙක් කහවනු දෙවයි; කහාපණුට්ඨාපනඤ්ච, කහවණු නැගීම්ද; සබ්බසම්පි, හැමදෙනාහටම; අකප්පියං, අකැපයි.

292 කස වප ඉච්චාදිං, සහව වපුරව යනාදි(අකැපතෙපුල්;)අවත්වා, නොකියා; එත්තිකාය ච භූමියා, මෙතෙක් කුඹුරෙහි, එත්තකො භාගො, මෙතෙක් කොටස්; දෙය්‍යොති, දියයුත්තේයි; භූමිංවා, භූමියහෝ; පතිට්ඨාපෙති, පිහිටුවාද.

293 291 එත්තකෙ භූමිභාගෙ, මෙතෙක් බිම්කොටස්හි; සස්සං කතං, ගොයම්කරණලද; එත්තකං ගණ්හථ, මෙතෙක් භාග ගත්වයි; එවං, මෙසේ; වදන්තෙන, (ගොයම්කලවුන්) කියනකල්හි; පමාණං ගණ්හනත්ථං,(උත්කියනු නොඅදහා තමාම කුඹුරෙහි) පමණ දන්නා පිණිස; දණ්ඩරජ්ජුභි, යටිත්හා රැහැණින්; මිණනෙ, මිනීමෙහිද; ඛලෙ ඨත්වා, කලවිට සිට;රක්ඛණෙ, (අනුන් නොසෙසින් නොගනදි) රැක්මෙහිද; තං, ඒ ධාන්‍යය; නීහරාපනෙ,(කලවිටින්)ගෙණයැවීමෙහිද; කොට්ඨාදිපටිසාමනෙ, (ගෙණගිය ධාන්‍යය) කොටුගේ ආදියෙහි ලවා සැඟවීමෙහිද; එතං, මේ ධාන්‍යය; තස්සෙව, ඕහටම; අකප්පියං, (ධාන්‍යවිචාරයකළහෙයින් ඕහටම) අකැපයි.

295 පිතුසන්තකම්පි, මව්පියන් සන්තකදවූ; ගිහිසන්තකං, ගි

---

* අතිරෙකභාගගහණං—පොත්

296 පිතුන්නං කප්පියං වත්ථුමවස්සං පටිසාමියං,
අත්තනො සන්තකං කත්වා ලබ්භතෙ පටිසාමිතුං.

297 දෙහී'ති පටිසාමෙත්වා වුත්තො වා'පි පටික්ඛිපෙ,
පාතෙත්වාන ගතෙ ලබ්භං පළිබොධො'ති ගොපිතුං.

298 කම්මං කරොන්තා ආරාමෙ සකං වඩ්ඪකි ආදයො,
පරික්ඛාරං ච සයනභණ්ඩං වා රාජවල්ලභා.

299 දෙහී'ති පටිසාමෙත්වා වදන්ති යදි ඡන්දසො,
න කරෙය්‍ය භයා ඨානං ගුත්තං දස්සෙතු වට්ටති.

300 බලක්කාරෙන පාතෙත්වා ගතෙසු පටිසාමිතුං,
භික්ඛුං මනුස්සා සඞ්කන්ති නට්ඨෙ වත්ථුම්හි තාදිසෙ.

301 විහාරාවසථස්සන්තො රතනං රතනසම්මතං,
නික්ඛිපෙය්‍ය ගහෙත්වාන මහග්ඝෙ'රක්ඛෙ'පි තාදිසෙ,
සාමිකානාගමං ඤත්වා පතිරූපං කරිස්සති'ති.

---

ගිහිනිසුත් අයත්; යංකිඤ්චි, (කැපඅකැප) යම්කිසි වස්තුවක්; භණ්ඩාගාරිකසීසෙන, භාණ්ඩාගාරිකශීර්ෂයෙන්; (රැකදෙමි යන සිතින්;)සචෙ, ඉදින්; පටිසාමෙය්‍ය, සඟවාතබානම්; පාචිත්ති, පචිත්තිවේ.

296 පිතුන්නං, මව්පියන් අයත්වූ; අවස්සං පටිසාමියං, අවශ්‍යයෙන් හඟාතිබිය යුතුවූ; කප්පියං වත්ථුං,(පිළිඈ)කැපවස්තුව; අත්තනො සන්තකං කත්වා, තමාසතු කොට; පටිසාමිතුං, සඟවා තබන්නට; ලබ්භතෙ, වටී.

297 පටිසාමෙත්වා, සඟවාතබා; දෙහීති, දෙවයි; වුත්තොවාපි, කියන ලද්දේද; පටික්ඛිපෙ, (නොවටනේයයි) ප්‍රතික්ෂෙපකරත්තේය; පාතෙත්වාන,(රැකදෙවයි) තබාපියා, ගතෙ, (මව්පියන්නි පෙළින්) ගියකල්හි; පළිබොධො ති,(අද්‍යාරාමසිකපද විසින්)පළිබොධයයි; ගොපිතුං, රකින්ට; ලබ්භං, වටී.

298 299 ආරාමෙ, වෙහෙර; කම්මං කරොන්තා, කර්මාන්තකරන්නාවූ; වඩ්ඪකිආදයො, වඩුඈදීහු; සකං පරික්ඛාරං වා,(වෑපොරොඈ) තමන්ගේ පිරිකරහෝ; රාජවල්ලභා, රාජවල්ලභයෝ; සයනභණ්ඩංවා,(තමන්ගේ හෝනා කළාල් පිඩාම්ඈ) සයනභාණ්ඩහෝ;පටිසාමෙත්වාදෙහීති, සඟවා තබාපියා දෙවයි;යදි වදන්ති, ඉදින් කියත් නම්; ඡන්දසො,(වඩුආදින්කෙරෙහි) ස්නෙහයෙන්ද; භයා, (රාජවල්ලභයන් කෙරෙහි) භයින්ද; නකරෙය්‍ය, නොකරන්නේයි; ගුත්තට්ඨානං, රක්ෂස්ථානයක්; දස්සෙතුං, (මෙහිත බවයි නොකියා මෙතැන රක්ෂා ඇතැයි) දක්වත්; වට්ටති, වටී.

300 301 බලක්කාරෙන, බලාත්කාරයෙන්; පාතෙත්වා, තබාපි

"දූසනන්ති".

302 පුප්ඵං වෙළුං ඵලං චුණ්ණං අනාතකට්ඨං ච මත්තිකං,
කුලසඞ්ගහාත්‍ථං දදතො කුලදූසනදුක්කටං,

යා; ගහෙතුං, ගියකල්හි; පටිසාමිතුං, සඟවා තබන්නට(වරී;) ච තුවිනි,(රන්පිළිඈ)වස්තුවක්; නට්ඨෙ,(යම්බඳුනැතෙත)නටකල්හි; මනුස්සා,(ගිහි)මිනිස්නු; ඟිත්තබ්බං, මහනාහු; ආසඞ්කන්ති, සැක කෙරෙද්ද; තාදිසෙ, එබඳුවූ; විහාරාවසථස්සන්තො, විහාරයෑතුලෙහි(නමාවසන)ගෙය ඇතුලෙහි(තුබූ;)රතනං,(මුතුමැණික්ඈ) රුවනක්හෝ; රතනසම්මතං, රුවනැයි සලකනලද (පිළිඈ කැපවතක්හෝ; ගහෙත්වාන, ගෙණ; නික්ඛිපෙය්‍ය (හිමියන්දක්නාතෙක්) නගාතබන්නේයි; තාදිසෙ, එබඳුවූ (මහණුන්කෙරෙහි සැක කරන්වද නිසිතැන්වූ;)මග්ගෙ, මාර්ගයෙහිද; අරඤ්ඤෙපි, අරණ්‍යයෙහිද; (තුබූ භාණ්ඩයක් දැක) සාමිකානාගමනක්ඛිත්වා (මගින් පහව බලානිද) හිමියන්ගේ නොඊමදුන; පතිරූපං කාරියසනි, සුදුස්සක් කරන්නේයි. ("පතිරූපන්ති රතනසම්මතෙ පංසුකූලගහණං, රතනෙ නිරුස්සුක්කගමණං.*

"මුත්තං මණිං වෙළුරියඤ්ච සඞ්ඛං
සිලප්පවාළං රජතං සුවණ්ණං
මසාරගල්ලම්පි ච ලොහිතඞ්කං
දසප්පකාරං රතනං වදන්ති" †

"මග්ගෙ අරඤ්ඤෙ තාදිසං භණ්ඩං පස්සිත්වා මග්ගා ඔක්කම්ම නිසීදිතබ්බං, සාමිකෙසු ආගතෙසු තං ආචික්ඛිතබ්බං, සචෙ සාමිකෙ නපස්සති රතනසම්මතං පංසුකූලං ගහෙතබ්බං, රතනඤ්චෙ හොති තුණ්හීභූතෙන ගන්තබ්බං" ‡යනුමෙහි අටුවායි.)

"දූසනන්ති"දූසනං යත්නෙහි (කුලදූෂණ නම්).

302 පුප්ඵං, (සපුමල්ඈ) මල්හෝ; වෙළුං, (හිදෙළුයවඈ) හුන

* පතිරූපං යනු රුවන්සම්මතදෙයක් වූකල පංසුකූල (සංඥයෙන්)ග්‍රහණය, රත්නයක්වූකල නිරුත්සාහව යාමයි.

† මුතුය මැණික්ය වෛරෝඩ්මිණිස සක්ය සිලාය පබලුය රිදීය සුවර්ණය මැසිරිගල්ය පද්මරාගමිණිය (හෙවත්) රතුකැටය යන මොහු දශප්‍රකාර රත්නයයි කියති.

‡ මාර්ගයෙහි හෝ අරණ්‍යයෙහි හෝ එබඳු බඩුවක් දැක මගින් ඉවත්ව හිඳියයුතු, සැමියා ආකල එය කියයුතු, ඉදින් සැමියා නොදක්නේ නම් රුවනැයි සම්මතදෙය පංසුකූලසංඥයෙන් ගතයුතු, ඉදත් රුවන් වේනම් තුෂ්ණීම්භූතව යායුතුයි.

303 ථූලච්චයං ගරුභණ්ඩම්ස්සරෙනෙත්ථ සඞ්ඝිකං,
දෙන්තස්ස දුක්කටාදීනි ථෙය්‍ය සඞ්ඝඤ්ඤසන්තකං.

304 කුලසඞ්ගහත්ථං රොපෙතුං රොපාපෙතුඤ්ච සබ්බථා,
ඵලපුප්ඵූපගං රුක්ඛං ජග්ගිතුඤ්ච න වට්ටති.

---

හෝ; ඵලං, (තාලපනසාදි) ඵලහෝ; චුණ්ණං, (මහරිඳුණුආ) ඳුණුහෝ; දන්තකට්ඨංවා, දැහැටිදඬුහෝ; මත්තිකං,(පියවිම්මැටිආ) මැටිහෝ; කුලසඞ්ගහත්ථං, (පසයනිසා) කුලත්සගන්නාපිණිස; දදතො, දෙන්නාහට; කුලදූසනදුක්කටං, කුලදූෂණ දුකුළාවේ.

303 එත්ථ, මේ පුප්ඵාදියෙහි; සඞ්ඝිකං, සඟසතුවූ; ගරුභණ්ඩං, ගරුභාණ්ඩය; ඉස්සරෙන, ඓශ්වර්යයෙන්; (ඉසුරුපවත්වා) දෙන්තස්ස, (කුලසගන්නාසඳහා) දෙන්නාහට; ථූල්ලච්චයං, ථුලසි වෙයි; සඞ්ඝඤ්ඤසන්තකං, සඟසතු පුඟුලුසතු(මල් ආ); ථෙය්‍ය, සොරසිතින(දෙන්තස්ස, කුලසංග්‍රහ සඳහා දෙන්නාහට;)දුක්කටාදීනි; (භාණ්ඩයෙහි අගය තුබූසේ)දුකුළාආදීහු වෙත්.

("තත්ථ යො හරිත්වා වා හරාපෙත්වා වා පක්කොසිත්වා වා පක්කොසාපෙත්වා වා සයං වා උපගතානං යං කිඤ්චි අත්තනො සන්තකං පුප්ඵං කුලසඞ්ගහත්ථාය දෙති දුක්කටං,පරසන්තකං දෙති දුක්කටමෙව, ථෙය්‍යචිත්තෙන දෙති භණ්ඩග්ඝෙන කාරෙතබ්බො, එසෙව නයො සඞ්ඝිකෙ'පි' අයංපන විසෙසො. සෙනාසනත්ථාය නියාමිතං ඉස්සරවතාය දදතො ථූල්ලච්චයං" * යනු අටුවායි. "සෙනාසනත්ථාය නියාමිතං ගරුභණ්ඩං හොති" යනු මෙහි ටීකායි "භික්ඛුසඞ්ඝං අභිභවිත්වා ඉස්සරවතාය විස්සජ්ජෙන්තො ථුල්ලච්චයං ආපජ්ජති" †

304 කුලසඞ්ගහත්ථං, කුලත් සගන්නා පිණිස; ඵලපුප්ඵූපගං රුක්ඛං, මල්ගා පත් දෙන රුක්; රොපෙතුං, රොපනය කරන්නට ද; රොපාපෙතුංච, රොපනය කරවන්නටද; ජග්ගිතුඤ්ච (වැටකිරීම්ආදී විසින්) පිළිදග්නටද; සබ්බථා, (කප්පියවොහාර අකප්පිය වොහාරාදී) හැමපරිද්දෙන්ම; නවට්ටති, නොවටී.

---

* එනි යමෙක් ගෙණැවිත් හෝ ගෙණ්ණවා හෝ කැඳවා හෝ කැඳවාවා හෝ තමන්ම පැමිණිවූන්ට හෝ යම්කිසි තමා සතු දෑපයක් කුලයා සගන්නා පිණිස දෙයිනම් දුකුළාවේ. අනුන් සන්තකය දෙයිනම් දුකුළාමය. සොරසිතින් දේනම් බඩු අගින් කාරුතුත්තේය. සඟසතුදෙයෙහි ද මෙම්ම නයයි. මේ වනාහි වෙනසයි සෙනසුන් පිණිස නියමකරණලද (ගරුබඩු තමන්ම ඉසුරුමත් භාවයෙන්) දෙන්නාහට ථුලැසිය.

† බික්සඟුන් අබිබවා ඉසුරුමතුන්ට හරණේ ථුලැසියට පැමිණෙයී.

305 නිමිත්තොභාසතො කප්පවොහාරපරියායතො,
අත්තනො පරිභොගත්‍ථං රොපාපනාදි ලබ්භරෙ.

306 චුතතාව වෙජ්ජකා ජඞ්ඝපෙසනෙ ගිහිකම්මසු
ඨපෙත්වා පිතරො භණ්ඩුං වෙය්‍යාවච්චකරං සකං.

307 දුක්කටං පදවාරෙන හරණෙ දූතසාසනං,
සාසනං අග්ගහෙත්වා'පි පඨමං වදතො පුන.

---

305 නිමිත්ත, නිමිත්ත (කර්‍ම) විසින්ද; ඔභාසතො, ඔභාස විසින්ද; කප්පවොහාර, කප්පියවොහාර විසින්ද; පරියායතො, පරියාය විසින්ද; අත්තනො, තමහට; පරිභොගත්‍ථං, ඵලපරිභොග පිණිස; රොපාපනාදි, රොපනය කරවීම් ආදිහු; ලබ්භර, වපින්. (මෙහි "නිමිත්ත" නම් හුදළු ආදිගෙණහැර සාමණෙරාදීන් සමීපයෙහි තැබීමයි. "ඔභාස" නම් හුදළු ආදිද මල් රුක්ද ගෙණ සිටීමයි. "කප්පියවොහාර" නම් මේ රුක වනසේ දන මේ වල වනසේ දන යනාදි වචනයි. "පරියාය" නම් නොබෝකලකින් උපකාරයට වැටෙන හෙයින් මල්,රුක් ආදීහු නුවනැත්තන් විසින් රොපනය කරවිය යුත්තාහ යනාදි වචනයි.)

306 307 වෙජ්ජකා, පිළියම්; චුතතාව, (යට) කියනලදමය; ජඞ්ඝපෙසනෙ, (ගිහින් කී හසුන් ගෙණ යන) කකුල්මෙහෙයෙහි (විනිශ්චයකියනුලැබේ) ගිහිකම්මසු, (කෘෂිවණිජ්ජාදිවූ) ගිහිමිනී; සූත්ගේ කටයුත්තෙහි; පිතරො, මව්පියන්ද; භණ්ඩුං, පණ්ඩුපලාං සයාද; සකං වෙය්‍යාවච්චකරං, තමාගේ මෙහෙකරුවාද; ඨපෙත්වා, තබා; දූතසාසනං, ගිහින්ගේ හසුන්; හරණෙ, ගෙණයාමෙහි; පදවාරෙන, පියවර විසින්; (හෙවත්) පෙදෙහි පෙදෙහි; දුක්කටං, දුකුළාවෙයි; පඨමං, පළමුකොට; සාසනං, හසුන්; අගගෙහෙත්වා, නොගෙණ; පුන, නැවත; වදතොපි, කියන්නාහටද,(දුක්කටං,) දුකුළාවේ. "අගහෙත්වාපි යනු යෙහිදු ඇවැත්ම කියමින් එව්නු කිපු හසුන්ම කියනෙමි යන බැවින් කිපුවෙත්. එව්නු කියන හසුන් පිළිකෙව් කොට කුළුණෙහි සිට නිසි විසින් තමාම කියමි කියත් හොත් නිරවැනි" යනු අටුවාසත්නයි.)

("මම වචනෙන භගවතො පාදෙ වන්‍දථා'ති වා චෙතියං පටිමං බොධිං සඞ්ඝත්‍ථෙරං වන්‍දථා'ති වා චෙතියෙ ගන්‍ධපූජං කරොථ පුප්ඵපූජං කරොථා'ති වා භික්ඛූ සන්නිපාතෙථ දානං දස්සාම ධම්මං දෙසෙස්සාමා'ති වා ඊදිසෙසු ඨානෙසු කුක්කුච්චං නකා

308 උපපන්නපච්චයා එවං පඤ්චන්නාම්පි අකප්පියා,
අභූතාරෙචනාරූපසංවොහාරුගතාදිසා.

309 හරාපෙත්වා හරිත්වා'පි පිතුන්නං සෙසඤාතිනං,
පත්තානං වත්ථුපූජත්ථං දාතුං පුප්ඵානි ලබ්භති;
මණ්ඩනත්ථඤ්ච ලිඞ්ගාදිපූජත්ථඤ්ච න ලබ්භති.

---

තබ්බං කප්පියසාසනානි එතානි න ගිහීනං ගිහිකම්මපටිසංයුත්තානි" * යනු අටුවායි.)

308 එවං උපපන්නපච්චයා, මෙසේ (අෂ්ටවිධවූ කුලදූෂණකර්මයෙන්) උපන්පසයෝ; පඤ්චන්නම්පි, පඤ්චසහධර්මිකයන්ටම; අකප්පියා, අකැපයෝයි; අභූතාරෙචනාරූපසංවොහාරුගතාදිසා, උතුරුමිනිස්දම් ඇරැජීමෙන් රත්රිදී ඈ පෙරළුකිරීමෙන් උපන් පසබඳුවෝයි.

309 පිතුන්නං, මව්පියන්ට; හරාපෙත්වා, අනුන්අතයවාද; හරිත්වාපි, තමාගෙණහැරද; පත්තානං, (මල්පුදනතැනට) සම්ප්‍රාප්තවූ; සෙසඤාතිනං, සෙසුනෑයන්ටද; වත්ථුපූජත්ථං, තුනුරුවන් පුදන්නු පිණිස; පුප්ඵානි, තමාඅයත් මල්; දාතුං, දෙන්නට; ලබ්භති, වටී; මණ්ඩනත්ථඤ්ච, පලඳනා පිණිසද; ලිඞ්ගාදිපූජත්ථංච, සිවලිඟාදිපුදනු පිණිසද; න ලබ්භති, නොවටී.

("ආචරියුපජ්ඣායෙසු සගාරවා සාමණෙරා බහූනි පුප්ඵානි ආහරිත්වා රාසිං කත්වා ඨපෙන්ති. ථෙරා පාතොව සම්පත්තානං සද්ධිවිහාරිකාදීනං උපාසකානං වා ත්වං ඉදං ගණ්හ ත්වං ඉදං ගණ්හාති දෙන්ති පුප්ඵදානං නාම න හොති. චෙතියං පූජෙස්සාමා 'ති ගහෙත්වා ගච්ඡන්තා'පි පූජං කරෙන්තා'පි තත්ථ තත්ථ සම්පත්තානං චෙතියපූජනත්ථාය දෙන්ති, එතම්පි පුප්ඵදානං නාම න හොති. උපාසකෙ අක්කපුප්ඵාදීහි පූජෙන්තෙ දිස්වා විහාරෙ කණ්ණිකාරපුප්ඵාදීනි අත්ථි උපාසකා තානි ගහෙත්වා පූජෙථා'ති වත්තුම්පි වට්ටති". † යනු අටුවායි).

---

* මාපියනිත් බුදුන්ගේ පාවඳුයි හෝ චෛත්‍ය ප්‍රතිමා, බොධි සඞ්ඝස්ථවිරයන් වඳුයි හෝ චෛත්‍යයට සුවඳ පූජාකරව් මල් පූජාකරව්යි හෝ භික්ෂූන් රැස්කරව් දන් දෙමු බණ දෙශනා කරවමුයි හෝ මෙබඳු හසුන්හි කුකුස් නොකටයුතුයි; මොව්හු කැප හසුන්හ ගෘහස්ථයන්ගේ ගෘහකර්මප්‍රතිසංයුක්ත නොවන් නාහුයි.

† ආචාර්යොපාධ්‍යායයන් කෙරෙහි ගෞරවසහිත සාමණේර යෝ බොහෝමල් ගෙණැවිත් රැස්කොට තබති ස්ථවිරහු උදෑසනම පැමිණි සද්ධිවිහාරිකාදීන්ට හෝ උපාසකයන්ට හෝ

310 තථා ඵලං ගිලානානං සම්පත්තිස්සරියස්ස ච,
පරික්ඛයවිහීනානං දාතුං සපරසන්තකං.

311 භාජෙන්තෙන ඵලපුප්ඵම්හි දෙය්‍යං පත්තස්ස කස්සචි,
සම්මතෙනා'පලොකෙත්වා දාතබ්බමිතරෙන තු.

312 විහාරෙ වා පරිච්ඡිජ්ජ කත්වාන කතිකං තතො,
දෙය්‍යං යථාපරිච්ඡෙදං ගිලානස්සෙතරස්ස වා,
යාචමානස්ස කතිකං වත්වා රුක්ඛා ච දස්සියා.

---

310 ඵලං (තාලපනසාදී තමා අයත්) ඵලද; තථා, එසේමැයි; (පුෂ්පයෙහි කීනයින් මැයි;) ගිලානානං, ගිලන් මිනිසුන්ටද; සම්පත්තිස්සරියස්සච, (තමාකරා) සම්ප්‍රාප්ත ඉසුරුභවද; පරික්ඛයවිහීණානං, වියයට නිසි ද්‍රව්‍ය නැත්තවුන්ටද; සපරසන්තකං, තමාගා තමාවිස්වසුත් සන්තකඵල; දාතුං, දෙන්නට (වටී; ඵලදාන නොවේ)

311 ඵලපුප්ඵම්හි, (සඟසතු) මල්ඵලපස්; භාජෙන්තෙන, බෙදනකල්හි; පත්තස්ස,(එතනට) සම්ප්‍රාප්තවූ; කස්සචි, කිසිමිනිසෙක්හට; සම්මතෙන,(මල් පක් බෙදනුකොට) සම්මතමහණකු විසින්; දෙය්‍යං, (සඟුන් එක්කෙණෙකුන්ට දෙන වසගින් භාගයක් පමණ) දියයුතුය; ඉතරෙන තු, අසම්මතයා විසින් වනාහි; අපලොකෙත්වා, සඟුන් හැමදෙනාම අසවා; දාතබ්බං, දියයුතුයි.

("උපඩ්ඪභාගං දාතබ්බමිතිවුත්තං කුරුන්දියං,
ථොකථොකන්ති නිද්දිට්ඨං මහාපච්චරියං පන". *)

312 විහාරෙ වා, විහාරයෙහිදු; පරිච්ඡිජ්ජ, (ඵල විසින් හෝ රුක් විසින් හෝ) පිරිසිඳ; කතිකං කත්වාන, කතිකාකොට; තතො, ඉක්බිත්තෙන්; යාචමානස්ස, ඉල්වන්නාවූ; ගිලානස්ස, ගිලන්හටහෝ; ඉතරස්සවා, (ඉසුරුආදී) නොගිලන්හටහෝ; යථාපරිච්ඡෙදං, කළපරිච්ඡෙදවූ පරිද්දෙන්; දෙය්‍යං,(සතරපස් පකෙත්) දියයුත්තේය; කතිකං වත්වා,(මහසඟුන් කළ)කතිකා කියා; රුක්ඛා

---

තෝ මේ ගණු තෝ මේ ගණුයි දෙත්නම් එය පුෂ්පදානයනම් නොවෙයි. චෛත්‍යයට පුදත්නෙම්යි ගෙණයත්නෝද පුදක රත්නෝද ඒ ඒ තැනට පැමිණියවුන්ට චෛත්‍යපූජාපිණිස දෙත්නම් මෙයද පුෂ්පදානනම් නොවෙයි. වරමල් ආදියෙන් පුදත්නාවූ උපාසකයන් දැක උපාසකවරුනි වෙහෙර කිණිහිරි මල් ආදිය ඇත එය ගෙණ පුදව්යි කියත්වද වටී.

* කුරුන්දියඅටුවායෙහි අඩකොටසක් දියයුතුයයි කියනලදී මහාපච්චරියෙහිවනාහි ටිකටික (දියයුතු) යයි දක්වනලදී.

313 සිරිසවුණ්ණකසවාදිචුණ්ණ* සෙසෙ ච නිච්ජයො,
යථාවුත්තනයො යෙව පණ්ණම්පෙත්ථ පවෙසයෙ'ති.

---

**"වස්සූපනායිකාචෙවා"ති.**

314 පුරිමිකා පච්ඡිමිකා දුවෙ වස්සූපනායිකා,
තත්ථා'ලයපරිග්ගහො වචීභෙදෙ ච එදිසො.

315 **"ඉමස්මිං විහාරෙ ඉමං තෙමාසං වස්සං උපෙමි"**
**"ඉධ වස්සං උපෙමි"**ති චිත්තුප්පාදෙ'ත්ථ ආලයො.

---

වා, වෘක්ෂයෝගෙහෝ; දැසියා, (මේගසින් මෙතෙක් පස්ගත්නට ලැබෙයිකියා) දුක්වියයුත්තාහුයි.

("සංඝාරාමෙ'පි ඵලපරිච්ඡෙදෙන වා රුක්ඛපරිච්ඡෙදෙන වා කතිකා කාතබ්බා, තතො ගිලානමනුස්සානං වා අඤ්ඤෙසං වා ඵලං යාචන්තානං යථාපරිච්ඡෙදෙන චත්තාරිපඤ්චඵලානි දාතබ්බානි, රුක්ඛා වා දස්සෙතබ්බා ඉතො ගහෙතුං ලබ්භන්ති'ති, ඉධ ඵලානි සුන්දරානි ඉතො ඵලං ගණ්හථා'ති එවං පන න වත්තබ්බං" † යනු අටුවායි.)

313 සිරිසවුණ්ණකසවාදිචුණ්ණ, මහරිසුණු කෙළිඳැසු ණුඅෑසුණෙණ්හිද; සෙසෙච,(මැටිය දැහැටිදඬුය හුණුදඬුය යන)සෙස්සෙහිද; නිච්ජයො, විනිශ්චය; යථාවුත්තනයොයෙව, උක්තප්‍රකාරනය ඇත්තේමැයි;පණ්ණම්පි, (ගුප්පත් තලපත් ආදිවූ කැහැකි) නොකැහැකි පත්ද; එත්ථ, මේකුලදූෂනයෙහි; පවෙසයෙ, ඇතුලත් කරනතේයි.

---

("වස්සූපනායිකාචෙවා"ති, වස්සූපනායිකාචෙව යත්නෙහි (වසෙලබීම්නම්).

314 පුරිම්කා, පෙරවසන; පච්ඡිමිකා, පසුවසනයි; වස්සූපනායිකා, වස්සූපනායිකාවෝ; දුවෙ, දෙකදෙනෙකි; තත්ථ, ඒ දෙව සත්හි; (වසෙලැබීම්නම්) එදිසො, මතුයෙහි කියනලද බඳුවූ; ආලයපරිග්ගහො, අලයපරිග්‍රහයහෝ; වච්භෙදෙවා, වාක්භෙදයහෝයි.

315 එත්ථ, මෙහි; ඉමස්මිං විහාරෙ ඉමං තෙමාසං වස්සංඋපෙමි

---

* සිරීසකසවාදිනංචුණ්ණ-බුරුම්පොත්.

† සඞ්ඝාරාමයෙහිදු ඵලපරිච්ඡෙදයෙන්හෝ වෘක්ෂපරිච්ඡෙදයෙන්හෝ කතිකා කටයුත්තිය-එහෙයින් ඵලයාඥකරන්නාවූ ගිලන්මනුෂ්‍යයන්ටහෝ අනික් අයටහෝ පිරිසිඳිපරිද්දෙන් සතර පස් ඵලකොණකුත් දියයුත්තාහුය. මෙයින් ගන්නට ලැබෙය යි රුක්හෝ දක්වියයුත්තාහුය. මෙහි ඵල යහපති මෙයින් ඵලගණුයි මෙසේ වනාහී නොකිය යුතුයි.

316 නොපෙතුකාමෙං ආවාසං තදහු'තික්කමෙය්‍ය වා,
භවෙය්‍ය දුක්කටාපත්ති ජිනං වා'නුපගච්ඡතො.

ති, ඉමස්මිං විහාරෙ ඉමං තෙමාසං වස්සං උපෙමිදී, (තිම වාක් හෙදානම) ඉධ වස්සං උපෙමීති, ඉධවස්සං උපෙමිසී,(යන)චිත්තුප්පාදෙ,, සිත්ඉපදවීම; ආලයො, ආලයපරිග්‍රහනම්. (ආලයපරිග්‍රහනම් ව්‍රජයෙහි සත්‍ථයෙහි නාවායෙහි සෙනසුන් නොලබන්නාහට ය ලැබිතිනම්. "ඉධවස්සංඋපෙමි"සී වාක්භෙදම කටයුතුසි.
"සචෙ ඉධ වස්සං වසිස්සාමීති ආලයො අත්‍ථි අසතියා පන වස්සං න උපෙති ජිනාවසෙසා න හොතීති පවාරෙතුඤ්ච ලබ්භති එව" * යතු මෙහි ටීකාසි.
"වස්සං උපගච්ඡන්තෙන හි නාලකපටිපදං පටිපන්නෙනා'පි පඤ්චන්නං ඡදනානං අඤ්ඤතරෙනයෙව ඡදනෙන සඡාරබ්ධෙ සෙනාසනෙ උපගන්තබ්බං වුත්තං හෙතං "නභික්ඛවෙ අසෙනාසනිකෙන වස්සං උපගන්තබ්බං යොඋපගච්ඡෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති. තස්මා වස්සකාලෙ සචෙ සෙනාසනං ලභති ඉච්චෙතං කුසලං නො චෙ ලභති හත්‍ථකම්මං පරියෙසිත්වා'පි කාතබ්බං හත්‍ථකම්මං අලභන්තෙන සාමම්පි කාතබ්බං නත්වෙව අසෙනාසනිකෙන වස්සං උපගන්තබ්බං අයමනුධම්මතා" † යතු ඇටුවාසි.
"පඤ්ච ඡදනානිනාම ඉට්ඨකාඡදනං සිලාඡදනං සුධාඡදනං තිණඡදනං පණ්ණඡදනං"-අනුධම්මතානම්වති.)
316 නොපෙතුකාමො, වස්නොඑලඹෙනුකැමතිව; ආවාසං, වස්විසියයුතු වෙහෙර; තදහු, එ(වස්වසන) දවස්, අතික්කමෙ

* ඉදිත් මෙහි වස් වසම්සි ආලය ඇත්තේද සිහිනැතිවීමෙන්ව නාහි වස්නොයෙලඹේද සුත්වස්ඇත්තේ නොවේනුයි පවාරණය කරන්වත් ලැබේමය.

† වස්එලඹෙන්නාහු විසින්ද නාලකප්‍රතිපදාවට පිළිපන්නාහු විසින්ද (ගඩොල්. ගල්. සුණු. තෘණ. පර්ණ, යන පස් ප්‍රකාරඡදනයන් අතුරෙන් එක්තරා ඡදනයකින්ම උපලක්ෂිතවූ ආලිඳය සහිත සෙනසුණෙහි එලඹියයුතු. "මහණෙනි සෙනසුන් නැත්තහුවිසින් වස්නොයෙලඹිය යුත්තේය යමෙක් එලඹියේනම් දුකුළාවක්හුගේ ඇවැති"සි මෙය වදාරණලදුවය. එහෙයින් වස්කල ඉදින් සෙනස්නක් ලබානම් එය මැනවි නොලබානම් හස්තකර්මපයෙෂසන කොටද (සෙනසුන්) කටයුතු. හස්තකර්ම නොලබන්නාහු විසින් තමා විසින් මුත් කටයුතු. නැත්තාහු විසින් වස් නොයෙලඹියයුතුමය (යන) මේ අනුධම්මතාසි.

317 දුතියං උපගච්ඡෙය්‍ය ඡින්නවස්සො'නුපාගතො,
න පක්කමෙය්‍ය තෙමාසං අවසිත්වාන චාරිකං.

318 මාතාපිතුනමත්ථාය පඤ්චන්නං සහධම්මිනං,
ගිලානතදුපට්ඨාකභත්තමෙසිස්සමොසධං.

319 පුච්ඡිස්සාමි උපට්ඨිස්සං ගන්ත්වා නාභිරතං අහං,
වූපකාසෙස්සං කුක්කුච්චං දිට්ඨිං ගරුකමාදිකං.

320 කරිස්සං වා'පි කාරෙස්සං නොදනඤ්ච විවෙචනං,
උට්ඨානඤ්චා'පි උස්සුක්කං ගන්තුම්වෙවමාදිනා,
ලබ්භං සත්තාහකිච්චෙන පහිතෙ'පහිතෙ'පි වා.

---

ය්‍යවා, (සම්මහණෙක්)ඉක්මවත්තේනම්,(ඕහටද) ඡින්නං, (වසෙලඹෙන දවස්බව) දූන දූන; අනුපගච්ඡතොංවා, (වෙහෙරරැදවස්) නොඑළඹෙනුවහටද; දුක්කටාපත්ති, දුකුළාඇවැත්; භවෙය්‍ය, වන්නීයි.)

317 ඡින්නවස්සො, (පෙරවස්හි වසෙලැඹැ) සුන්වස්වූයේද; අනුපාගතො, (කිසිඅන්තරායක්ත් පෙරවස්හි) නොඑළඹියේද; දුතියං උපගච්ඡෙය්‍ය, පස්වසත්හි වසෙලඹෙත්තේයි; තෙමාසං, (වසෙලඹි) තුම්මස; අවසිත්වාන, නොවැස; චාරිකං, ගමත්; න පක්කමෙය්‍ය, (අකරණීයව) නොයත්තේයි.

318 319 320 මාතාපිතුනමත්ථාය,මව්පියන් පිණිස;පඤ්චන්නං සහධම්මිනං, පස් සහ දැමියන් පිණිස; ගිලානතදුපට්ඨාකභත්තං ගිලනුන්හා ගිලන්මෙහෙකරුවන්ට බත්ද; ඔසධං, බෙහෙත්ද; එසිස්සං, සොයම්සිහෝ; පුච්ඡිස්සාමි, (සුවදුක්) විචාරම්සිහෝ; උපට්ඨිස්සං, (ගිලනුන්ට) මෙහෙකෙරෙම්සිහෝ; (සත්කරණීන් හසුන් එව්ව නොඑව්ව යත් වටී);අහං, මම; ගන්ත්වා, නොස්, නාභිරතං, (විසභාගරූප දශීනාදියෙන් සස්නෙහි) උකටලීවූවහු; වූපකාසෙස්සං, එතනින් අනිස්තැනකට ගෙණයම්සිහෝ; කුක්කුච්චං, (පස් සහ දැමියන්ට උපන් විනය පිළිබඳ) කුකුස්; නොදනඤ්ච,දුරුකිරීම්ද; දිට්ඨිං,(ගත්)මිථ්‍යාදෘෂ්ටි; විවෙචනං, හැරවීම්ද; ගරුකං, සඟවෙසෙස්ඇවැත්; උට්ඨානඤ්චාපි, (පරිවාසදානං දීන්) නැගීම්ද;ආදිකා උස්සුක්කං,(තජ්ජනීයාදිකම්ම සන්හිඳුවන්නට)උත්සාහ; කරිස්සං වා පි,කෙරෙම්සිහෝ; කාරෙස්සං,කරවම්සිහෝ; ඉති, මෙසේ;එවමාදිනා, මේආදිවූ; සත්තාහකිච්චෙන, සත්තාහකරණීයයෙන්; ගන්තුං, යන්නට, පහිතෙ, (කැඳවා) එවූකල්හිද; අපහිතෙපිවා, (කැඳවා) නොඑවූකල්හිද; ලබ්භා, එවී.

321 සඞ්ඝකම්මෙ වජෙ ධම්මසවණත්ථං නිමන්තිතො,
ගරූහි පහිතො වා'පි ගරූනං වා'පි පස්සිතුං.

322 න භණ්ඩධොවනුද්දෙසඤාතුපට්ඨාකදස්සනෙ,
ලබ්භා න පාපුණෙය්‍ය'ජ්ජෙවාගමිස්සන්ති'දූරගො.

323 සෙසඤාතීහි පහිතෙ භික්ඛුනිස්සිතකෙන ච,
උපාසකොපාසිකාහි නිද්දිසිත්වාව පෙසිතෙ.

324 වස්සච්ඡෙදෙ අනාපත්ති අන්තරායෙ සති'ත්තනො,
සඞ්ඝසාමග්ගියා වා නො ඡින්නවස්සො පවාරයෙ.

---

321 සඞ්ඝකම්මෙ, තමාගේහෝ සෙසුසඟුන්ගේහෝ සෙනසුන් මහසෑ පිළිබඳ නවාම්ඇ කුඩුමහත්කටයුත්තක් ඇතිකල්හීද; ධම්මසවණත්ථං, බණඅසන පිණිස; නිමන්තිතො, (අවමැනවැයි හෝ අසෝදවස් රැස්වූමමැනවැයි කතිකාවිසින්හෝ) නිමන්තිතවද; ගරූහි, ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන්විසින්; පහිතොවාපි, (චීවරධොවනාදි පිණිස) යවනලද්දේද; ගරූනං, ආචාර්‍ය්‍යඋපාධ්‍යායයන්; පස්සිතුං වාපි, දක්නටද; වජෙ, (සතිකරුණින්) යන්නේයි.

("වස්සං උපගතෙනෙත්ථ අනිමන්තිතභික්ඛුනා,
ධම්මස්ස සවණත්ථාය ගන්තුං පන න වට්ටති.
අසුකන්නාම දිවසං සන්නිපාතො භවිස්සති,
ඉච්චෙවං කතිකා පුබ්බං කතා චෙ පන වට්ටති".*)

322 භණ්ඩධොවන, (තමාගේ) සිවුරු සේදීමපිණිසද; උද්දෙස, බණ හැදෑරීම් පිණිසද; ඤාතුපට්ඨාකදස්සනෙ, නෑයන් උපාසක ජනයන් දක්නාපිණිසද; න(වජෙ, සත්තාහකරණීයයෙන්)නො යන්නේයි; අජ්ජෙව, අදම; ආගමිස්සන්ති,(සිට නැවත) එම්යි; අදූරගො, නුදුරුතැනට ගිය මහණ; නපාපුණෙය්‍ය, (ඉදිත්වෙහෙරට) නොපැමිණියේ වීනම් (හෙවත්) අතරමගම අරුණුනැගේ වීනම්; ලබ්භං, වටී. (වස්සච්ඡෙදහා රාත්‍රිච්ඡෙද දුකුළා නොවේ).

323 සෙසඤාතීහි, (මව්පියන්මිස) සෙසු නෑයන්විසින්ද; භික්ඛුනිස්සිතකෙනච, භික්ෂූන් නිසා ජීවත්වන්නාහුවිසින්ද; පහිතෙ, (ස්වාමීන් එනුකැමැත්තෙම් යනාදින් කියා) එවූකල්හිද; උපාසකොපාසිකාහි, (නොනෑ) උපාසක උපාසිකාවන් විසින්; නිද්දිසිත්වාව, (දන් දෙනුකැමැත්තෙමි යනාදි යම්කිසි කාරණයක්) දක්වාම; පෙසිතෙ, කියා එවූකල්හිද; (සතිකරණින් යන්නට වටී.)

324 අත්තනො, තමහට; අන්තරායෙසති, (රජචොරාදි) අන්තරා

---

* මෙහි වසෙලඹුනු නොනිමතුභික්ෂුවවිසින් ධම්ශ්‍රවණපිණිස යන්ටවනාහි නොවටී—ඉදිත්වනාහි අසවල්නම් දවස රැස්වීම වන්නේයයි මෙසේ පෙර කතිකා කරණලද්දීනම්(යන්ට) වටී.

325 අබ්භොකාසෙ * ච රුක්ඛස්ස සුසිරෙ විටපෙ'පිවා,
ඡවකුටිඡන්නචාටිසු උපගන්තුං න වට්ටති.

326 අසෙනාසනිකෙනාපි උපගන්තුං න වට්ටති,
පවාරෙතුඤ්ච ලභති නාවාසත්ථවජූපගො'ති.

---

"අවෙභඞ්ගියකානි."

327 ආරාමාරාමවත්ථූනි විහාරො තස්ස වත්ථු ච,
මඤ්චො පීඨං භිසි බිම්බොහනාදිසයනාසනං.

---

යක් ඇතිකල්හිද,සඞ්ඝසාමග්ගියාවා,සංඝයාසමග නොවබිදෙන කල්හිද; වස්සච්ඡෙදෙ, වස්බිඳීමෙහි; අනාපත්ති, ආපත්තිනැති; ජීවිතාවසෙසා, සුත්වස්වූයේ; නොපවාරයෙ, නොපවරන්නේ යි. ("වසිසෙයි කට්පුතුතන්ත් සහිකරණීච්චියෙහි එහිකොණෙ ණි" යනුමෙහි සන්නයි.)

325 අබ්භොකාසෙච, අබවස්හිද; රුක්ඛස්ස සුසිරෙ, ගස්සිදුරෙ හි ද; විටපෙපිවා, වෙලෙප්හිද; ඡවකුටි, සොහොන්කිලියෙහිද; ඡන්න, කුඩයෙහිද; චාටිසු, සැළියෙහිද; උපගන්තුං, වසෙලැ ඹෙන්ට; නවට්ටති, නොවටී. (මැම්තුනක් හිඳුවා මත්තෙහි ගල් ලෑනැල්ලකින් වසනලද්දී ඡවකුටිනමු.)

326 අසෙනාසනිකෙනාපි, (සර්‍වප්‍රකාරයෙන්)සෙනාසුන්නැත් තහු විසින්ද; උපගන්තුං, වසෙලැඹෙන්ට; නවට්ටති, නොවටී; ("න භික්ඛවෙ අසෙනාසනිකෙන වස්සං උපගන්තබ්බං, යනු විසිබෙසිකොට අසිවන් කිසූභයෙන්"යනු විනය සන්නයි.) නාවා, නැවිහිද; සත්ථ, සත්‍ථායෙහිද; වජෙ, වජයෙහිද; උපගො, වසෙලැඹියේ; පවාරෙතුඤ්ච, පවරන්නටද; ලභති, ලැබේ. (වස්ස ච්ඡෙදනිමිත්තවූ ආපත්තිද නොවේ.

"වජෙ සත්ථෙ නාවායන්ති තීසු ඨානෙසු නත්ථි වස්සච්ඡෙදෙ ආප ත්ති, පවාරෙතුඤ්ච ලභති"–† යනු අටුවාසි.)

---

"අවෙභඞ්ගියානි" අවෙභඞ්ගියා යන්නෙහි (ගරුබඩුනම්.)

327 ආරාම, පුෂ්පාරාම ඵලාරාමද; ආරාමවත්ථූනි, ආරාමභූමිද; වි හාරො,(ප්‍රාසාදාදී)සෙනසුන්ද; තස්ස වත්ථුච, ඒ විහාරය සම්බන්ධ භූමිද; මඤ්චො, ඇඳද; පීඨං, පුටුද; භිසි, (පඤ්චවිධ) භිසිහුද; බි ම්බොහනාදිසයනාසනං, කන්වසින් ඈ ශොනාහිඳිනාදෑද.

---

* අජ්ඣොකාසෙ–ඈතම්

† වජය. සත්‍ථාය. නැවය. යන තුන්තැන්හි වස්බිඳීමෙහි ඇවැත් නැති, පවාරණය කරන්නටද ලැබේ.

328 ලොහකුම්භී කටාහො ච ලොහභාණ්ඩකවාරකො,
කුඨාරී වාසි ඵරසු කුද්දාලො ච නිඛාදනං.

329 වල්ලි වෙළු තිණං පණ්ණං මුඤ්ජබබ්බජමත්තිකා,
දාරුමත්තිකභණ්ඩානි පඤ්චෙතෙ අවිභාජියා.

330 ථුල්ලච්චයා භාජයතො භාජිතා'පි අභාජිතා,
ගරුභණ්ඩානි වුච්චන්ති එතෙ විස්සජ්ජියා න ච.

---

328 329 ලොහකුම්භි, ලොහොසැළිද; කටාහොච, ලොහො කටාරම්ද; ලොහභාණ්ඩක, ලොහොසැලද; වාරකො, ලොහොකලද; කුඨාරි, කෙටේරිද; වාසි, වෑද; ඵරසු, පොරෝද; කුද්දාලොච, හුදල්ලද; නිඛාදනං, නියත්ද; වල්ලි, (වෙවැල්ඈ) වැල්ද; වෙළු,(මහනුණඈ)හුණද; තිණං,(ඉලුක් ඈ ගේසොයන)තණද; පණ්ණං, (තල්පත්ඈ) පත්ද; මුඤ්ජ, මුදුතණද; බබ්බජ, බබුස්තණද; මත්තිකා, මැටිද; දාරුමත්තිකභණ්ඩානි, දාරුභාණ්ඩමත්තිකාභාණ්ඩද;(යන) එතෙපඤ්ච, මේපමරාසීහු; අවිභාජියා, (සඞ්ඝ ගණ පුද්ගලයන් විසින්) නොබෙදිය යුත්තාහුයි.

("විසඞ්ගහානි ද්වෙ හොන්ති තතියං චතුසඞ්ගහං,
චතුත්ථං නවකොට්ඨාසං පඤ්චමං අට්ඨභෙදනං.
ඉති පඤ්චහි රාසීහි පඤ්චනිම්මලලොචනො,
පඤ්චවීසවිධං නාථො ගරුභණ්ඩං පකාසයි" *

"මංසදිබ්බධම්මබුද්ධසමන්තචක්ඛු වසෙන පඤ්චලොචනො"†)

330 භාජයතො, බෙදන්නාහට; ථුල්ලච්චයං, තුලැසිවෙයි; භාජිතාපි, බෙදනලද්දාහුදු; අභාජිතා, නොබෙදනලදුවෙත්; එතෙ, මොහු; ගරුභණ්ඩානි, ගරුභාණ්ඩයහයිද; නවිස්සජ්ජියා, නොදිය යුත්තාහයි ("ච" ශබ්දයෙන් අවෙහඞ්ගියහයි)ද; වුච්චන්ති, කියනු ලැබෙත්.

---

*(ගරුභාණ්ඩ) දෙදෙනකුන්ගේ සඞ්ග්‍රහයෝ දෙකොත්වෙති, තුන්වැනිව සතරක්හුගේ සඞ්ග්‍රහයවේ, සතරවැනිව නවකොටසක් (හුගේසඞ්ග්‍රහය)වේ, පස්වැනිව අටකොටසක් (හුගේසඞ්ග්‍රහය)වේ–ඇතනප්‍රකාරයෙන් ගරුභාණ්ඩය කලාප පසකින් පස්විසි වැදෑරුම්යයි පස්ප්‍රකාරනිර්මල ඇස්ඇති සර්වඥයන්වහන්සේ ප්‍රකාශකළසේක්.

† මසැස,දිවැස,දහමැස,බුදැස,සමතැස, විසින් පස් ඇස් ඇතියේයි.

331 වල්ලි'ඩ්ඪබාහුමත්තා'පි වෙළු අට්ඨඞ්ගුලායතා,
තිණාදි මුට්ඨිමත්තම්පි පණ්ණමෙකම්පිමත්තිකා.

332 පාකතා පණ්ඩුවණ්ණා වා සුධා කඞ්ගුට්ඨආදිකා,
තාලපක්කප්පමාණා'පි දින්නා වා තත්‍ථ ජාතකා.

333 රක්ඛිතා සඞ්ඝිකා රජ්ජුයොත්තාදි ච අභාජියා,
භාජියා නිට්ඨිතෙ කම්මෙ සඞ්ඝිකෙ චෙතියස්ස වා.

334 පත්තාදිං භික්ඛුසාරුප්පං තථා විප්පකතාකතං,
භාජියං ලොහභණ්ඩෙසු වාරකං පාදගණ්හකං.

335 වෙළුම්හි භාජියා තෙලනාළි කත්තරදණ්ඩකො,
ජත්තදණ්ඩසලාකායො තථොපාහනදණ්ඩකො.

---

331 332 333 අඩ්ඪබාහුමත්තාපි, අඩබඹයක් පමණදවූ; වල්ලි, වැල්ද; අට්ඨඞ්ගුලායතා, අටඟුලක්දිගඇති; වෙළු, (පත්ගිත්දඬුක් පමණදවූ) හුණද; මුට්ඨිමත්තම්පි, මිටක්පමණදවූ; තිණාදි, (ගේ සොයන)තණහා“ආදි”ශබ්දයෙන්ගත් මුදුතණබබුස්තණද; එකම්පි, එකද; පණ්ණං, (තල්පත්ඈ) පතෙක්ද; පාකතා, පියවිහෝ; පණ්ඩුවණ්ණා වා,(නිල්ඈ පස්වණක්) පැඇතිහෝ; සුධා, සුණුහෝ; කඞ්ගුට්ඨආදිකා, නොකවූ සදෑලමලඈහෝ; තාලපක්කප්පමාණාපි, තල්පකක්පමණදවූ; මත්තිකා, මැටිද; (යන මොහු) දින්නාවා, සඟහටදෙනලද්දාහුහෝ; තත්‍ථ ජාතකා, සංඝිකභූමියෙහි උපන්නාහු හෝ; රක්ඛිතා, රක්නාලද්දාහුම; අභාජියා, නොබෙදිය යුත්තාහුයි; සඞ්ඝිකා, සඟසතුවූ; රජ්ජු,(හුනියදකොස්සෙත්කළ) රැහැණද; යොත්තාදිච, (සමිත්කළ) යොත්ආදිහුද; (අභාජියා) නොබෙදිය යුත්තාහුයි; සඞ්ඝිකෙ කම්මෙ, සඟසතුකම යුතුද; චෙතියස්සවා, චෛත්‍යසන්තකකටයුතුද; නිට්ඨිතෙ, නිමිකල්හි; භාජියා, බෙදිය යුත්තාහුයි.

(“අඩ්ඪබාහුති කප්පරතො පට්ඨාය යාව අංසකූටං විදත්ථි චතුරඞ්ගුලං”* යොත්තාදියන්හි “ආදි”ශබ්දයෙන් නියදින් කොස්සෙත් කළ ඒ වැලරැහැණ ගත්හු.)

334 ලොහභණ්ඩෙසු, ලොහභාණ්ඩයෙහි; භික්ඛුසාරුප්පං, මහණුන්ට සරුප්වූ; පත්තාදිං,පාත්‍රා(තඹු)ආදිද;තථා, එසේම;විප්පකතා, කොට නොනිමි ලොහොබඩුද; අකතං, යපලුඈ නොකළ ලොහොබඩුද; පාදගණ්හකං, මඟබනැළියෙන් පස්නැළියක් තෙල්ගන්නා; වාරකං, කළයද; භාජියං, බෙදියයුත්තෝයි.

335 වෙළුම්හි, වෙළුයෙහි; තෙලනාළි, තෙල්නැළි; භාජියා; බෙ

---

* අඩබාහු. යනු වැලමිට පටන් අංසකූටය දක්වා එක්වියත් සතරඟුල් ප්‍රමාණයයි.

336 අනුඤ්ඤාතවාසිදණ්ඩො කරණ්ඩො පාදගණ්ඨකො,
අරණීසජ්ජනිසිඩගාදිභික්ඛුපකරණං තථා

337 තචපීතානිට්ඨිතං දාරුභණ්ඩං දනතඤ්ච භාජියං,
භික්ඛුපකරණෙ පාදඝටකො මතනිකාමයො.

338 භාජියං කප්පියං චම්මං තෙලචම්මමභාජියං,
ගරුනා ගරුභණ්ඩඤ්ච ථාවරං ථාවරෙන ච.

339 ථාවරං පරිවතෙතතය්‍ය තථා කත්වා ච භුඤ්ජතු,
වලලාදිං ඵාතිකම්මෙන ගණ්හ සෙසමභාජියනති.

---

දියයුත්තිය; කතතරදණ්ඩකො, සැරයට්යද; ජතතදණ්ඩසලාකා යො, සැත්දඬුහා ගොනැස්ද; උපාහනදණ්ඩකො, වහන්කොක් කද; තථා, එසේමැයි.

336 අනුඤ්ඤාතවාසිදණ්ඩො, (කරවියල්ලෙහි ලං පරිහරණකට හැකි)අනුදත් වෑයෙනි දඬද; පාදගණ්ඨකො, පාදයක් තෙල්ගන්නා; කරණ්ඩො, කරඬුවද; අරණීසජ්ජනිසිඩගාදි, අරණීභාණ්ඩ අඳුන්නළ තෙල් හං ආදිවූ;භික්ඛුපකරණං, මහණපිරිකරද; තථා, එසේම; (බෙදිය යුත්තේයි.)

337 තචපීතානිට්ඨිතං, සැස නොංනිමනලද; දාරුභණ්ඩං, දාරු භාඬද; දනතඤ්ච, (නොසැසිහෝ කොටනොනිමිහෝ) දළද; භාජියං, බෙදියයුත්තේයි; භික්ඛුපකරණෙ, මහණපිරිකරෙහි;ම තනිකාමයො, මැටිමුවාවූ; පාදඝටකො, පාදයක් තෙල් ගන්නා කළය;(බෙදිය යුත්තේයි.)

338 339 කප්පියං චම්මං, කැපසම්; භාජියං, බෙදියයුත්තේය; තෙලචම්මං, තෙලිසම්, අභාජියං,නොබෙදියයුත්තේය;ගරුනා, (මචපීඨාදි) ගරුභාඬයෙන්; ගරුභණ්ඩඤ්ච, (මචපීඨාදි) ගරුභාඬද, ථාවරඤ්ච, (ආරාමාදි) ථාවරයද; පරිවතෙතතය්‍ය, පෙරළිකරත්තේය; ථාවරෙනච, (ආරාමාදි) ථාවරයෙන්වනානි; ථාවරං, (ආරාමාදි) ථාවරයම;(පෙරළිකරත්තේයි)තථා කත්වා, එසේ(පෙරළි) කොට; (ලදකැපපසය) භුඤ්ජතු, වලඳුවා; වලලාදිං, වැල් හුණුආදී; ඵාතිකම්මෙන, වැඩකමින්; ගණ්හ,ගන්නේය;සෙසං, (ආරාමාදි)සෙස්ස; අභාජියං, නොබෙදියයුත්තේයි.

("ඵාතිකම්මං නාම සමකං වා අතිරෙකං වා තදග්ඝණකං, එවට නාමිලහෝ වඩාදිමහෝ ඵාතිකම්මනම්.මේ මැසිපුටුඇයහහවදෙ මිකළගුරුබඩුවෙයි නොබෙජියයුතු, සඟිනි පිරිමැජි නිබැවිනි.මෙ සපිහිමියන වසෙයිනි ගණිනට දෙමියි කෑගුරුබිඩිහොතුජු කෙ පෙවතුබෙජෙයි වසෙයිනිගණිනිවට්යිද වාකීසෙයිනි කරනිදෙ,

"පකිණ්ණකානි."

340 සමාරබනබෙන ඨානෙ සොඩුකබලකපාසකෙ,
සයනෙනන දිවා මාරං බන්ධෙය්‍ය පරිවත්තකං.

341 විඤ්ඤුම්හි පුරිසෙ සන්තෙ අභොගො වා'පි කප්පති,
සචෙසෙ තං විනා කාරං සයනෙනා දුක්කටං ඵුසෙ,

312 රතනානි'ත්ථිරූපානි ධඤ්ඤමිත්ථිපසාධනං,
තූරියාවුධභණ්ඩානි ආමසන්තස්ස දුක්කටං.

---

සනැත අයපවජනිබෙජෙසි ගතනොලැබෙයි මෙම්මැසිපුටුවසෙ ගිහිගණිනවි සඟහවදෙමිසි කිදෙසනැති පළමිසකිගිපෙරෙමිජ් කියාසීකතුරුබඩිවෙයි"–යනු–කංඛාවිතරණී ගැටපදයි.)

---

"පකිණ්ණකානි" පකිණ්ණකං යත්නෙහි (සංකීර්ණය නමි.)

340 සමාරබනබෙන, දොරහා දොරබාඇති, සොඩුකබලකපාස කෙ, වටෙවූ උතුරලි ඇති; ඨානෙ, (සෙනසුන් අබවස්ඇ) තැන්හි; දිවා, දහවල්; සයනෙනන, හෝනශුච්සින්; පරිවත්තකං, පිරිවැටෙන; මාරං, දොර; බන්ධෙය්‍ය, පියාලියයුත්තේයි.

341 විඤ්ඤුම්හිපුරිසෙ, (නොනිදන ආරාමික සාමණේරාදි)විඥ පුරුෂයකු; සන්තෙ, (සමීපයෙහි) ඇතිකල්හි; අභොගොවාපි, (මොහු මා රකී නි යන)අභොගයද; කප්පති, වටී; සචෙසෙ, තමාඳසු රුපවත්නා තන්හි; තං අකාරංවිනා, (දොරපිමය අභොගකිරීමය යන)ඒආකාරනැතිව; සයනෙනා, හෝනෙත්; දුක්කටං ඵුසෙ, දුකුලා අවදනේයි. ("බැසහොනාකල්හි දොරපියයි දොරනිසයි මගෙ වැ දොර තමාම වරිනී වටි" යනු අටුවාසන්නයි.)

342 රතනානි, දශවිධරත්නද; ඉත්ථිරූපානි, (දැරුලොහමයාදි) මාගම්රුද; ධඤ්ඤං,(සප්තවිධ)ධාන්‍යද; ඉත්ථිපසාධනං,(පිළි පත් මුදුඇ) මාගම්පලඳනාද; තූරියාවුධභණ්ඩානි, (පිඹිනා සක්කුලල් බෙරඇ)තූර්‍ය්‍යභාණ්ඩහා(කඩු කාල් දුනු හීදඩුඇ)ආයුධභාණ්ඩද; ආමසන්තස්ස, (ඳනඳන) අතින් ගත්නාහට; දුක්කටං, දුකුලාවේ.

("සුවණ්ණපටිමඤ්චාපි චෙතියං භාරකූටකං,
අනාමාසන්ති නිද්දිට්ඨං කුරුන්දට්ඨකථාය හි." *

"ඉත්ථිසණ්ඨා නෙනකතං යන්තංහි, තිරච්ඡානගත මාගම් රුව්හි යටතින් පරිජ්පොහොනා තිරිසන්හියමාගමුත්ද අනාමාසබැවින් ඒ පියලිත්මැ සටන්වූ මාගම්රුඅනාමාසයි. මාගම්පැවිජියන් පිළිම්කොලොත් දොස්නැතියෙත් ඇඳුරෙෝ.මාගම්රුඇති පිළිබිජ්

---

* රත්පිළිමයද හරකූඑසැයද(හෙවත්)පිත්තලකරඬුද යනමේ අනාමාසයයි කුරුන්දිය අටුවාහෙහි දක්වනලදී.

343 සිත්ථතෙලොදතෙලෙහි ඵණහත්ථඵණෙහි වා,
කොච්ඡෙන වා'පි යො කෙසෙ ඔසණ්ඨෙය්‍ය'ස්ස දුක්කටං.

344 නෙකපාරුපණා* එකත්ථරණා වා තුවට්ටයුං, †
තථෙකකම්මෙව භුඤ්ජෙය්‍යුං එකස්මිං වා'පි භාජනෙ.

345 චතුරඞ්ගුලතො ඌනමධිකට්ඨඞ්ගුලං තථා,
දන්තකට්ඨං න ඛාදෙය්‍ය ලසුණං න අකල්ලකො.

---

හිජ් ඇහිරිළිජ් මාගම්රුව්හි නොගෙණයනුත් වටි-මාගම්කො ලෙබ්රෙහි සෙහින් පැහැර පසුල්ගෙණයනබැව්න් මඩුගහිසෙ ජීනියි කිසිවෙකින් ඔවයි ව්හිජ්ව්ය යුතුය" යනු විනය සන්නයි. රත්රිඳි පබළු ආදියකළ දෑගැප් පිළිමයෙහි කෑසලහරණටද මොනරපිළිත් පිසිනටද වටි.)

343 සිත්ථතෙලොදතෙලෙහි, හිටිමුසුතෙලින් දියමුසුතෙලින් හෝ; ඵණහත්ථඵණෙහිවා, දනනමයාදි පෙණෙත්හා අත්පෙණ යයි කියනලද ඇඟිල්ලෙන්හෝ; කොච්ඡෙනවාපි, කොස්සෙන් හෝ; යො, යමෙක්; කෙසෙ, කෙසයන්; ඔසණ්ඨෙය්‍ය, (අලඞ්කාරපිණිසමටකොට) නමානම්; අස්ස, ඕහට; දුක්කටං, දුක්ලාවේ. (ඡව්සිටිකෙස් නෙත්අනින් මටකොට හොවානම් වරදනැති.)

("කොච්ඡනාම උසීරමයං වා මුඤ්ජබබ්බජමයං වා." ‡)

344 එකපාරුපණාවා, එකක්පෙරවහො; එකත්ථරණාවා, එකක්අතුටහෝ; එකමෙකඩවා, එකඇඳකහෝ; තුවට්ටයුං, දෙදෙනෙක් හොවිත්නම්; න, නොවටි; (දුක්ලාවේ) එකස්මිං භාජනෙ වාපි, එක්වලඳකහෝ; භුඤ්ජෙය්‍යුං, (දෙදෙණෙක්) වලඳත්නම්; තථා, එසේම (නොවටි.)

345 චතුරඞ්ගුලතො ඌනං, (වඩුඅඟුලින්) සතරඟුලකින් උනුවූ; තථා, එසේම; අධිකට්ඨඞ්ගුලං, අටඟුලකින් වැඩියාවූ; දන්තකට්ඨං, දැහැටි; නඛාදෙය්‍ය, නොකන්නේය; අකල්ලකො, නොගිලන් මහණ; ලසුණං, (අමුමගඩ) ලූණු; න ඛාදෙය්‍ය, (කෙවලකොට) නොකන්නේයි.

(මගධරට උපන් භණ්ඩිකලසුණම මෙහි ලසුණයයි ගත්නාලදී. භණ්ඩිකලසුණනම් සතරම්ජියෙහි පටන් බොහෝ මිජිඇත්තේයි. පලණ්ඩුකභඤ්ජනකාදි ලසුණයෙහි මගධරට උපදදෙ,ස්නැති. "මගධරට්ඨෙ ජාතලසුණමෙව හි ලසුණන්ති ඉධාධිප්පෙතං තම්පි භණ්ඩිකලසුණමෙව, න එකමිඤ්ජිකං. පලණ්ඩුකාදීනං ච වණ්ණෙන වා මිඤ්ජාය වා නානත්තං වෙදිතබ්බං, වණ්ණෙන තාව, පලණ්ඩුකො නාම පණ්ඩුවණ්ණො හොති, භඤ්ජනකො ලොහිත

---

* නෙකපාපුරණා- † තුවට්ටෙය්‍යුං- ‡ කොච්ඡනම්. සුවඳහො මුවං හෝ මුඳුතණ බබුස්තණමුවා හෝ (කොස්සයි.)

316 හීනුක්කට්ඨෙහි උක්කට්ඨං හීනං වා ජාතිආදිහි,
උජුං වා'ක්කොසපදෙසෙන වදෙ දුබ්භාසිතං දවා.

---

වණ්ණො, හරිතකො හරිතපණ්ණවණ්ණො, මිඤ්ජාය පන පලණ්ඩුකස්ස එකා මිඤ්ජා හොති, භඤ්ජනකස්ස ද්වෙ, හරීතකස්ස තිස්සො, චාවලලසුණො අමිඤ්ජකො, කුරුකමත්තමෙව හි තස්ස හොති, මහාපච්චරිආදීසු පන පලණ්ඩුකස්ස තිනි මිඤ්ජානි, භඤ්ජනකස්ස ද්වෙ, හරීතකස්ස එකාති වුත්තං, එතෙ පලණ්ඩුකාදයො සභාවෙනෙව වට්ටන්ති, සූපසම්පාකාදීසු පන මාගධකම්පි වට්ටති, තඤ්හි පච්චමානෙසු මුග්ගසූපාදීසු වා මච්ඡමංසවිකතියා වා තෙලෙ වා බදරසාලවාදීසු වා අම්බිලසාකාදීසු වා උත්තරිභඞ්ගෙසු වා යත්ථකත්ථචි අන්තමසො යාගුභත්තෙපි පක්ඛිත්තං වට්ටති" † යනු අටුවායි)

316 හීනුක්කට්ඨෙහි, හීනඋකටවූ; ජාතිආදිහි, ජාති නාමගොත්‍රාදීන්; උක්කට්ඨං, උකටවූහෝ; හීනංවා, යටත්වූහෝ (යම්කිසි වක්හට) උජුංවා ("චණ්ඩාලොසි" යනාදීන්) ඍජුරාහෝ; අක්කොසපදෙසෙන, ("සන්ති ඉධෙකච්චෙ චණ්ඩාලා" යනාදීන්) පරියායෙන් හෝ; දවා, (හුදෙක්) කෙළිනාඅදහසින්; වදෙ, කියානම්; දුබ්භාසිතං, දුබැසිඇවැත් වේ.

---

* මගධරට හටගත් ලූනුණුම මෙහි ලූනුණුයයි දක්වනලදි, එයද භණ්ඩිකනම් ලූනුණුමැයි. එක්මදුලු දෙමදුලු තුන්මදුලු (හෙවත්) එක්බික් දෙබික් තුන්බික් ඇත්තේනොවෙයි, පලණ්ඩුකාදීන්ගේ වර්ණයෙන් හෝ බික්වලින්හෝ නානත්වය දතයුතු. වර්ණයෙන් පළමුකොට (දතයුත්තේය,) පලණ්ඩුකනාම් ලූනුණු පඬුවත් වෙයි. භඤ්ජනකනාම් ලූනුණු ලේවත් වෙයි. හරීතකනාම් ලූනුණු නිල්කොළවර්ණවෙයි. බික්වලින් වනාහි (දෙවනුවදතයුත්තේය.) පලණ්ඩුකයගේ එක් මදුලුවෙයි. භඤ්ජනකයගේ දෙමදුලු වෙයි. හරීතකයගේ තෙම්දුලුවෙයි. චාවලනම් ලූනුණු තොමදුලු (හෙවත්) අබික්වෙයි. ඒ ලූනුණගේ කුරුකමාත්‍රයක්මවෙයි. මහාපච්චරිආදියෙහි වනාහි පලණ්ඩුකයගේ මදුලු (හෙවත්) බික් තුනැයිද. භඤ්ජනකයගේ දෙකැයිද. හරීතකයගේ එකැයිද කියනලදී. මේ පලණ්ඩුකාදීහු ස්වභාවයෙන්ම වටිත්. සූපසම්පාදනය කිරීමාදියෙහි වනාහි මගධරට හටගත් ලූනුණුද වටී. එය වනාහි පැසෙනුලබන්නාවූ මුද්ගසූපාදියෙහිහෝ මත්ස්‍යමාංස විකෘතියෙහි හෝ තෙලෙහි හෝ බෙබර එලවියලාකරණ ඛාද්‍යාදියෙහිහෝ ඇඹුල්පලාආදියෙහිහෝ ව්‍යඤ්ජනසූපාදී යම්කිසිවෙක්හි හෝ යටත්පිරිරසයින් කැඳබතෙහිදු ප්‍රක්ෂෙපකරණලද්දේ වටී.

347 දීඝෙ නඛෙ ච කෙසෙ ච නාසාලොමෙ න ධාරයෙ,
න ලබ්භං වීසතිමට්ඨං සම්බාධෙ ලොමහාරණං.

348 යථාබුඩ්ඪං න බාධෙය්‍ය සඞ්ඝුද්දිට්ඨං ච සඞ්ඝිකං,
අධොතඅල්ලපාදෙහි න'ක්කමෙ සයනාසනං,
සුධොතපාදකං වා'පි තථෙව සවුපාහනො.

---

347 දීඝෙනඛෙච, (මසින් ඉතිරිවූ) දික්නියද; කෙසෙච, (දෙමසින් හෝ දැඟුලෙන්හෝ වැඩි) දික් කෙස්ද; නාසාලොමෙ, නැහැ(යෙන් පිටත්ව පැණනැගිස්) ලොම්ද; නධාරයෙ, නොදරන්නේයි; වීසතිමට්ඨං, විසිනියපොතු (ඔප්නගා) මටකිරීම්ද; සම්බාධෙ, පිළිසත්පියෙස්හි, ලොමහාරණං, ලොම්හැරීම්ද; නලබ්භං, නොවටී. (පුවක් ලෙඩිආදීන් නියමල හැරෑ සුදුකරත් කැපූතැන් හී කොරොස් හරුත් වටි,

"සම්බාධෙ'ති පටිච්ඡන්නොකාසෙ, තස්ස විභාගදස්සනත්ථම්පන උභො උපකච්ඡකා මුත්තකරණන්ති වුත්තං." * යනු අටුවායි. ගඩපොළඅෑ ආබාධයක් ඇත ලොම්හරුත් වටී.)

348 සංඝුද්දිට්ඨංචා, සංඝයා උදෙසනලදහෝ; සඞ්ඝිකං, සඟසතුහෝ; (මඬු. ඇතිරි. හැඳ. පුටු. ආ සෙනසුන්,) යථාබුඩ්ඪං, සඟමහලු පිළිවෙළ; නබාධෙය්‍ය, නොවලකන්නේයි; අධොතඅල්ලපාදෙහි; නොදෙව්පයින්හෝ තෙත්පයින්හෝ; සයනාසනං, (පිරියම්කළ බුමුතුරුණු ආ) සෙනසුන්; න අක්කමෙ, නොඇක්මෙන්නේයි; සුධොතපාදකංවාපි; දෙව්පයින්ම ඇක්මියයුතු තැනුදු; සවුපාහනො, පයලූ වහන් ඇතිව; තථෙව, එසේම (නොඇක්මෙන්නේ)යි. (ආගන්තුකයන් සැතපෙන සඳහා සපයා දෙනලද තමන්සතු චම්මඛණ්ඩ පචාර කොජව කටසාරදී ඇතිරි රුක්ඛමූලාදී සඞ්ඝුද්දිට්ඨ නමි.

"තෙන ඛොපන සමයෙන මනුස්සා සඞ්ඝං උද්දිස්ස මණ්ඩපෙ පටියාදෙන්ති, සන්ථරෙ පටියාදෙන්ති, ඡබ්බග්ගියානං භික්ඛූනං අන්තෙවාසිකා භික්ඛූ සඞ්ඝිකංයෙව භගවතා. යථාබුඩ්ඪං අනුඤ්ඤාතං න උද්දිස්ස කතන්ති බුද්ධපමුඛස්ස සඞ්ඝස්ස පුරතො පුරතො ගන්ත්වා මණ්ඩපෙ පරිග්ගණ්හන්ති සන්ථරෙ පරිග්ගණ්හන්ති ඔකාසෙ පරිග්ගණ්හන්ති ඉදං අම්හාකං උපජ්ඣායානං භවිස්සති ඉදං අම්හාකං ආචරියානං භවිස්සති ඉදං අම්හාකං භවිස්ස තීති-පෙ-න භික්ඛවෙ උද්දිස්සකතම්පි යථාබුඩ්ඪං පටිබාහිතබ්බං යො පටිබා

---

* සම්බාධෙ යනු පිළිසත් අවකාශයෙහිය ඒපිළිසත්අවකාශයාගේ විභාගදක්වනු පිණිස වනාහි දෙකිසිලි සම්ප්‍රයෝග මූත්‍රකරණස්ථානයයි දක්වනලදී.

349 සඞ්ඝාටියා න පල්ලත්ථෙ භිත්තාදිං නාපස්සයෙ,
පරිකම්මකතං සණෙන උදකෙ නො න ආචමෙ.

---

හෙය්‍ය ආපත්ති දුක්කටස්ස" * යනු පෙළයි-"යදිපන තත්ථ නෙවාසිකා අනත්ථතාය'පි භූමියා ඨපෙන්ති අධොතපාදෙහි'පි වලඤ්ජන්ති තථෙව වලඤ්ජිතුං වට්ටති" † යනුඅටුවායි.

"නෙවාසිකා පකතියා අනත්ථතාය භූමියා ඨපෙන්ති චෙ, තෙසම්පි අනාපත්තියෙව. මාරවිතපාණාදයො අපරිකම්මකතා'පි න අපස්සයිතබ්බා" යනු විනය සන්නයි.)

349 සඞ්ඝාටියා, සංඝාටිනාමයෙන් ඉටු සිවුරෙන්; න පල්ලත්ථෙ, (විහාරයෙහිදු අන්තරඝරයෙහිදු) අකවටු නොඇවුළුවන්නේයි; පරිකම්මකතං, සුණුවම් ඈ හෝ සිතියම්කළ; භිත්තාදිං, බිතත් දොරකවුළු ඈ; න අපස්සයෙ, (සිවුරු ඈ කිසිවකින් නොවසා සිස්වෙරිත්)නොවැතිරෙත්නේයි; උදකෙ සණෙන, දිය ඇතිකල්හි; න ආචමෙ, (සිරුරු කිසකොට) දිය නොගණීනම්; නො, නොවටී.

("අඤ්ඤාගාමෙ වාසත්ථාය උපගතෙන අධිට්ඨිතං සඞ්ඝාටිං විනා සෙසචීවරෙහි පල්ලත්ථිකාය නිසීදිතුං වට්ටති" ‡ යනු අටුවායි.)

---

* එකලවනාහි මනුෂ්‍යයෝ සඟහු උදෙසා මණ්ඩප පිළියෙල කරති සථාන පිළියෙළ කරති ෂට්වර්ගික භික්ෂූන්ගේ අතවැසි භික්ෂූනු බුදුන් විසින සඟසතුදෙය වැඩිමහළු පිළිවෙළින් අනුදන්නාලද්දේය, උදෙසා කරණලද්ද නොවේයයි බුදුන් පළමු කොට ඇති සඟහු පෙරටුවෙන් පෙරටුවෙත් නොස් මෙය අප උපාධ්‍යායයන්ට වන්නේය මෙය අප ආචාර්‍යයන්ට වන්නේය මෙය අපට වන්නේයයි මණ්ඩප පිළිගණ්නි ඇතිරිලි පිළිගණ්නි සථාන පිළිගණිති—පෙ—මහණෙනි උදෙසාකරණලද්දද වැඩිමහලු පිළිවෙළ ප්‍රතිබාහණය නොකට්යුතුයි. යමෙක් ප්‍රතිබාහණය කරන්නේනම් දුකුළාවක් සම්බන්ධවූ ඇවති.

† ඉදින්වනාහි එහි නෙවාසිකයෝ නොඅතුළ භූමියෙහි (තැපිඅඳ යමක්) තබත්ද නොදෙව්පාවලින්දු වලඤ්ජනයකෙරෙත්ද (ආගන්තුගයන්ටද) එසේම වලඤ්ජනය කරන්ට වටී.

‡ ඇතුලුගම් වාසය පිණිස පැමිණියහු විසින් (සංඝාටිනමින්) ඉටනලද සඟළහැර සෙසු සිවුරුවලින් අකවටු අවුලුවීමෙන් හිඳිනට වටී.

350 අකප්පියසමාදානෙ දවා සිලාපවිජ්ඣනෙ,
දෙසනාය සභාගාය ආවිකම්මෙ ච දුක්කටං.

351 පටිස්සවවිසංවාදෙ සුද්ධචිත්තස්ස දුක්කටං,
පටිස්සවක්ඛණෙයෙව පාචිත්ති ඉතරස්ස තු.

352 න රුක්ඛමභිරූහෙය්‍ය සති කිච්චෙව පොරිසං,
ආපදාසු යථාකාමං කප්පති අභිරූහිතුං.

---

350 අකප්පියසමාදානෙ, (පඤ්චසහධම්මිකයන්) අකැපයෙහි සමාදන් කරවීමෙහිද; දවා, කෙළියෙන්; සිලාපවිජ්ඣනෙ, ගල් පෙරළීම් අතකුරුගැසීම් ආදියෙහිද; සභාගාය, (එක්වසිත්)සභාගාපත්තියගේ; දෙසනාය, දෙසීමෙහිද; ආවිකම්මෙච, ඇරුජීමෙහිද; දුක්කටං, දුකුළාවේ. (අකප්පියසමාදාන නම් පස් සහදම්යන්ට නොවටනා බැව් දැන දැන මේකර මේබඳු යනාදීන් අයපයෙහි සමාදන් කරවීමයි.

“න කෙවලඤ්ච පාසාණෙ, අඤ්ඤම්පි යං කිඤ්චි දාරුඛණ්ඩං වා ඉට්ඨකාඛණ්ඩං වා හත්ථෙන වා යන්තෙන වා පවිජ්ඣිතුං න වට්ටති, චෙතියාදීනං අත්ථාය පාසාණාදයො හසන්තා පවට්ටෙන්ති'පි ඛිපන්ති'පි උක්ඛිපන්ති'පි කම්මසමයො'ති වට්ටති” * යනු අටුවායි. එත්තොර වැඟෙව ඇවතුදු උව දෙසත් වපි.)

351 පටිස්සවවිසංවාදෙ, (“අහම්පි මයං ඉධ වස්සං වසිස්සාම එකතො උද්දිසාපෙස්සාම” යනාදීන් දුන්) පිළින අන්තරායක් නැතිව නොකිරීමෙහි; සුද්ධචිත්තස්ස, කියනසඳ කොරෙම්යි යන සිත් ඇත්තාහට; දුක්කටං, දුකුළාවෙයි; ඉතරස්සතු, නොකෙරෙමියි යන සිත් නැතියහුට වනාහි; පටිස්සවක්ඛණෙයෙව, පිළිනදුන් කෙණෙහිම; පාචිත්ති, (මුසාවාදනිමිත්ත) පචිතිවේ.

352 රුක්ඛං, රුකට; නාභිරූහෙය්‍ය, නොනැගෙන්නේය; සති කිච්චෙව, (මලදඹුඛිදිනා ආ) කටයුත්තක් ඇතිකල්හිම; පොරිසං, මිනිස් පමණක් (නැගෙන්නේය;) ආපදාසු, (එතලම්හගදශිනා දී)ආපදායක් ඇතිකල්හි; යථාකාමං, කැමතිපරිද්දෙන්; අභිරූහිතුං, නැගෙන්ට; කප්පති, කැපයි.

(“ආපදාසූති වාළමිගාදයො වා දිස්වා මග්ගමූළ්හො වා දිසා ඔලොකෙතුකාමො හුත්වා දවදාහං වා උදකොඝං වා ආගච්ඡන්තං

---

* හුදෙක්පාසාණයත් පමණක්නොවෙයි. අනිකුදු යම්කිසි දරකඩක්හෝ උළුකඩක්හෝ අතින්හෝ යන්ත්‍රයකින්හෝ විදින්ට නොවටී. චෛත්‍යාදිය පිණිස ගල් ආදිය සිනාසෙමින් පෙරළත්ද විසිකරත්ද ඔසවත්ද කම්මසමයතුයි වටී.

353 විනා'ද්ධානං වජන්තස්ස දුක්කටං පරිස්සාවනං,
යාචමානස්ස අද්ධානෙ අදෙන්තස්සාපි දුක්කටං.

351 ථුල්ලච්චයං ඵුසෙ අඞ්ගජාතච්ඡෙදෙන දුක්කටං,
ආබාධප්පච්චයා'ඤ්ඤත්‍ර සෙසඞ්ගෙ අත්තඝාතනෙ.

855 චිත්තපොත්ථකරූපානි න කරෙ න ච කාරයෙ,
න වුට්ඨාපෙය්‍ය භුඤ්ජන්තමාරාමාරඤ්ඤගෙහසු.

---

දිස්වා, ති එවරූපාසු ආපදාසු අතිඋච්චම්පි රුක්ඛං අභිරූහිතුං වට්ටති" * යනු අටුවායි).

353 පරිස්සාවනංවිනා, පෙරහණ නැතිව; අද්ධානං, (යමත් පිරිසෙයින් අඩයොදුනක් පමණදවූ) දුරුමග; වජන්තස්ස, යන්නාහට; දුක්කටං, දුකුළාවේ; අද්ධානෙ, අධ්වමගහිලා; යාචමානස්ස, (තමාගේ පෙරහණ නැතිව) ඉල්වන්නාහට; අදෙන්තස්සාපි, නොදෙන්නාහටද; දුක්කටං, දුකුළාවේ.

("අපරිස්සාවනකස්සෙව යො න දදාති තස්ස ආපත්ති, යොපන අත්තනො භණ්ඩෙ පරිස්සාවනෙ විජ්ජමානෙ'පි යාචති තස්ස න අකාමා දාතබ්බන්ති" † යනු අටුවායි.)

354 අඞ්ගජාතච්ඡෙදෙන, තමානිමිත්කැපීමෙන්, ථුල්ලච්චයං ඵුසෙ, තුලැසි ඇවැත් අවදනේය; ආබාධප්පච්චයා අඤ්ඤත්‍ර, (අහිකීටාදී) ආබාධකාරණයකින් මිස; සෙසඞ්ගෙ, (කන් නාසා ඈ) සෙස්සු අඞ්ගයන් කැපීමෙහිදු; අත්තඝාතනෙ, (ආහාරොපච්ඡෙදදීන්) තමාමැරීමෙහිද; දුක්කටං, දුකුළාවේ.

("ආබාධෙසති අඞ්ගුලිආදීනි ඡින්දිතුං වට්ටතියෙව" ‡ යනු අටුවායි.)

355 චිත්තපොත්ථකරූපානි, සිතියම්රූ පෙතැලිරූ; නකරෙ, නොකරන්නේසි; නචකාරයෙ, නොදකරවන්නේසි; ආරාම, විහාරයෙහිද; අරඤ්ඤ, අරණ්‍යයෙහිද; ගෙහෙසු, අන්තරඝරයෙහිද; භුඤ්ජන්තං, වලඳමින්නුත් භික්ෂූහු; නවුට්ඨාපෙය්‍ය, නොනඟන්නේසි.

---

* ආපදාසු යනු වනළමෘගාදීන් දැකහෝ මත්මුලාව දිසාව බලනු කැමතිවහෝ එන්නාවූ වනදාහයක් හෝ උදකොඝයක් හෝ දැක යන මෙබඳු ස්වරූපවූ ආපදාවක් ඇතිකල්හි ඉතා උස් රුකට නගින්ටද වටී.

† පෙරහණ නොමැත්තහුටම යමෙක් නොදේනම් ඔහුට ඇවැති. යමෙක් වනාහි තමාඅත පෙරහණ ඇතිකල්හිදු යාඥකෙරේ නම් ඔහුට නොකමැත්තෙත් නොදිය යුතු.

‡ ආබාධයක් ඇති කල්හි ඇඟිලි ආදීන් සිඳින්ට වටීමය.

356 යානානි පුමයුත්තානි සිවිකං හත්ථවට්ටකං,
පාටඞ්කිඤ්ච ගිලානස්ස කප්පතෙ අභිරූහිතුං.

357 බුද්ධං ධම්මඤ්ච සඞ්ඝඤ්ච ආරබ්භ කරණෙ දවං,
දුක්කටං පරිසං වා'පි අසුද්ධස්ස උපලාළනෙ.

358 කායං ඌරුං නිමිත්තං වා භික්ඛුනීනං න දස්සයෙ,
විවරිත්වා න සිඤ්චෙය්‍ය තා කද්දමුදකාදිනා.

---

("රූපං තත්‍ථ පුරිසිත්ථීනං තිරච්ඡානගතස්ස වා,
කාරෙන්තස්ස කරොතො වා හොති ආපත්ති දුක්කටං
ජාතකම්පන වත්ථුං වා කාරාපෙතුං පරෙහි වා
මාලාකම්ම ලතාකම්මං සයං කාතුම්පි වට්ටති"*
යනු වනාච්නිසයි.)

356 පුමයුත්තානි, (ගොන්ආ) පුරුෂයන්යෙදූ (හෙවත්) පිරිමින් උසුලන; යානානි, ගැල්ද; සිවිකං, සිවිගෙයද; හත්ථවට්ටකං, අත්වටුගලමද; පාටඞ්කිඤ්ච, හීදෙළුද; අභිරූහිතුං, නැගෙන්ට; ගිලානස්ස, ගිලන්හට; කප්පතෙ, කැපයි.

("පුරිසයුත්තං ඉත්ථිසාරථී වා හොතු පුරිසසාරථී වා වට්ටති, හත්ථවට්ටකම්පන ඉත්ථියො වා වහන්තු පුරිසා වා වට්ටති යෙව"† යනු අටුවායි.)

357 බුද්ධං, බුදුන්ද; ධම්මඤ්ච, ධර්මයද; සඞ්ඝඤ්ච, සංඝයාද; ආරබ්භ, අරබයා; දවංකරණෙ, පරිහාසවචනකිමෙහිද; අසුද්ධස්ස (දුස්සීලදවූ) අභික්ෂුගේ; පරිසං, පිරිස්වූ සාමණේරාදී යම්කිසිවකු; උපලාළනෙවාපි, (තමහට උපස්ථානකරවනපිණිස තොපට පාසිවුරුදෙම්හ යනාදීන්) නැලවීමෙහිද; දුක්කටං, දුකුළාවේ. ("කිම්බුද්ධො සිලාකබුද්ධො උදාහු පටිබුද්ධො" "කිං ධම්මො අජධම්මො ගොධම්මො" "කිං සඞ්ඝො අජසඞ්ඝො ගොසඞ්ඝො" යනාදීන් කෙළිපිණිස බිණීම් දවකරණනම්.)

358 කායං, ශරීරයහෝ; ඌරුං, කලවයහෝ; නිමිත්තංවා, නි

---

* පුරුෂ ස්ත්‍රීන්ගේ හෝ තිර්‍යග්ගතිකයාගේ හෝ රූපය වනාහි කරන්නාටද කරවන්නාටද දුකුළා ඇවැත්වෙයි—(අපණ්ණක ජාතකාදී) ජාතකහෝ (විමානවස්තුආදී) කථාවස්තුහෝ අනුන් ලවා කරවන්ටද මාලාකම් ලතාකම් තෙමේකරන්ටද (අනුන් ලවා කරවන්ටද) වටී.

† පිරිමි සතුන් යෙදූ යහණාව ස්ත්‍රී සාරථියෙක් හෝ වේවයි, පුරුෂ සාරථියෙක් හෝ වේවයි වටී, හස්තවට්ටකය වනාහි ස්ත්‍රීයෝ හෝ වඩත්වයි (හෙවත් පෙරළත්වයි)පුරුෂයෝ හෝ පෙරළත්වයි වටීමය.

359 අගණ්හාතො ච ඔවාදං න පච්චාහරතො'පි ච,
බාලං ගිලානං ගම්යං වජ්ජයිත්වාන දුක්කටං.

360 ලොකායතං නවාචෙය්‍ය ඵළිතං න ච ගාහයෙ,
පෙලාය'පි න ජුඤ්ජෙය්‍ය න ඛීළෙ කඤ්චි ඛීළනං.

361 පාරුපෙ න නිවාසෙය්‍ය ගිහිපාරුතනිවාසනං,
සංවෙල්ලියං නිවාසෙය්‍ය දායං වා'ලිම්පයෙය්‍ය වා.

මිත්තහෝ; විවරිත්වා, සිව්ර පහකොට; භික්ඛුනීනං, මෙහෙණුන්ට; නදස්සයෙ, නොදක්වන්නේය; තා, ඒ භික්ෂුණීන්; කද්දමුදකාදිනා, කැලල්දියආදීන්; නසිඤ්චෙය්‍ය, නොඉස්නේයි.

359 බාලං, (හසුන් නොගනහෙන) බාලයාද; ගිලානං, (පොහෝ අගට ගොස් නොඇරැජියහෙන) ගිලන්හුද; ගම්යං (පෑළු වියදවස් බැහැරයන) ගම්කාහුද; වජ්ජයිත්වාන, හැර; ඔවාදං, (මාගම්පැවිජ්ජන්විසින් ඇයජ) අවවාද; අගණ්හාතොච, නොගන්නාහටද; නපච්චාහරතොපිච, නැවත අවුත් නොකියන්නාහටද; දුක්කටං, දුකුලාවේ.

(ඔවාදනම්. "භික්ඛුනිසඞ්ඝො අය්‍ය භික්ඛුසඞ්ඝස්ස පාදෙ වන්දති, ඔවාදූපසඞ්කමනඤ්ච යාචති, ලභතු කිර අය්‍ය භික්ඛුනිසඞ්ඝො ඔවාදූපසඞ්කමනං"යී අවවාද අසනපිණිස කරණ ආරාධනායි.)

360 ලොකායතං, විතණ්ඩශාස්ත්‍රය; නවාචෙය්‍ය, නොහදාරන්නේය; ඵළිතඤ්ච, නරකෙස්ද; නගාහයෙ, නොඋදුරුවන්නේය; පෙලායපි, (තඹ ලෝ ආදීන්කළ) පාත්‍රයෙහි තබාද; න ජුඤ්ජෙය්‍ය, නොවලඳන්නේය; කඤ්චිකීළනං, (ද්‍යුකෙළි ආ) කිසිකෙළියකුදු; න ඛීළෙ, නොකෙළින්නේයි.

("ලොකායතං නාම සබ්බං උච්ඡිට්ඨං සබ්බං අනුච්ඡිට්ඨං සෙතො කාකො කාළො බකො ඉමිනා ච ඉමිනා ච කාරණෙනාති එවමාදි නිරත්ථකකාරණපටිසංයුත්තං තිත්ථියසත්ථං. ආසිත්තකූපධානන්නාම තම්බලොහෙන වා රජතෙන වා කතාය පෙලාය එතං අධිවචනං, පටික්ඛිත්තත්තා පන දාරුමයා'පි නවට්ටති" * යනු අටුවායි. පෙලානම් මොරපාය යෙත්.)

361 362 ගිහිපාරුතනිවාසනං, ගිහින් පොරෙණසේ හඳනා

* ලොකායත, ශාස්ත්‍රයනම් මේමේකාරණයෙන් සියල්ල ඉඳුල්ය සියල්ල නොඉඳුල්ය කාකයා සුදුය කොකා කළුය යනාමේ ආදිවූ අර්ථවත්නොවූ කාරණයන්ගෙන් ප්‍රතිසංයුක්ත තීර්ථකශාස්ත්‍රයි. ආසිත්තකූපධානයනම් තඹපිත්තලයෙන්හෝ රිදියෙන්හෝ කාරණලද පාත්‍රවට මේ නාමෙකි, ප්‍රතික්ෂෙප කරණලදබැවින් දරමුවාද නොවටී.

362 වඩ්ඪිං යොජයෙ යාචෙ නොඤාතිකපවාරිතෙ,
අත්තනො පරිභොගත්ථං දින්නමඤ්ඤස්ස නො දදෙ,
අග්ගං ගහෙත්වා භුත්වා වා කතිපාහං පුනො දදෙ:

363 උද්දිස්ස යාචනෙ රක්ඛං ඤත්වා'ඤ්ඤත්වා ච දණ්ඩිතං,
ගීවා'ස්ස දණ්ඩිතෙ දණ්ඩො සයං දණ්ඩාපනෙ පන,
දණ්ඩස්ස අග්ඝභෙදෙන ඤෙය්‍යා පරාජිකාදිකා.

---

යේ; නපාරුපෙ, නොපොරවත්නේය; නනිවාසෙය්‍ය, නොහඳනේයි; සංවෙල්ලියං, අමුඩුගැසූ; න නිවාසෙය්‍ය, නොහඳනේය; දැයාවා, වැල්හිඳු; න ආලිම්පයෙය්‍ය, (ගිනි නොලන්නේය;) නොලවන්නේයි; වඩ්ඪිං, පොලී; නපයොජයෙ, නොවඩන්නේය; නොඤාතිකාපවාරිතෙ, නොනෑ නොපැවරුවන්; නයාචෙ, (සිව්රු පිඩු පා සෙනසුන්) නොඉල්වන්නේයි; අත්තනො පරිභොගත්ථං, තමාගේම අනුභවය පිණිස; දින්නං, දෙනලද (චීවරාදිය;) අඤ්ඤස්ස, අන් (සසභාගධම්) කයක්හට; නොදදෙ, නොදෙන්නේය; අග්ගං ගහෙත්වා, (පිණ්ඩපාතාදී) අග ගෙණහෝ; කතිපාහං, කීපදවසක්; භුත්වාවා (වහන්දෑ) වැලඳගෙණහෝ; පුනො, ඉක්බිති; දදෙ, (කැමතිතැනකට) දෙන්නේයි.

("අත්තනො පරිභොගත්ථං දින්නන්නාම යං තුම්හෙ එව පරිභුඤ්ජථාති දින්නං, තං අඤ්ඤස්ස දදතො දුක්කටං, අග්ගං ගහෙත්වා පන දාතුං වට්ටති, සචෙ අසප්පායං, සබ්බම්පි අපනෙතුං වට්ටති, චීවරං එකාහංවා ද්වීහංවා පරිභුඤ්ජිත්වා දාතුං වට්ටති, පත්තාදීසු'පි එසෙව නයො" * යනු අටුවායි.)

363 දණ්ඩිතං, දඩනන්නාබව; ඤත්වා, දැනහො; අඤත්වාවා, නොදැනහෝ; උද්දිස්ස, (එකක්හු) උදෙසා; රක්ඛං, රක්‍ෂාව; යාචනෙ, අයජමෙන්; දණ්ඩිතෙ, (ඔහුඅතින්) දඩ ගත් කල්හි; දණ්ඩො, ගත්දඩ; අස්ස, (ඒරක්‍ෂාඉල්වූ) මහණහු; ගීවා, නයවෙයි; (බඩුදිම්වෙයි) සයං දණ්ඩාපනෙ පන, (ඔහුඅතින් මෙතෙක් දඩ ගන්වයි) තමාම දඩගැන්වීමෙහි වනාහි; දණ්ඩස්ස, (ගත්නාලද) දණ්ඩයාගේ; අග්ඝභෙදෙන; අගවූපරිද්දෙන්; පාරාජිකාදිකා, පරිජිආදීහු; ඤෙය්‍යා, දතයුත්තාහුයි.

---

* තමාට පරිභොගපිණිස දෙනලද්දනම් තුබවහන්සේම අනුභවකරව්යී කියා යමක් දෙනලදනම් එය අනිකක්හට දෙත්නාහුට දුකුලායි, අග්‍රයගෙනවනාහි දෙන්ටවටී, ඉදින් අසප්පාය ද සියල්ලමත් පහකරන්ට වටී, සිව්ර එකදවසක්හෝ දෙදවසක්හෝ පරිභොගකොට දෙන්ට වටී, පාත්‍රාදියෙහිදු මෙම නයයි.

364 හරන්තෙසු පරික්ඛාරං චොරෙ චොරෙ'ති භාසිතෙ,
අනත්ථාය'ස්ස ගණ්හන්ත දණ්ඩං ගීවා'ස්ස තත්තකං.

---

364 පරික්ඛාරං (ස්වරූඅෑ) පිරිකර; හරන්තෙසු, (සොරුන්) ගෙනයනකල්හි; අස්ස, ඒසොරහට; අනත්ථාය, අවැඩපිණිස; චොරෙචොරෙති, සොරෙක සොරෙකැයි; භාසිතෙ, කීකල්හි; දණ්ඩං ගණ්හන්තා, (ඒ අසා සොරහුඅතින්) දඩගන්නාකල්හි; තත්තකං, එතෙක්දඩ; අස්ස, ඒභික්ෂුහු; ගීවා, නයවේ.

("භික්ඛුනුපස්සයෙ ගාමදාරකා ධුත්තාදයො වා යෙ කෙචි අනාචාරං වා ආචරන්ති රුක්ඛං වා ඡින්දන්ති ඵලාඵලං වා හරන්ති පරික්ඛාරෙ වා අච්ඡින්දන්ති, භික්ඛුනී වොහාරිකෙ උපසඞ්කමිත්වා අම්හාකං උපස්සයෙ ඉදන්නාම කතන්ති වදති, කෙනාති වුත්තෙ අසුකෙනාති වත්තුං අම්හාකං න වට්ටති, තුම්හෙයෙව ජානිස්සථ, කෙවලංහි මයං රක්ඛං යාචිස්සාම තන්නොදෙථ අවහටභණ්ඩඤ්ච ආහරාපෙථාති වත්තබ්බං-එවංවුත්තෙ'පි සචෙ තෙ වොහාරිකා කාරකෙ ගවෙසෙත්වා තෙසං දණ්ඩං කරොන්ති සබ්බසාපතෙය්‍ය'පි ගණ්හන්ති භික්ඛුනියා නෙවගීවා න ආපත්ති-යොවායං භික්ඛුන්නං වුත්තො භික්ඛුනීනම්පි එසෙව නයො-යොපන දණ්ඩං කරිස්සන්තීති ජානන්තා'පි අනොදිස්ස කථෙන්ති තෙ ච පරියෙසිත්වා දණ්ඩං කරොන්තියෙව න දොසො, විහාරසීමාය රුක්ඛාදීනි ඡින්දන්තානං වාසිඵරසුආදීනි ගහෙත්වා පාසාණෙහි කොට්ටෙන්ති න වට්ටති, සචෙ ධාරා භිජ්ජති කාරාපෙත්වා දාතබ්බා, උපධාවිත්වා තෙසං පරික්ඛාරෙ ගණ්හන්ති තම්පි නකාතබ්බං, ලහුපරිවත්තනංහි චිත්තං, ථෙය්‍ය චෙතනාය උප්පන්නාය මූලච්ඡෙජ්ජම්පි ගච්ඡෙය්‍ය,, * යනු අටුවායි.)

---

* භික්ෂුණී උපශ්‍රයෙහි ගම්දරුවෝහෝ ධූර්තාදීහුහෝ යම්කිසිවෙක් අනාචාරයෙහිහෝ හැසිරෙත්ද රුක්හෝ සිඳිත්ද ඵලාඵල හෝ ගෙණයත්ද, පිරිකරහෝ පැහැරගණිත්ද, භික්ෂුණීහු වොහාරිකයන්කරා එලඹ අපගේ උපශ්‍රයෙහි මෙනම් දෙයක්කරණලදැයි කියාද, කවරෙක් විසිනැයි කියනලද කල්හි අසවලා විසිනැයි කියන්ට අපට නොවටී, හවත්හුම දැනගන්නාහුය. හුදෙක් අපි ආරක්ෂාව ඉල්වමු එය අපටදෙව් පැහැරගත් භාණ්ඩයද ගෙන්වව්යයි කියයුතු-මෙසේ කීකල්හිදු ඉදින් ඒ වොහාරිකයෝ කාරකයන් සොයා ඔවුන්ට දඬුවම් කරත්ද සියලුම් සම්පත් ගත්කල්හිදු භික්ෂුණියට ගීවාද නොවේමය ඇවැත්ද නොවේමය-මේ යම්ක් භික්ෂුණීන්ට කියනලදද භික්ෂූන්ටද මෙමනයයි, යමෙක් වනාහි දඬුවම් කරන්නේයයි දන්නේම උදෙසා නොකියාද ඔව්හුදු සොයා දඬුවම් කරත්ම දොස්නැති, විහාරසීමායෙහි වෘක්ෂාදීන් සිඳින්නවුන්ගේ වෑපොරොආදිය ගෙණවුත් ගල්වලින් තලන්නම් නොවටි, ඉදින් මුවඅත් බිඳෙතුලැ බීද කරවාදියයුත්තිය, දුවැවිත් ඔවුන්ගේ පිරිකර ගණිත්ද එයද නො'කටයුතුයි. එකාන්තයෙන්ම සිත වහා ඉපරළෙන්නේවෙයි සොරසිතඋපන් කල්හි මූලසිඳීමටද යන්නේය.

365 විඝාසුච්චාරසඞ්කාරමුත්තං ඡඩ්ඩෙය්‍ය දූතකාවිං,
බහි පාකාරකුඩ්ඩානං වලඤ්ජෙ නාවලොකිය,
හරිතෙ වා'පි වීහාදිනාළිකෙරාදිරොපිමෙ.

366 යොජාපෙතුඤ්ච යොජෙතුං පජ්ජිතානි ච පස්සිතුං,
න ලබ්භං ධම්මයුත්තම්පි නච්චගීතඤ්ච වාදිතං,
උපහාරං කරෙමාති වුත්තෙ ච සම්පටිච්ඡිතුං.

---

365 විඝාස, උස්සප්අෑ ඉඳුල්ද; උච්චාරං, අහරමලද; සඞ්කාර, කසලද; මුත්තං, වටන්දියද; (යනමේ) පාකාරකුඩ්ඩානං බහි, පව්රුහා බිත්තිත් පිටත්හි; නාවලොකිය, නොබලා; වලඤ්ජෙ, මිනිස්හසර ඇතිතැන්හිද; වීහාදිනාලිකෙරාදිරොපිමෙ, වීහැල් ආදිත්හා පොල්පුවස්ආදීත් රොපනයකල; හරිතෙවාපි, නිලිගත් කෙත්වත්හා අරම්හිද; ඡඩ්ඩෙය්‍ය, පියානම්; දූතකාවං, දුකුළාවේ.

("යං මනුස්සානං උපභොගපරිභොගං රොපිමන්ති, ඛෙත්තං වා හොතු නාළිකෙරාදිආරාමො වා යත් කත්ථ්ච රොපිමහරිතෙ ඨානෙ" යනුද "අනික්ඛිත්තබීජෙසු ඛෙත්තකොනාදීසු වා අසඤ්ජාතරොපිමෙසු ඛෙත්තමරියාදාදීසු වා මනුස්සානං කචවරඡඩ්ඩනට්ඨානෙසු'පි ඡඩ්ඩිතඛෙත්තෙ'පි ඡඩ්ඩෙති වට්ටති,, * යනුඅටුවායි.

"සාමිකෙ අපලොකෙත්වා,යි බැවින් හිමියන කියෙහි ලති දෙස්නැති, එකරුණෙහිබි කී සගින්අයති එතුයෙහි ලති දෙස් නැති" යනු කංඛාවිතරණී ගැටපදයි.)

366 ධම්මයුත්තම්පි, ධර්මයෙන් යුක්තදවූ; නච්චංවා, නැටුම්හෝ; ගීතංවා, ගීහෝ; වාදිතංවා, බෙරගැසීම්හෝ; යොජාපෙතුං, යොදවන්නටද; යොජෙතුං, (තමා) යොදන්නටද; පජ්ජිතානි, අනුත්විසින් යොදනලද්දවූත්; පස්සිතුඤ්ච, බලන්නටද; උපහාරං කරෙමාති, පූජාකරම්හයි; වුත්තෙ, කීකල්හි; සම්පටිච්ඡිතුංවා, (මැනවැයි යනාදීන්) ගිවිස්නටද; න ලබ්භං, නොවටී; (බුදුහු පුදයටනිස්සහයිහෝ පුදකරවනු කටයුත්තේයයිහෝ කියත් වටී.)

("අරියානං පරිනිබ්බාණකාලෙ රතනත්තයගුණූපසංහිතං සාධූනං කීළිකගීතං වා අසඤ්ඤතභික්ඛූනං ධම්මභාණකගීතං වා ධම්මයුත්තගීතන්නාම" යනුද "ආරාමෙ ඨත්වා අඤ්ඤං ආරාමෙ වා

---

* යා—පෙ—රොපිමං, යනු කෙතක්හෝ වේවා පොල්ආදි ආරාමයක්හෝ වේවා යම්කිසි රොපණය ඇති නිලිගත් තැනෙක්හි—නික්ෂෙපනොකළබීජයත් ඇති කෙත්කොන්ආදියෙහිහෝ නොහටගත් රොපණය ඇති ක්ෂෙත්‍රමර්‍යාදාවත්හිහෝ මිනිසුන්ගේ කසලදමන තැන්හිද හරණලද කෙතෙහිද දමානම් වටී.

367 රාජාගාරං පෙක්ඛරණිං උය්‍යානං චිත්තාගාරකං,
කීළත්ථං ගච්ඡතො දට්ඨුං ආරාමං දුක්කටං කතං.

368 නාවෙ න පටිබාහෙය්‍ය ‘සඞෙඝනඤ්ඤ’ණෙඟ න චීවරං,
නිඩ්ඩහෙය්‍ය ඛමාපෙය්‍ය ගුරුනා ච පණාමිතො.

---

බහිආරාමෙ වා නච්චාදීනි පස්සති වා සුණාති වා සලාකභත්තාදී නමත්ථාය අක්ඛුන වා කෙනචි කරණීයෙන ගන්ත්වා ගතට්ඨා නෙ පස්සති වා සුණාති වා තාදිසෙන උපද්දවෙන උපද්දුතො ස මජ්ජට්ඨානං පවිසති එවං පවිසිත්වා පස්සති වා සුණාති වා අනා පත්ති" * යනුඅටුවාසි.)

367 කීළත්ථං,(රජදරුවන්) කෙළෙනාපිණිස; කතං, කරණලද; රාජාගාරං, රජගෙයද; පොක්ඛරණිං, පොකුණද; උය්‍යානං, (නුවර සමීපයෙහි කළ)උයන්ද; චිත්තාගාරකං, චිත්‍රශාලාද; ආරාමං,(රජගේ අබියස්හි කළ) අරම්ද; දට්ඨුං, බලනුපිණිස; ගච්ඡතො, යන්නාහට; දුක්කටං, (පියෙහි පියෙහි) දුකුළාවේ.

("අජ්ඣාරාමෙ රාජාගාරාදීනි කරොන්ති තානි පස්සති, පිණ්ඩපා තාදීනමත්ථාය ගච්ඡන්තස්ස මග්ගො හොන්ති තානි පස්සති, ර ඤ්ඤො සන්තිකං කෙනචි කරණීයෙන ගන්ත්වා පස්සති, කෙනචි උපද්දුතො පවිසිත්වා පස්සති අනාපත්ති,, † යනුඅටුවාසි.)

368 නාවෙ, සඟමහණුන්; ආසනෙන, හුනස්නෙන්; නපටිබා හෙය්‍ය, නොපිළිබඟන්නේය; උණෙඟ, ඇව්වෙහි; චීවරං, සිවුරු; ననිඩ්ඩහෙය්‍ය, නොදවන්නේය; ගුරුනා, ආචාර්‍ය්‍යොපාධ්‍යායයන් විසින්; පණාමිතොච, (මෙහි නොවස යනාදීන්) ප්‍රණාමණයක රණලද්දේද; ඛමාපෙය්‍ය, ක්ෂමාකරවන්නේයි.

---

* ආර්‍ය්‍යයන්ගේ පරිනිර්වාණකාලයෙහි රත්නත්‍රයෙන් ගුනසංපූ න්න සාධූන්ගේ ක්‍රීඩාහිහෝ සංයතනොවූ භික්ෂූන්ගේ ධම්මභා ණකහීහෝ දහම්පුත් හිනම්වේ–ආරාමයෙහි සිට ආරාමයතුලහෝ ආරාමය පිටිහෝ නෘත්‍යාදිය දකීහෝ අසයිහෝ සලාකබත් ආදි ය පිණිස හෝ අන් කිසි කටයුත්තකින් ගොස් හෝ ගියතැනදී දකීහෝ අසයිහෝ එබඳු උපද්‍රවයකින් පීඩාකරණලද්දේ නෘ ත්‍යස්ථානයට ප්‍රවේශවේද මෙසේ ප්‍රවේශව දකීහෝ අසයිහෝ ඇවැත්නැති.

† ආරාමයතුල රජගෙවල්ආදිය කරත්ද ඒදකිද පිණ්ඩපාතාදියපි ණිස යන්නහුගේ මාර්ගයෙහි වෙත්නම් ඒ දකිද රජසමීපයට කි සිකටයුත්තකින් ගොස් දකිද කිසිවෙක් විසින් පීඩාකරණලද්දේ ප්‍රවේශව දකිද ඇවැත්නැති.

339 අක්කොසනෙ පරම්මුඛා ආපත්තිහි ච සත්තන්නං,
භික්ඛුමුපාසකං වා'පි අඤ්ඤෙනෙව ච දුක්කටං.

370 න ලබ්භා විනිපාතෙතුං සද්ධාදෙය්‍යඤ්ච චීවරං,
ලබ්භං පිතූනං සෙසානං ඤාතීනම්පි න ලබ්භති.

371 වස්සං වුත්ථො'ඤ්ඤතො'ඤ්ඤත්ථ භාගං ගණ්හෙය්‍ය දුක්කටං,
පටිදෙය්‍ය නට්ඨෙ ජිණ්ණෙ ගීවා නො දෙය්‍ය චොදිතො,
ධුරනික්ඛෙපතො තෙසං හොති භණ්ඩග්ඝකාරියො.

372 න සන්තරුත්තරො ගාමං කල්ලො වා සඋපාහනො,
පවිසෙය්‍ය න ධාරෙය්‍ය චාමරීමකසබීජනිං.

---

369 සත්තන්නංආපත්තිහි, සත්ඇවැත්කඳින්; භික්ඛුංවා, මහණකුද; අඤ්ඤෙනෙවච, ("අස්සද්ධො අප්පසන්නො" යනාදී) සෙසුආක්‍රොශවචනයෙන්; උපාසකංවාපි, උපාසකයාද; පරම්මුඛා, නොහමුයෙහි; අක්කොසනෙ, ආක්‍රොශකිරීමෙහි; දුක්කටං, දුකුලාවේ. (පව්ගරහණවිසින් කියත් දොස් නැති )

370 සද්ධාදෙය්‍යං, සැදැහැයෙන්දුන්; චීවරඤ්ච, සිවුරුද; "ච" ශබ්දයෙන් පිණ්ඩපාතාදීද; විනිපාතෙතුං, (පඤ්චසහධම්මිකයන්හා දෙමව්පියන්විනා සෙස්සත්ව) දෙත්; නලබ්භං, නොවටී; පිතූනං, මව්පියන්ට (දෙත්;) ලබ්භං, වටී; සෙසානං ඤාතීනම්පි, සෙසු නෑයන්ටද; නලබ්භති, නොවටී.

371 අඤ්ඤත්ථ, අනික්වෙහෙරෙක; වස්සං වුත්ථො, වස්වුසූයේ; අඤ්ඤතො, අනික් වෙහෙරකින්; භාගං, (වස්සාවාසිකචීවර) භාගයක්; ගණ්හෙය්‍ය, ගණීනම්; දුක්කටං, දුකුලාවෙයි; පටිදෙය්‍ය, නැවත(ගත්තෙනට)දෙන්නේයි; නට්ඨෙ.(ගත්කොටස)නටකල්හිද; ජිණ්ණෙ, දිරාගිය කල්හිද; ගීවා, නයවේ; චොදිතො, (හිමියන්විසින්) ඉල්වනලද්දේ;නොදෙය්‍ය, නොදේනම්; තෙසං, ඒ (වෙහෙර සිවුරුලැබියයුතු) මහණුන්ගේ; ධුරනික්ඛෙපතො, ධුරනික්ෂෙපයෙන්; භණ්ඩග්ඝකාරියො හොති, බඩුයෙහි අගය වූ පරිද්දෙන් කටයුතුවේ.

372 සන්තරුත්තරො, සඟල නොගෙණ හඳනාපොරෝනා දෙක මතු වැලඳගත්තේද;කල්ලො, නොගිලන්වූ; සඋපාහනොවා, පයලූවහන්අත්තේද; ගාමං, ගමට; නපවිසෙය්‍ය, නොවදනේය; චාමරිමකසබීජනිං, චමරවාළයෙන් කළ මකසබීජනිය; නධාරෙය්‍ය, නොදරන්නේයි.

("අග්ගළගුත්තවිහාරෙ චීවරං ඨපෙත්වා පවිසිතුං වට්ටති, ආර

373 අගිලානො න ඡින්දෙය්‍ය කෙසෙ කත්තරියා බහි,
ආරාමතො න ධාරෙය්‍ය ඡත්තං ලබ්භති ගුත්තියා.

374 වාහෙය්‍ය නුභතොකාජං එකන්තරිකකාජකං,
සීසක්ඛන්ධකටිභාරෙ හත්ථොලම්බො ච ලබ්භති.

375 ආපත්තියා අනොකාසකතං චොදෙය්‍ය දුක්කටං,
සුද්ධස්ස ච අවත්ථුස්මිං තථා ඔකාසකාරණෙ.

---

ක්ඛෙත්තෙන පන හණ්ඩිකබද්ධකාය පක්ඛිපිත්වා පාසාණසුසිරරුක්ඛසුසිරාදීසු පටිච්ඡන්නෙනාපි ඨපෙත්වා බහි ගන්තබ්බං"*යන්නු අටුවාසී.)

373 අගිලානො, නොගිලන්වහණ; කත්තරියා, කතුරෙන්; කෙසෙ, කෙසයන්; නඡින්දෙය්‍ය, නොකපන්නේය; ආරාමතො බහි, ආරමින් පිටත; ඡත්තං, කුඩය; නධාරෙය්‍ය, නොදරන්නේය; ගුත්තියා,(සිව්රුහා ආත්ම) රක්‍ෂාපිණිස; ලබ්භති, (ඡත්‍රධාරණය) වටී.

("ගණ්ඩවණ්ණරුචිසීසරොගාබාධප්පච්චයා කෙසෙ කත්තරියා ඡෙදාපෙතුං වට්ටති"යන්නුද-"යස්ස කායදාහො වා පිත්තකොපො වා හොති, චක්ඛුං වා දුබ්බලං, අඤ්ඤො වා කොචි ආබාධො විනා ඡත්තෙන උප්පජ්ජති, තස්ස ගාමෙ වා අරඤ්ඤෙ වා ඡත්තං වට්ටති, වසෙස පන චීවරගුත්තත්ථං වාළමිගචොරභයෙසු අත්තගුත්තත්ථම්පි වට්ටති, එකපණ්ණච්ඡත්තම්පන සබ්බත්ථෙව වට්ටති" † යන්නුඅටුවාසී—රුචිනම් දුෂ්ටව්‍රණයි. එකපණ්ණච්ඡත්තනම් තලපතයි.)

374 උභතොකාජං, දෙකෙළවර (බැඳ එල්වූ බරඇති)කද; න වාහෙය්‍ය, නොඋසුලන්නේය; එකන්තරිකකාජකං, එක්කෙළවරක බැඳ එල්වූ බරඇති කදහා දෙදෙනා උසුලන අතුරු කදද; සීසක්ඛන්ධකටිභාරෙ, හිසින් අසරුවෙන් උකුලෙන් ගන්නා බරද; හත්ථොලම්බොච, අතින් එල්වා ගන්නාබරද; ලබ්භති, වටී.

375 අනොකාසකතං, චොදනාවට අවකාශනොකළ (භික්ෂු)

---

* අගුලින් ආරක්ෂිතවූ විහාරයෙහි සිව්රු තබා ප්‍රවෙශවෙන්ට වටී, ආරණ්‍යකභික්ෂුවවිසින් බඩු (දමන) හැලියෙහි බහා ගල්සිදුරු රුක් සිදුරු ආදී පිළිසත්තැන්හි තබා පිටතට යායුතුයි.

† ගඩුවණ අරුච් ශිෂිරුජා ආබාධයන් හෙතුකොටගෙණ කෙස යන් කතුරින් කපවන්ට වටී. යමෙකුට කායදාහයෙක්හෝ පිත්ත කොපයෙක්හෝ වේද ඇසහෝ දුර්වලවේද අන්කිසිආබාධයක් හෝ ඡත්‍රය නොදැරීමෙන් උපදීද ඔහුට ගමෙහිහෝ වනයෙහි හෝ ඡත්‍රය වටී, වණිකල සිව්රු ආරක්ෂාපිණිසත් චණ්ඩමෘග චොර බියෙහි ආත්මරක්ෂා පිණිසත් වටී. එකපණ්ණච්ඡත්‍රය වනාහි හැමතැන්හිම වටී.

376 අඩ්ඪඞ්ගුලාධිකං මඤ්චපටිපාදං න ධාරයෙ,
පකතඞ්ගුලෙන සත්ථානං මඤ්චං වා උච්චපාදකං.

377 මූගබ්බතාදිං ගණ්හෙය්‍ය දුක්කටං තිත්ථියබ්බතං,
ඛුරභණ්ඩං පරිහරෙ තථා නහාපිතපුබ්බකො.

378 යඞ්කිඤ්චි යාචිතුං හත්ථකම්මං තදනුසාරතො,
ලද්ධං ගහෙතුං නික්කම්මම'යාචිත්වා'පි කප්පති,
කාරෙතුමාහරාපෙතුං යඞ්කිඤ්චි පරසන්තකං.

---

හු; ආපත්තිය, ඇවතිත්; චොදෙය්‍ය. චොදනා කෙරේනම්; දුක්කටං, දුකුළාවෙයි; සුධස්ස, සුධයා, අවත්ථුස්මිං, නිකාරණෙහි, ඔකාසකාරණෙච,("කරොහි මෙ ආවුසො ඔකාසං තං අහං වත්තුකාමො"යි චොදනාකාරත්වාව) අවකාශ කැරවීමෙනිද; තථා, එසේම; (දුකුළාවේ.)

376 සත්ථානං, මිනිසුන්ගේ; පකතඞ්ගුලෙන, පියවීඅඟුලෙන්; (භෙවත්)වඩුඅඟුලින්;අඩ්ඪඞ්ගුලාධිකං,අඩඟුලකින් ඉතිරිවූ; මඤ්චපටිපාදං,හැඳපාඅළුද;උච්චපාදකං,වඩුරියනින් උස්පා ඇති මඤ්චවා, හැඳද; නධාරයෙ, නොදරත්තේයි,

377 මූගබ්බතාදිං, මූකව්‍රතාදීවූ; තිත්ථියබ්බතං, තීර්ථකයන්ගේ ව්‍රතං; ගණ්හෙය්‍ය. ගණීනම්; දුක්කටං, දුකුළාවෙයි; නහාපිතපුබ්බකො, පෙර කරණැවැමිමහණ; ඛුරභණ්ඩං, කරණැවැම්පිරිකර; පරිහරෙ, පරිහරණය කෙරේනම්; තථා, එසේම; (දුකුළාවේ) (අනුන් අහිත් ගෙණ කෙසවෙඳදැදි කර්මාන්ත කරත් වපි.)

378 යඞ්කිඤ්චි,(කිසයේබැඳ්ම් ගෙත්තම්ආ)යම්කිසි;හත්ථකම්මං, අතින් කටයුතු මෙහෙයක්, යාචිතුං, (හස්තකර්මයක්දෙවයි) ඉල්වන්නටද; තදනුසාරතො, ඒ (හස්තකර්මයාගෙ) අනුසාරයෙන්; ලද්ධං, ලදකැපවතක්; ගහෙතුං, ගන්නටද; නික්කම්මං, (කසීවනිජ්ජාදි)කටයුත්තක් නැත්තාහු; අයාචිත්වාපි, (හස්තකර්ම) නොඉල්වාද; කාරෙතුං, (කැමතිමෙහෙයක්) කරවන්නටද; අපරසන්තකං, අනුන්අයත්නොවූ; යඞ්කිඤ්චි, (එලාඑලාදි)යම්කිසිවක්; ආහරාපෙතුං, (අරණ්‍යයෙන්) ගෙන්වන්නටද; කප්පති, කැපයි.

("හත්ථකම්මංනාම. කිඤ්චි වත්ථු න හොති, තස්මා කිම්භනෙන ආගතත්ථ කොන කම්මෙනාති පුච්ඡිතෙ වා අපුච්ඡිතෙ වා යාචිතුං වට්ටති, විඤ්ඤත්තිපච්චයා දොසො නත්ථි,, * යනුඅටුවායි).

---

* හස්තකර්මයනම් කිසිවස්තුවක් නොවෙයි ඒහෙයින් කිමෙක්ද ඉවාමිති කවරකර්මයකින් අයේවූදැයි විචාළකල්හිහෝ නොවිචාළකල්හිහෝ ඉල්වන්ට වපි, විඤ්ඤප්තිය හෙතුකොට ගෙණ දොෂයෙක් නැති.

379 ගිහීනං ගොපකෙ දෙන්තෙ ගහෙතුං දෙති යත්තකං,
ලබ්භං යථා පරිච්ඡෙදං සඞ්ඝචෙතියසන්තකෙ.

380 ඡහාපජ්ජෙය්‍ය ආපත්ති කායවාචාහි වා ඡහි,
අලජ්ජිඤ්ඤාණකුක්කුච්චපකතත්තා සතිප්ලවා,
අකප්පියෙ කප්පියෙ වා කප්පාකප්පියසඤ්ඤිතා.

381 අලජ්ජිඤ්ඤාණතා'පත්ති කායවාචාහි ඡාදයෙ,
ලිඞ්ග සඞ්ඝ ගණෙ'කස්මිං චතුධා 'පත්ති වුට්ඨති.

382 පරිකථොභාසවිඤ්ඤත්ති න ලබ්භා පච්චයද්වයෙ,
විඤ්ඤත්තියෙව තතියෙ සෙසෙ සබ්බම්පි ලබ්භති.

---

379 ගිහීනං, ගිහිමිනිසුන් අයත් (ඵලාඵලාදිය); ගොපකෙ, උද්‍යානාදිරක්නාහු; දෙන්තෙ, දෙනකල්හි; යත්තකං දෙති, යම්පමණක් දේද; ගහෙතුං, (එපමණක්)ගනුත්;ලබ්භං, වට්; සඞ්ඝචෙතියසන්තකෙ, සංඝසන්තක චෛත්‍යසන්තකයෙහි; යථාපරිච්ඡෙදං, (දවසකට මෙතෙක් ගණුයි නමහට) පිරිසුන්සේ (ගොපකයා දෙනකල්හි;) ලබ්භං, (ගන්නට) වට්.

380 කායවාචාහි, කායවාචායන; විහි, දෙපරිද්දෙන්; ආපත්ති, ඇවැත්; ආපජ්ජෙය්‍ය, අවදනේයි; (අවදනේද) අලජ්ජී, අලජ්ජ බැවින්හෝ; අඤ්ඤාණ, අඤ්ඤාණබැවින්හෝ; කුක්කුච්චපකතත්තා, කුකුසින් මඩනාලදබැවින්හෝ; සතිප්ලවා, සිහිමුළාංයෙන්හෝ; අකප්පියෙ, අකැපයෙහිද; කප්පියෙවා, කැපයෙහිද; කප්පාකප්පියසඤ්ඤිතාවා, (යථාක්‍රමයෙන්)කැපසංඥහෝ අකැපසංඥහෝ ඇතිබැවිනයන; ඡහි, සපරිද්දෙන් (අවදී.)

381 ආපත්ති, (මෙසේ අවත්) ඇවැත්; අලජ්ජිඤ්ඤාණතා, අලජ්ජිබැවින්හෝ; අඤ්ඤාණබැවින්හෝ; කායවාචාහි, කායවාක් දෙකින්; ඡාදයෙ, සඟවන්නේයි; ලිඞ්ග, ලිඟුපෙරළීමෙනිය; සඞ්ඝ, සඟමැදය; ගණෙ, ගණමැදය; එකස්මිං, එක්පුඟුලෙකු කෙරෙහියයන; චතුධා, සතරපරිද්දෙන්; ආපත්ති වුට්ඨාති, ඇවැතින්, නැඟීමවේ.

382 පච්චයද්වයෙ, (චීවරපිණ්ඩපාත යන පළමු) දෙපසයෙහි, පරිකථා, පරියායකථාද; ඔභාස, පහළකොට කියන පසපිළිබඳකථාද; විඤ්ඤත්ති, විඤ්ඤප්තිද; නලබ්භා, නොවට්; තතියෙ, තුන්වන සෙනසුන් පසයෙහි; විඤ්ඤත්තියෙව, විඤ්ඤත්තියම (නොවට්;) සෙසෙ, ගිලන්පසයෙහි; සබ්බම්පි, (පරිකථාදි) සියල්ලම, ලබ්භති, වට්.

("චීවරෙ පිණ්ඩපාතෙ ච නිමිත්තොභාසපරිකථාවිඤ්ඤත්තියො න වට්ටන්ති" යන අටුවායෙහි නිමිත්ත වචන සහචරපරිකථාදි ශබ්දයන්ගේ සන්නිධිබලයෙන් ලබන නිමිත්ත ශබ්දයාද ගෙණ නිමිත්තපරිකථොභාසවිඤ්ඤත්ති යයි ගතයුතු.)

383 න රූහතච්චයෙ දාතුං පඤ්චන්නං සහධම්මිනං,
සඞ්ඝෙසච ච තං හොති ගිහීනං පන රූහති.

---

("නිමිත්තං නාම. යඞ්කිඤ්චි පරෙසං පච්චයදානසඤ්ඤජනකං කායවචීකම්මං, ඛාදනීයං ගහෙත්වා ගච්ඡන්තෙ දිස්වා කිං ඛාදනීයං ලභිත්ථාති ආදිනා නයෙන තස්ස පවත්තනි වෙදිතබ්බා-පරිකථා නාම. යථා තං ලභති තථා තථා පරිවත්තෙත්වා කථනං, එතරහි භික්ඛූ පිණ්ඩපාතෙන කිලමන්තීති ආදිනා නයෙන තස්ස පවත්තනි වෙදිතබ්බා-ඔභාසො නාම. පච්චයපටිසංයුත්තකථා, වච්ඡපාලකෙ දිස්වා 'කිං ඉමෙ වච්ඡා ඛීරගොවච්ඡා තක්කගොවච්ඡා'ති පුච්ඡිත්වා ඛීරගොවච්ඡා භන්තෙ'ති වුත්තෙ න ඛීරගොවච්ඡා යදි ඛීරගොවච්ඡා සියුං භික්ඛූ'පි ඛීරං ලභෙය්‍යුන්ති ආදිනා නයෙන තස්ස පවත්තනි වෙදිතබ්බා—විඤ්ඤත්ති නාම අඤ්ඤාතකඅප්පවාරිතට්ඨානෙ ආහාරං දෙන්තීති විඤ්ඤාපනා—සෙනාසනෙ පන නිමිත්තං නාම සෙනාසනත්ථං භූමිපරිකම්මානි කරොන්තස්ස කිං භන්තෙ කයිරති කො කාරාපෙතීති ගිහීහි වුත්තෙ න කොචීති පටිවචනං, යංවා පනඤ්ඤම්පි එවරූපං නිමිත්තකම්මං—ඔභාසො නාම උපාසකා තුම්හෙ කුහිං වසථාති පාසාදෙ භන්තෙ'ති භික්ඛූනම්පන උපාසකා පාසාදො න වට්ටතීති වචනං, යංවා පනඤ්ඤම්පි එවරූපං ඔභාසකම්මං—පරිකථා නාම භික්ඛුසඞ්ඝස්ස සෙනාසනං සම්බාධන්ති වචනං, යාවා පනඤ්ඤා'පි එවරූපා පරියායකථා—භෙසජ්ජෙ සබ්බම්පි ලබ්භති, තථා උප්පන්නම්පන භෙසජ්ජං රොගෙ වූපසන්තෙ පරිභුඤ්ජිතුං න වට්ටති, තත්ථ විනයධරා භගවතා ද්වාරං දින්නං තස්මා වට්ටතීති වදන්ති, සුත්තන්තිකා පන කිඤ්චාපි ආපත්ති න හොති, ආජීවම්පන කොපෙති, තස්මා න වට්ටතිච්චෙව වදන්ති" † යනු විසුද්ධිමාර්ග අටුවායි.)

(මෙපමණකින් සතරවනපසයෙහි පරිකථාදි සතරමැ වටී, තුන්වනපසෙහි විඤ්ඤත්තිවූත් සෙසුතුන වටී පළමුදෙපසයෙහි හැම නොවටී යනු උක්තයයි දතයුතු.)

383 පඤ්චන්නංසහධම්මිනං, පඤ්චසහධර්මිකයන්ගේ; අච්චයෙදානං,(මා මලකල්හි මාගේ පිරිකර උපාධ්‍යායන්ටදෙම් යනාදි)

---

† නිමිත්තනම් අනුන්ට ප්‍රත්‍යයදානසංඥ උපදවන යම්කිසි කායවාක්කර්මයකි, කැවිලි ගෙණ යන්නවුන් දැක කිම කැවිලි ලදුද යනාදි ක්‍රමයෙන් එහි ප්‍රවෘත්ති දතයුත්තාහුය-පරිකථානම් යම්සේ එය ලබාද ඒ ඒ පරිද්දෙන් පෙරළා කීමයි,මෙකල භික්ෂූහු පිණ්ඩපාතයෙන් කලාන්තවෙත් යනාදි ක්‍රමයෙන් එහි ප්‍රවෘත්ති දතයුත්තාහුය—ඔභාසනම් ප්‍රත්‍යයප්‍රතිසංයුක්තකථායි වච්ඡපාලයන් දැක කිම මේ වස්සෝ කිරිදෙනුන් වස්සෝද මෝරුදෙනුන් වස්

384 භික්ඛු වා සාමණෙරො වා කාලං කයිරාථ'පස්සයෙ,
භික්ඛුසඞ්ඝාව දායජ්ජා තස්ස සෙසෙපට්ඨ'යන්නාගයො.

---

තමන් ඇවෑමෙහි දීම; නරුහති, නොනැගෙසි; තං, ඒව්වරාදිව ස්තුව; සඞ්ඝසෙසවවහොති, සාංඝසනාතකමවෙසි; ගිහිනාම්පන, ගිහිනිස්සූරගේ(තමන් ඇවෑමෙහි දීම)වනාහි; රුහති, නැගේ.

("සචෙ පඤ්චසු සහධම්මිකෙසු යොකොචි කාලංකරොන්තො මමච්චයෙන මය්හං පරික්ඛාරෝ උපජ්ඣායස්ස හොතු ආචරියස්ස හොතු සද්ධිවිහාරිකස්ස හොතු අන්තෙවාසිකස්ස හොතු මාතු හොතු පිතු හොතු අඤ්ඤස්ස වා කස්සචි හොතු'ති වදති තෙසං න හොති, සඞ්ඝස්සෙව හොති, නහි පඤ්චන්නං සහධම්මිකානං අච්චයෙන දානං රුහති, ගිහීනම්පන රුහති,, * යන්නුඅටු වාසි.)

384 භික්ඛුවා, භික්ෂුයෙක්හෝ; සාමණෙරොවා, සාමණෙර

---

සෝදැයි විචාර ස්වාමීනි කිරිදෙනුන් වස්සෝයයි කීකල්හි කිරිදෙනුන් වස්සෝ නොවෙයි ඉදින් කිරිදෙනුන් වස්සෝ වත්නාහු නම් භික්ෂූහුද කිරි ලබත්නාහූයයි යනාදික්‍රමයෙන් එහි ප්‍රවෘත්ති දක්නුත්නාහුය—විඤ්ඤත්තිනම් නොනෑ නොපැවරුතැන්හි අහර දෙවයි ඇඟවීමයි—සෙනාසනයෙහි වනාහි නිමිත්තනම් සෙනසුන් පිණිස භූමිපරිකර්මයක් කරන්නාහුට ගිහියන්විසින් ස්වාමීනි කුමක් කෙරේද කවරෙක් කරවාදැයි කීකල්හි කිසිවෙක් නැතැයි යන පිළිවදනි, මෙබඳු අනිකුදු යමක්හෝ වනාහි නිමිත්තකර්ම නම් වෙයි—ඔභාසනම් උපාසකවරුනි තෙපි කොහි වසව්ද ස්වාමීනි ප්‍රාසාදයෙහිය(යීකීකල) උපාසකවරුනි භක්‍ෂූන්ටවනාහි ප්‍රාසාද නොවටීද යනවචනි, මෙබඳු ස්වරූප අන් යම් කිසිවකුදු ඔභාස කර්ම නම් වෙයි—පරිකථානම් භික්ෂුසඞ්ඝයාහට සෙනසුන් ගැහැටයයි කීමයි. මෙබඳු අනිකුදු යම් පයඝීය කථාවකි—බෙහෙතෙහි සියල්ලම වටී. එසේඋපත් බෙහෙත වනාහි රෝගය සන්සිඳුනුකල්හි පරිභොගකරන්ට නොවටී. එහි විනයධරයෝ බුදුන්විසින් වාරය දෙනලදී එහෙයින් වටීයයි කියත්, සූත්‍රාන්තිකයෝවනාහි කිසිදඇවතක් නොවෙයි ආජීවයවනාහි කොපවෙයි එහෙයින් නොවටීයයිම කියත්.

* ඉදින් පස්සහදම්යන් අතුරෙන් යම්කිසිවෙක් කාළුරියකරන්නේ මාගේඇවෑමෙන් මාපිරිකර උපාධ්‍යායයාහට වේවා ආචාර්යයාට වේවා සද්ධිවිහාරිකයාට වේවා අතවැසියාට වේවා මව්ටවේවා පියාට වේවා අන්කිසිවකුට හෝ වේවයි කියාද ඔවුන්ට නොවෙයි සඞ්ඝයාටම වෙයි, පස්සහදම්යන්ගේ ඇවෑමෙන් දීම නොනැගෙයි, ගිහින්ගේවනාහි දීම නැගෙයි.

385 පුරිමස්සෙවි'මං දින්නං දෙහි නෙත්වා'ප්පකස්සි'ති.
පච්ඡිමස්සෙව දම්මී'ති දින්නං ඤත්වා ඉමං විධිං,
ගණ්හෙ විස්සාසගාහා වා 'ධිට්ඨෙ මතකචීවරං.

386 ලොහභණ්ඩෙ පහරණිං දාරුභණ්ඩෙ ච දාරුජං,
පත්තං පාදුකපල්ලඞ්කං ආසන්දිං මත්තිකාමයෙ,
ඨපෙත්වා කප්පති සබ්බං කතකං කුම්භකාරිකන්ති.

---

යෙක්හෝ; උපස්සයෙ, මෙහෙණවර; කාලංකතිරාඑ, මෙහෙණීනම්; භික්ඛුසඞ්ඝාව, භික්ෂුසඞ්ඝම; තසඑ, ඒදෙදෙනාසතුපිරිකර; දායජ්ජං, හිමිය; සෙසෙපි, භික්ඛුනී සික්ඛමාන සාමණෙරීන් (භික්ෂුවිහාරයෙහි) මළකල්හිදු; අයනාභයො, මෙම නයයි; (උත්සතුපිරිකර භික්ෂුණීසඞ්ඝම හිමියයිසේයි.)

385 ඉමං නෙත්වා අප්පකස්ස දෙහීති, මේ ගෙණගොස් අසවල්හට දෙවයි; දින්නං, දෙනලද (චීවරාදිය;) පුරිමස්සෙව, (ලබන්නාහු (අතට නොගියතාක්කල්) දායකයා සන්තකමය; දම්මීති දින්නං, මේ අසවල්හට)දෙම්යි දෙනලද්දේ;පච්ඡිමස්සෙව, (දුන්තැනපටන්) පිරිකරලබන්නාහු සන්තකමැයි;ඉමං විධිං,මේ විධානය; ඤත්වා, දැන; (හෙවත් මෙසේප්‍රකාරයෙන් හිමියන්)හැඳින; විස්සාසගාහාවා, (ජීවත්වන හිමියන්කෙරෙහි) විශ්වාසග්‍රාහයෙන්හෝ; ගණ්හෙ, ගන්නේය; මතකචීවරං(වා,ඌමළහොත්) මතකචීවර කොටහෝ; අධිට්ඨෙ, ඉටන්නේයි; (අන්මහණුන් නැතහොත් මේ මට පැමිණෙයි සිතින් සැලකීම අධිෂ්ඨානනම්.)

386 ලොහභණ්ඩෙ, ලොහභාණ්ඩයෙහි; පහරණිං; ආයුධද, දාරුභණ්ඩෙ, දාරුභාණ්ඩයෙහි; දාරුජං, දාරුමයවූ; පත්තං, පාත්‍රයද; පාදුක, (පයලාසත්මන්කවහැරි) මරවැඩියද; පල්ලඞ්කං, (ඇරගිලුවූ වාළ රූපඇති) පර්‍ය්‍යඞ්කයද; ආසන්දිං, පමණඉකුත්දික්හගලා පුටුවද; මත්තිකාමයෙ, මැටියෙන්කළ භාණ්ඩයෙහි; කතකං, කතම්ලලකයද; කුම්භකාරිකං, සබ්බමත්තිකාමයකුටියද; ඨපෙත්වා, තබා; සබ්බං (සෙසු ලොහභාණ්ඩය දාරුභාණ්ඩය මත්තිකාභාණ්ඩය යන) සියල්ල; කප්පති, කැපයි.

("කතකන්නාම පදුමකණ්ණිකාකාරං පාදඝංසනත්ථං කණ්ටකෙ උට්ඨාපෙත්වා කතං, තං වට්ටං වා හොතු චතුරස්සාදිභෙදං වා බාහුලිකානුයොගත්තා පටික්ඛිත්තමෙව' නෙව පටිග්ගහෙතුං න පරිභුඤ්ජිතුං වට්ටති" * යනු අටුවායි.)

---

* කතකයනම් පියුම්කෙම් ආකාර පාසවන්නුපිණිස කටුනගා කරණලද්දකි, එය වට්හෝ වේවා හතරැස්ආදි භෙදහෝ වේවා බාහුල්කානුයොගබැවින් ප්‍රතික්ෂෙපකරණලද්දේමය, නොම්පිළිගන්වද නොමපරිභොග කරන්වද වටී.

"දෙසනා"ති.

387 චාගො යො භික්ඛුභාවස්ස සා පාරාජිකදෙසනා,
යථාවුත්තෙන උට්ඨානං ගරුකාපත්තිදෙසනා.

388 උක්කුටිකං නිසීදිත්වා පග්ගණ්හිත්වාන අඤ්ජලිං,
ථුල්ලච්චයාදිං දෙසෙය්‍ය එවමෙකස්ස සන්තිකෙ.

(7) "අහම්භන්තෙ එකං ථුල්ලච්චයාපත්තිං ආපජ්ජිං තං තුම්හමූලෙ පටිදෙසෙමී"ති වත්වා. තෙන "පස්සසි ආවුසො තං ආපත්තින්ති" වුත්තෙන. "ආම භන්තෙ පස්සාමී"ති වත්වා. පුන තෙන "ආයතිං ආවුසො සංවරෙය්‍යාසී"ති වුත්තෙන. "සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමී"ති වත්තබ්බං.

---

"දෙසනා"ති, දෙසනායත්හොහි; (ආපත්තිදෙසනා නම්.)

387 භික්ඛුභාවස්ස, භික්ෂුවෙශයාගේ; යොචාගො (ගෘහස්ථාදි භාවයට පැමිණීමෙන්) යම්පරිත්‍යාගයෙක් අද්ද; සා, හෝතොමෝ; පාරාජිකදෙසනා, පාරාජිකාදෙශනා නම්වේ; යථාවුත්තෙන, යථොක්තපරිච්ඡෙදෙන්; උට්ඨානං, (ආපත්තීන්) නැගීම; ගරුකාපත්තිදෙසනා, සඞ්ඝාදිසෙසාපත්තිදෙශනා නම් වෙයි.

388 උක්කුටිකං නිසීදිත්වා, උළුක්කෙන් හිඳ; අඤ්ජලිංපග්ගණ්හිත්වාන, අඳිලිබැඳ; එකස්ස සන්තිකෙ, එක් මහණක්හු කෙරෙහි;එවං, මෙසේ; ථුල්ලච්චයාදිං, ථුල්ලච්චයාදි ඇවැත්, දෙසෙය්‍ය, දෙසන්නේයි.

(7) අහම්භන්තෙ—පෙ—පටිදෙසෙමීති, "අහම්භන්තෙ එකං ථුල්ලච්චයාපත්තිං ආපජ්ජිං තං තුම්හමූලෙ පටිදෙසෙමී"යි; වත්වා, කියා; තෙන, ඔහුවිසින්; පස්සසි ආවුසො තං ආපත්තින්ති, "පස්සසි ආවුසො තං ආපත්තිං"යි; වුත්තෙන, කීකල්හි; ආමභන්තෙ පස්සාමීති, "ආමභන්තෙ පස්සාමි"යි; වත්වා, කියා; පුන, නැවත; තෙන, ඔහු විසින්; ආයතිං ආවුසො සංවරෙය්‍යාසීති, "ආයතිං ආවුසො සංවරෙය්‍යාසි"යි; වුත්තෙන, කීකල්හි; සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමීති, "සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමි"යි; වත්තබ්බං, කියයුතු.

(භන්තෙ, ස්වාමීය; අහං, මම; එකංථුල්ලච්චයාපත්තිං, එක්තුලැසිඇවතක්; ආපජ්ජිං, අවත්මි; තං, ඒ; තුම්හමූලෙ, තොපකෙරෙහි; පටිදෙසෙමීති, දෙසම්යි; වත්වා, කියා; තෙන, ඔහුවිසින්, ආවුසො, ඇවැත; තං ආපත්තිං, ඒඇවැත; පස්සසීති, දක්හිදැයි; වුත්තෙන, කීකල්හී; භන්තෙ, සවාමීය; ආම, එසේයි; පස්සාමීති, දක්මියි; වත්වා, කියා; පුන, නැවත; තෙන, ඔහුවිසින්, ආයතිං, මත්තෙහි; සංවරෙය්‍යාසීති, සංවරයෙහි සිටිහිදැයි; වුත්තෙන, කීසඳ; සාධු, යහපතැයි; සුට්ඨු, මනාකොට; සංවරිස්සාමීති, සංවරයෙහිසිටිම්යි; වත්තබ්බං; කියයුතුයි; යනුමෙහිඅර්ථයි.)

(8) "අහම්භන්තෙ වෙථුල්ලවච්චයාපත්තියො ආපජ්ජිං" "අහම්භන්තෙ සම්බහුලා ථුල්ලවච්චයාපත්තියො අපජ්ජිං, තා තුම්හ මූලෙ පටිදෙසෙමි"ති වත්තබ්බං.

(9) නිස්සග්ගියෙසු පන "ඉදම්මෙ භන්තෙ චීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං, ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමී"ති. "ඉමානි මෙ භන්තෙ චීවරානි—පෙ—එතම්මෙ භන්තෙ චීවරං—පෙ—එතානි මෙ භන්තෙ චීවරානි දසාහාතික්කන්තානි නිස්සග්ගියානි, එතානාහං ආයස්මතො නිස්සජ්ජාමී"ති.

389 නිස්සජ්ජිත්වාන දෙසෙය්‍ය ආපත්තිං තෙන භික්ඛුනා,
පටිග්ගහෙත්වා ආපත්තිං දෙය්‍යං නිස්සට්ඨචීවරං,
"ඉමං ඉමානි එතං එතානි චීවරානි ආයස්මතො දම්මී"ති.

---

(8) වෙථුල්ලවච්චයාපත්තියො, ථුල්ලවච්චයාපත්ති දෙකෙක් සම්බහුලා ථුල්ලවච්චයාපත්තියො, බොහෝ ථුල්ලවච්චයාපත්තීන්;

(9) නිස්සග්ගියෙසු පන, නිසගි (පචිති) යෙහිවනාහි; ඉදම්මෙ භන්තෙ චීවරං—පෙ—නිස්සජ්ජාමීති, (සමීපයෙහි එක් සිවුරක්වූව) "ඉදම්මෙ භන්තෙ චීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමි" කියාද; ඉමානි මෙ භන්තෙ චීවරානි—පෙ—(බොහෝවූව) "ඉමානිමෙභන්තෙ චීවරානි දසාහාතික්කන්තානි නිස්සග්ගියානි ඉමානාහං ආයස්මතො නිස්සජ්ජාමි" කියාද; එතම්මෙ භන්තෙ චීවරං—පෙ—(දුරුඑකක්වූව) "එතම්මෙ භන්තෙ චීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං එතාහං ආයස්මතො නිස්සජ්ජාමි" කියද; එතානි මෙ භන්තෙ චීවරානි—පෙ—නිස්සජ්ජාමීති, (බොහෝවූව) "එතානි මෙ භන්තෙ චීවරානි දසාහාතික්කන්තානි නිස්සග්ගියානි එතානාහං ආයස්මතො නිස්සජ්ජාමි" කියාද.

389 නිස්සජ්ජිත්වාන (වස්තුව මෙසේ) නිසඳා; ආපත්තිං (අවත්) ඇවත්; දෙසෙය්‍ය, දෙසන්නේයි; තෙන භික්ඛුනා, (සිවුරනිසඳනද ලද) ඒභික්ෂුහුවිසින්; ආපත්තිං, ඇවැත්; පටිග්ගහෙත්වා, පිළිගෙණ; නිස්සට්ඨචීවරං, නිසඳුසිවුර ඉමං—පෙ—දම්මීති, "ඉමං ඉමානි එතං එතානි චීවරානි ආයස්මතො දම්මී"යි කියා, දෙය්‍යං, දියයුත්තේයි.

("සචෙ එකං චීවරං හොති "අහම්භන්තෙ එකං නිස්සග්ගියං පාචිත්තියං ආපන්නො තං පටිදෙසෙමී"ති. සචෙ බහූනි "අහම්භන්තෙ සම්බහුලා නිස්සග්ගියා පාචිත්තියාපත්තියො ආපන්නො තා පටිදෙසෙමී"ති වත්වා තෙන "පස්සසි ආවුසො"ති වුත්තෙන "ආම පස්සාමී"ති වත්වා "ආයතිං ආවුසො සංවරෙය්‍යාසී"ති වුත්තෙන

(10) ඉදමෙම භන්තෙ චීවරං රත්ති විප්පවුත්ථං අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා නිස්සග්ගියං.

(11) ඉදමෙම භන්තෙ අකාලචීවරං මාසාතික්කන්තං නිස්සග්ගියං.

---

"සාධු සුට්ඨු සංවරිස්සාමි" * යි මෙසේසින් ඇවැත් දෙසූකල්හි ඇවැත් පිළිගත්තහු විසින් (සම්පයෙහි එකසිවුරක්වුව "ඉමං චීවරං ආයස්මතො දම්මි" යි කියාද බොහෝවුව "ඉමානි චීවරානි ආයස්මතො දම්මි" යි කියාද දුරඑකක්වුව "එතං චීවරං ආයස්මතො දම්මි" යි කියාද බොහෝවුව "එතානි චීවරානි ආයස්මතො දම්මි" යි කියාද නිසඟුසිවුර දියයුතු—භන්තෙ, ස්වාමිය; මෙ, මාගේ; ඉදං චීවරං, මේ (අතිරේක) චීවරය; දසාහාතික්කන්තං, දසදවස ඉක්මුණේය; නිස්සග්ගියං, නිසදියයුත්තේය; අහං, මම; ඉමං, මේසිවුර; ආයස්මතො, ඇවැත්හට; නිස්සජ්ජාමි, නිසජමි; භන්තෙ, ස්වාමිය; මෙ, මාගේ; ඉමානි චීවරානි, මේචීවරයෝ; දසාහාතික්කන්තානි, දසදවසක් ඉක්මුනාහ; නිස්සග්ගියානි, නිසදියයුත්තාහ; ඉමානි, මෙචීවරයන්—පෙ—එතං චීවරං, ඒසිවුර; එතානි චීවරානි, ඒචීවරයෝ-පෙ-එතානි, ඒචීවරයන්; ආයස්මතො, ඇවැත්නට; නිස්සජ්ජාමි, නිසජමියි. (මෙසේසින් යටපාඨයෙහි අඳිදතයුතු.)

(10) භන්තෙ, ස්වාමිය; මෙ, මාගේ; ඉදං චීවරං, මේසිවුර; භික්ඛු සම්මුතියා අඤ්ඤත්‍ර, මහණසම්මුතිනැතිව; රත්තිං, රාත්‍රියෙහි; විප්පවුත්ථං, වියොව වසනලද; නිස්සග්ගියං, නිසදියයුත්තේය; අහං, මම; ඉමං, මේසිවුර; ආයස්මතො, ඇවැත්නට; නිස්සජ්ජාමි, නිසජමියි.

(11) අකාලචීවරං, නොකල්සිවුර; මාසාතික්කන්තං, මසක් ඉක්මුණේය. ("අකාලචීවරං නාම අනත්ථතෙ කඨිනෙ එකාදසමාසෙ උප්පන්නං' අත්ථතෙ කඨිනෙ සත්තමාසෙ උප්පන්නං' කාලෙ'පි උද්දිස්ස දින්නං" †

---

* ඉදින් එක් සිවුරක් වේනම් ස්වාමිනි මම එක් නිසගිපචිතියකට අවත්මි එය දෙසමියි. ඉදින් බොහෝ වූවාහුනම් ස්වාමිනි මම බොහෝනිසගි පචිතිආපත්තීන්ට පැමිණියෙමි එයදෙසමියිකියා ඔහුවිසින් ඇවැත්නි දක්හිදැයි කීකල්හි එහෙයි දක්මියිකියා ඇවැත්නි මත්තෙහි සංවරයෙහි සිටිහිදැයි කීකල්හි යහපත මනාකොට සංවරයෙහි සිටිමි.

† අකාල චීවරයනම් කඨිනය නොඅතුළ කල්හි (ඉල්මසහැර අනික්) එකොළොස්මස උපන්නාවූද කඨිනය අතුළකල්හි (ඉල්මසහා හෙමන්ත සෘතුවහැර අනික්) සත්මස උපන්නාවූද කාලයෙහි උදෙසා දෙනලද්දාවූද මේ අකාලචීවරයයි.

(12) ඉදම්මෙ භන්තෙ පුරාණචීවරං අඤ්ඤාතිකාය භික්ඛුනියා ධොවාපිතං නිස්සග්ගියං.

(13) ඉදම්මෙ භන්තෙ චීවරං අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො පටිග්ගහිතං අඤ්ඤත්‍ර පාරිවට්ටකා නිස්සග්ගියං.

(14) ඉදම්මෙ භන්තෙ චීවරං අඤ්ඤාතිකං ගහපතිකං අඤ්ඤත්‍ර සමයා විඤ්ඤාපිතං නිස්සග්ගියං.

(15) ඉදම්මෙ භන්තෙ චීවරං අඤ්ඤාතිකං ගහපතිකං තතුත්තරිං අඤ්ඤත්‍ර සමයා විඤ්ඤාපිතං නිස්සග්ගියං.

(16) ඉදම්මෙ භන්තෙ චීවරං පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතිකං ගහපතිකං උපසංකමිත්වා විකප්පං ආපන්නං නිස්සග්ගියං.

(17) ඉදම්මෙ භන්තෙ චීවරං පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතිකෙ ගහපතිකෙ උපසංකමිත්වා විකප්පං ආපන්නං නිස්සග්ගියං.

---

(12) පුරාණචීවරං, (වැලඳගත්) පරණ සිවුර; අඤ්ඤාතිකාය භික්ඛුනියා, නොනෑමෙහෙණකලවා; ධොවාපිතං, සෝදවනලද.

("අඤ්ඤාතිකා නාම, මාතිතො වා පිතිතො වා යාවසත්තමා කුලපරිවට්ටා අසම්බන්ධා" *)

("පුරාණචීවරං නාම සකිං නිවත්ථං වා සකිං පාරුතං වා" †)

(13) අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො, නොනෑමෙහෙණක අතින්; පාරිවට්ටකා අඤ්ඤත්‍ර, පරිවට්ටකයක්නැතිව, (යටත්පිරිසෙයින් අරළුකඩකුඩුවෙනාදී) පටිග්ගහිතං, පිළිගන්නාලද.

(14) අඤ්ඤාතිකං, නොනෑ; ගහපතිකං, ගිහිමිනිසකු; සමයා අඤ්ඤත්‍ර, (අසුන්සිවුරු නටසිවුරු ඇති) සමය මිස; විඤ්ඤාපිතං, විණවනලද.

(15) තතුත්තරිං, කීපමණකින් වඩා (හෙවත්) හඳණ පොරෝණ පමණෙකින් වැඩියක්, සමයා අඤ්ඤත්‍ර, (අසුන්සිවුරු නටසිවුරු ඇති) සමයමිස; විඤ්ඤාපිතං, විනවනලද.

(16) පුබ්බෙ, පළමු; අප්පවාරිතො, (කෙබඳු සිවුරකින් අවුද කෙබඳුසිවුරක් ගෙණදෙම්දැයි) නොපවරණලද්දුව; අඤ්ඤාතකං ගහපතිකං, නොනෑ ගිහිමිනිසෙකුකරා; උපසඞ්කමිත්වා, එළඹ; විකප්පං (මේ සිවුරම්ලයෙන්ම දිගිත් පළලිත් මෙබඳුහෝ මෙබඳු සිවුරක් ගෙණදෙවයන) අධිකවිධානයට; ආපන්නං, පමුණුවනලද.

(17) අඤ්ඤාතකෙ ගහපතිකෙ, නොනෑ ගිහිමිනිසුන්කරා; උපසඞ්කමිත්වා, එළඹ.

---

* නොනෑයෝනම් මව්පක්ෂයෙන්හෝ පියපක්ෂයෙන්හෝ සත්වැනි කුලපරම්පරාවදක්වා අසම්බන්ධයෝයි.–† පොරාණකචීවරය නම් වරක් හඳනාලද්දහෝ වරක් පොරෙණලද්දහෝයි.

(18) ඉදමෙම භනෙන විවරං අතිරෙක තීකබතතුං චොදනාය අතිරෙකජකබතතුං ඨානෙන අභිනිපථාදීතං නිසසගගියං.

(19) ඉදමෙම භනෙන සඑතා කොසියමිසසකං කාරාපිතං නිසසගගියං.

(20) ඉදමෙම භනෙන සුඛකාළකානං එළකලොමානං සඑතා කාරාපිතා නිසසගගියං.

(21) ඉදමෙම භනෙන සඑතං අනාදියිතවා තුලං ඔදාතානං තුලං ගොචරියානං කාරාපිතං නිසසගගියං.

(22) ඉදමෙම භනෙන සඑතං ඌනජබබසසානි කාරාපිතං අඤ්ඤත්‍ර භිකඛුසම්මුතියා නිසසගගියං.

(23) ඉදමෙම භනෙන නිසීදනසඑතං අනාදියිතවා පුරාණසඑතසස සාමනතා සුගතවිදතිං කාරාපිතං නිසසගගියං.

---

(18) අතිරෙකතීකබතතුං, තුන්වරකට අධික කොට, චොදනාය, (ඇවත සිවුරෙන් මට අපී ඇත යන) චොදනායෙන්; අතිරෙකජකබතතුං, සවරකට අධිකකොට; ඨානෙන, (තුෂ්ණීම්භූතව) සිටීමෙන්; අභිනිපථාදිතා, නිපදයනලද.

(19) ඉදං සඑතං, මේ සඑතය; කොසියමිසසකං, හිඟිරිහු මුසු කොට; කාරාපිතං, කරවනලද.

("සඑත නාම සමෙ භූමිභාගෙ කොසියංසූනි උපරූපරි සඑරිතවා කඤ්ජිකාදිහි සිඤ්චිතවා කතං අචායිමං" *)

(20) ඉදං සඑතං, මේ සඑතය; සුඛකාලකානං, හුදෙක් කලු වූ; එළකලොමානං, එළලොමින්; කාරාපිතං, කරවනලද

(21) ඔදාතානං, සුදුඑළලොම්න්; තුලං, භාගයක්ද; ගොචරියානං, කිඹුල්වන් එළලොමින්; තුලං, භාගයක්ද; අනාදියිතවා, නොගෙණ.

(22) භිකඛුසම්මුතියා අඤ්ඤත්‍ර, මහණසම්මුතිනැතිව; ඌනජබබසසානි, කලනැත්පවත් සහවුරුද්දක් නොපිරෙනතෙක්; කාරාපිතං, කරවනලද,

(23) පුරාණසඑතසස, (අනුභව කරණලද) පරණසඑත යාගේ; සාමනතා, එක්පසකින්; සුගතවිදතිං, සුගත් වියතක් පමණ; අනාදියිතවා, නොගෙණ.

---

* සඑතයනම් සමවූභූමිභාගයෙහි කොසියතුල් මතුමතුයෙහි අතුරා කාඩි (කැද) ආදියෙන් තෙමා කරණලද්දකි (නොහොත්) නොවීමෙන් ඉපදවූ ඇතිරියකි.

(24) ඉමානි මෙ භන්තෙ එළකලොමානි තියොජනපරමං අතික්කාමිතානි නිස්සග්ගියානි.

(25) ඉමානි මෙ භන්තෙ එළකලොමානි අඤ්ඤාතිකාය භික්ඛුණියා ධොවාපිතානි නිස්සග්ගියානි.

(26) අහං භන්තෙ රූපියං පටිග්ගහෙසිං ඉදං මෙ භන්තෙ නිස්සග්ගියං ඉමාහං සංඝස්ස නිස්සජ්ජාමී''ති.

(27) අහං භන්තෙ නානප්පකාරකං රූපියසංවොහාරං සමාපජ්ජිං ඉදං මෙ භන්තෙ නිස්සග්ගියං ඉමාහං සංඝස්ස නිස්සජ්ජාමී''ති.

390 නිස්සජ්ජිත්වාන ආපත්තිං දෙසෙය්‍යාථ ගිහිං වදෙ,
ජානාහි'මන්ති ඉමිනා සො වදෙය්‍ය හරාමි කිං.

391 අවත්වා 'මන්ති තෙලාදිං වදෙ භික්ඛූන කප්පියං,
යං ආහරති සො තෙන පරිවත්තෙත්වාන කප්පියං.

392 ලද්ධා ඨපෙත්වා වෙ පෙතෙ සෙසෙහි පරිභුඤ්ජිතුං,
තතො අඤ්ඤෙන ලද්ධො'පි භාගො නෙසං න කප්පති.

---

(24) ඉමානි එළකලොමානි, මේ එළකලෝමයෝ; තියොජනපරමං, තුන්යොදුනක්පමණතැන්; අතික්කාමිතානි, ඉක්මවනලදහ.
(25) අඤ්ඤාතිකාය භික්ඛුනියා, නොනෑමෙහෙණකලවා; ධොවාපිතානි, සෝදවනලදහ.
(26) රූපියං, රන්රිදීමසුකාවූණු; පටිග්ගහෙසිං, ගත්මි.
(27) නානප්පකාරකං (කතාකතාදිවිසින්) නොයෙක්ප්‍රකාරවූ; රූපියසංවොහාරං, රන්රිදීමසුකාවණු පෙරළීකිරීමට; සමාපජ්ජිං, පැමිණියෙමි; භන්තෙ, ස්වාමිය; මෙ, මාවිසින්; ඉදං, මේ; නිස්සග්ගියං, නිසජියයුත්තේය; අහං, මම; ඉමං, මේ; නිස්සජ්ජාමිති, නිසජමිසි.
390 නිස්සජ්ජිත්වාන, වස්තුවනිසජා; ආපත්තිං, (අවත්) ඇවැත්; දෙසෙය්‍ය, දෙසත්තේය, අථ (ඇවැත්දෙසූ) ඉක්බිති; ගිහිං, (එ තැනටපැමිණි) ගිහිම්නිසකුට; ඉමං ජානාහීති, මෙදන්වයි; වදෙ, කියත්තේය; සො, හෙතෙම; ඉමිනා, මෙයින්; කිං හරාමි, කුමක් ගෙණෙම්දැයි; වදෙය්‍ය, කියානම්.
391 ඉමන්ති, මේ (ගෙණෙ) යි; අවත්වා, නොකියා; භික්ඛූනං, මහණුන්ට; තෙලාදිං, තෙල් (මී සකුරු) ආදිය; කප්පියං, කැපය යි; වදෙ, කියත්තේය; සො, හෙතෙම; තෙන, ඒ (නිසදූ) වතින්; පරිවත්තෙත්වාන, පෙරළීකොට; යං කප්පියං, යම්කැපවතක්; ආහරති, ගෙණේද (තං, ඒකැපවත.)
392 එතෙ වෙපෙ ඨපෙත්වා, (රූපියපටිග්ගාහක රූපියසංවොහාර

393 රුක්ඛච්ඡායා'ප්‍යන්තමසො තත්‍රනිබ්බත්තා න කප්පති,
නිස්සට්ඨපටිලද්ධම්පි ආදිතො සන්ථතත්තයං.

394 නොචෙ ලබ්භෙථ එවං සො ඉමං ඡඩ්ඩෙති සංඝියො,
එවම්පි භික්ඛු ඡඩ්ඩෙය්‍ය නොචෙ ලබ්භෙය්‍ය සම්මතො.

395 එතානි දුතියං පත්තං සඞ්ඝෙ සෙසානි ලබ්භරෙ,
සඞ්ඝෙ'කස්මිං ගණෙ චත්තුං ලබ්භං භාසන්තරෙන'පි.

(28) අහම්භන්තෙ නානප්පකාරකං කයවික්කයං සමාපජ්ජිං ඉ
දම්මෙ භන්තෙ නිස්සග්ගියං.

---

ක) ඒදෙදෙනාමැතබා; සෙසෙහි, සෙසුමහණුන්විසින්; පරිභුඤ්ජිතුං, වලඳන්නට; ලබ්භං, වටී; තතො, ඒ(නිසඳුවත් පෙරළිකොට ගෙණ)කැපවතින්; අඤ්ඤෙන, අනිකකුවිසින්, (යටත්පිරිසෙයින් ආරම්කයකුදුවිසින්)ලද්ධාභාගොපි, ලදකොටසකුදු; නෙසං, ඒ දෙදෙනාහට; නකප්පති, නොවටී.(බොහෝකියා කිමෙක්ද.)

393 අන්තමසො, යටත්පිරිසෙයින්; තත්‍රනිබ්බත්තා, ඒවස්තු වෙන්උපන්; රුක්ඛච්ඡායාපි, ගස්සෙවනකුදු; නකප්පති' (ඒ දෙ දෙනාට) නොවටී; නිස්සට්ඨපටිලද්ධං, නිසඳුනැවතලද්දාවූ; ආදිතො, ආදියෙහි; සන්ථතත්තයම්පි, (කොසියය. සුද්ධකාලකය. ද්වෙ භාගයයන) සන්ථතුනද (නකප්පති, "අඤ්ඤෙනාකතං පටිලභිත්වා පරිභුඤ්ජති ආපත්තිදුක්කටස්ස"යි වදාළබැවින් හැමදෙනාහටම නොවටී.)

394 එවං, මෙසේ(කීසෙයින්) නොචෙලබ්භෙථ, ඉදින්නොලැබී නම්; සො, ඒගිහිමිනිස්; ඉමං ඡඩ්ඩෙති, මේදමයි;සංඝියො(සඟුන් විසින්) කියයුත්තේය; එවම්පි, මෙසේයිතුදු; නොචෙලබ්භෙය්‍ය, ඉදින්නොලැබේනම්; සම්මතො (මහසඟුන්විසින් රුපිය ඡඩ්ඩක සම්මුතියෙන්) සමන්නාලද්දාවූ; භික්ඛු, මහණතෙම; ඡඩ්ඩෙය්‍ය (හුනුනැන්සලකුණු නොකොට අසුචියක්මෙන්) දමන්නේයි.

395 එතානි, පිළිගන්නාලද රුපිය පෙරළිකරණලද රුපිය ය නාතිස්නිසගිවස්තූන්ද; දුතියංපත්තං (ඌනපඤ්චබන්ධන පාත්‍රයක් ඇතිව විණවනලද)දෙවනපාත්‍රයද; සඞ්ඝෙ, මහසඟමැද,(නිසඳත්තේය)සෙසානි, සෙසුනිසගිවස්තූහු; සඞ්ඝෙ, සඟමැදද; එකස්මිං, එක්පුඟුලෙකුකෙරෙහිද; ගණෙ, ගණමැදද; චත්තුංලබ්භරෙ, නිසඳත්වලැබෙති; භාසන්තරෙනපි,(පෙළකියන්නට නොනිස්සහු විසින් දෙමළබස්අෑ) අන්බසිනුදු; ලබ්භං (නිසඳත්) වටිමැයි,

(28) නානප්පකාරකං (චීවරාදිකැපබඩුවිසින්) අනේකප්‍රකාරවූ; කයවික්කයං, ගණුදෙනු; සමාපජ්ජිං, සමවන්නිමි.

(29) අයම්මෙභන්තෙපත්තොදසාහාතික්කන්තොනිස්සග්ගියො.

(30) අයම්මෙ භන්තෙ පත්තො ඌනපඤ්චබන්ධනෙන පත්තෙන චෙතාපිතො නිස්සග්ගියො ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති.

396 නිස්සජ්ජිත්වාන දෙසෙය්‍ය ආපත්තිං පත්තගාහකං,
සම්මන්නිත්වාන සඞ්ඝස්ස පත්තන්තං තස්ස දාපයෙ.

(31) ඉදම්මෙභන්තෙභෙසජ්ජංසත්තාහාතික්කන්තංනිස්සග්ගියං

(32) ඉදම්මෙ භන්තෙ වස්සිකසාටිකචීවරං අතිරෙකමාසෙ සෙසෙ ගිම්හානෙ පරියිට්ඨං අතිරෙකද්ධමාසෙ සෙසෙ ගිම්හානෙ කත්වා පරිදහිතං නිස්සග්ගියං.

(33) ඉදම්මෙ භන්තෙ චීවරං භික්ඛුස්ස සාමං දත්වා පුන අච්ඡින්නං නිස්සග්ගියං.

(34) ඉදම්මෙ භන්තෙ චීවරං සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි වායාපිතං නිස්සග්ගියං.

---

(29) අයම්පත්තො, මේපාත්‍රය; දසාහාතික්කන්තො, (ඉටත්වි කපුත්නැතිව) දසදවසක් ඉක්මූනේය.

(30) ඌනපඤ්චබන්ධනෙන පත්තෙන, උනුපස්බාත් පාඇතියව; චෙතාපිතො, ඉල්වාගත්නාලද; නිස්සග්ගියො, නිසපියයුත්තේය; අහං, මම; ඉමං, මේපාත්‍රය; සඞ්ඝස්ස, සඟහට; නිස්සජ්ජාමි, නිසජමියි.

396 නිස්සජ්ජිත්වාන, (මෙසේ පාත්‍රය) නිසඳ; ආපත්තිං, (ඇවත්) ඇවැත්; දෙසෙය්‍ය, දෙසන්නේය; පත්තගාහකං, පාත්‍රගන්වන මහණක්හු; සම්මන්නිත්වාන, (ඥත්තිවියතිකම්මයෙන්) සැමැ; සඞ්ඝස්ස, සංඝයාගේ; පත්තන්තං, පශ්චිමාන්තපාත්‍රය; (හැමදෙනාගත්වා කෙළවරලදපාත්‍රය;) තස්ස, ඔහට; දාපයෙ, දෙවන්නේයි.

(31) ඉදං භෙසජ්ජං, මේ බෙහෙද; සත්තාහාතික්කන්තං, සත්දවසක් ඉක්මූනේය.

(32) ඉදං වස්සිකසාටික චීවරං, මේවැසිසළුසිවුර; ගිම්හානෙ, ගිම්හන්හි; අතිරෙකමාසෙ, මසකට අධිකයක්; සෙසෙ, සිටිකල්හි; පරියිට්ඨං ("කාලෙ වස්සිකසාටිකාය" යනාදීන්) පිරියස්නාලද; ගිම්හානෙ, ගිම්හන්හි; අතිරෙකඩ්ඪමාසෙ, අඩමසකට අධිකයක්; සෙසෙ, සිටිකල්හි; කත්වා, (ගෙත්තම් රදත් කප්බින්දු දීමෙන්) කොට නිමවා; පරිදහිතං, වැලඳගන්නා ලද්දේය.

(33) භික්ඛුස්ස, භික්‍ෂුහට; සාමං දත්වා, (වෙය්‍යාවච්චාදීන් කැමතිව) තමාවිසින්මදී; පුන, නැවත; අච්ඡින්නං, (නොකරණහෙයින් සකසංඥයෙන්) අසිදගන්නාලද.

(34) සාමං, තමාවිසින්ම; සුත්තං විඤ්ඤාපෙත්වා, (සිවුරුපිණිස) හූල්වාගෙණ; තන්තවායෙහි, (නොනෑනොපැවරූ) වියන්නන් ලවා; වායාපිතං, වියවනලද-

(35) ඉදමෙම භන්තෙ චීවරං පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතකස්ස ගහපතිකස්ස තන්තවායෙ උපසඞ්කමිත්වා විකප්පං ආපන්නං නිස්සග්ගියං.

(36) ඉදමෙම භන්තෙ අච්චෙකචීවරං චීවරකාලසමයං අතික්කාමිතං, නිස්සග්ගියං.

(37) ඉදමෙම භන්තෙ චීවරං අතිරෙකඡාරත්තං විප්පවුත්ථං අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා නිස්සග්ගියං.

(38) ඉදමෙම භන්තෙ ජානං සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමිතං නිස්සග්ගියං ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමි''ති.

---

("සුත්තන්තන්ති ඡබ්බිධං ඛොමසුත්තාදිං වා තෙසං අනුලොමං වා, විඤ්ඤාපෙත්වාති චීවරත්ථාය යාචිත්වා'' * යනුඅටුවායි.)

(35) පුබ්බෙ, පෙර; අප්පවාරිතො, චීවර සවාමීනුවිසින් නොපවරණලදුව; අඤ්ඤාතකස්ස ගහපතිකස්ස, නොනෑ ගිහිමිනිසකුගේ; තන්තවායෙ, වියන්නාවුන්කරා; උපසඞ්කමිත්වා, එළඹ; විකප්පං (දිගපුළුල ඇතිකොට කරව යනාදි විසින්) අධිකප්ඛානයට ආපන්නං, පමුණුවනලද.

(36) අච්චෙකචීවරං (ගමියගිලානාදීන්විසින් වස්සාවාසිකදෙම් හයිකියා දෙනලද) අත්‍යායික චීවරය; චීවරකාලසමයං, සිවුරුකල්ඇතිසමය; අතික්කාමිතං, ඉක්මවනලද.

("චීවරකාලසමයන්ති අනත්ථතෙ කඨිනෙ වස්සානස්ස පච්ඡිමො මාසො අත්ථතෙ පඤ්චමාසා'' †)

(37) භික්ඛුසම්මුතියා අඤ්ඤත්‍ර, මහණසම්මුතියක් නැතිව; අතිරෙකඡාරත්තං, සදවසකට වඩා; විප්පවුත්ථං, වියෝව වසනලද.

(38) මෙ, මාවිසින්; පරිණතං, (දෙමහ කරමහ යනාදීන්)සඟහට පිරිණැමුනු; සඞ්ඝිකං, (පරිණතහෙයිම්ම) සඞ්ඝසන්තකවූ; ඉදං ලාභං, මේ (චීවරාදී) ප්‍රත්‍යය; ජානං, දැනදැන; අත්තනො, තමහට; පරිණාමිතං, (මට දෙව යනාදීන්) පිරිණාමවනලද; නිස්සග්ගියං, නිසජියයුතුය; අහං, මම; ඉමං, මේ; ආයස්මතො, ඇවැත්හට; නිස්සජ්ජාමි,ති, නිසජමියි (මෙසේ කියා නිසජියයුතු.)

---

* සුත්තං යනු කොමුහු ඈ ෂට්විධයහෝ ඔවුන්ට අනුලොමය හෝයි. විඤ්ඤාපෙත්වා යනු සිවුරුපිණිස ඉල්වා.

† චීවරකාලසමයනම් කඨිනය නොඅතුළකල්හි වස්සානඃතුවසම්බන්ධවූ පශ්චිමමාසයද කඨිනයඅතුළකල්හි (ඒ පශ්චිමමාසයපටන්) පස්මසදවෙයි.

397 සෙසං සබ්බං යථායොගං ආදිම්හි විය යොජයෙ.

(39) අහම්භන්තෙ එකං පාචිත්තියාපත්තිං ආපජ්ජිං, වෙ—පෙ— සම්බහුලා පාචිත්තියාපත්තියො ආපජ්ජිං,

(40)"ගාරය්හං භන්තෙ ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමී"ති. තෙන "පස්සසි ආවුසො තං ධම්මන්ති" වත්තබ්බං.

(41) අහම්භන්තෙ එකං දුක්කටාපත්තිං ආපජ්ජිං. වෙ—පෙ—සම්බහුලා දුක්කටාපත්තියො ආපජ්ජිං.

(42) අහම්භන්තෙ එකං දුබ්භාසිතාපත්තිං ආපජ්ජිං. වෙ—පෙ— සම්බහුලා දුබ්භාසිතාපත්තියො ආපජ්ජිං තා තුම්හමූලෙ පටිදෙසෙමී,ති.

(43) අහම්භන්තෙ වෙ නානාවත්ථුකා ථුල්ලච්චයාපත්තියො ආපජ්ජිං, සම්බහුලා නානාවත්ථුකා ථුල්ලච්චයාපත්තියො ආපජ්ජිං. තා තුම්හමූලෙ පටිදෙසෙමී"ති වත්වා තෙන "පස්සසි ආවුසො තා ආපත්තියො"ති වුත්තෙන "ආම භන්තෙ පස්සාමී"ති වත්වා පුන තෙන "ආයතිං ආවුසො සංවරෙය්‍යාසී"ති වුත්තෙන "සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමී"ති වත්තබ්බං.

---

397 සෙසං සබ්බං, සෙසු සියල්ල; යථායොගං, යෙදෙනයෙදෙනසේ; ආදිම්හිවිය, පළමු (නිස්සග්ගියෙහි) සෙයින්ම; යොජයෙ, යොදන්නේයි.

(39) එකං පාචිත්තියාපත්තිං, පචිතිආපත්ති එකක්; වෙ, (පාචිත්තියාපත්ති)දෙකක්; සම්බහුලා පාචිත්තියාපත්තියො, බොහෝ පාචිත්තියාපත්තීන්; ආපජ්ජිං, අවත්මි.

(40) භන්තෙ, ස්වාමිය; ගාරය්හං, නින්දාකටයුතුවූ; අසප්පායං, සැපනොවන්නාවූ; පාටිදෙසනීයං ධම්මං, පාටිදෙසනීයාපත්තියක්, ආපජ්ජිං, අවත්මි, තං, ඒ; පටිදෙසෙමී'ති, දෙසමියි; (කියයුත්තේය) තෙන, ඒ පිළිගන්නහුවිසින්; පස්සසි ආවුසො තං ධම්මන්ති, "පස්සසි ආවුසො තං ධම්මං"කියා; වත්තබ්බං, කියයුතුයි.

(41) එකං දුක්කටාපත්තිං, දුක්කටාපත්ති එකක්. වෙ, (දුක්කටාපත්ති) දෙකක්. සම්බහුලා දුක්කටාපත්තියො, බොහෝදුක්කටාපත්තීන්; ආපජ්ජිං, අවත්මි.

(42) එකං දුබ්භාසිතාපත්තිං, දුබ්භාසිතාපත්ති එකක්. වෙ (දුබ්භාසිතාපත්ති) දෙකක්. සම්බහුලා දුබ්භාසිතාපත්තියො, බොහෝදුබ්භාසිතාපත්තීන්;

(43) නානාවත්ථුකා, නානාවස්තුඇති; වෙ ථුල්ලච්චයාපත්තියො, ථුල්ලච්චයාපත්තීන් දෙදෙනකු; නානාවත්ථුකා, නානාව

398 අදෙසනාගාමිනියා අනාපත්තිඤ්ච දෙසිතං,
නානාසංවාසනිස්සීමට්ඨිතානං චතුපඤ්චගි,
මනසා පකතත්තානං නානෙකා'ති න දෙසයෙ'ති.

"ඡ න්‍ද දා නං"ති

399 භෙරිං ඝණ්ඩිං ච තාලෙත්වා කම්මප්පත්තෙන සමාගතෙ,
සඞ්ඝෙ හරෙය්‍ය ඡන්දං වා පාරිසුද්ධිං පවාරණං.

400 එකං භික්ඛුමුපාගම්ම නිසීදිත්වාන උක්කුටිං,
අඤ්ජලිං පග්ගහෙත්වාන දදෙ ඡන්දං විචක්ඛණො.

---

සත්‍යැති; සම්බහුලා ථුල්ලච්චයාපත්තියො, බොහෝථුල්ලච්චයාපත්තින්; අපජ්ජිං—පෙ—පටිදෙසෙමීති, "අහං භන්තෙ සම්බහුලා ථුල්ලච්චයාපත්තියො ආපජ්ජිං තා තුම්හාමූලෙ පටිදෙසෙමී"යි වත්වා, කියා; තෙන, ඔහුවිසින්; පස්සසි ආවුසො තා ආපත්තියො ති, "පස්සසි ආවුසො තා ආපත්තියො"යි; වූතෙන, කී කල්හි; ආම භන්තෙ පස්සාමීති, "ආම භන්තෙ පස්සාමි"යි; වත්වා, කියා; පුන, නැවත. තෙන, ඔහුවිසින්; ආයතිං ආවුසො සංවරෙය්‍යාසීති, "ආයතිං ආවුසො සංවරෙය්‍යාසි"යී; වූතෙන, කීකල්හි; සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමීති, "සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමි"යි; වත්තබ්බං, කියයුතුයි.

398 අදෙසනාගාමිනියං, දෙසනාගාමිනී නොවන. (පාරාජිකාසංඝාදිසෙසද) අනාපත්තිඤ්ච; නිරවැද්ද; දෙසිතං, දෙසූඇවැත්ද; නානාසංවාසනිස්සීමට්ඨිතානං (සන්තිකෙ,) නානාසංවාසයන්හා සමග බහිසීම සිටියන්කෙරෙහිද; චතුපඤ්චගි, සතරපස්දෙනකු එක්වද; මනසා, (තුදෙක්) සිතින්ද; අපකතත්තානං (සන්තිකෙ,) පාරාජිඅවන්නන් පොහෝපවුරුණු සිටුවනලද්දුවන් කෙරෙහිද; නානා, බොහෝආපත්තීන්; එකා ඉති, එකඅපත්තියෙකැයිද; නදෙසයෙ, නොදෙසන්නේයි.

---

("ඡන්දදානං"ති, ඡන්දදානං යන්නෙහි(සැද පිරිසිදු පවුරුණු දීම්නම්.)

399 භෙරිං, බෙරහෝ; ඝණ්ඩිංවා, ගෙඩියහෝ; තාලෙත්වා, ගසා; කම්මප්පත්තෙන, සඞ්ඝකම්මයට නිසිවූ; සඞ්ඝෙ, චතුර්වර්ගාදිසඞ්ඝයා; සමාගතෙ, රැස්වූකල්හි; ඡන්දංවා, සැදහෝ; පාරිසුද්ධිං, පිරිසිදුහෝ; පවාරණං, පවුරුණුහෝ; හරෙය්‍ය, ගෙණයන්නේයි.

400 එකං භික්ඛුං, එක්මහණකුහු කරා; උපාගම්ම, එලඹ; උක්කුටිං, එලිල්ලෙන්; නිසීදිත්වාන, හිද; අඤ්ජලිං පග්ගහෙත්වාන, ඇඳිලිබැද; ඡන්දං, අදහස; විචක්ඛණො, නුවනැත්තේ; දදෙ, දෙන්නේයි.

(44) "ජන්දම්මිජන්දංමෙහරජන්දංමෙ ආරොචෙහී"ති වත්තබ්බං.
(45) පාරිසුද්ධිං දෙන්තෙන "පාරිසුද්ධිං දම්මි පාරිසුද්ධිං මෙ හර පාරිසුද්ධිං මෙ ආරොචෙහී"ති වත්තබ්බං.

401 පාරිසුද්ධිප්පදානෙන සම්පාදෙති උපොසථං,
සඞ්ඝස්ස අත්තනො චා 'පි සෙසකම්මං විබාධති.

402 ඡන්දදානෙන සඞ්ඝස්ස වයං සාධෙති නා'ත්තනො,
තස්මා ඡන්දං දදන්තෙන දාතබ්බා පාරිසුද්ධි'පි.

403 හරෙය්‍යෙකො බහූනම්පි නො හරෙය්‍ය පරම්පරා,
පරම්පරාහටා * ඡන්දපාරිසුද්ධි න ගච්ඡති.

---

(44) ඡන්දං —පෙ— ආරොචෙහීති, "ඡන්දං දම්මි ඡන්දං මෙ හර ඡන්දං මෙ ආරොචෙහී"යි; වත්තබ්බං, කියයුතුයි. ඡන්දං, අදහස; දම්මි, දෙමි; මෙ, මාගේ; ඡන්දං, අදහස; හර, ගෙණියා; මෙ, මාගේ; ඡන්දං, අදහස; ආරොචෙහි, අරොජ; (යනුමෙහි අථයි.)
(45) පාරිසුද්ධිං දෙන්තෙන, පිරිසුදු දෙන්නහුවිසින්; පාරිසුද්ධිං —පෙ— ආරොචෙහීති, "පාරිසුද්ධිං දම්මි පාරිසුද්ධිං මෙ හර පාරිසුද්ධිං මෙ ආරොචෙහී"යි; වත්තබ්බං, කියයුතුයි. පාරිසුද්ධිං, පිරිසුදු; දම්මි, දෙමි; මෙ, මාගේ; පාරිසුද්ධිං, පිරිසුදුබව; හර, ගෙණියා; මෙ, මාගේ; පාරිසුද්ධිං, පිරිසුදුබව; ආරොචෙහි, අරොජ; (යනුමෙහි අථයි.)
401 පාරිසුද්ධිප්පදානෙන, පිරිසිදුදීමෙන්; සඞ්ඝස්ස, සඟහටද; අත්තනො චාපි, තමහටද; උපොසථං, පොහොය; සම්පාදෙති, සපයයි; සෙසකම්මං, (සංඝයාගේ අපලොකනාදිසෙසු) සඞ්ඝකම්; විබාධති, කොපාකෙරේ.
402 ඡන්දදානෙන, (ඡුදු) සැදදීමෙන්; සඞ්ඝස්ස; සඟහට; වයං, පොහොයහා සෙසු සඞ්ඝකම්; සාධෙති, සපයයි; නාත්තනො, තමහට පොහෝ නොසපයා; තස්මා, තමාපොහෝ නොකළානම්වනහෙයින්; ඡන්දං දදන්තෙන,(පොහෝදවස්) සැදදෙන්නහුවිසින්; පාරිසුද්ධිපි, පිරිසිදුදු; දාතබ්බා, දියයුත්තීයි.
403 එකො, එක්මහණෙක්; බහුනම්පි, බොහෝදෙනෙකුගේද; (සදපිරිසුදු) හරෙය්‍ය, ගෙණියත්තේය; පරම්පරා, පරම්පරායෙන්; නොහරෙය්‍ය, නොගෙණයන්නෙයි; පරම්පරාහටා, පරම්පරායෙන් ගෙණයනලද; ඡන්දපාරිසුද්ධි, සැදපිරිසුදු; නගච්ඡති (සඟමැදට) නොයේ.
("එකෙන බහූනම්පි ආහටා පාරිසුද්ධි ආහටා'වහොති, සචෙ

---

* පරංපරාගතා-කියාද පාඨයි.

404 සබ්බූපචාරං කත්වාන එවං දෙය්‍යා පවාරණා.

(46) "පවාරණං දම්මි පවාරණං මෙ හර පවාරණං මෙ ආරොචෙහි මමත්ථාය පවාරෙහී,,ති වත්තබ්බං.

405 ආරොචෙත්වා'ථ සො සඞ්ඝං පවාරෙය්‍යෙවමාගතො.

(47) "ඉත්ථන්නාමො භන්තෙ සඞ්ඝං පවාරෙති දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදතු තං සඞ්ඝො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සතී"ති.

---

පන සො අනතරා අඤ්ඤං භික්ඛුං දිස්වා යෙසං තෙන පාරිසුද්ධි ගහිතා තෙසඤ්ච අත්තනො ච පාරිසුද්ධිං දෙති තස්සෙව පාරිසුද්ධි ආගච්ඡති, ඉතරා පන බිළාලසංඛලිකා පාරිසුද්ධි නාම හොති, සා න ආගච්ඡති,, * යනුඅටුවායි.)

404 සබ්බූපචාරංකත්වාන, (සිවුරුඑකස්කිරීම්ආදිවූ) සියලුඋපචාරකොට; පවාරණා, පවුරුණුතොමෝ; එවං, මෙසේ; දෙය්‍යා, දියයුත්තීයි.

(46) පවාරණං දම්මි—පෙ—පවාරෙහීති, "පවාරණං දම්මි පවාරණං මෙ හර පවාරණං මෙ ආරොචෙහි මමත්ථාය පවාරෙහී"ති. වත්තබ්බං, කියයුතුයි. පවාරණං දම්මි, පවුරුණු දෙමි; මෙ, මාගේ; පවාරණං, පවුරුණු; හර, ගෙණයා; මෙ, මාගේ; පවාරණං, පවුරුණු; ආරොචෙහි, අරොජ; මමත්ථාය, මාපිණිස; පවාරෙහි, පවර; (යනුමෙහි අර්ථයි.)

405 ආගතො, (පවුරුණුගෙණ) ආ; සො, ඒමහණ; ආරොචෙත්වා (මෙනම් මහණහුවිසින් පවුරුණුදෙනලදැයි සඟහට) අරොජ; අථ, ඉක්බිති; එවං, මෙසේ; (ඉත්ථන්නාමො භන්තෙ යනාදි විසින්) සඞ්ඝං, සංඝයා; පවාරෙය්‍ය, පවරන්නේයි.

(47) ඉත්ථන්නාමො—පෙ—පටිකරිස්සතීති, "ඉත්ථන්නාමො භන්තෙ සඞ්ඝං පවාරෙති දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා

---

* එක් භික්ෂුවක්විසින් බොහෝභික්ෂූන්ගේ පාරිසුද්ධිතොමෝ ගෙණෙනලද්දී ගෙණඑනලද්දීමවන්නීය, ඉදින් වනාහි හෙතෙම අතර (මග) දී අනික් භික්ෂුවක් දැක ඔහුවිසින් යමෙකුන්ගේ පාරිසුද්ධියගන්නාලද්දීද ඔවුන්ගේද තමාගේද පාරිසුද්ධිය දේද (එකල්හි) ඔහුගේම පාරිසුද්ධිය එයි අනික් පාරිසුද්ධිතොමෝනම් බලල්ගෙලබැඳි සංබලිකයක්හා සමවන්නීය ඕතොමෝනොඑයි. (බලලාගේ ග්‍රීවයෙහි බැඳි සංබලිකය බලලා එනකල්හිම එයි නොයෙනකල්හි නොමඑයි එසේම අනික් භික්ෂුවක් විසින් ගෙණෙනලද පාරිශුද්ධිය ඒභික්ෂුව එනකල්හි එයි නොයෙන කල්හි නොමඑයි. යනු භාවයි.)

406 ගහෙත්වා පාරිසුද්ධිං වා ඡන්දං වා'පි පවාරණං,
හාරකො සඞ්ඝමප්පත්වා විබ්භමෙය්‍ය මරෙය්‍ය වා.

407 සාමණෙරාදිභාවං වා පටිජානෙය්‍ය නා'හටා,
පත්වා සඞ්ඝං තථා හෙය්‍ය ආහටා හොති හාරකො.

408 සඞ්ඝප්පත්තො පමත්තො වා සුත්තො නාරොචයෙය්‍ය වා,
අනාපත්ති ච සංචිච්ච නාරොචෙන්තස්ස දුක්කටන්ති.

---

“උ පො ස ථො”ති

409 ද්වෙ උපොසථා චාතුද්දසො පණ්ණරසො ඉති,
සුත්තුද්දෙසමධිට්ඨානපාරිසුද්ධිවසා තයො.

---

වදතු නං සඞ්ඝො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සති”යි (පවරන්නේයි.) භන්තෙ, ස්වාමීය; ඉත්ථන්නාමො, මෙනම් මහණ; සඞ්ඝං, සංඝයා; පවාරෙති, පවරයි; සඞ්ඝො, සංඝතෙමේ; අනුකම්පං උපාදාය, කාරුණ්‍යපිණිස; දිට්ඨෙනවා, දුටුදෙයකින් හෝ; සුතෙනවා, ඇසූදෙයකින්හෝ; පරිසංකායවා, සැකයකින් හෝ; තං, ඕහට; වදතු, කියාවා; පස්සන්තො, දක්නේ; පටිකරිස්සාමීති, පගළකරන්නේයි. (යනුමෙහිඅර්ථයි.)

406–407–පාරිසුද්ධිංවා, පිරිසුදුහෝ; ඡන්දං වා, සැදහෝ; පවාරණං, පවුරුණුහෝ; ගහෙත්වා, ගෙණ; හාරකො, සගමැදට ගෙණ යන මහණ; සඞ්ඝං අප්පත්වා, සංඝයා අත්පසට නොපැමිණ; විබ්භමෙය්‍ය, ගිහිවීනම්හෝ; මරෙය්‍යවා, මෙලෙව්වීනම්හෝ; සාමණෙරාදිභාවං, සාමණෙරාදිභාවය; පටිජානෙය්‍යවා, ප්‍රතිඥකෙරේනම්හෝ; නාහටා, ගෙණයනලද්දිනොවේ; හාරකො (සැදපිරිසුදු) ගෙණයන්නේ; සඞ්ඝං පත්වා, සංඝයාඅත්පසට පැමිණ; තථා හෙය්‍ය, එසේ (ගෘහස්ථාදිභාවයට පැමිණියේ වීනම්; ආහටා) හොති, ගෙණඑනලදවේ.

408 සඞ්ඝප්පත්තො, සංඝයාකරාඑළඹියේ; පමත්තොවා, පමාවූහෝ; සුත්තොවා, නිදන්නේහෝ; නාරොචයෙය්‍ය, (මෙනම්ම හනාහුවිසින් සඳපිරිසුදුපවුරුණුදෙන්ලදැයි) නොඅරොජානම්; අනාපත්තිච, ආපත්තිනැත්මය; සංචිච්ච, දැනදැන; නාරොචෙන්තස්ස, නොඅරොජන්නාහට; දුක්කටං, දුකුළාවේ.

---

“උපොසථො”ති, උපොසථොයන්නෙහි (පොහෝනම්.)

409 චාතුද්දසො, තුදුස්වක්පොහොය; පණ්ණරසො ඉති, පසළොස්වක්පොහොයයි; ද්වෙ උපොසථා, උපොසථයො දෙදෙනෙකි; සුත්තුද්දෙස, පාමොක් උසුරුවනුවිසින්; අධිට්ඨාන, ඉටත් විසින්; පාරිසුද්ධිවසා, පිරිසුදුපොහොවිසින්; තයො, තුන්දෙනෙකි.

410 සුත්තුද්දෙසො'ව සඞ්ඝස්ස අධිට්ඨානඋපොසථො,
පුග්ගලස්සෙව සෙසානං පාරිසුද්ධිඋපොසථො.

411 පුබ්බකිච්චෙච පුබ්බ කරණෙ * පත්තකල්ලෙ සමානිතෙ
සුත්තං උද්දිස්සති සඞ්ඝො පඤ්චධා සො විභාවිතො.

---

410 සුත්තුද්දෙසො, පාමොක්උදුරුවනපොහොය; සඞ්ඝස්සෙව, සඞ්ඝහටමය; අධිට්ඨානඋපොසථො, ඉටත්පොහොය; පුග්ගලස්සෙව, පුද්ගලයාහටමය; පාරිසුද්ධිඋපොසථො, පිරිසුදුපොහොය; සෙසානං, සෙසු තුන්දෙනාහට දෙදෙනාහටමයි.

411 පුබ්බකිච්චෙච, (ඡන්දාහරණාදිවූ) පූර්වකෘත්‍යද; පුබ්බකරණෙ, (සම්මජ්ජනාදිවූ) පූර්වකරණද; පත්තකල්ලෙ, (උපොසථාදිවූ) ප්‍රාප්තකාලයද; සමානිතෙ, පිළියෙලකළකල්හි; සඞ්ඝො (චතුර්වර්ගාදි) සංඝතෙමේ; සුත්තං උද්දිස්සති, පාමොක්උදුරුවත්තේය; සො, ඒ ප්‍රාතිමොක්ෂොද්දෙශය; පඤ්චධා, (නිදානොද්දෙශාදි) පස්පරිද්දකින්; විභාවිතො, විභාගකරණලදී.

(සම්මජ්ජනී පදීපො ච උදකං ආසනෙන ච,
උපොසථස්ස එතානි පුබ්බකරණන්ති වුච්චති. †

ඡන්දපාරිසුද්ධි උතුක්ඛානං භික්ඛුගණනා ච ඔවාදො,
උපොසථස්ස එතානි පුබ්බකිච්චන්ති වුච්චති. ‡

"සබ්බපඨමං කත්තබ්බං පුබ්බකරණං තදනන්තරං කත්තබ්බං පුබ්බකිච්චන්නාම." §

උපොසථො යාවතිකා ච භික්ඛූ
කම්මප්පත්තා සභාගාපත්තියො ච,
නවිජ්ජන්ති වජ්ජනියා ච පුග්ගලා,
තස්මිං නහොන්ති පත්තකල්ලන්ති වුච්චති. ¶)

---

* පුබ්බකිච්චෙච කරණෙ —ඇතම්.

† හැමදීමද, පහන්දැල්වීමද, අසුන් පැනවීමද, පැන් තැබීමද, යන මේ සතරවත්හු සංඝයාගේ රැස්වීමෙන් පළමු කටයුතු බැවින් උපොසථයට පූර්වකරණයයි කියනුලැබේ.

‡ ඡන්දයහා පාරිසුද්ධිය ගෙණ ඊමද, හෙමන්තාදී ත්‍රිවිධ සෘතූන්ගේ ප්‍රකාශකිරීමද, භික්ෂූන් සංඛ්‍යාකිරීමද, භික්ෂුණීන්ටදියයුතු අවවාද දැනයද, යනමේ පඤ්චකර්මයෝ ප්‍රාතිමොක්ෂොද්දෙශයෙන් පළමු කටයුතු බැවින් උපොසථයට පූර්වකෘත්‍යයයි කියනුලැබේ.

§ සියල්ලට පළමුව කටයුතුවූයේ පූර්වකරණනම් ඊට අනතුරුව කටයුතුවූයේ පූර්වකෘත්‍යනමි.

¶ ත්‍රිවිධ උපොසථ දිනයන් අතුරෙන් එක්තරා එකක්වීමද?

412 විනා'න්තරායං සඞ්ඛිපෙත්වු'ද්දෙසො විනිවාරිතො,
ථෙරොව ඉස්සරො වීසු උද්දෙසෙසෙවත් තිස්සුවා,
විසදෙසු'භි වුත්තත්තා අවත්තනෙන'පි වට්ටති.

413 ආගච්ඡෙය්‍යුං යදි සමා උද්දිසන්තෙ'ථ ථොකිකා,
උද්දිට්ඨං තං සුඋද්දිට්ඨං සොතබ්බමවසෙසකං.

---

(නිදානුද්දෙස, පාරාජිකුද්දෙස, සඞ්ඝාදිසෙසුද්දෙස, අනියතුද්දෙස, විත්ථාරුද්දෙස, යයි මෙසේයින් පසෙක්වේ.)

412 අන්තරායං විනා, (රාජන්තරායාදි)අන්තරායක් නැතිව; සඞ්ඛිපෙත්වා, සංක්ෂෙපයෙන්; උද්දෙසො, පාමොක් උදෙසීම; විනිවාරිතො, වලකනලද්දේය; එසේ උද්දෙසෙසු, මෙපස්වැදෑරුම් උද්දෙශයන් අතුරෙහි; වීසු, දෙකක්හෝ; තිස්සුවා, තුනක්හෝ; විසදෙසු, වනපොත්කල්හි; ථෙරොව, තෙරම; ඉස්සරොති, (පාමොක්හි) හිමියයි; වුත්තත්තා, වදාළහෙයින්; අවත්තනෙනපි, හැමනොදුහුනුකල්හිදු; වට්ටති, (අන්තරායවිනාව සංක්ෂෙපයෙන් උසුරුවීම) වටී.

(අන්තරායනම්. රාජන්තරාය, චොරන්තරාය අග්‍යන්තරාය, උදකන්තරාය, මනුස්සන්තරාය, අමනුස්සන්තරාය, වාළන්තරාය, සිරිංසපන්තරාය, ජීවිතන්තරාය, බ්‍රහ්මචරියන්තරාය, යනමේ දශයයි )

413 උද්දිසන්තෙ, (පාමොක්) උසුරුවනසඳ; සමා, (ආවාසිකයන්හා) සමවූහෝ; අථ, නැවත; ථොකිකා, මදවූහෝ, (අමුතුමහණහු) යදි; ආගච්ඡෙය්‍යුං, ඉදින් අවිනම්; (යා,) යම්ක්; උද්දිට්ඨං, උසුරුවනලදද; තං, ඒ; සුඋද්දිට්ඨං, මනාකොට උසුරුවනලද; අවසෙසකං, නොඋදෙසූතැන්; සොතබ්බං, (ආවාසිකයන් හා එක්ව හිඳ) ඇසියයුතුයි.

---

සංඝයාවිසින් අනුඥප්තවූ (සතරනමකගේ පටන්) යම්පමණ භික්ෂූහු කම්මප්‍රාප්තවූවාහු අත්පස නොහැර එකසීමාවෙහි සිටියාහුද, ඔහු සමානවස්තුකාපත්ති ඇත්තාහු නොවෙත්ද, යිමින් බැහැරකටයුතුවූ(ගහට්ඨ, භික්ඛුණී, සික්ඛමාන, සාමණේර, සාමණේරි, සික්ඛාපච්චක්ඛාතක, අන්තිමවත්ථුඅජ්ඣාපන්නක, ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තක, ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තක, පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛිත්තක, පණ්ඩක, ථෙය්‍යසංවාසක, තිත්ථියපක්කන්තක, තිරච්ඡානගත, මාතුඝාතක, පිතුඝාතක, අරහන්තඝාතක, භික්ඛුණීදූසක, සංඝභෙදක, ලොහිතුප්පාදක, උභතොබ්‍යඤ්ජනක, යන) එක්විසිපුද්ගලයන් එහි නොවෙත්ද, යනමේ සිව්ලක්ෂණෙන් සංඝනිඃතවූයේ ප්‍රාප්තකාලයයි, කියනුලැබේ.

414 උද්දිට්ඨමත්තෙන සකලායෙ, කච්චායුට්ඨිතාය වා,
පාරිසුද්ධිං කරෙය්‍ය,සං සන්තිකෙ බහුකා‘ථ චෙ,
කත්වා සබ්බවිකප්පෙසු පුබ්බකිච්චං පුනු‘ද්දිසෙ.

415 ආවාසිකානං පණ්ණරසො ඉතරානං සචෙ ‘තරෙ,
සමා‘තරෙ‘නුවත්තන්තු පුරිමානං සචෙ‘ධිකා,
පුරිමා අනුවත්තන්තු තෙසං සෙසෙ‘ප්‍ය‘යන්තයො.

416 ආවාසිකානං පාටිපදො, ඉතරානං උපොසථො,
සමථොකානං සාමග්ගිං මූලට්ඨා දෙන්තු කාමතො,
බහිගන්ත්වා න කාතබ්බො නොචෙ දෙන්ති උපොසථො.

---

414 උද්දිට්ඨමත්තෙන,(පාමොක්)උසුරුවා හුන්කෙණෙහිහෝ; සකලායවා, ගැමදෙනාගෝ;එකච්චාය, සමහරකෙණෙකු න්ගෝ; උට්ඨිතාය, නැඟීසිට්සදෑ;(ආගචෙඡය්‍ය,)සමගෝ මදගෝ අමුතුසංඝයාආනම්;එසං සන්තිකෙ,ඒ පොහෝකළවුත් කෙරෙහි; පාරිසුඩිං කරෙය්‍ය, පිරිසුදු(පොහෝ)කරත්තේයි; අථ, නැවත; බහුකා චෙ, ඉදින් (අමුතුමහණහු) බොහෝවූනම්; සබ්බවිකප්පෙසු, “උද්දිසන්තෙ උද්දිට්ඨමත්තෙන” යනාදිසියලු විධානයන්හි; පුබ්බකිච්චං කත්වා, පූර්වකෘත්‍යය කොට; පුන, නැවත; උද්දිසෙ, (ආදියෙහිපටන් පාමොක්) උසුරුවන්නේයි.

415 ආවාසිකානං ආවාසිකයන්ට; පණ්ණරසො, පණුරසිපොහොය; ඉතරානං, අගන්තුකයන්ට; සචෙතරෙ, ඉදින් තුදුස්වක් පොහෝ වීනම්; සමා, සමගෝ; (ඌණා, මදවූගෝ;) ඉතරෙ, ආගන්තුකයෝ; පුරිමානං, ආවාසිකයන්ට; අනුවත්තන්තු, අනුවෙත්වා; (“අජ්ජුපොසථො පණ්ණරසො”යි, පොහෝ කරණ කල්හි ඉවසත්වා) සචෙධිකා, ඉදින් (ආගන්තුකයෝ) බොහෝ වූනම්; තෙසං, ඒ අගන්තුගයන්ට; පුරිමා, ආවාසිකයෝ; අනුවත්තන්තු, අනුවෙත්වා, (“අජ්ජුපොසථො චාතුද්දසො”යි පොහෝ කරණකල්හි ඉවසත්වා;) සෙසෙපි, ආවාසිකයන්ට තුදුස්වක්පොහොය අගන්තුගයන්ට පණුරසිවූකල්හිදු; අයන්තයො, මෙමනයයි.

416 ආවාසිකානං, ආවාසිකයන්ට; පාටිපදො, පැළවිදවස්; ඉතරානං, ආගන්තුගයන්ට; උපොසථො, පොහෝදවස්වීනම්; මූලට්ඨා, ආවාසිකයෝ; සමථොකානං, තමන්හා සමවූහෝ මදවූහෝ අගන්තුගයන්ට; සාමග්ගිං, කායසාමග්‍රිය; කාමතො, (තමන්ගේ) ඉච්ඡායෙන්; දෙන්තු, දෙත්වා; නොචෙ දෙන්ති, ඉදින්. නොදෙත්නම්; බහිගන්ත්වාන, (අගන්තුගයන් විසින් සීමින්) බැහැරගොස්; උපොසථො, පොහොය; කාතබ්බො, කටයුත්තේයි.

417 දෙය්‍යා'නිච්ඡාය සාමග්ගිං බහූසු බහි වා වජෙ,
ආගන්තුකානං පාටිපදෙ එවමෙව නයං නයෙ.

418 සාවෙය්‍ය සුත්තං සංචිච්ච අසාවෙන්තස්ස දුක්කටං,
සම්මජ්ජිතුං පදීපෙතුං පඤ්ඤපෙතුං දකාසනං,
න කරෙය්‍ය තථා කල්ලො මහාථෙරෙන පෙසිතො.

---

417 බහූසු, (ආගන්තුකයන්) බොහෝකල්හි; අනිච්ඡාය, අනිච්ඡායෙනුදු; (නොකැමැතිසේද) සාමග්ගිං, (කාය) සාමග්‍රියහෝ, දෙය්‍යා, දියයුත්තිය; බහිවා, පිට (සීමට) හෝ; වජෙ, යන්නේයි; ආගන්තුකානං පාටිපදෙ, (ආවාසිකයන්ට පොහෝදවස) ආගන්තුකයන්ට පැළවීකල්හි; නයං, මෙකීනය; එවමෙව, මෙසේම; නයෙ, දන්නේයි.

("ඉධ පන භික්ඛවෙ ආවාසිකානං භික්ඛූනං පණ්ණරසො හොති ආගන්තුකානං පාටිපදො, සචෙ ආවාසිකා බහුතරා හොන්ති-පෙ- සචෙ සමසමා හොන්ති ආගන්තුකෙහි ආවාසිකානං සාමග්ගී දාතබ්බා නිස්සීමං වා ගන්තබ්බං, සචෙ ආගන්තුකා බහුතරා හොන්ති ආගන්තුකෙහි ආවාසිකානං න අකාමා දාතබ්බා සාමග්ගී, ආවාසිකෙහි නිස්සීමං ගන්ත්වා උපොසථො කාතබ්බො,, * යනු පෙලයි.)

